322 වන කාණ්ඩය - 06 වන කලාපය
தொகுதி 322 - இல. 06
Volume 322 - No. 06

2025 නොවැම්බර් 13 වන බ්‍රහස්පතින්දා
2025 நவம்பர் 13, வியாழக்கிழமை
Thursday, 13th November, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීම සඳහා කරන ලද ඉල්ලීම [තීරුව 985]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 989-1014]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

වෙළෙඳ පොළෙහි කීරි සම්බා සහල් හිඟය [තීරුව 1014]

**වරප්‍රසාද:**

මාධ්‍ය තුළ ව්‍යාජ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීම [තීරුව 1020]

විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව ගරු කථානායකතුමා සමඟ කළ සාකච්ඡාවක් සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශය [තීරුව 1021]

CIDA හි හිටපු අධ්‍යක්ෂවරයා විසින් ''කෝප්'' කමිටුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව කරන ලද විවේචනය [තීරුව 1022]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 – [පස්වන වෙන් කළ දිනය]:**

දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [තීරු 1031-1154]

**කල්තැබීමේ යෝජනාව:**

අක්ෂි සෞඛ්‍යය සඳහා ජාතික ක්‍රමෝපායික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම [තීරු 1155-1166]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

சிறப்புரிமைக் கேள்வியொன்றை எழுப்புவதற்காக விடுக்கப்பட்ட வேண்டுகோள் [ப: 985]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 989-1014]

**தனி அறிவித்தல் மூல வினா:**

சந்தையில் கீரி சம்பா அரிசிக்கான தட்டுப்பாடு [ப: 1014]

**சிறப்புரிமை:**

ஊடகங்களில் உண்மைக்குப் புறம்பான செய்திகளைப் பரப்புதல் [ப: 1020]

எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களின் பாதுகாப்பு தொடர்பில் மாண்புமிகு சபாநாயகர் அவர்களுடனான கலந்துரையாடல் பற்றிய கூற்று [ப: 1021]

CIDAஇன் முன்னாள் பணிப்பாளரினால் "கோப்" குழுவின் செயற்பாடுகள் தொடர்பில் செய்யப்பட்ட விமர்சனம் [ப: 1022]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட ஐந்தாம் நாள்]:**

இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 1031-1154]

**ஒத்திவைப்புப் பிரேரணை:**

கண் சுகாதாரத்துக்கென தேசிய மூலோபாயத் திட்டமொன்றைச் செயற்படுத்தல் [ப: 1155-1166]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Request to Raise a Question of Privilege [Col. 985]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 989-1014]

QUESTION BY PRIVATE NOTICE:

Scarcity of Keeri Samba in the Market [Col. 1014]

PRIVILEGE:

Dissemination of Fake News on Media [Col. 1020]

Statement Made Regarding Discussion with Hon. Speaker on Security of Opposition Members [Col. 1021]

Criticism by Former Director of CIDA on Functions of COPE [Col. 1022]

APPROPRIATION BILL, 2026 - [Fifth Allotted Day]:

Second Reading-Debate Adjourned [Cols. 1031-1154]

ADJOURNMENT MOTION:

Implementation of a National Strategic Plan for Eye Health [Cols. 1155-1166]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 13 වන බ්‍රහස්පතින්දා***
*2025 நவம்பர் 13, வியாழக்கிழமை*
*Thursday, 13th November, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීම සඳහා කරන ලද ඉල්ලීම
சிறப்புரிமைக் கேள்வியொன்றை எழுப்புவதற்காக விடுக்கப்பட்ட வேண்டுகோள்
REQUEST TO RAISE A QUESTION OF PRIVILEGE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to make this Announcement with reference to a letter submitted to me on 10.11.2025 by the Hon. (Dr.) Ramanathan Archchuna, Member of Parliament seeking permission to raise a matter of Privilege, citing a defamatory statement that had been made against him on 10.11.2025 during the Second Reading Debate of the Appropriation Bill.

I wish to inform that I refer the matter stated therein to the Committee on Ethics and Privileges to be considered whether there has been any breach of Privilege, in terms of the Parliament (Powers and Privileges) Act, No. 21 of 1953, as amended.



## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ඔක්තෝබර් 15 දිනැති අංක2458/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි ඉදිරිපත් කරමි.

මෙම රෙගුලාසි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක ඇමතිතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් නියෝග ඉදිරිපත් කරමි.

(i) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 8 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117(2) වගන්තියේ (ඩ) සහ (ණ) ඡේද යටතේ එවකට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 06 දිනැති අංක 2422/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(ii) 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 7 වගන්තියේ (ජ) සහ (ණ) ඡේද සහ 9 වගන්තිය සමඟ කියවිය යුතු 39 වගන්තිය යටතේ එවකට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 06 දිනැති අංක 2422/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

මෙම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ශ්‍රී ලංකා පොලීසිය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු කථානායකතුමනි, ගොඩකවෙල, පින්නකන්ද යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.බී.එන්.එස්. මාරසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜகத் குணவர்தன)
(The Hon. (Dr.) Jagath Gunawardana)

ගරු කථානායකතුමනි, නවතල්වත්ත, බෝවල, අංක 379/1 යන ලිපිනයෙහි පදිංචි පී. දිනේෂ් ප්‍රේමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)

ගරු කථානායකතුමනි, හෝමාගම, උඩුවන, පන්සල පාර, අංක 280/6 යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්.ටී. දසනායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### කින්නියා - කොළඹ ප්‍රධාන මාර්ගය: පුළුල් කිරීම
### கிண்ணியா - கொழும்பு பிரதான வீதி: விஸ்தரித்தல்
### KINNIYA-COLOMBO MAIN ROAD: WIDENING

1350/2025

**1.** **ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මාර්ග පුළුල් කළ යුතු තත්ත්වයක පවතින බවත්;

(ii) කින්නියා ප්‍රදේශයේ ජනගහනය සහ එම ප්‍රදේශයට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයන් සංඛ්‍යාව අනුව කින්නියා-කොළඹ ප්‍රධාන මාර්ගය ප්‍රමුඛත්වයදී පුළුල් කළ යුතු බවත්;

(iii) එම මාර්ගයට ආසන්නව පාසැල් පිහිටා තිබෙන අතර අධික රථවාහන තදබදයක් තිබෙන බවත්, පදිකයන්ට ප්‍රමාණවත් පහසුකම් නොමැති බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) කින්නියා-කොළඹ ප්‍රධාන මාර්ගයේ පළල කොපමණද;

(ii) එම මාර්ගය එක් දිශාවකට පමණක් වාහන ගමන් කළ හැකි මාර්ගයක්ද;

(iii) නොඑසේ නම්, දිශා දෙකටම වාහන ගමන් කළ හැකි මාර්ගයක්ද;

(iv) ඉහත මාර්ගය පුළුල් කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, යෝජිත මාර්ගයේ දිග සහ පළල කොපමණද;

(vi) ඒ සඳහා ඇස්තමේන්තු කර ඇති වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வீதி அபிவிருத்தி அதிகாரசபையால் பராமரிக்கப்பட்டு வருகின்ற திருகோணமலை மாவட்டத்தின் வீதிகள் விஸ்தரிக்கப்பட வேண்டிய நிலையில் காணப்படுகின்றன என்பதையும்;

(ii) கிண்ணியா பிரதேசத்தின் சனத்தொகை மற்றும் அப்பிரதேசத்துக்கு வருகை தரும் உள்நாட்டு மற்றும் வெளிநாட்டு சுற்றுலாப் பயணிகளின் எண்ணிக்கைக்கு அமைவாக, கிண்ணியா - கொழும்பு பிரதான வீதியை முன்னுரிமை வழங்கி விஸ்தரிக்க வேண்டும் என்பதையும்;

(iii) மேற்படி வீதிக்கு அருகே பாடசாலைகள் அமைந்துள்ளதுடன், அதிக வாகன நெரிசல் நிலவுவதையும் பாதசாரிகளுக்குப் போதுமான வசதிகள் இல்லை என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) கிண்ணியா - கொழும்பு பிரதான வீதியின் அகலம் யாது;

(ii) மேற்படி வீதி ஒரே திசையில் மாத்திரம் வாகனம் பயணம் செய்யக்கூடிய ஒருவழிப் பாதையா;

(iii) இன்றேல், இரு திசைகளிலும் வாகனம் பயணம் செய்யக்கூடிய இருவழிப் பாதையா;

(iv) மேற்படி வீதியை விஸ்தரிக்க நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா;

(v) ஆமெனில், உத்தேச வீதியின் நீளம் மற்றும் அகலம் யாது;

(vi) அதற்கென மதிப்பீடு செய்யப்பட்டுள்ள செலவினம் எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he admit that -

(i) the roads in the Trincomalee District, maintained by the Road Development Authority, are in such condition that they need to be widened;

(ii) the Kinniya-Colombo main road should be prioritized for widening due to the population of the Kinniya area and the number of local and foreign tourists visiting the area; and

(iii) there are schools located near this road, there is a heavy traffic congestion on the road and that there are not enough facilities for pedestrians?

(b) Will he inform this House -

(i) the width of the Kinniya-Colombo main road;

(ii) whether the said road is a one-way road;

(iii) if not, whether it is a two-way road;

(iv) whether steps have been taken to widen the said road;

(v) if so, the length and width of the proposed road; and

(vi) the estimated cost for the proposed road?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) • ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සියලු මාර්ග පුළුල් කළ යුතු තත්ත්වයක නොපවතී.

(ii) ඔව්.

• කින්නියා සිට කොළඹ දක්වා ගමන් කිරීමේදී තඹලගමු කින්නියා මාර්ගය - B-541 - භාවිත කළ යුතු අතර, තඹලගමු හන්දියේ සිට අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමලය මාර්ගයට - A006 මාර්ගය - එය සම්බන්ධ වේ. A006 මාර්ගය අඹේපුස්සේදී A001 මාර්ගයට - මහනුවර-කොළඹ - සම්බන්ධ වේ.

ඒ අනුව, තඹලගමු කින්නියා මාර්ගයේ,

I. කිලෝමීටර 13.5 සිට කිලෝමීටර 15.2 දක්වා ද;

II. අඹේපුස්ස-කුරුණෑගල-ත්‍රිකුණාමලය මාර්ගයේ කිලෝමීටර 193 සිට කිලෝමීටර 196 - නගරාසන්න ප්‍රදේශය - දක්වා ද; පුළුල් කළ යුතු තත්ත්වයක පවතී.

(iii) ඔව්.

• තඹලගමු කින්නියා මාර්ගයේ කිලෝමීටර 13.5 සිට කිලෝමීටර 15.2 දක්වා කාර්යාල හා පාසල් වේලාවන්හි අධික රථ වාහන තදබදයක් දැකිය හැකිය.

• පදිකයන්ට ද ප්‍රමාණවත් පහසුකම් නොමැත.

(ආ) (i) පාරේ පළල ගැන අහන්නේ.

1. තඹලගමු කින්නියා මාර්ගය - B-541

• කිලෝමීටර 0 සිට කිලෝමීටර 8.5 දක්වා පළල මීටර් 6.6ක්ද, ඒකේ hard shoulder එක දෙපැත්තෙන්ම මීටර් 0.3 තුන බැගින් ද වෙනවා.

• ඒ වාගේම, ඒකේ කිලෝමීටර 8.5 සිට කිලෝමීටර 12.2 දක්වා පාරේ පළල මීටර් 6.2යි.

කිලෝමීටර 12.2 සිට කිලෝමීටර 15.2 දක්වා පාරේ පළල මීටර් 7.7යි. මීටර් දශම 5 ගණනේ hard shoulder එක දෙපැත්තේම තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමාට මේක අදාළ නැහැ කියලා මම දන්නවා. නමුත් මේ පාර ගැන ඇහුවාට පස්සේ අපි ඒක හරියට කියන්න ඕනෑ.

2. කොළඹ සිට නිට්ටඹුව දක්වා මාර්ගය මංතීරු හතරක්.

• ඒ මාර්ගයේ පළල මීටර් 13යි.

3. කොළඹ සිට අඹේපුස්ස දක්වා මාර්ගය මංතීරු 2යි.

• ඒ මාර්ගයේ පළල මීටර් 6.8යි.

4. අඹේපුස්ස සිට ත්‍රිකුණාමලය දක්වා මාර්ගය මංතීරු දෙකක්.

• ඒ මාර්ගයේ පළල මීටර් 7.2යි.

(ii) නැත. මෙය එක් දිශාවකට පමණක් වාහන ගමන් කළ හැකි මාර්ගයක් නොවේ.

(iii) ඔව්. දිශාවන් දෙකටම වාහන ගමන් කළ හැකි මාර්ගයකි.

(iv) නැත.

(v) අදාළ නොවේ.

(vi) • 2026 වර්ෂය සඳහා වූ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොමැත.

(ඇ) • 2027 වර්ෂය සඳහා widening and improvement යටතේ මාර්ගය පුළුල් කිරීමට ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය වේ. මේ සඳහා ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු කළ යුතු බැවින් ඒ සඳහා යම් කාලයක් ගත විය හැක. ඉඩම් අත්පත් කර ගැනීමට සාමාන්‍යයෙන් මාස 12ත්, 18ත් අතර කාලයක් යනවා.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! திருகோணமலை மாவட்டத்தில் அதிகளவு மக்கள் வாழுகின்ற பிரதேசம்தான் கிண்ணியா. 75,000க்கும் மேற்பட்ட மக்கள் வாழுகின்ற அந்தப் பிரதேசத்தில் காணப்படுகின்ற இந்த வீதி காரணமாக பல பிரச்சினைகள் எதிர்நோக்கப்படுகின்றன. ஆகையால், இந்த வீதியைப் புனரமைக்கவேண்டிய அல்லது விஸ்தரிக்கவேண்டிய தேவை காணப்படுகின்றது. அதனால்தான் நான் இந்தக் கேள்வியைக் கேட்டேன். கௌரவ அமைச்சர் அவர்கள் சொன்ன விடைக்கு இணங்க, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

திருகோணமலை - மட்டக்களப்பு வீதியில் குறைந்தது கிண்ணியா முச்சந்தியில் இருந்து சூரங்கல் பிரதேசம் வரையிலான பகுதியையாவது விஸ்தரிப்பதற்கு நடவடிக்கை எடுக்க முடியுமா? எனக் கேட்கின்றேன். ஏனென்றால், இந்த வீதியில் பல விபத்துகள், பிரச்சினைகள் ஏற்படுகின்றன. பண்டிகைக் காலங்களில் உயிர்ச் சேதங்கள்கூட ஏற்படுகின்ற சூழல் காணப்படுகின்றது. சென்ற காலங்களில் இதை விஸ்தரிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட்டது. எனினும், நீங்கள் கூறியதுபோன்று அந்தக் காணிக்காரர்களுக்கான கொடுப்பனவுப் பிரச்சினையால் அது இடைநிறுத்தப்பட்டு இருக்கின்றது.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේක සිදු කිරීමේ අවශ්‍යතාව මාර්ග සංවර්ධන අධිකාරියත්, අප අමාත්‍යාංශයත් පිළිගන්නවා. ත්‍රිකුණාමලය Chief Engineer's Office area එකට අයිති "A" ශ්‍රේණියේ මාර්ග තුනක් තිබෙනවා, A-6, A-12, A-15 වශයෙන්. ඒ වාගේම "B" ශ්‍රේණියේ මාර්ග විශාල ප්‍රමාණයක් තිබෙනවා. ජනාධිපතිතුමා විසිනුත් විශාල වශයෙන් මුදල් වෙන් කර තිබෙනවා, මාර්ග සංවර්ධනයට. නමුත්, මේ කාර්යය සඳහා මේ වසරේ මුදල් වෙන් කරන්න පුළුවන්ද කියන එක මට මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න බැහැ. මොකද, අපි දැනට සැලසුම් සකස් කර අවසන් නිසා. ලබන වසරේ ඉදිරිපත් කරන 2027

වර්ෂයට අදාළ අය වැයට හෝ මේ සඳහා මුදල් වෙන් කිරීම ඇතුළත් කිරීමට අපි උත්සාහ කරන්නම්. අපට සමහර අවස්ථාවල විවිධ හේතු නිසා විශේෂ ව්‍යාපෘති කල් දමන්න සිදුවනවා. අන්න එවැනි අවස්ථාවකදී තමයි අපට මේ සඳහා උත්සාහ කරන්න වෙන්නේ. මට බොරු පොරොන්දුවක් දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි. 2027 වර්ෂයේ අය වැයට මෙම යෝජනාව ඇතුළත් කරන්න අපි උත්සාහ කරන්නම්.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே!

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தில் வாகன நெரிசல், மக்கள் தொகை என்பன அதிகரித்து இருக்கின்றன. மேலும், வெளிநாட்டு உல்லாசப் பிரயாணிகளின் வருகையும் அதிகரித்து இருக்கின்றது. எனவே, அங்கு RDAக்குச் சொந்தமான பிரதான வீதிகளில் போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சின்மூலம் colour lights அமைக்கவேண்டிய தேவை உள்ளது. எனினும், எங்களுடைய மாவட்டத்தில் இன்னும் colour light system அறிமுகப்படுத்தப்படவில்லை. எங்களுடைய நகர்ப் பகுதிகளில் colour light systemஐ அறிமுகப்படுத்துகின்ற வேலைத்திட்டம் ஏதாவது அரசாங்கத்திடம் இருக்கின்றதா? என நான் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் RDAஇல் வேலைசெய்யும் ஊழியர்களை நிரந்தரமாக்கி இருக்கின்றீர்கள். O/Lஇல் தேர்ச்சி பெறாதவர்கள் என்ற அடிப்படையில், சில ஊழியர்கள் இன்னும் permanent பண்ணப்படாமல் இருக்கின்றார்கள். அவர்களுடைய கடின உழைப்பு, அவர்கள் செய்த தியாகம், அவர்கள் வேலைசெய்த காலம் என்பவற்றைக் கருத்திற்கொண்டு, அவர்களுக்கும் நிரந்தர நியமனம் வழங்குவதற்கு உங்களால் நடவடிக்கை எடுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න දෙකක් ඇහුවා. ඒ තමයි, traffic lights ගැන සහ සේවකයන් ස්ථිර කිරීම ගැන. Traffic lights සම්බන්ධව ඔබතුමන්ලා DDC එකේදී යෝජනාවක් අනුමත කරලා, ඒ යෝජනාව අපට එවන්න ගරු මන්ත්‍රීතුමා. අපි ඒකට traffic survey එකක් කරන්න ඕනෑ. ඔබතුමා දන්නවා, මඩකලපුව දිස්ත්‍රික්කයේ සමහර traffic lights දාලා තිබෙන්නේ කිසිම survey එකක් කරන්නේ නැතුව කියලා. ඒකෙන් traffic වැඩි වෙනවා. නමුත්, ඔබතුමා ඒ පළාතේ පොලීසියත් එක්ක කථා කරලා අපට යෝජනාවක් ඉදිරිපත් කළොත්, survey එකෙන් pass වෙනවා නම්, අපි අනිවාර්යයෙන්ම මේක ලබන අවුරුද්දේ හදනවා. නමුත්, city එකක් වුණාම පොෂ් එකට traffic lights තිබෙන්න ඕනෑය කියලා හිතන පිරිසකුත් ඉන්නවා. ඒක හොඳ දෙයක් නොවෙයි. ඔබතුමා DDC එක හරහා යෝජනාව එවන්න, survey එක pass වුණොත් මම අනිවාර්යයෙන්ම එම කටයුත්ත කරලා දෙන්නම්.

ගරු කථානායකතුමනි, මම ඊයේත් පාර්ලිමේන්තුවේදී මේ ගැන ප්‍රකාශ කළා. අපි RDA එකේ සේවකයන් හත්සිය ගණනක් ස්ථිර කළා. තවත් තුන්සිය ගණනක් ඉන්නවා, ඔවුන් සාමාන්‍ය පෙළ විභාගය ලියලා නැහැ. අපි ඔවුන් මුණගැහුණා. අපි ඔවුන්ට කිව්වා, පෙබරවාරි මාසයේ පවත්වන සාමාන්‍ය පෙළ විභාගයට වාඩිවෙන්න කියලා. විභාගය ලිවීම ප්‍රමාණවත්, passවීම අවශ්‍ය නැහැ. පෙබරවාරි මාසයේ පැවැත්වෙන O/L විභාගයට වාඩි වුණාට පස්සේ ඔවුන්ගෙන් සුදුසුකම් තිබෙන අය ස්ථිර කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

## මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්කවල නීති විරෝධී ධීවර කටයුතු මැඩලීම: ගත් පියවර
### முல்லைத்தீவு மற்றும் மன்னார் மாவட்டங்களில் சட்டவிரோத மீன்பிடி நடவடிக்கைகளைக் கட்டுப்படுத்தல்: நடவடிக்கை
### CURBING ILLEGAL FISHING ACTIVITIES IN MULLAITIVU AND MANNAR DISTRICTS: MEASURES TAKEN

1352/2025

**2. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්කවල තහනම් පන්න ක්‍රම සහ අනවසර ධීවර යාත්‍රා භාවිත කරමින් නීති විරෝධී ධීවර කටයුතු සිදු කරන බව දන්නේද;

(ii) එසේ නම්, ඒවා මැඩලීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඒ සඳහා නිරීක්ෂණ සහ මෙහෙයුම් කටයුතු ශක්තිමත් කිරීමට ඉදිරියේදී ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) ඉහත නීති විරෝධී ධීවර කටයුතු -

(i) හේතුවෙන් මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්කවල ගුණාත්මක මත්ස්‍ය නිෂ්පාදනයට ඇතිවූ බලපෑම කවරේද;

(ii) හේතුවෙන් එම දිස්ත්‍රික්කවල ධීවරයන්ගේ ආර්ථිකට සිදුවූ බලපෑම සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) හේතුවෙන් පීඩාවට පත්වූ සාමාන්‍ය ධීවරයන්ගේ ජීවනෝපාය මාර්ග සහ ඔවුන්ගේ ආදායම් සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) මැඩලීමට ප්‍රමාණවත් පරිදි නීතිය ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(v) මැඩලීම සඳහා ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා පොලීසිය අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා]

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு மற்றும் மன்னார் மாவட்டங்களில், தடைசெய்யப்பட்ட மீன்பிடி முறைகளையும் சட்டவிரோத மீன்பிடிப் படகுகளையும் பயன்படுத்தி சட்டவிரோத மீன்பிடி நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருவதை அறிவாரா;

(ii) ஆமெனில், அவற்றைக் கட்டுப்படுத்துவதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(iii) அதற்கான கண்காணிப்பு மற்றும் அமுலாக்கல் நடவடிக்கைகளை வலுவூட்ட எதிர்காலத்தில் அமுல்படுத்தப்படும் வேலைத்திட்டம் யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி சட்டவிரோத மீன்பிடி நடவடிக்கைகள் காரணமாக -

(i) முல்லைத்தீவு மற்றும் மன்னார் மாவட்டங்களில் மீன்பிடி உற்பத்தியின் தரம் தொடர்பில் ஏற்பட்டுள்ள தாக்கம் யாது;

(ii) இதன் காரணமாக மேற்படி மாவட்டங்களில் மீனவர்களின் பொருளாதாரத்துக்கு ஏற்பட்டுள்ள தாக்கம் தொடர்பான ஆய்வு மேற்கொள்ளப் பட்டுள்ளதா;

(iii) மேற்படி விடயம் காரணமாகப் பாதிக்கப் பட்டுள்ள சாதாரண மீனவர்களின் வாழ்வாதாரத் தையும் அவர்களின் வருமானத்தையும் உறுதி செய்வதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக் கைகள் யாவை;

(iv) இவ்விடயத்தைக் கட்டுப்படுத்துவதற்குப் போதியளவில் சட்டம் அமுல்படுத்தப் படாமைக்கான காரணங்கள் யாவை;

(v) இதனைக் கட்டுப்படுத்துவதற்காக கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சு, இலங்கை கடற்படை மற்றும் இலங்கை பொலிஸாருக்கு இடையில் சிறந்ததோர் ஒருங்கிணைப்பு பேணி வரப்படுகின்றதா;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he state -

(i) whether he is aware that illegal fishing activities are being carried out in the Mullaitivu and Mannar Districts using prohibited fishing methods and unauthorized fishing vessels;

(ii) if so, the measures that have been taken to curb those activities; and

(iii) the measures that will be taken in the future to strengthen the surveillance and the operational activities in that regard?

(b) Will he also state -

(i) the impact of the aforesaid illegal fishing activities on the quality of fish production in the Mullaitivu and Mannar Districts;

(ii) whether a survey has been conducted regarding the impact of aforesaid illegal fishing activities on the economy of the fishermen in aforesaid districts;

(iii) the measures that have been taken to secure the livelihoods and the income of the ordinary fishermen affected by aforesaid illegal fishing activities?

(iv) the reasons for not adequately enforcing the law to curb these illegal fishing activities; and

(v) whether a proper coordination is being maintained between the Ministry of Fisheries, Aquatic and Ocean Resources, the Sri Lanka Navy and the Sri Lanka Police to combat these illegal fishing activities?

(c) If not, why?

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත, 1979 අංක 59 දරන (විදේශීය ධීවර බෝට්ටු) විධිමත් කිරීමේ පනත සහ 2017 අංක 11 දරන ධීවර හා ජලජ සම්පත් සංශෝධන පනත මෙන්ම එම පනත් යටතේ ක්‍රියාත්මක වන රෙගුලාසි 104ක ප්‍රමාණයකින් ලංකාවේ ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන ලබා දී ඇත.

අංක 948/25 දරන 1996 ධීවර මෙහෙයුම් නියෝග මඟින් ප්‍රකාශ කර ඇති පරිදි දේශීය ධීවර කර්මාන්තය සඳහා භාවිත කළ හැකි අනුමත පන්න ක්‍රම 17කි. ඒ සඳහා ද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයුම් බලපත්‍ර ලබා ගත යුතුය. විධිමත් මෙහෙයුම් බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව යම්කිසි තැනැත්තෙකු ධීවර කටයුත්තක නිරත වන්නේ නම් එවන් ධීවර කටයුතු සියල්ල නීති විරෝධී වේ.

ඒ අනුව මුලතිව් හා මන්නාරම පමණක් නොව, දිවයිනේ ධීවර දිස්ත්‍රික්ක 15 තුළ යම් යම් මට්ටම්වලින් නීති විරෝධී ධීවර කටයුතු ඉතා සුළු ධීවරයින් පිරිසක් විසින් සිදු කරනු ලබයි.

(ii) මෙම නීති විරෝධී ධීවර කටයුතු සිදු කිරීම ආරම්භ වූයේ මෑතකදී නොවන අතර, පසුගිය දශක කිහිපය පුරාම විවිධාකාරයෙන් නීති විරෝධී ධීවර කටයුතු සිදු කර ඇත.

මත්ස්‍ය සම්පතට හානිවන තිරසාර ධීවර කර්මාන්තයට බලපෑම් ඇති කරන ආකාරයේ මසුන් ඇල්ලීමේ කටයුතු තහනම් කිරීම සඳහා

විවිධ කාලවල නීති රෙගුලාසි පැනවීම සිදු කර ඇත. ඒ අනුව නීති විරෝධී ධීවර කටයුතු මැඩ පැවැත්වීම සඳහා ප්‍රධාන වශයෙන්ම අත්‍යවශ්‍ය කරුණ වනුයේ නීති පද්ධතිය ශක්තිමත් කිරීමයි.

ඒ නිසාවෙන්ම අපේ රජය බලයට පත් වූ වහාම ධීවර සහ ජලජ සම්පත් පනත පරිච්ඡින්න කර නව පනතක් හඳුන්වා දීම සඳහා නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූල වන ආකාරයට සංශෝධනය කරන ලද නව පනත් කෙටුම්පතට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන දැනට නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර තිබෙනවා. නීති කෙටුම්පත් සම්පාදකගේ එකඟතාව ලද පසු පාර්ලිමේන්තුවට එය ඉදිරිපත් කර අනුමත කර ගැනීමට අපේක්ෂා කරන අතර, ඒ සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව අපේක්ෂා කරන බවත් මම ගරු මන්ත්‍රීතුමාට සඳහන් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ඊට අමතරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර පරීක්ෂක වරුන්ගේ සහ සහකාර අධ්‍යක්ෂවරුන්ගේ හිඟයක් තිබෙනවා. ඒ වෙනුවෙන් අපි 2025 ඔක්තෝබර් මාසයේ 19වැනි දා අමාත්‍යාංශ මට්ටමින් තරග විභාගයක් පැවැත්වූවා. එම තරග විභාගයට අනුව අපි සහකාර අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් නිලධාරින් බඳවා ගැනීමට නියමිතයි. ඒ අය බඳවා ගැනීමෙන් පසුව අපට මේ කටයුත්ත වඩාත් වේගත්ව කරගෙන යන්න පුළුවන්.

ඊට අමතරව, ධීවර සහ ජලජ සම්පත් පනත යටතේම බලයලත් නිලධාරින් ලෙස ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය යන ආයතනවල නිලධාරින්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් සමඟ නීති විරෝධී ධීවර කටයුතු මැඩ පැවැත්වීම සඳහා අපි ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. ඒ අනුව මුහුදේ සිදු කරන වැටලීම්, අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණය ක්‍රමානුකූලව වැඩි කරන්න ශ්‍රී ලංකා නාවික හමුදාවත්, ශ්‍රී ලංකා පොලීසියත්, ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවත් එක්ක අපට හැකියාව ලැබුණා.

විශේෂයෙන්ම පුපුරණ ද්‍රව්‍ය භාවිත කරලා මසුන් මැරීම ඉතාම අහිතකර සහ නීති විරෝධී ධීවර කටයුත්තක් නිසා එම කාර්යය මැඩ පැවැත්වීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයත්, පොලීසියත් සමඟ අපි ඒකාබද්ධ උත්සාහයක නිරත වෙනවා. පුපුරණ ද්‍රව්‍ය ධීවරයින් අතට පත්වීම වැළැක්වීම සඳහාත්, ඊට පූර්ව ක්‍රියාමාර්ග ගැනීම සඳහාත් අපි මැදිහත් වීමක් කරලා තිබෙනවා. ඒ කටයුත්ත අඛණ්ඩව සිද්ධ වෙනවා. ආරක්ෂක අංශ සමඟ අඛණ්ඩව සිදු කරන මෙම ක්‍රියාමාර්ග හේතුවෙන් වැඩි කාලයක් යාමට ප්‍රථම සියලු නීති විරෝධී ක්‍රියා නතර කිරීමට කටයුතු කළ හැකි බව මම මේ මොහොතේදී ගරු මන්ත්‍රීතුමාට ප්‍රකාශ කරනවා.

(iii) නීති විරෝධී ධීවර කටයුතු මැඩ පැවැත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග, වැඩසටහන් දැනටමත් ආරම්භ කර තිබෙනවා. මා කලින් සඳහන් කළ ආකාරයට නීතිමය රාමුව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නව පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත් පසු ඒ යටතේ අවශ්‍ය නව රෙගුලාසි පැනවීමට අප කටයුතු කරනවා. එම නව රෙගුලාසි කෙටුම්පත් කිරීම මේ වනවිටත් ආරම්භ කර තිබෙනවා. ඒ ආකාරයට නෛතික රාමුව ශක්තිමත් කිරීම සිදුකර, ඒ ඔස්සේ නීති විරෝධී ධීවර කටයුතු සිදු කරන තැනැත්තන්ට උපරිම දඬුවම් ලබා දීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට අපගේ අමාත්‍යාංශය මැදිහත් වෙනවා.

ඊට අමතරව, ධීවර දෙපාර්තමේන්තුවේ වැටලීම් කටයුතු ශක්තිමත් කිරීම සඳහා ආරක්ෂක සේවාවක් ලබා ගැනීමට තීරණය කර ඇති අතර, හැකි සෑම අවස්ථාවකදීම ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පොලීසියේ දායකත්වය ලබා ගැනීම අප අඛණ්ඩව සිදු කරනු ලබනවා.

ගරු කථානායකතුමනි, ඊට අමතරව අපි දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් ධීවර සම්බන්ධීකරණ කමිටු පවත්වනවා. මේ වනවිටත් දිස්ත්‍රික් ධීවර සම්බන්ධීකරණ කමිටු විසි පහෙන්, විස්සක් අපි කැඳවා තිබෙනවා. තව පහයි කැඳවන්න තිබෙන්නේ. විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ උතුරු සහ නැඟෙනහිර සියලුම දිස්ත්‍රික් ධීවර සම්බන්ධීකරණ කමිටු කැඳවා අවසන්. ඒවා කැඳවීම තුළ අපි විශේෂයෙන්ම මේ තිබෙන සියලු ගැටලු සම්බන්ධව ඉතා ගැඹුරින් සාකච්ඡා කර විසඳුම් ලබා දීමට කටයුතු කර තිබෙනවා. ඒ අනුව ඒවායේ කිසියම් සාර්ථකභාවයක් ඇති බවට ගරු මන්ත්‍රීතුමා විශ්වාස කරනු ඇතැයි අපි හිතනවා.

(ආ) (i) මෙම දිස්ත්‍රික්කවල වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණය පහත පරිදි වේ.

| වර්ෂය | වාර්ෂික නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | |
|---|---|---|
| | මුලතිව් | මන්නාරම |
| 2024 | 13,980 | 22,015 |
| 2023 | 11,080 | 24,400 |
| 2022 | 7,730 | 21,045 |
| 2021 | 14,500 | 18,035 |
| 2020 | 8,670 | 20,320 |

නීති විරෝධී ධීවර කටයුතු ගුණාත්මක මත්ස්‍ය නිෂ්පාදනයට සෘජුවම බලපෑම් ඇති කරනවා. පුපුරණ ද්‍රව්‍ය යොදා අල්ලා ගනු ලබන මසුන් කල් තබා ගත නොහැකි ආකාරයට පත්වීම සිදු වෙනවා. එමෙන්ම පුපුරණ ද්‍රව්‍ය යොදා සිදු කරනු ලබන පිපුරුම් මඟින් සියලු ජීවීන් බලපෑමට ලක් වනවා මෙන්ම මත්ස්‍යයන්ගේ බිත්තර හා පරිසර පද්ධතිය ද විනාශ වීම සිදු වෙනවා. එමෙන්ම පුපුරණ ද්‍රව්‍ය යොදා සිදු කරනු ලබන පිපිරුම් මඟින් මියයන මසුන්ගෙන් අල්ලා ගැනීමට හැකි වනුයේ යම් ප්‍රතිශතයක් පමණයි. ඒ ප්‍රතිශතය නැවත වතාවක් වෙනම තැන්පත් කරන්න අපි කටයුතු කරනවා.

මුලතිව් සහ මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි සිදුවන ප්‍රධානතම නීති විරෝධී ධීවර කටයුතු දෙක වනුයේ පුපුරණ ද්‍රව්‍ය යොදා මසුන් ඇල්ලීම සහ විදුලි ආලෝකය යොදා මසුන් ආකර්ෂණය කර - light coarse - මසුන් ඇල්ලීමයි.

ඩයිනමයිට් වැනි පුපුරණ ද්‍රව්‍ය යොදා මසුන් මැරීමේදී මසුන්ගේ ගුණාත්මක තත්ත්වයට හානි සිදු වෙනවා. පිපිරීමේදී ඇතිවන කම්පනය මඟින් මසුන් මියයාම නිසා මසුන්ගේ අභ්‍යන්තර අවයව

[ගරු රත්න ගමගේ මහතා]

පුපුරා ගොස් රුධිර වහනයක් සිදු වෙනවා. මසුන්ට අභ්‍යන්තර මෙන්ම බාහිරව ද විශාල ලෙස හානි සිදුවීම නිසා ගුණාත්මක තත්ත්වය රඳවා ගැනීමට ඉතා අපහසුයි. එවිට මසුන් ඉතා ඉක්මනින් නරක් වීම සහ ගුණාත්මක තත්ත්වය හීනවීම සිදු වෙනවා.

තවද, අනීතිකව වට කරන ලද දැල්වලින් මසුන් විශාල වශයෙන් ඇල්ලීමේදී මසුන් එකට තද වී ගුණාත්මකභාවයට හානි වෙනවා. තංගුස් දැල් මඟින් මසුන්ගේ ඉතා කුඩා අවධි අවස්ථා අල්ලා ගැනීම මඟින් එහි ගුණාත්මකභාවයට ද හානි සිදු වෙනවා.

පසුගිය වසර කිහිපය තුළ මත්ස්‍ය නිෂ්පාදනය පහළ යාමට තහනම් පන්න ක්‍රම භාවිත කිරීම මෙන්ම කොවිඩ් වසංගත තත්ත්වය තුළ රැකියාවට යාමට නොහැකි වීම, ධීවරයන් සඳහා අවශ්‍ය ඉන්ධන නිසි ලෙස නොලැබී යාම, ඉන්ධන මිල ඉහළ යාම යන කරුණු ද මෙයට ප්‍රධාන වශයෙන් බලපාන ලදී.

(ii) සමීක්ෂණයක් සිදු කර නොමැත. නීති විරෝධී ධීවර කටයුතු සිදු කරනු ලබන්නේ ඉතාම සුළු ධීවරයන් පිරිසක් විසිනි. එසේ කිරීමට හේතු වනුයේ නීති විරෝධී ධීවර කටයුතු මඟින් විශාල ලාභයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. නමුත් මෙම තත්ත්වය ධීවරයන් අතිවිශාල පිරිසකගේ දෛනික ජීවන වෘත්තියට අහිතකර ලෙස බලපාන අතර, ප්‍රමාණවත් මත්ස්‍ය අස්වැන්නක් ලබා ගැනීමට නොහැකි වීමද මේ නිසා සිදු වෙයි.

(iii) මෙම නීති විරෝධී ධීවර කටයුතු මඟින් ඍජුව නිශ්චිතව යම් ධීවරයෙකුට අගතියක් සිදු වීම හඳුනාගත නොහැකිය. දිස්ත්‍රික්කයක් තුළ ධීවරයින් විශාල පිරිසක් රැකියාවේ නිරතව සිටීම නිසා නිශ්චිතව බලපෑම් සිදු වන ධීවරයා කවුද යන්න තීරණය කළ නොහැකිය. නමුත් නීති විරෝධී ධීවර කටයුතු නිසා සමුද්‍රීය පරිසර පද්ධතියටම පොදුවේ අහිතකර තත්ත්වයක් ඇති වන නිසා මෙය සමස්ත ධීවර ප්‍රජාවටම බලපාන කරුණක් වශයෙන් අර්ථ දැක්විය හැකිය. මේ නිසා සිදු කළ යුත්තේ, නීති විරෝධී ධීවර කටයුතු නිසා පීඩාවට පත් වන ධීවරයන් කවුද යන්න සොයා බලා ඔවුන්ට සහන සැලසීම නොව ධීවර සම්පතට සහ සමුද්‍රීය පරිසරයට අහිතකර ලෙස බලපාන නීති විරෝධී ධීවර කටයුතු නතර කිරීමයි. නීති විරෝධී ධීවර කටයුතු නතර කිරීම තුළින් මත්ස්‍ය සම්පත ආරක්ෂා වන අතර, සියලු ධීවරයන්ට ඔවුන්ගේ ආදායම සුරක්ෂිත කර ගත හැකිය.

ඒ අනුව නීති විරෝධී කටයුතු මැඩ පැවැත්වීම සඳහා උපරිම ආකාරයෙන් කටයුතු කරනු ලැබේ.

(iv) නීතිය ක්‍රියාත්මක නොකරනවාය යන්න සම්බන්ධයෙන් එකඟ විය නොහැකිය.

ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරින් නිරන්තරයෙන් සෝදිසි මෙහෙයුම් සහ වැටලීම් සිදු කරනු ලබයි. ඒ අනුව නීති විරෝධී ධීවර කටයුතුවල නිරත වූවන් අධිකරණයට ඉදිරිපත් කර නීති මඟින් කටයුතු කරනු ලබයි. මුලතිව්, මන්නාරම සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල පසුගිය වසර තුනෙහි පවරන ලද නඩු ප්‍රමාණය පහත පරිදිය.

| දිස්ත්‍රික්කය | පවරන ලද නඩු ප්‍රමාණය | | |
|---|---|---|---|
| | 2023 | 2024 | 2025 |
| මුලතිව් | 49 | 55 | 103 |
| මන්නාරම | 57 | 71 | 41 |
| ත්‍රිකුණාමලය | 151 | 152 | 97 |

ඉදිරියේදී මෙම තත්ත්වය තවත් වැඩි කිරීම සඳහා අවශ්‍ය සම්පත් ලබා දීමට කටයුතු කරන අතර, ඒ මඟින් තවදුරටත් නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ.

නීතිය ක්‍රියාත්මක කිරීමට අමතරව නීති විරෝධී ධීවර කටයුතු සම්බන්ධයෙන් ඇති වන බලපෑම පිළිබඳව ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ද නිරන්තරයෙන්ම සිදු කරනු ලබයි. මෙහි අරමුණ වනුයේ නීති විරෝධී ධීවර කටයුතු සිදු නොකිරීම සඳහා ධීවර ප්‍රජාව පෙලඹවීමයි.

(v) නීති විරෝධී ධීවර කටයුතු මැඩලීම සඳහා ඊට සම්බන්ධ සියලු පාර්ශ්ව සමඟ මින් පෙර කිසිදු දිනක සිදු නොවූ ආකාරයේ මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමට දැනටමත් කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා නාවික හමුදාව, වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය - NARA - සහ දිස්ත්‍රික් ධීවර කාර්යාලවල නිලධාරින්ගේ ද සහභාගිත්වයෙන් මේ පිළිබඳව නිරන්තරයෙන් සාකච්ඡා කිරීම් සිදු කරනු ලබයි. එහිදී එක් එක් දිස්ත්‍රික්කවල සිදු වන නීති විරෝධී කටයුතු කවරේද යන්න වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන එම තත්ත්වය මැඩ පැවැත්වීම සඳහා ක්‍රමවේදයක් සකස් කරනු ලබයි.

මේ සම්බන්ධයෙන් නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් මාගේ ප්‍රධානත්වයෙන් අදාළ සියලු පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් 2025.08.22 දිනත්, 2025.10.16 දිනත් ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා, අතිරේක ලේකම් ඇතුළු ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධානීන් සහ ධීවර අමාත්‍යාංශයේ ප්‍රධානීන් සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී. මෙම ක්‍රියාදාමය අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු සිදු කෙරේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

முல்லைத்தீவு, மன்னார் மற்றும் வடக்கு மாகாணத்தின் ஏனைய பகுதிகளில் குறிப்பாக, முல்லைத்தீவின் கொக்கிளாய் பிரதேசத்தில் வேறு மாவட்டங்களைச் சேர்ந்த மீனவர்கள் வருகைதந்து சட்டவிரோத மீன்பிடியில் ஈடுபடுவதோடு, அந்தப் பிரதேச மீனவர்களைப் பாதிக்கின்ற நடவடிக் கைகளிலும் ஈடுபட்டு வருகின்றார்கள். அதேபோல, மன்னார் பிரதேசத்துக்கு கற்பிட்டி போன்ற பகுதிகளில் இருந்து மீனவர்கள் வருகின்ற நிலைப்பாடு காணப்படுகின்றது.

ஏற்கெனவே நாங்கள் அங்கு சட்டவிரோத மீன்பிடியைக் தடைசெய்து இருக்கிறோம். உதாரணத்துக்கு light coarseஐக் குறிப்பிடலாம். முல்லைத்தீவு, கொக்கிளாய் பிரதேச மக்கள் அந்த மீன்பிடி முறைமூலம் மீன்பிடியில் ஈடுபடுவது கிடையாது. ஆனால், திருகோணமலை போன்ற பகுதிகளில் இருந்து வருபவர்கள் அந்த மீன்பிடியில் ஈடுபடுகின்றார்கள். இதைவிட, அங்கு இந்திய மீனவர்களின் ஆக்கிரமிப்பும் கணிசமாக இருக்கின்றது. இதன் காரணமாக அந்தப் பிரதேச மீனவர்களுடைய வாழ்வாதாரம் பாதிக்கப்படுகின்றது. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, இதற்கு உங்களுடைய அமைச்சினூடாக எடுக்கப்பட்ட நடவடிக்கை என்ன என்பதைக் குறிப்பிட முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ කාරණයට අදාළව පළමු අතුරු ප්‍රශ්නයෙන් ප්‍රශ්න දෙකක් යොමු කළා. මන්නාරම, කිලිනොච්චිය, යාපනය හා මුලතිව් කියන දිස්ත්‍රික්ක හතර අතරින් ඔබතුමා විශේෂයෙන්ම මතු කළා, මන්නාරම හා මුලතිව් දිස්ත්‍රික්කවල නීති විරෝධී කටයුතු ඉතා ප්‍රබලව සිද්ධ වනවා කියලා. මා දන්නා තරමින් පසුගිය මාසයේ ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අදාළ දිස්ත්‍රික්ක දෙක තුළ මේ පිළිබඳව විශේෂ සාකච්ඡා දෙකක් ආරක්ෂක අමාත්‍යාංශයෙන් පැවැත්වුවා. ශ්‍රී ලංකා නාවික හමුදාව, යුද්ධ හමුදාව, පොලීසිය හා ධීවර දෙපාර්තමේන්තුවත් සම්බන්ධ වී කළ සාකච්ඡා දෙකකදීම ඒ සම්බන්ධව තීරණ ගත්තා. මීට පෙර ගරු මන්ත්‍රීතුමා සහ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාත් ඇතුළුව අප සියලුදෙනාගේ සහභාගිත්වයෙන් පවත්වපු සම්බන්ධීකරණ කමිටුවලදී අපි තීන්දුවකට ආවා, ආරක්ෂක අංශත්, ඒ වාගේම ධීවර දෙපාර්තමේන්තුවත් එක්ක - මේ සියලු අංශ එක්ක - මෙහෙයුම් මැදිරියක් පවත්වාගෙන යන්න. එම මෙහෙයුම් මැදිරියේ hotline එකක් හරහා ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න. ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධව ගරු අමාත්‍යතුමා මඟින් විමසීමක් කිරීමට මම කටයුතු කරන්නම්. අදාළ මෙහෙයුම් මැදිරිය මේ වන විට ක්‍රියාත්මක වන්නේද යන්නත්, මේ වන විට අදාළ පැමිණිලිවලට අනුව ක්‍රියාත්මක වූ ආකාරයත්, එසේ නොවුණා නම් ඒකට අදාළව අමාත්‍යාංශය පැත්තෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවත් මම ගරු අමාත්‍යතුමාගේත්, අමාත්‍යාංශයේත් අවධානය යොමු කරලා ඉදිරි කටයුතු කරන්නම්. ඒක එක ප්‍රශ්නයක්.

ඒ වාගේම ඔබතුමා අනෙක් ප්‍රශ්නයෙන් ඇහුවා, ඉන්දියානු ධීවර යාත්‍රා පිළිබඳව. දිගින් දිගටම මේ ගරු සභාවේත්, ඒ වාගේම දීර්ඝ කාලීනව අපේ අමාත්‍යාංශය වශයෙනුත් මේ සම්බන්ධයෙන් සාකච්ඡාව කළා. අපේ උත්සාහය වෙලා තිබෙන්නේ ඉන්දියානු රජයත්, අපේ රජයත් අතර රාජ්‍ය තාන්ත්‍රිකව මේ ප්‍රශ්නය විසඳා ගැනීමයි. ඊට අමතරව, මේ වන විටත් ශ්‍රී ලංකා නාවික හමුදාවත්, ධීවර දෙපාර්තමේන්තුවත් ඒකාබද්ධ වැටලීම් කිහිපයක් කරලා තිබෙනවා. උතුරේ ධීවරයන්ගෙන් අපට පැමිණිලි එනවා මේ වන විට අදාළ අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණය වැඩියි කියලා. අපි විශ්වාස කරනවා ඉදිරියේදී එය තවදුරටත් අවම කර ගන්න අපේ රජයට හැකි වෙයි කියලා. අමාත්‍යාංශය වශයෙන් අපි ඒකට උපරිම මැදිහත් වීමක් ලබා දෙනවා.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, முல்லைத்தீவு, மன்னார், வவுனியா மாவட்டங்களுக்கு ஒரேயொரு NAQDA அலுவலரே காணப்படுகின்றார். அவரது பெயர் திரு. நிசாந்தன். அங்கு நன்னீர் மீன்பிடியை ஊக்குவிக்கும் பொருட்டு நடவடிக்கைகள் எடுக்கப்பட்டாலும், நன்னீர் மீன்பிடியாளர்களைப் பதிவுசெய்து, அவர்களுக்குரிய அனுமதிப்பத்திரம் வழங்கும் செயற்பாடு மிகவும் மந்த கதியிலே நடைபெறுகின்றது. உதாரணத்துக்கு, பாவற்குள நன்னீர் மீன்பிடியாளர்கள் பல மாதங்களாக மேற்குறித்த அலுவலருடன் தொடர்புகொண்டு தங்களைப் பதிவுசெய்து தருமாறு கோரிக்கைவிடுத்து வருகிறார்கள். ஆனால், இதுவரை அதற்கு ஆக்கபூர்வமான நடவடிக்கை எடுக்கப்படவில்லை. நான் இது தொடர்பாக அவருடன் கலந்துரையாடியபோது, தான் ஒருவர் மாத்திரமே இருப்பதால் அந்த நடவடிக்கைகளை விரைவாக மேற்கொள்வது கடினமெனக் கூறினார். அத்தோடு, தனக்கு மொழி தெரியாததன் காரணமாக மீனவர்களுக்குக் கூட்டங்களை நடத்துவதிலும் பிரச்சினை இருப்பதாகச் சொன்னார். இவை பொருத்தமான காரணங்களாக இல்லை. மேலும், பாவற்குளம் பிரதேசத்தில் மீன்பிடியில் ஈடுபடுபவர்களுக்கு இடையே முரண்பாடுகள் காணப்படுகின்றன. எனவே, அனுமதிப்பத்திரம் வழங்குகின்ற நடவடிக்கையைத் துரிதப்படுத்தி, அந்த மீனவர்களுக்கு வாழ்வாதாரத்தை உறுதிப்படுத்துவதற்குரிய வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுக்குமாறு இந்த உயரிய சபையில் தங்களைக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විසින් යොමු කළ ප්‍රශ්නයට අදාළව එවැනි තත්ත්වයක් තිබේද, ප්‍රමාදයක් සිදුවේද යන්න සොයා බැලීමේ වගකීම මම භාර ගන්නවා. මේ කටයුතු සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ - NAQDA එකේ - නිලධාරීන් ප්‍රමාණවත් නැහැ. ඒ නිසා අමාත්‍යාංශය හැටියට අපි මේ පිළිබඳව ඉල්ලීමක් කරලා තිබෙනවා. රජයේ ඉදිරි බඳවා ගැනීම් පටිපාටිය යටතේ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට නිලධාරීන් බඳවා ගත් පසුව මේ තදබදය නතර වෙයි. ගරු කථානායකතුමනි, එතුමා කියන ආකාරයට උතුරේ මේ ප්‍රශ්නය තිබෙන නිසා අපි විශේෂ කරුණක් සේ සලකා වෙනත් ආයතනයකින් නිලධාරීන් ප්‍රමාණයක් මේ කටයුත්ත වේගවත් කිරීම වෙනුවෙන් කෙටි කාල සීමාවකට යොදා ගන්න අපි අමාත්‍යාංශය වශයෙන් කටයුතු කරනවාය කියන පිළිතුර මම ලබා දෙනවා.

## 2020 වර්ෂයේ සිට විශ්‍රාම වැටුප් ගෙවීම: වෙන් කළ මුදල

2020இலிருந்து வழங்கப்பட்ட ஓய்வூதியம்: ஒதுக்கப்பட்ட நிதி

PAYMENT OF PENSION SINCE 2020: MONEY ALLOCATED

1354/2025

**3. ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார)
(The Hon. (Prof.) Sena Nanayakkara)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සිටින විශ්‍රාම වැටුප්ලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

[ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා]

(ආ) (i) පවුල් ඒකකයක් ලෙස සැලකීමේදී විශ්‍රාමිකයෙකුගේ විශ්‍රාම වැටුප, පුද්ගල ප්‍රතිලාභයකට වඩා පොදු ප්‍රතිලාභයක් ලෙස සලකනු ලබන බව පිළිගන්නේද;

(ii) ඒ අනුව, විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයෙක් මිය යෑමෙන් පසු ඔහුගේ/ඇයගේ විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது இலங்கையிலுள்ள ஓய்வூதியதாரர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) 2020ஆம் ஆண்டு தொடக்கம் இதுவரை ஓய்வூதியக் கொடுப்பனவுகளுக்காக ஒதுக்கீடு செய்யப்பட்ட தொகை ஒவ்வோர் ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ஒரு குடும்ப அலகாகக் கருதும்போது ஓய்வுபெற்ற ஒருவரின் ஓய்வூதியமானது, தனிநபரின் நலன் என்பதை விடவும் பொது நலனாகக் கருதப்படுவதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) அதற்கமைய ஓய்வூதியதாரரொருவர் மரணித்ததன் பின்னர் அவருடைய ஓய்வூதியத்தை வழங்குவது தொடர்பாகப் பின்பற்றப்படும் நடைமுறைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House the -

(i) number of pensioners in Sri Lanka at present; and

(ii) amount allocated for the payment of pensions from the year 2020 to date, separately for each year?

(b) Will he also inform this House -

(i) whether he accepts that when considered as a family unit, the pension of a pensioner is considered a shared benefit rather than an individual benefit; and

(ii) accordingly, the procedure followed in relation to the pension of a pensioner after his/her death?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 735,110ක් පමණ වේ.

සෑම මසකම විශ්‍රාමිකයන් 2,500ක් පමණ එකතු වේ.

(ii)

| වර්ෂය | විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනය (රු.මිලියන) |
|---|---|
| 2020 | 263,279 |
| 2021 | 273,272 |
| 2022 | 318,720 |
| 2023 | 374,555 |
| 2024 | 397,487 |
| 2025 | 441,300 |

(ආ) (i) පිළිගනිමි.

කෙසේ වෙතත්, ඔහු ජීවත් වන පවුල් ඒකකයේ ආර්ථික මට්ටම අනුව විශ්‍රාමිකයා වෙත හිමිගත්වන විශ්‍රාම වැටුප භාවිත කරන ආකාරය රඳා පවතින බව සඳහන් කරමි.

(ii) • විශ්‍රාම වැටුප් ලබන රාජ්‍ය සේවයේ හෝ සන්නද්ධ හමුදා සේවයේ විශ්‍රාමිකයෙකු මිය යෑමෙන් පසුව එම විශ්‍රාමිකයා වෙත විශ්‍රාම වැටුප් ගෙවීමට පදනම් කර ගත් වැටුප අනුව ගණනය කරන අඩු නොකළ වැටුප, එම විශ්‍රාමිකයාගේ කලත්‍රයා වෙත වැන්දඹු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ලෙස හිමිගැන්වීම සිදු කරනු ලැබේ.

විශ්‍රාමිකයා මිය යන අවස්ථාවේදී ඔහුගේ/ඇයගේ කලත්‍රයා මියගොස් ඇත්නම් සහ ඒ වන විට අවුරුදු 26ට අඩු රැකියාවක් නොකරන දරුවන් සිටී නම් එම දරුවන්ට වයස අවුරුදු 26 වීම හෝ රැකියාවක් ලබා ගැනීම යන දෙකෙන් කලින් එළඹෙන අවස්ථාව දක්වා අනත්දරු විශ්‍රාම වැටුප හිමිගැන්වීම සිදු කරනු ලැබේ. විශ්‍රාමිකයා වෙත විශ්‍රාම වැටුප් ගෙවීමට පදනම් කරගත් වැටුප අනුව ගණනය කරන අඩු නොකළ වැටුප අනත්දරු විශ්‍රාම වැටුප වශයෙන් හිමිගැන්වීම සිදු කෙරේ.

• විශ්‍රාමිකයා යෙදී සිටි සේවය අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේදී අදාළ කර ගත යුතු විධිවිධාන ඇතුළත් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන පහත පරිදි වේ.

- 1898 අංක 01 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත හා එහි සංශෝධන
- 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත හා එහි සංශෝධන
- 1970 අංක 18 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රම (සන්නද්ධ බල සේනා) පනත හා එහි සංශෝධන

- 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත
- 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත
- 2008 අංක 32 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත
- 1974 අංක 16 දරන පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත

(ඇ) අදාළ නොවේ.

**ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார)
(The Hon. (Prof.) Sena Nanayakkara)

ගරු කථානායකතුමනි, මම අහපු ප්‍රශ්නයට සවිස්තරාත්මක පිළිතුරක් සැපයීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට පළමුවෙන්ම මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ප්‍රශ්නය ගැන අපි නිරන්තරයෙන් සාකච්ඡා නොකළත් යම්කිසි ආකාරයක ඛේදනීය තත්ත්වයක් ප්‍රකාශ කරන බවක් මම විශ්වාස කරනවා. ඇමතිතුමා කියපු විධියට, අම්මා හෝ තාත්තා මිය ගියාට පස්සේ වයස අවුරුදු 26ට වැඩි අවිවාහක දරුවන්ට විශ්‍රාම වැටුප හිමි වෙන්නේ නැහැ. මේ රටේ සමහර පවුල්වල රෝගාතුර වූ විශ්‍රාමික දෙමව්පියන් රැකබලා ගනිමින් තමන්ගේ ජීවිතය කැප කරන දරුවෝ ඉන්නවා. සමහර වෙලාවට අම්මාට තාත්තාට අවශ්‍ය රැකවරණය ලබා දෙමින්, ඇප උපස්ථාන කරමින් විවාහ වෙන වයස් සීමාව ඉක්මවා යනතුරු සිටින දරුවෝ ඉන්නවා. විවාහ වුණොත් අම්මාට තාත්තාට ලැබෙන රැකවරණයේ අවිනිශ්චිතතාව නිසා ඔවුන් විවාහ වීමෙන් වැළකී ඉන්නවා. ඒ අතරතුර අම්මා තාත්තා මිය ගියොත් දරුවෝ තනි වෙනවා. ඒ වෙනකොට ඒ දරුවන්ගේ විවාහ වීමේ වයස් සීමාවත් ඉක්මවා ගිහිල්ලා. ඒ විධියට වඩාත් අසරණභාවයට පත්වෙන ජීවිත අපට දකින්න ලැබෙනවා. විශේෂයෙන්ම දියණිවරු කියන්නේ, අම්මාට තාත්තාට ආදරය කරන, ඇප උපස්ථාන කරන අය. අපට මෙවැනි දරුවන්ටත් යම් ආකාරයකින් නීතිමය ප්‍රතිපාදනයක් සැපයීම පිළිබඳව සාවධානව හිතන්න බැරිද? මේක එක්තරා ආකාරයකින් මේ දරුවන්ගේ ජීවිත පිළිබඳව ඇති විශාල ප්‍රශ්නයක් විසඳන විසඳුමක් වෙන්න පුළුවන්. එම නිසා ඒ අයට සහනයක් සැලසීම වෙනුවෙන් යම් නීතිමය ප්‍රතිපාදනයක් නැද්ද කියන කාරණය මම ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පළමුවැනි අතුරු ප්‍රශ්නයට අදාළව සලකා බැලීමට යම් ඉඩ කඩක් තිබෙනවා නම් අපි ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කරනවා. ලෝකයේ බොහෝ රටවල අවුරුදු 18 සම්පූර්ණ වූ පසුව දරුවෙක් ස්වාධීන පුරවැසියකු හැටියට තමයි සැලකෙන්නේ. මේ රටේ දරුවන්ට අවුරුදු 26 දක්වා දෙමව්පියන්ගේ විශ්‍රාම වැටුප, වැන්දඹු හා අනත්දරු දීමනාවක් හැටියට ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා විසින් මතු කරන ලද විශේෂ අවස්ථා තිබෙන නිසා ඒ පිළිබඳව අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ඉදිරියේදී සැලසීමට අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්.

**ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார)
(The Hon. (Prof.) Sena Nanayakkara)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේක ප්‍රශ්නයකටත් වැඩිය, ඒ මතු කියපු ප්‍රශ්නයට අදාළ යෝජිත විසඳුමක් සඳහා ප්‍රවේශයක් කියලා මට හිතෙනවා. අපට බැරිද, එබඳු දරුවන්ට ඒ තාත්තා හෝ අම්මා කරපු රැකියා ක්ෂේත්‍රය අනුව යම්කිසි ආකාරයක සේවාවක් සපයන්න හරි, රැකියාවකට හරි ඒ ආයතනවල අවස්ථාවක් සලසා දෙන්න? එහෙම නැත්නම් ඔවුන්ගේ නඩත්තුව සඳහා බැංකු ණය සහන ව්‍යාපෘතියක් වාගේ දෙයක් ක්‍රියාත්මක කරන්න? මේ පිළිබඳව ඔබතුමාගේ අදහස මොකක්ද?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එතුමා සඳහන් කරපු ආකාරයට ඒ ක්ෂේත්‍රයේම කිසියම් රැකියාවක් ලබා දීම පිළිබඳව දැනටමත් ගැටලු තිබෙනවා. හේතුව, ඒ රැකියාව සඳහා අවශ්‍ය කරන සුදුසුකම් සම්පූර්ණ නොකළ කෙනෙකුට අපට ඒ අවස්ථාව ලබා දෙන්න පුළුවන් වෙන්නේ නැහැ. නමුත්, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ආකාරයට වෙනත් ව්‍යාපෘති මඟින්, එහෙම නැත්නම් වෙනත් වැඩසටහන් මඟින් අවශ්‍ය යම් සහනයක් සලස්වා දීමට හැකියාවක් තිබෙනවා. අපි ඒ පිළිබඳව කටයුතු කරන්න සූදානම්.

## හැඩඔය පානීය ජල ව්‍යාපෘතිය: වර්තමාන තත්ත්වය
### ஹெட ஓயா நீர் விநியோகத் திட்டம்: தற்போதைய நிலை
### HEDA OYA WATER SUPPLY PROJECT: PRESENT STATUS

1395/2025

**4. ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් සහ ලාහුගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල උග්‍ර පානීය ජල හිඟයක් පවතින බවත්;

(ii) එම පානීය ජල හිඟයට විසඳුමක් ලබා දීමේ අරමුණින් 2018, 2019 සහ 2020 වර්ෂවලදී පිළිවෙළින් රුපියල් මිලියන 150ක්, 25ක් සහ 50ක් වැය කරමින් එවකට පැවති රජයන් විසින් හැඩඔය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) පානීය ජල හිඟයට විසඳුමක් ලෙස ක්‍රියාත්මක කරන ලද ඉහත ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ඉහත (අ)(i) හි සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජීවත් වන ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරා ගැනීමට හැකි බැවින් එම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை மாவட்டத்தின், பொத்துவில் மற்றும் லாஹுகல ஆகிய பிரதேச செயலாளர் பிரிவுகளில் பாரிய குடிநீர்த் தட்டுப்பாடு நிலவுகின்றது என்பதையும்;

(ii) மேற்படி குடிநீர்த் தட்டுப்பாட்டுக்குத் தீர்வு காணும் நோக்கில், 2018, 2019 மற்றும் 2020ஆம் ஆண்டுகளில் முறையே 150 மில்லியன், 25 மில்லியன் மற்றும் 50 மில்லியன் ரூபாய் செலவிட்டு, கடந்த காலங்களில் ஆட்சியில் இருந்த அரசாங்கங்கள் ஹெட ஓயா நீர் விநியோகத் திட்டத்தை நடைமுறைப்படுத்தியது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) குடிநீர்த் தட்டுப்பாட்டுக்குத் தீர்வாக நடைமுறைப்படுத்தப்பட்ட மேற்படி கருத்திட்டத்தின் தற்போதைய நிலை யாது என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்தை நடைமுறைப்படுத்துவதன் மூலம் மேலே (அ)(i) இல் குறிப்பிடப்பட்டுள்ள பிரதேச செயலாளர் பிரிவுகளில் வசிக்கின்ற மக்களின் குடிநீர்த் தேவைப்பாட்டைப் பூர்த்திசெய்ய முடியுமென்பதால், குறித்த கருத்திட்டத்தை மீள நடைமுறைப்படுத்துவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Is he aware that -

(i) there is a severe scarcity of drinking water in the Pottuvil and Lahugala Divisional Secretaries' Divisions of the Ampara District; and

(ii) the then governments implemented the Heda Oya Water Supply Project in 2018, 2019 and 2020, spending Rs. 150 million, Rs. 25 million and Rs. 50 million, respectively, with the aim of providing a solution to the said scarcity of drinking water?

(b) Will he inform this House -

(i) the present status of the said project that was implemented as a solution to the scarcity of drinking water; and

(ii) whether steps will be taken to restart the said project, as its implementation would meet the drinking water demand of the residents in the Divisional Secretaries' Divisions mentioned in (a) (i) above?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සපුරාලීම මූලික කර ගෙන 2008 වසරේදී USAID ආයතනය මඟින් භූගත ජලය මඟින් ජලය ලබා දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. නමුත් එම ව්‍යාපෘතිය මඟින් මේ වන විට ලාහුගල, පානම යන ප්‍රදේශවල ජනතාවගේ ද පානීය ජල අවශ්‍යතාව සපුරාලීම සඳහා පියවර ගෙන ඇත. එකී හේතුවෙන් වර්තමානයේදී එම ප්‍රදේශවල ජනතාවට දිනකට පැය 02ක පමණ ජල සැපයුමක් පමණක් ලබා දීමට හැකි වී ඇත.

(ii) ඔව්.

2016 වසරේදී හැඩඔය ව්‍යාපෘතිය යෝජනා කරන ලද අතර, එමඟින් පොතුවිල්, ලාහුගල, මඩුල්ල හා සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කිරීමට යෝජනා විය. නමුත් මෙය ක්‍රියාවට නැංවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා ඇත.

(ආ) (i) අ (ii) පිළිතුරෙහි දක්වා ඇති පරිදි මෙම ව්‍යාපෘතිය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අතරමඟ නවතා දමා ඇත.

නැත.

හැඩඔය ජල ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා තීරණය කර නොමැති අතර, අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පවතින පානීය ජල අවශ්‍යතා සඳහා සේනානායක සමුද්‍රයෙන් ජලය ලබා ගැනීම සඳහා ව්‍යාපෘතියක් යෝජනා කර ඇත.

(ii) යෝජිත එම ව්‍යාපෘතියේ I අදියර සඳහා රුපියල් මිලියන 12,000ක් පමණ වැය වනු ඇත. මෙම ව්‍යාපෘති යෝජනාව මූල්‍ය සමාලෝචනය සඳහා ලෝක බැංකුව වෙත ඉදිරිපත් කර ඇත.

කෙසේ වෙතත්, වර්තමානයේ කෙටි කාලීන විසඳුමක් ලෙස raw water ප්‍රමාණය වැඩි කිරීම සඳහා හැඩඔය -නාවල්ආරු හරහා අමුණක් - a weir-type anicut - ඉදිකිරීම සිදු කරමින් පවතී. මෙම ක්‍රියාවලිය 2026 ජූලි මාසයේ අවසන් කිරීමට නියමිත වේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අතුරු ප්‍රශ්න තිබෙනවාද?

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
கௌரவ சபாநாயகர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, ஹெட ஓயா திட்டம் ஆரம்பிக்கப்படும்வரை கோமாரி, பொத்துவில், பானம, லகுகல கிராம மக்களுக்கு சுத்தமான குடிநீரை வழங்கும்பொருட்டு ஹெட ஓயா ஆற்றுப்படுக்கையில் மேலதிகமாக ஆழ்துளைக் கிணறுகளை அமைத்து நீரை வழங்க நடவடிக்கை எடுக்க முடியுமா? அருகம்பை உட்பட பல பிரதேசங்கள் உல்லாசப் பிரயாணத்துறைக்குப் பெயர்போன பிரதேசங்களாக இருப்பதாலும், சுமார் 5,000 குடும்பங்கள் தற்போது ஒரு மணி நேர குடிநீரை மட்டுமே National Water Supply and Drainage Board மூலம் பெறுவதாலும் நீரின் தேவை அதிகமாக உள்ளது. ஆதலால் மேலதிக ஆழ்துளைக் கிணறுகளை அமைத்து குடிநீர்ப் பிரச்சினையைத் தற்காலிகமாகத் தீர்க்க நடவடிக்கை எடுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, ලාහුගල සහ ආරුගම්බේ ප්‍රදේශවල ජල සැපයුමේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා අපි දන්නවා. විශේෂයෙන්ම ඒක සංචාරක කලාපයක්. National Water Supply and Drainage Board එකෙන් ඒ ප්‍රදේශයට වතුර දීලා තිබෙනවා. ඒ ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයට අදාළ හෝටල් ගණනාවක් තිබෙනවා කියලා අපි දන්නවා. එක පැත්තකින්, ඒ හෝටල්වල සවි කරලා තිබෙන ටැංකිවලට මේ වතුර ටික පුරවාගන්න නිසා සාමාන්‍ය ජනතාවට යම් වතුර ප්‍රමාණයක් මදි වෙන තත්ත්වය උග්‍ර වෙච්ච ගැටලුවකුත් මෙතැන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා අහන්නේ ගැඹුරු ළිං හාරලා ඒවා ජල මූලාශ්‍රයක් විධියට පාවිච්චි කරන්න බැරිද කියලා නේ. ඇත්තටම National Water Supply and Drainage Board එක මේ සඳහා උත්සාහ දරලා තිබෙනවා.

නමුත් අවාසනාවන්ත කාරණය කියන්නේ, ඒ ප්‍රදේශයේ භූගත ජලය ප්‍රමාණවත් පරිදි තිබෙනවාද කියලා තවමත් සොයාගෙන නැති එකයි. මේ සම්බන්ධයෙන් පර්යේෂණ කර තිබෙනවා, කැණීම් කර තිබෙනවා. දැනට මූලාශ්‍රයක් හම්බ වෙලා නැහැ. සේනානායක සමුද්‍රයේ ඉඳලා එතැනට ජලය ගෙනියන එක තමයි මේකට තිබෙන උත්තරය කියලා යෝජනා වෙන්නේ ඒ නිසායි. ඒක දැවැන්ත ව්‍යාපෘතියක්. කිලෝමීටර 60ක් විතර ඈතට වතුර ගෙනියන්න තිබෙනවා. ඒ නිසා, භූගත ජලය භාවිත කරන්න පුළුවන් කියලා දැනට පිළිතුරක් ලැබිලා නැහැ. .

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொண்டு, எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கிறேன்.

கௌரவ அமைச்சர் அவர்கள் சொன்னதைப்போன்று, தற்காலிகமாக இருக்கும் இந்தத் தீர்வுகளைவிட, எதிர்காலத்தில் - இந்த அரசாங்கம் ஆட்சியில் இருக்கின்ற காலத்துக்குள் - நிரந்தரத் தீர்வாக சேனாநாயக்க சமுத்திரத்திலிருந்து குடிநீரைப் பொத்துவில் மக்களுக்குக் கொண்டுவரும்போது, இடையிலுள்ள மடுல்ல, சியம்பலாண்டுவ, லகுகல, செங்காமம், கோமாரி, கனகர்கிராமம், பானம போன்ற கிராம மக்களுக்கும் நீரை வழங்க முடியும். எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இந்த முன்மொழிவை அவசரமாக நடைமுறைப்படுத்த நடவடிக்கை எடுக்க வேண்டுமென அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම සංචාරක කලාපයකට පානීය ජලය අත්‍යවශ්‍යයි කියලා අපි දන්නවා. සාමාන්‍ය ජනතාවත් එතැන ඉන්නවා. සේනානායක සමුද්‍රයේ ඉඳලා මෙතැනට ජලය ගෙනියනවා නම් කිලෝමීටර 60ක් ඈතට වතුර ගෙනියන්න ඕනෑ. නමුත් ඒ ගෙනියද්දී සියඹලාණ්ඩුවට, පානමට වතුර දීලා තමයි ගෙනියන්න ඕනෑ. අති දැවැන්ත මුදලක් මේකට ආයෝජනය කරන්න වෙනවා. මූලික අදියරේදී රුපියල් මිලියන 12,000ක් විතර ආයෝජනය කරන්න වෙනවා. ඇත්තටම මගේ පිළිතුරේදී සඳහන් කළා වාගේ ඒ සඳහා ලෝක බැංකුවත් එක්ක සාකච්ඡා කරමින් සිටිනවා. අපි ඒ සඳහා සැලකිය යුතු මට්ටමක උත්සාහයක් දරමින් ඉන්නවා.

## සේවායෝජකයින් විසින් EPF සඳහා දායක මුදල් නොගෙවීම: අධිභාර නිවේදන නිකුත් කිරීම
## ஊழியர் சேமலாப நிதியத்துக்கு ஊழியர்கள் பங்களிப்புத் தொகை செலுத்தாமை: மிகைக் கட்டண அறிவித்தல் வழங்குதல்
## NON-PAYMENT OF CONTRIBUTIONS TO EPF BY EMPLOYERS: ISSUANCE OF NOTICES OF SURCHARGE

1434/2025

5. **ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලට අදාළ දායක මුදල් නොගෙවීම සම්බන්ධයෙන් 2024 ඔක්තෝබර් මස සිට සේවායෝජකයන්ට දැනුම් දීමට කම්කරු දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබේද;

(ii) සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් නොගෙවීම සම්බන්ධයෙන් අධිභාර පැනවීමේ නිවේදන නිකුත් කර ඇති කාල සීමාව කොපමණද;

(iii) දීර්ඝ කාලයක සිට අධිභාර අය කර ගැනීම ප්‍රමාදවී තිබේ නම්, ඊට හේතු කවරේද;

(iv) 2019 පාස්කු ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ 2022 ආර්ථික අර්බුදය හේතුවෙන් අභියෝගයට ලක්වූ ව්‍යාපාරවලට අධිභාර පැනවීමේදී සහන ලබා දීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊழியர் சேமலாப நிதியத்துக்குப் பங்களிப்புத் தொகை செலுத்தாமை தொடர்பாக 2024 ஒக்ரோபர் மாதத்திலிருந்து தொழில்வழங்குநர் களுக்கு அறிவிக்கத் தொழில் திணைக்களம் நடவடிக்கை எடுத்துள்ளதா என்பதையும்;

(ii) ஊழியர் சேமலாப நிதியத்துக்குப் பங்களிப்புத் தொகை செலுத்தாமை தொடர்பாக மிகைக் கட்டண விதிப்பு அறிவித்தல் வழங்கப்பட்டுள்ள காலப்பகுதி யாது என்பதையும்;

[ගරු ඔෂානි උමංගා මහත්මිය]

(iii) நீண்ட காலமாக மிகைக் கட்டண அறவீட்டுச் செயற்பாட்டில் தாமதம் ஏற்பட்டிருப்பின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) 2019 உயிர்த்த ஞாயிறு தாக்குதல், கொவிட்-19 பெருந்தொற்று மற்றும் 2022 பொருளாதார நெருக்கடி போன்ற காரணங்களால் சவாலுக்குட்பட்ட வணிகங்களுக்கு மிகைக் கட்டணம் விதிக்கின்றபோது, நிவாரணங்கள் வழங்க நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour:

(a) Will he inform this House -

(i) whether the Department of Labour has taken steps to notify employers regarding the non-payment of contributions to the Employees' Provident Fund since October, 2024;

(ii) the time period for which notices of surcharges for non-payment of contributions to the Employees' Provident Fund have been issued;

(iii) if the collection of surcharges has been delayed for an extended period, the reasons for such delay; and

(iv) whether steps have been taken to provide relief to enterprises affected by the 2019 Easter attack, the COVID-19 pandemic and the 2022 economic crisis, when imposing surcharges?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කම්කරු නිලධාරීන් විසින් නිතිපතා සිදුකෙරෙන ක්ෂේත්‍ර පරීක්ෂණ හෝ පැමිණිලි පරීක්ෂණ මත පදනම්ව හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීම සඳහා සේවායෝජකයන් වෙත නිවේදන නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව, 2024 ඔක්තෝබර් මස සිට ද ඊට පෙර සිදු කළ අයුරින් දෛනිකව මෙම කාර්යය අඛණ්ඩව ඉදිරියටත් කරගෙන යනවා.

(ii) සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව දායක මුදල් නොගෙවීම තහවුරු වූ පසු දායක මුදල් නොගෙවූ මුළු කාලය සඳහා හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීම සඳහා නිවේදන නිකුත් කිරීමට කම්කරු දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.

(iii) ඉහත (i) හි සඳහන් පරිදි හඳුනා ගන්නා ලද දායක මුදල් නොගෙවීම් සඳහා අධිභාර අයකර ගැනීම්වලට අමතරව සේවායෝජක විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නියමිත දායක මුදල් ප්‍රමාදව ගෙවන අවස්ථාවලදී ප්‍රමාද කාලය මත පදනම්ව ගණනය කරන අධිභාරය සඳහා නිවේදන ද කම්කරු දෙපාර්තමේන්තුව විසින් යොමු කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවීම් කිරීමේදී ඇති වූ ප්‍රමාදයන් හඳුනාගැනීම සඳහා කාල පමාවක් ගත වන අතර, එක් එක් ආයතනය සඳහා වෙන වෙනම නිවේදන දත්ත පද්ධතිය මඟින් ජනනය කළ යුතු වේ. ශ්‍රී ලංකා මහ බැංකුවට සේවාදායකයන් තම ගෙවීම් සමඟ යොමු කරන ලැයිස්තුවේ පවත්නා සේවක තොරතුරු දත්ත පද්ධතිය හා නොසැසඳෙන අවස්ථාවලදී එම තොරතුරු සැසඳීම් කර නිසි පරිදි හඳුනා ගැනීමෙන් පසු දත්ත පද්ධතියට ඇතුළත් කෙරේ. එවැනි අවස්ථාවලදී සිදු වන ප්‍රමාදවීම් දත්ත පද්ධතිය මඟින් හඳුනා ගැනීම සඳහා යම් කාලයක් ගතවන බැවින් අයකර ගැනීම්වලට අදාළ නිවේදන නිකුත් කිරීම් ප්‍රමාද වී ඇත. ඊට අමතරව කම්කරු දෙපාර්තමේන්තුවේ දීර්ඝ කාලයක් තිස්සේ පවතින සේවක පුරප්පාඩු සහ දත්ත පද්ධතියට පිවිසීම සඳහා ප්‍රමාණවත් පරිගණක හා උපාංගවල පැවති හිඟකමද ප්‍රමාදවීම් සඳහා හේතු වී ඇත.

(iv) පාස්කු ප්‍රහාරය සඳහා අධිභාර සහන ලබා දී නොමැති අතර, කොවිඩ් 19 වසංගතය හා 2022 ආර්ථික අර්බුදය පැවති කාලය සඳහා සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් ගෙවීමට සහන කාලයක් ලබා දී ඇත. තවද, එම සහන කාලය තුළ ගෙවීම් කර ඇති ආයතන සඳහා අධිභාර සහන ලබා දීමට ද කටයුතු කර ඇත. ඒ යටතේ මේ දක්වා ආයතන 291ක් සඳහා රුපියල් 109,800,657ක් අධිභාර නිදහස් කිරීම් සහන ලබා දී ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිපාදන ලබා ගැනීමට යාමේදී සේවාදායකයන් දැඩි අපහසුතාවකට පත් වෙන තත්ත්වයක් අපි ඉතිහාසයේ ඉඳලාම දැක්කා. B Card එක තිබුණත්, C Form එකේ තිබෙන නමේ යම් අකුරක වෙනස්කමක් තිබුණත්, Central Bank එක ඒ තොරතුරු enter කරද්දී ඒ වෙනස තිබුණත්, නැවත වතාවක් සේවායෝජකයා වෙත ගිහිල්ලා ඒවා නිවැරදි කර ගෙන ආ යුතු පසුබිමක් තමයි තිබෙන්නේ. එතකොට තමන්ට හිමි වරප්‍රසාදය ගන්න තිබෙන අවස්ථාව මඟ හැරී, කාලය ගත වෙමින් පවතින තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඊට අමතරව සේවාදායකයෙක් ආයතන කිහිපයක වැඩ කරලා තිබෙනවා නම්, සමහර වෙලාවට ඒ ආයතන වසා දමා තිබෙන්න පුළුවන්. උදාහරණයක් විධියට, හොරණ වැඩ කරන කෙනෙක් අනුරාධපුරය වැනි ප්‍රදේශයක වැඩ කරලා අනුරාධපුරයේ ඒ ආයතනය වහලා තිබුණොත්, හොරණ ග්‍රාම නිලධාරි වසමට ඇවිල්ලා ඒ ග්‍රාම නිලධාරිගෙන් අත්සනක් අරගෙන යන්න ඕනෑ, ඒක නිවැරදි කරන්න. එතකොට, අනුරාධපුරයේ තත්ත්වය ගැන හොරණ ඉන්න කෙනා දන්නේ නැහැ. මේවා යාවත්කාලීන විය යුතුයි. බොහෝවිට ඩිජිටල්කරණය හරහා මේ ගැටලුව නිරාකරණය කර ගැනීමට හැකියාව තිබෙනවා. ගරු ඇමතිතුමනි, කාර්යක්ෂමව - අකාර්යක්ෂමතාවෙන් තොරව - මේ කටයුතු සිදු කරන්න කොපමණ කාලයක් ගතවෙයිද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මෙතැනදී කරුණු කිහිපයක් පැන නඟිනවා. එකක් තමයි සේවක අර්ථසාධක අරමුදලේ පරිපාලන කටයුතු කම්කරු අමාත්‍යාංශය යටතේ සිද්ධ වීම. ඒ වාගේම මේ අරමුදලට ලැබෙන මුදල් පරිපාලනය සිද්ධ වෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව යටතේයි. එතකොට තමන්ට හිමි දායක මුදල් ආපසු ලබාගන්න යනකොට අකුරුවල හෝ වෙනත් දෙයක සිදු වෙලා තිබුණු පුංචි වැරැද්දක් නිසා යම් යම් පමාවීම් පැන නඟිනවා. දැනට දත්ත පද්ධති දෙකක් -කම්කරු අමාත්‍යාංශය යටතේ තිබෙන දත්ත පද්ධතියත්, ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ තිබෙන දත්ත පද්ධතියත් - ක්‍රියාත්මක වෙනවා. අපි දැන් ඒ වෙනුවෙන් විසඳුමක් යෝජනා කරමින් ඒ දෙකම එක දත්ත පද්ධතියක් හරහා ගෙන ඒමට, ඒ දත්ත පද්ධති දෙක අතර අන්තර් සම්බන්ධය හැදීමට මේ වෙනකොටත් සාකච්ඡා පවත්වමින් තිබෙනවා.

ඒ වාගේම සේවකයන්ට අර්ථසාධක අරමුදලේ තමන්ගේ හිමිකාරිත්වය පිළිබඳ තොරතුරු විමසා ලබා ගැනීමට, ඔවුන්ට හිමි මොහොතේ මුදල් ආපසු ලබා ගැනීමට සහ සේවායෝජකයන්ගේ පැත්තෙන් අර්ථසාධක අරමුදල් අදාළ පරිදි ගෙවීම සිදු කිරීමට දැනට තිබෙන ක්‍රමවේද අපි වේගවත් කරලා තිබෙනවා. අපි යම් තාක්ෂණික උපක්‍රම, ඔන්ලයින් ක්‍රමවේද හඳුන්වා දී තිබෙනවා. කම්කරු අමාත්‍යාංශයට එන්නේ නැතිව අදාළ වැඩපොළේ ඉඳලා, ගෙදර ඉඳලා තාක්ෂණය ඔස්සේ අදාළ වැඩ කටයුතු සිද්ධ කරගන්න අවශ්‍ය කටයුතු කරන්න ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම ඔවුන්ට හිමි දායක මුදල් ආපසු ලබා ගැනීමට අවස්ථා ගණනාවක් විවෘත කරලා දෙනවා. අපි ඒ කටයුතු වේගවත් කරනවා. දැන් සාකච්ඡා වට ගණනාවක්ම පැවැත්වූවා. ඉතින්, හැකි ඉක්මනින් මේ කරුණු ඉෂ්ට කර දීලා ඉතා පහසුවෙන් සේවකයන්ට තමන්ගේ අරමුදල්වල තොරතුරු දැන ගැනීමටත්, ප්‍රතිලාභ ලබා ගැනීමටත්, සේවායෝජකයාට අපහසුවකින් තොරව ඒ සඳහා මැදිහත් වෙලා තමන්ගේ දායක මුදල් ලබා දෙන්නත් අවස්ථාව සලසන්න අපි බලාපොරොත්තු වෙනවා.

මොකද, දැන් දායක මුදල් ගෙවන්න යම් ප්‍රමාදයක් සිද්ධ වුණොත් අධිභාර අය කරන ක්‍රමවේදයක් තිබෙනවා. ඒක සියයට 50ක් දක්වා යනවා. ඔවුන්ගේ ගෙවීම ප්‍රමාද කරලා අධිභාර අය කිරීම වෙනුවට පමා නොවී දායක මුදල් ගෙවීමට පහසුකම් හදලා දුන්නාම ගොඩක් ගැටලු නිරාකරණය කරගන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)ෙ
මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Speaker, under Standing Order No. 27(2), I would like to ask a Question from the Minister of Health and Mass Media.

கௌரவ சுகாதார அமைச்சர் அவர்களே, நேற்றையதினம் மன்னார் உட்பட வடக்கு மாகாணம் முழுவதும் தாதிய உத்தியோகத்தர்கள் அடையாள பணிப் புறக்கணிப்பை ஆரம்பித்து இருக்கிறார்கள். இது தொடர்ந்து நடைபெறுமானால், வடக்கு மாகாணத்தில் இருக்கின்ற பொது மக்கள் தேவையில்லாமல் மிகப் பெரிய பிரச்சினைக்கு உள்ளாகுவார்கள். வடக்கு மாகாணத்தில் மட்டுமே சில விடயங்களைச் சுகாதாரத் துறையில் செய்திருக்கிறார்கள். முக்கியமாக, சகல உத்தியோகத்தர்களும் ஒரே புத்தகத்தில் sign பண்ண வேண்டுமென முடிவு எடுத்திருக்கிறார்கள். வடக்கு மாகாணத்தில் இருக்கின்ற தாதிய உத்தியோகத்தர்களின் பிரதிநிதிகளை சுகாதார அமைச்சுக்கு அழைத்து, அவர்களுடன் கலந்துரையாடி, இந்தப் பிரச்சினைக்கு முடிவு காண வேண்டுமென நான் உங்களை தயவாகக் கேட்டுக் கொள்கின்றேன். ஏனென்றால், இது பொது மக்களுக்குப் பெரிய பிரச்சினையாக இருக்கின்றது. நன்றி!

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, උතුරු පළාතේ ඊයේ තිබුණු සංකේත වැඩ වර්ජනය පිළිබඳව පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් ගණනාවක් මා සමඟ කථාබහ කළා. අද ඒ වර්ජනය ක්‍රියාත්මක වෙන්නේ නැහැ, ඊයේ පමණයි ක්‍රියාත්මක වුණේ. විශේෂයෙන්ම හෙද නිලධාරීන්ගේ attendance register එක සම්බන්ධයෙන් තමයි ඒ වර්ජනය ක්‍රියාත්මක වුණේ. ඒ ගැන පළාත් ලේකම්වරයා, ආණ්ඩුකාරවරයා ඇතුළු පළාත් සභා ප්‍රධානීන් සහ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා එක්ක සාකච්ඡාවක් තිබුණා. ඒ සාකච්ඡාවේ ප්‍රතිඵල අනුව මේ සම්බන්ධව යම් එකඟතාවකට එන්න පුළුවන්. ගරු කථානායකතුමනි, ඒ රෝහල් සේවකයන්ගේ පැමිණීම සම්බන්ධයෙන් විගණන පරීක්ෂණයක් පවත්වා තිබුණා. ඒ විගණන වාර්තා කිහිපයක් පදනම් කරගෙන තමයි, පළාත් සභාව මේ සම්බන්ධව යම් තීරණයකට ඇවිල්ලා තිබුණේ. කෙසේ වෙතත් ඒ වර්ජනය අද දිනයේදී ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ වෘත්තීය සමිති එක්ක ඊයේ රාත්‍රි සාකච්ඡාවක් සිදු කරලා තිබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### වෙළෙඳ පොළෙහි කීරි සම්බා සහල් හිඟය
### சந்தையில் கீரி சம்பா அரிசிக்கான தட்டுப்பாடு
### SCARCITY OF KEERI SAMBA IN THE MARKET

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன் கீழ் வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர் அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

எமது நாட்டு மக்களின் பிரதான உணவு நெல் அரிசிச் சோறு என்பதில் யாருக்கும் மாற்றுக் கருத்துகள் இருக்க முடியாது. எனினும் அண்மைக் காலங்களில் அரிசி விநியோகம் சம்பந்தமாகப் பல்வேறு முரண்பாடான கருத்துகள் நிலவுகின்றன. இந்த விடயத்தில் அரிசியும் நுகர்வோரும் மட்டும் தங்கியிருக்கவில்லை. மாறாக, விவசாயிகள், அரிசி உற்பத்தியாளர்கள், இறக்குமதியாளர்கள் மற்றும் இதனோடு மறைமுகமாகச் சம்பந்தப்பட்ட வேறு பல குழுவினரும் உள்ளனர். இதனோடிணைந்த செயற்பாடுகளில் மிகவும் அதிகமான அளவில் அவர்களின் வாழ்வாதாரம் பின்னிப் பிணைந்துள்ளது. எனவே, பின்வரும் கேள்விகளைக் கேட்பதன்மூலம் இந்த விடயத்திற்குப் பொருத்தமான மாற்று வழிகளைத் தேட முடியுமா? எனும் ஆவலில் இவற்றைச் சமர்ப்பிக்கின்றேன்:

1. வருடமொன்றுக்கு வெள்ளை நாடு, சிவப்பு நாடு, சிவப்புப் பச்சை, வெள்ளைப் பச்சை, சம்பா, கீரி சம்பா ஆகிய அரிசி வகைகளின் மொத்தத் தேவை எவ்வளவு? நமது நாட்டில் வருடமொன்றில் உற்பத்தி செய்யப்படுகின்ற மேற்கூறிய அரிசி வகைகளின் அளவு எவ்வளவு? உற்பத்தியைவிட மேற்படி அரிசி வகைகள் மேலதிகமாகத் தேவைப்படுமாயின், அதன் அளவு எவ்வளவு?

2. அரச நிர்ணய விலைக்கேற்ப கீரி சம்பா அரிசி தவிர்ந்த ஏனைய அரிசி வகைகள் சந்தையில் போதியளவு கிடைக்கின்றது. அரிசி ஆலை உரிமையாளர்கள், வியாபாரிகள், நெல் அறுவடைக் காலத்தில் கீரி சம்பா நெல்லை நிர்ணயிக்கப்பட்ட விலைக்கும், அதற்குக் குறைந்த விலைக்கும் கொள்முதல் செய்கின்றனர். அவ்வாறு கொள்வனவு செய்த நெல்லைப் பதுக்கி வைத்து, இப்பொழுது அரிசியாக்கி கூடிய விலைக்குக் கறுப்புச் சந்தையில் விற்பனை செய்கின்றனர். இதனைக் கட்டுப்படுத்துவதற்குப் பொருத்தமான நடவடிக்கைகளை எடுக்க முடியுமா? ஆமெனின், அதுபற்றி இச்சபைக்குத் தெளிவுபடுத்த முடியுமா?

3. கீரி சம்பா அரிசி கறுப்புச் சந்தையில் கூடிய விலையில் விற்பனை செய்யப்படுவதனால் அதன் விலையைக் கட்டுப்படுத்துவதற்கு அதற்கு ஒத்த பால் பொன்னி அரிசி எத்தனை மெற்றிக் தொன் இறக்குமதி செய்யப்பட்டுள்ளது?

4. நிர்ணயிக்கப்பட்ட விலையைவிடக் குறைந்த விலையில் வெள்ளை நாடு, சிவப்பு நாடு, சிவப்புப் பச்சை, வெள்ளைப் பச்சை, சம்பா ஆகிய அரிசி வகைகள் சந்தையில் போதியளவு இருக்கின்றது. அவற்றை நிர்ணயிக்கப்பட்ட விலையைவிடக் குறைத்தே விற்கின்றனர். உதாரணமாக 'சதொச'வின் tender விபரங்களை எடுத்துப் பார்த்தாலே, உண்மை நிலைமைகளை அறியலாம். இவ்வாறு இருக்கத்தக்கதாக தற்பொழுது இந்த கீரி சம்பா அரசிக்கு ஒப்பான பொன்னி, வெள்ளைப் பச்சை, குருணல் போன்ற அரிசி வகைகள் இறக்குமதி செய்யப்பட்டுள்ளது ஏன்? இவற்றில் எத்தனை மெற்றிக் தொன் இறக்குமதி செய்யப்பட்டுள்ளது?

5. அரிசி உற்பத்தியாளர்கள், நுகர்வோர், விவசாயிகள் அதனுடன் சம்பந்தப்பட்ட ஏனைய குழுவினர் எனும் சகல தரப்பினரும் பாதுகாக்கப்படும் விதத்தில், பிராந்திய ரீதியிலான அரிசி உற்பத்தியாளர்களை ஊக்குவித்து, அரிசி விலையை நிலைப்படுத்தி, தட்டுப்பாடற்ற சீரான அரிசி விநியோகத்தை ஏற்படுத்தப் பொருத்தமான புதிய அணுகுமுறைகளை உருவாக்க முடியுமா?

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු කථානායකතුමනි, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

එතුමා ප්‍රශ්නය අසමින් කිව්වා වාගේ කථා දෙකක් නැහැ, හාල් තමයි මිනිස්සුන්ගේ ප්‍රධාන ආහාරය සඳහා අවශ්‍ය වන්නේ.

1. කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව ශ්‍රී ලංකාව තුළ වාර්ෂික සහල් අවශ්‍යතාව මෙට්‍රික්ටොන් මිලියන 2.7ක් පමණ වේ. -ගෘහස්ථ පරිභෝජනය සඳහා සහල් මෙට්‍රික්ටොන් මිලියන 2.4ක්ද, කර්මාන්ත සඳහා සහල් මෙට්‍රික්ටොන් මිලියන 0.3ක් ද අවශ්‍ය වනු ඇත.

   දේශීය සහල් නිෂ්පාදනය වරින් වර සහල් වර්ග අනුව වෙනස් වන අතර කෘෂිකර්ම අමාත්‍යාංශයේ දත්ත අනුව 2025 යල කන්නයේදී නාඩු සහල් සියයට 80.2ක්, සම්බා සහල් සියයට 9.3ක්, කීරි සම්බා සහල් සියයට 8.8ක් හා වෙනත් සහල් වර්ග සියයට 1.7ක් ලෙසත් වගා කර තිබුණි. මෙම වාර්තා අනුව කීරි සම්බා සහල් වාගේම අනෙකුත් සම්බා සහල්වල හිඟයක්ද, නාඩු සහල්වල අතිරික්තයක්ද වාර්තා කර තිබුණි.

   ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව අපේ 2025 යල කන්නයේ වී අස්වැන්න පුරෝකථනය සහ සත්‍ය අස්වැන්න ගත්තාම, අපි 2025 යල කන්නයේ වී වගාව සම්පූර්ණයෙන් කරලා තිබෙන වගා වපසරිය හෙක්ටෙයාර 532,684යි. ඒ අනුව, සුදු නාඩු සියයට 64ක් තිබෙනවා, රතු නාඩු සියයට 21.98ක් තිබෙනවා, සුදු සම්බා සියයට 5.72ක් තිබෙනවා, රතු සම්බා සියයට 0.95ක් තිබෙනවා, කීරි සම්බා සියයට 7.01ක් තිබෙනවා, අනෙකුත් සහල් වර්ග සියයට 1ක වාගේ ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. ඒ අනුව ගත්තාම අපේ පුරෝකථනය තිබුණේ සියයට 80යි, ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, නාඩු සහල් සියයට 86ක් තිබෙනවා. කීරි සම්බා සහ සම්බා අපි පුරෝකථනය කළා, සියයට 17ක්. හැබැයි, අපට හම්බ වෙලා තිබෙන්නේ සියයට 14කට අඩු ප්‍රමාණයක්. ඒ අනුව කීරි සම්බා සහ සම්බා අස්වැන්නේ -විශේෂයෙන්ම කීරි සම්බා- සියයට 3කට වැඩි ප්‍රමාණයක හිඟයක් තිබෙනවා.

2. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මාසිකව පවත්වනු ලබන මිල උච්චාවචනය පිළිබඳ රැස්වීම්වලදී දිගින් දිගටම කීරි සම්බා සහල් ආනයනය පිළිබඳව සාකච්ඡාවට භාජන විය. මීට අමතරව ලංකා සතොස ආයතනය විසින් සතිපතා පවත්වනු ලබන ටෙන්ඩර් කැඳවීම්වලට කීරි සම්බා සහල් දිගින් දිගටම ඉදිරිපත් නොවිය. එබැවින්, මෙම සියලු කරුණු සැලකිල්ලට ගෙන මේ පිළිබඳව ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව වෙත කරුණු වාර්තා කළ අතර, ඒ අනුව ඔක්තෝබර් මස සිට සහල් ආනයනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

වෙළෙඳ පොළ සහල් මිල පාරිභෝගිකයාට දැරිය නොහැකි මට්ටමක පවතින අවස්ථාවකදී පාරිභෝගිකයා ආරක්ෂා කිරීම උදෙසා අප අමාත්‍යාංශය යටතේ ඇති පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් අවශ්‍ය නියාමනය සිදු කරනු ලබයි. විශේෂයෙන්ම වැඩි මිලට සහල් අලෙවි කිරීම හෝ සහල් සඟවනු ලබන වෙළෙඳුන්, නිෂ්පාදකයන්, වී මෝල් හිමියන් සොයා වැටලීම් සිදු කිරීම සහ නිෂ්පාදකයන්, වෙළෙන්දන් සහ පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් මඟින් සාධාරණ වෙළෙඳ චර්යා කෙරෙහි දැනුවත් කිරීමේ කටයුතු කරනු ලබයි. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාර්තා අනුව 2025 වර්ෂයේදී 4,870ක් පමණ වැටලීම් සිදු කර, ඉන් රුපියල් මිලියන 121ක දඩ මුදලක් අය කරගෙන තිබුණු අතර, පුහුණු වැඩසටහන් 1,260ක් පවත්වා තිබුණි.

3. 2025 ඔක්තෝබර් 15වන දින සිට පොන්නි සම්බා - GR 11 සහල් - ආනයනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ අතර, ශ්‍රී ලංකා රේගු වාර්තා අනුව 2025.11.11වන දින දක්වා මෙට්‍රික්ටොන් 61,564ක ප්‍රමාණයක් ආනයනය කර තිබුණි.

ගරු මන්ත්‍රීතුමනි, මේ කියන්නේ 11වැනි දා දක්වා ප්‍රමාණය. අද 13වැනි දා. අද උදේ වෙනකොට මෙට්‍රික්ටොන් 63,000ක් දක්වා ආනයනය කර තිබුණා. අපි bills of lading සඳහා දවස් 12ක කාලයක් දුන්නා. Bills of lading දුන්නාට පස්සේ ඒවා නිදහස් කර ගන්න අපි 15වැනි දා දක්වා කාලය ලබා දුන්නා. ඒ කියන්නේ, bills of lading දෙන්න දවස් 12ක වාගේ කාලයක් තිබුණා. Bills of lading දුන්නාට පස්සේ වරායට ඇවිල්ලා නිදහස් කර ගන්න දවස් 15කට ආසන්න කාලයක් තිබුණා. පාර්ලිමේන්තුවේ සමහර මන්ත්‍රීවරු මේ ගැන ප්‍රශ්න කළා, හාල් ඇටයක්වත් එන්නේ නැති වෙයි කියලා. මොකද, වී කොටාගෙන එනවාද, නැද්ද කියලා දන්නේ නැති නිසා. අපේ රටේ ආනයනකරුවන්ගේ හැසිරීම පිළිබඳව අපට පසුගිය කාලයේ හොඳ අත්දැකීමක් ලැබුණා. අපට අවශ්‍යව තිබුණේ, කීරි සම්බා ආදේශන මෙට්‍රික් ටොන් 20,000 ඉඳලා උපරිමය 40,000 දක්වා ප්‍රමාණයක් ගෙන්වන්න. ඒ අනුව තමයි අපි ඒ සඳහා ලබා දෙන දින ප්‍රමාණය සීමා කළේ. ඒ වාගේම, ආනයනකරුවෙකුට ගෙන්විය හැකි සහල් ප්‍රමාණයත් සීමා කළා. ගරු කථානායකතුමනි, ඒ අනුව එක්කෙනෙකුට මෙට්‍රික් ටොන් 520ක් ආනයනය කිරීමට තමයි අපි ඉඩ දුන්නේ. ඒ කියන්නේ, උපරිම ප්‍රමාණය කන්ටේනර් 20යි. ඒ අනුව මේ මාසයේ 15වැනි දා වෙනකොට මෙට්‍රික් ටොන් 65,000කට වැඩි ප්‍රමාණයක් එයි කියලා අපි හිතනවා.

4. පහත සඳහන් පරිදි වර්තමාන රජය විසින් වෙළෙඳ පොළ තුළ සහල් අලෙවි කිරීම සඳහා උපරිම සිල්ලර මිලක් පැනවීමට කටයුතු කර ඇති අතර, එම පාලන මිලට හෝ ඊට අඩු මිලට වෙළෙඳ පොළ තුළ සහල් අලෙවි කිරීමේ හැකියාව වෙළෙඳුන් සතුව පවතී.

| අනු අංකය | ගැසට් නිවේදන අංකය | දිනය | සහල් වර්ගය | කිලෝග්‍රෑම යක් සඳහා පාලන මිල |
|---|---|---|---|---|
| 1 | 2414/02 | 2024.12.09 | කැකුළු | 210.00 |
| | | | නාඩු | 220.00 |
| | | | සම්බා | 230.00 |
| 2 | 2459/12 | 2025.10.21 | පොන්නි සම්බා - GR 11 | 240.00 |
| | | | කිරි පොන්නි / පාල් පොන්නි | 255.00 |

රුපියල් 260 තමයි කීරි සම්බාවල සිල්ලර මිල, ගරු කථානායකතුමනි. එමෙන්ම, 2025.10.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කීරි සම්බාවලට ආදේශකයන් වන GR 11 හා පොන්නි සම්බා ආනයනය කිරීම සඳහා පමණක් අනුමැතිය ලබා දී ඇති බව සඳහන් කරනවා.

5. රජය විසින් වෙළෙඳ පොළ කටයුතුවලට අනවශ්‍ය ලෙස මැදිහත් වීම සිදු නොකරන අතර, ඉල්ලුම හා සැපයුම යන සාධක මත වෙළෙඳ පොළ මිල මට්ටම තීරණය වනු ඇත. වෙළෙඳ පොළ සහල් මිල පාරිභෝගිකයාට දැරිය නොහැකි මට්ටමක පවතින විටදී සහ අසාධාරණ ලෙස වෙළෙඳ පොළ තුළ වෙළෙඳ චර්යාවන් -භාණ්ඩ සැඟවීම, කළු කඩ වෙළෙඳාම- පවතින අවස්ථාවලදී ඒවා ඉවත් කිරීමේ අරමුණින් රජය මැදිහත් වීමක් සිදු කරනු ලබයි.

එසේම, දිගු කාලීන විසඳුමක් ලෙස වී ගොවීන් විවිධ වී ප්‍රභේද වගා කිරීමට පෙලඹවීම උදෙසා සහ ආරක්ෂා කිරීම උදෙසා විවිධ සහන සැපයීම හරහා ගොවීන් දිරිමත් කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලබයි. එහිදී ගොවීන්ට පොහොර සහනාධාර ලබා දීම, සහනදායී මිලට අමුද්‍රව්‍ය ලබා දීම, වීවලට ලබා දෙන සහතික මිල වැඩි කිරීම සහ කන්න රැස්වීම්වලදී ගොවීන් දැනුවත් කිරීම යනාදී ක්‍රියාමාර්ග කෘෂිකර්ම අමාත්‍යාංශය, වෙළෙඳ අමාත්‍යාංශය සහ අදාළ ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

තවද, පසුගිය රජය විසින් ඇවර කර තිබුණු සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව නැවත ස්ථාපිත කර, වී අලෙවි මණ්ඩලය හා එක්ව ගොවීන්ගේ වී මිලදී ගැනීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සමඟ එක්ව එම වී සහල් බවට පත් කර ලංකා සතොස අලෙවි සැල් ජාලය, සමුපකාර ජාලය හා අවශ්‍ය අවස්ථාවලදී සුපිරි වෙළෙඳ සැල් ජාලය ඔස්සේ සාධාරණ මිලකට පාරිභෝගිකයා වෙත අලෙවි කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

එමෙන්ම 2026 වර්ෂයේදී සමුපකාර සමිති සඳහා වී වියළන යන්ත්‍ර ලබා දීම තුළින් එම සමිති වී මිලදී ගැනීමේ ක්‍රියාවලියට සක්‍රියව දායක කර ගැනීම හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් සියලුම වී මෝල්හිමියන් ලියාපදිංචි කර ගැනීම තුළින් නියාමනය සිදු කිරීමටත් කටයුතු කරනු ලබයි.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! உண்மையிலே குறித்த விடயம் சம்பந்தமாகப் போதிய விளக்கத்தைத் தந்திருக்கிறீர்கள்; சில தரவுகளை முன்வைத்திருக்கிறீர்கள். இருந்தாலும், எமது பகுதியிலுள்ள விவசாயிகள் பாரியள விலான பல பிரச்சினைகளுக்கு முகங்கொடுக்கின்றார்கள். அங்குள்ள விவசாயிகள் கூறுகின்றார்கள், கீரி சம்பா தவிர ஏனைய அரிசி வகைகளின் இருப்பு போதுமான அளவில் இருக்கும்போது, இவ்வாறு இறக்குமதி செய்யப்பட்டமை யானது தங்களுக்குப் பாரிய பாதிப்பை உருவாக்குகின்றது என்று. எதிர்காலத்தில் அது தொடர்பாகக் கருத்தில் எடுத்துக் கொள்ளுங்கள்!

அதேபோன்று, கீரி சம்பாவை அரிசி ஆலை உரிமையாளர்களோ அல்லது வியாபாரிகளோ குறைந்த விலையில் கொள்முதல் செய்து stock பண்ணுகின்றார்கள். நாங்கள் இன்றைக்கும் supermarket பக்கம் போனால், அங்கு சந்தைப்படுத்தலுக்கு கீரி சம்பா அரிசி இல்லை என்று சொல்கின்றார்கள். ஆனால், counterஇல் bill போடும்போது கீரி சம்பா கேட்டால், bill போடாமல் கூடிய விலைக்குத் தருகின்றார்கள். இந்த விஷயம் பிரபல supermarketsஇல்

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

நடைபெறுகின்றது. அந்த விடயம் சம்பந்தமாகவும் கருத்திலெடுத்துச் சரியான முறையில் கீரி சம்பா அரிசி கிடைப்பதற்குரிய ஏற்பாட்டைச் செய்ய வேண்டும்.

அத்தோடு, விவசாய மக்களுக்காகத் தொடர்ச்சியாக வருடாவரும் பாரியளவு நிதியை - பல பில்லியனை - ஒவ்வோர் அரசாங்கமும் ஒதுக்குகின்றது. இருந்தாலும், அவர்களுக்கான முன்னேற்றம் இடம்பெறவில்லை. உரிய காலத்தில் அவர்களின் நெல்லுக்கு விலை நிர்ணயம் செய்யப் படுவதில்லை. உதாரணமாக வட, கிழக்கில் அறுவடையை Januaryஇல் start பண்ணுகின்றார்கள். ஆனால், அரசினால் விலை நிர்ணயம் Februaryஇல் செய்யப்படுகின்றது; அது பாரியதொரு பாதிப்பு. அவ்வாறு விவசாயிகள் பாதிக்கப் படாமல் இருந்தால், போதியளவான உற்பத்தி இந்த நாட்டில் நடைபெறும் என்று எதிர்பார்க்கின்றார்கள். ஆகவே, கௌரவ அமைச்சர் அவர்களிடம் இதற்குரிய ஏற்பாடுகளைச் செய்துகொடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නයේ සාධාරණ යථාර්ථයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වෙනකොටත් වී මිල ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ අනුව, නාඩු වී කිලෝව රුපියල් 120යි; සම්බා වී කිලෝව රුපියල් 125යි; කීරි සම්බා වී කිලෝව 132යි. ගරු මන්ත්‍රීතුමනි, කීරි සම්බා මිල පිළිබඳව දැනටමත් කෘෂිකර්ම අමාත්‍යාංශය සාකච්ඡා කරනවා. මේ මාසයේ 25වැනි දා කෘෂිකර්ම ඇමතිතුමා එක්කත් සාකච්ඡාවක් යොදාගෙන තිබෙනවා, කීරි සම්බාවල මිලේත් යම් සංශෝධනයක් කළ යුතුයි කියලා. මොකද, කීරි සම්බා සහල් කිලෝවක් රුපියල් 260ට විකුණන නිසා වී මිලේත් යම් වැඩි වීමක් අවශ්‍යයි කියන කාරණය ගොවීන්ගේ පැත්තෙන් ඉල්ලා තිබෙනවා.

ඔබතුමා මතු කරපු අනෙක් කාරණයටත් මම උත්තර දෙන්න ඕනෑ. ෂොප් එකට ගියාම එළියේ බඩු නැහැ. හැබැයි, ඇතුළේ තිබෙනවා. අහනවා, ඕනෑද කියලා. ඒක කරනවා. ඒකට හේතුව තමයි ගරු මන්ත්‍රීතුමනි, මම මතු කරපු කාරණය. කීරි සම්බා අස්වැන්න සියයට තුනක් විතර අඩුයි. ගරු කථානායකතුමනි, ඒ කියන්නේ, අපේ ඉල්ලුමට සාපේක්ෂව සියයට නවයක විතර සහල් අවශ්‍යතාවක් තිබෙනවා. හැබැයි, අපට සියයට හයහමාරක, හතක විතර වී නිෂ්පාදනයක් තමයි තිබෙන්නේ. මේ හිඩැස තමයි වෙළෙඳ පොළ තුළ තිබෙන්නේ. විශේෂයෙන් කීරි සම්බා එකතු කරපු මහ මෝල් හිමියන් විසින් තමයි මේ ජාවාරම කරන්නේ. ඒකට උත්තරයක් ලෙස තමයි කීරි සම්බා ආදේශන වන GR 11 සහ පොන්නි සම්බා සහල් ගෙනාවේ. මේවා තමයි අපේ කීරි සම්බාවලට තිබෙන ආදේශන සහල් වර්ග.

ගරු කථානායකතුමනි, අපේ රටේ කෘෂිකර්ම අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනවා, යාය 500 වැඩ පිළිවෙළ. 2025 අවුරුද්දේ යල සහ මහ කන්න දෙකේම හෙක්ටෙයාර 35,000කට ආසන්න ප්‍රමාණයක් තමයි වැඩ කළේ. එක කන්නයකට හෙක්ටෙයාර 35,000 - 37,000 අතර වගා කරනවා. හෙක්ටෙයාර 50,000කවත් කීරි සම්බා වවන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි. නැත්නම් දේශීය අවශ්‍යතාවට ප්‍රමාණවත් කීරි සම්බා ලැබෙන්නේ නැහැ. ඒක නිසා අනෙකුත් සහල්වල - නාඩු සහ රතු - අතිරික්තයක් තිබෙනවා. කීරි සම්බා සහල්වල හිඟයක් තිබෙනවා. ඒක නිසා යාය 500 වැඩ පිළිවෙළ යටතේත්, මහා වාරිමාර්ග ප්‍රදේශවලත් කීරි සම්බා වැඩිපුර ප්‍රමාණයක් වගා කිරීම සඳහා ගොවීන්ට උපදෙස් දෙන්නත්, ඒ සඳහා අවශ්‍ය වතුර ලබා දෙන්නත් කියලා උපදෙස් ලබා දීලා තිබෙනවා. ඔබතුමා මතු කරපු කාරණයට කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානය යොමු කරලා, ඒකට අවශ්‍ය කරන උපදෙස් දීලා තිබෙනවා කියලා මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද: මාධ්‍ය තුළ ව්‍යාජ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීම
## சிறப்புரிமை: ஊடகங்களில் உண்மைக்குப் புறம்பான செய்திகளைப் பரப்புதல்
## PRIVILEGE: DISSEMINATION OF FAKE NEWS ON MEDIA

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே!

தமிழ் மக்களைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர் அமிர்தநாதன் அடைக்கலநாதன் ஆகிய என்னைப் பற்றி, எனது பெயருக்கும் பதவிக்கும் களங்கம் விளைவிக்கும் வகையில், உண்மைக்குப் புறம்பான செய்திகள் கடந்த சில வாரங்களாக இணையவழி ஊடாகவும் போலியான முகநூல் கணக்கினூடாகவும் YouTube ஊடாகவும் சில தனிநபர் களாலும் IBC எனப்படும் ஊடகத்தாலும் பரப்பப்பட்டு வருகின்றது. தற்கொலை செய்து இறந்த ஒருவரது மரணத்தை என்னுடன் சம்பந்தப்படுத்தி, கொலை செய்யப்பட்டாரெனப் பொய்ப் பிரசாரம் செய்யப்படுகின்றது.

மேலும், பொய்யான, தனித்தனியாகத் துண்டு துண்டாகப் பதிவுசெய்யப்பட்ட தொலைபேசி உரையாடல் குரல் பதிவுகளை, வெட்டியும் ஒட்டியும் திரிவுபடுத்தியும் தவறாகச் சித்தரித்தும் போலி முகநூலில்களில் எனக்கெதிராகப் பரப்பப்பட்ட செய்திகளை ஆதாரமாகக்கொண்டு முகநூல் பக்கங்களில் பதிவேற்றப்பட்டிருந்த செய்திகள் எனது கௌரவத்துக்கும் தனிப்பட்ட மரியாதைக்கும் நம்பிக்கைக்கும் பொதுமக்கள் மத்தியிலும் அரசியல் பரப்பிலும் சர்வதேச மட்டத்திலும் பங்கம் விளைவித்திருப்பதோடு, தவறான தோற்றப்பாட்டையும் ஏற்படுத்தியிருக்கிறது. இதனால், நான் பெரிதும் மன உளைச்சலுக்கும் துன்பத்துக்கும் ஆளாகி யுள்ளேன். மேலும், இதன்மூலம் இந்த உயரிய சபையின் கௌரவமும் கேள்விக்குட்படுத்தப்பட்டுள்ளது.

யாழ்ப்பாணம் நகரத்தில், பருத்தித்துறை வீதியில் அமைந்துள்ள அலுவலகத்தில் இயங்கிவரும், IBC Tamil TV,

28c, Wood End Gardens, Northolt, UB5 4QJ, United Kingdom என்ற பிரித்தானிய இலண்டன் நகரப் பதிவைக் கொண்ட, இணையவழி ஊடகம் சில தனிநபர்களை அழைத்து எனக்கு எதிரான மேற்கூறிய கருத்துகளை ஒளிப்பதிவுசெய்து வெளியிட்டுள்ளது. இவ்வூடகத்திற்கு "Smart Media Group" என்னும் பெயரில் இலங்கையில் அனுமதி வழங்கப்பட்டு, பின்னர் பாதுகாப்புத் தரப்பினரால் தடை செய்யப் பட்டுள்ளதாக அறிகிறேன். அந்த வகையில், அனுமதி இல்லாமல் இவ்வூடகம் இயங்கி வருகின்றது என்பதையும்

கவனத்தில் கொள்ளவேண்டியுள்ளது. அதுபோல், 'காலைக் கதிர்' எனும் இணையவழி மஞ்சள் ஊடகம், 11.11.2025இல் எனது பெயரைக் குறிப்பிட்டு நான் கைதுசெய்யப்படுவது உறுதி எனச் செய்தி வெளியிட்டுள்ளது.

இவ்வாறு பொய்யான தகவல்களை வெளியிடுவது பாராளுமன்ற (அதிகாரங்களும் சிறப்புரிமைகளும்) சட்டத்தின் 22(2)ஆம் பிரிவினை மீறும் செயற்பாடாகும். இவ்வாறான சட்ட மீறல், குற்றவியல் தண்டனைச் சட்டக்கோவைச் சட்டத்தின் 90ஆம் பிரிவினை மீறுவதுடன், இது மேல் நீதிமன்றத்தால் தண்டனை வழங்கப்படக்கூடிய குற்றமுமாகும். இவர்கள் சட்டத்தைக் கையில் எடுத்துத் தவறான செய்தியை வெளியிடுவது பாரதூரமான செயலாக இருக்கின்ற அதேவேளை, அது எனக்குக் களங்கத்தையும் ஏற்படுத்துகிறது. உண்மையற்ற, ஆதாரமற்ற, பொய்யான செய்திகளை வேண்டுமென்றே பரப்பும் இவர்களின் செயல் எனது பாராளுமன்ற சிறப்புரிமையை மீறும், அவமதிக்கும் நடவடிக்கையாக உள்ளதால், மேற்படி விடயத்தினை ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தி எனக்கு நீதி வழங்குமாறு வேண்டிக் கொள்கிறேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න. ඔබතුමාගේ ඉදිරිපත් කිරීම අවසානයි නේද?

**ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ சபாநாயகர் அவர்களே, ஒரு நிமிடம் தாருங்கள்!

இவ்வாறு முகநூலிலும், இணையவழியிலும் தவறான செய்திகளைப் பரப்பிப் பிழைத்துக்கொண்டிருக்கின்ற ஐந்து களுக்கு, உங்களிடம் ஆதாரம் இருந்தால், அவற்றை நீதிமன்றத்திற்கு ஆற்றுப் படுத்துங்கள்; நான் அதை எதிர்கொள்வதற்குத் தயாராக இருக்கின்றேன் என்பதைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். நன்றி!

## වරප්‍රසාද: විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව ගරු කථානායකතුමා සමඟ කළ සාකච්ඡාවක් සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශය
## சிறப்புரிமை: எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களின் பாதுகாப்பு தொடர்பில் மாண்புமிகு சபாநாயகர் அவர்களுடனான கலந்துரையாடல் பற்றிய கூற்று
## PRIVILEGE: STATEMENT MADE REGARDING DISCUSSION WITH HON. SPEAKER ON SECURITY OF OPPOSITION MEMBERS

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, 2025.10.31 වැනි දින ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් දසවැනි පාර්ලිමේන්තුවේ විපක්ෂය නියෝජනය කරන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වන ලදී.

එම සාකච්ඡාවට ගරු කථානායකතුමාට අමතරව සහභාගි වූයේ විපක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පමණි.

කෙසේ වෙතත්, එම සාකච්ඡාවේදී අප විසින් ඉදිරිපත් කරනු ලැබූ අදහස් පිළිබඳව එම සාකච්ඡාවට කිසිදු සම්බන්ධයක් නොමැති බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සමන්ත විද්‍යාරත්න මහතා විසින් මාධ්‍ය වෙත ප්‍රකාශයක් නිකුත් කර ඇත.

මෙම සිදුවීම හේතුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 1 වන කොටසේ, "සාමාන්‍ය වරප්‍රසාද, පරිහාර හා බලතල සාමාන්‍යයෙන් සහ පරිපූරක විධිවිධානයන්හි 3වන වගන්තිය ප්‍රකාරව මාගේ භාෂණයේ නිදහස අහිමි කර ඇති බව පෙන්වා දෙමි.

ඉතාම සංවේදී කරුණක් වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව වූ උක්ත සාකච්ඡාවේදී ගනු ලැබූ තීරණ එසේ මාධ්‍ය වෙත අදහස් ඉදිරිපත් කිරීම තුළින් මාගේ ආරක්ෂාවට ඉතා අහිතකර බලපෑමක් සිදු කර ඇත.

එසේ හෙයින්, මෙම වරප්‍රසාද කඩවීම සම්බන්ධයෙන් සොයා බලා සුදුසු පියවරක් ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ඒ වාගේම ගරු කථානායකතුමනි, එතුමා එම ප්‍රකාශය කරද්දී තවදුරටත් කියනවා, - මම ඒක ලියුමේ දැම්මේ නැහැ - ඒ රැස්වීමේ හිටපු නැති එක්කෙනා කියනවා, "ඕනෑ නම් ගිහිල්ලා කථානායකතුමාගෙන් අහන්න" කියලා. හරියට නිකම් ඔබතුමා ගිහිල්ලා එතුමාට කිව්වා වාගේ. එතකොට, අපි නොවෙයි ඔබතුමාට "පැලවත්තේ කථානායක" ලේබලය ගහන්නේ, ඒ ඇමතිතුමාම තමයි. ඒ නිසා ඒ සම්බන්ධයෙන් සොයා බලන එක ඔබතුමාට වටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් සොයා බලන්නම්.

## වරප්‍රසාද: CIDA හි හිටපු අධ්‍යක්ෂවරයා විසින් "කෝප්" කමිටුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව කරන ලද විවේචනය
## சிறப்புரிமை: CIDAஇன் முன்னாள் பணிப்பாளரினால் "கோப்" குழுவின் செயற்பாடுகள் தொடர்பில் செய்யப்பட்ட விமர்சனம்
## PRIVILEGE: CRITICISM BY FORMER DIRECTOR OF CIDA ON FUNCTIONS OF COPE

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සහ පොදුවේ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද උල්ලංඝනය වීම.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ හිටපු අධ්‍යක්ෂවරයෙකු වන සුසන්ත ලියනාරච්චි යන අය විසින් මාධ්‍ය හමුවක් කැඳවා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ක්‍රියාදාමයන් ප්‍රසිද්ධියේ, අශෝභන හා අශීලාචාර ලෙස විවේචනය කරමින්, කාරක සභාවේ සභාපතිවරයාට, කාරක සභාවට සහ අධිකාරියේ

[ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා]

වර්තමාන සභාපති මහාචාර්ය චන්දන ජයලත් මහතාට අපහාස කිරීම.

නිවාස, ඉදිකිරීම් හා ජලසම්පාදන අමාත්‍යාංශය යටතේ ඇති ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ 2022 හා 2023 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්ය සාධනය පරීක්ෂා කිරීම සඳහා 2025.10.08වැනි දින ප.ව. 1.30ට පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 5හිදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව රැස්වන ලදී.

එහිදී, අධිකාරිය සම්බන්ධ උක්ත සඳහන් පරීක්ෂාවට අදාළව විගණකාධිපතිවරයා විසින් සකස් කරන ලද විගණකාධිපති සංක්ෂිප්ත වාර්තාවේ සඳහන්ව තිබූ කරුණක් වූ 2021 වර්ෂයේදී එවකට අධිකාරියේ අධ්‍යක්ෂ (මුදල්)ගේ සේවය අවසන් කිරීමට විරුද්ධව ගොනු කළ නඩුව සඳහා අධිකාරිය විසින් රුපියල් 1,615,000ක් වියදම් කිරීම සහ එම නඩුවේ තීන්දුව අධිකරණය විසින් ලබාදුන් පසු එය ක්‍රියාත්මක නොකර රුපියල් 1,750,000ක මුදලක් ද, නැවත රුපියල් 10,820,000ක මුදලක් ද ඒ සඳහා නෛතික ගාස්තු ලෙස වියදම් කිරීම හා වර්තමානයේදී ද එක් නඩු වාරයකදී රුපියල් 625,000ක් බැගින් වූ මුදලක් වියදම් කිරීම සම්බන්ධයෙන් ගරු කාරක සභා සභාපති විසින් විමසන ලදී.

ඒ සම්බන්ධයෙන් එවකට අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සුසන්ත ලියනාරච්චි යන පුද්ගලයා මාධ්‍ය හමුවක් කැඳවා කාරක සභාව හමුවේ සභාපතිවරයා කළ එම කරුණු විමසීම පිළිබඳව ඉතා අශෝභන හා අශීලාචාර වචන භාවිත කරමින් නිර්දය ලෙස විවේචනය කර ඇත. එසේම එහිදී කාරක සභා සභාපති හා කාරක සභාවේ නිර්දේශ අභියෝගයට ලක් කිරීමක් ද සිදු කරනු ලබයි. මෙහිදී මෙම පුද්ගලයා කාරක සභා සභාපතිවරයාගේ හා කාරක සභාව වශයෙන් එහි සාමාජිකයින්ගේ ජනතා නියෝජිතයින් ලෙස ක්‍රියා කිරීමේ නිදහස අභියෝගයට ලක් කිරීමක් සිදු කරනු ලබයි. මෙම අශෝභන හා අශීලාචාර විවේචනය පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 3වැනි වගන්තිය ඇතුළත්ව පනතේ කරුණු උල්ලංඝනය කිරීමකි. අධිකාරියේ වර්තමාන සභාපති මහාචාර්ය චන්දන ජයලත් මහතා විසින් ද මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරක සභාවේ සභාපති වෙත 2025.10.13 දිනැතිව ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා ලේකම්ගේ අංක PS/LEG/COPE/288(1)/10/01 හා 2025.08.15 දිනැති කැඳවීම් ලිපියේ 03වැනි ඡේදය මඟින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, ප්‍රධාන මූල්‍ය නිලධාරි, ප්‍රධාන නීති නිලධාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ කාරක සභා රැස්වීම සඳහා අවශ්‍ය යැයි සැලකෙන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වෙනත් ඕනෑම නිලධාරියෙකු ආදී ලෙස නිලධාරින් කාරක සභා රැස්වීමට කැඳවා තිබුණි.

උක්ත නිලධාරින් 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 22වැනි වගන්තිය ප්‍රකාරව බලය දෙන්නා වූ සිතාසියක් යටතේ කාරක සභා රැස්වීම සඳහා කැඳවා තිබූ අතර, එසේ බලය දුන්නා වූ සිතාසියක් මඟින් කාරක සභා රැස්වීමක් සඳහා කැඳවීම් ලද පුද්ගලයෙකු පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත යටතේ ඇති 15 හා 16 යන වගන්තීන්හි සඳහන් වරප්‍රසාද මඟින් ආරක්ෂා වනු ඇත. එසේ කැඳවීම් ලද අධිකාරියේ වත්මන් සභාපති, ආයතනයේ ගණන් දීමේ නිලධාරි වශයෙන් කාරක සභා රැස්වීමේදී කාරක සභාව විසින් විමසන ලද කරුණු සඳහා පැහැදිලි කිරීම් කරන ලදී. එම පැහැදිලි කිරීම් සම්බන්ධයෙන් ද හිටපු අධ්‍යක්ෂ සුසන්ත ලියනාරච්චි යන පුද්ගලයා එම මහජන හමුවේදී දූර්දය ලෙස විවේචනය කරනු ලැබේ.

ඒ අනුව, කාරක සභාවේ සභාපතිවරයාගේ, කාරක සභාවේ හා අධිකාරියේ සභාපතිවරයාගේ පහත සඳහන් වරප්‍රසාද කඩ වී ඇති බව නිරීක්ෂණය වේ.

i. 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 3වැනි වගන්තිය උල්ලංඝනය කිරීම:

පාර්ලිමේන්තුවේදී භාෂණයේ, විවාද කිරීමේ හා කටයුතුවල නිරත වීමේ නිදහස තිබිය යුතු අතර, එම නිදහස පාර්ලිමේන්තුවෙන් පිටස්තර වූ යම් අධිකරණයකදී හෝ ස්ථානයකදී දෝෂාභියෝගයකට හෝ ප්‍රශ්න කිරීමකට භාජනය කළ නොහැකි වන්නේය. මෙම පනතේ 2වැනි වගන්තිය අනුව පාර්ලිමේන්තුව යන්නෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව අදහස් කෙරෙන අතර ඊට කාරක සභාවක් ද ඇතුළත් වේ.

ii. පනතේ 22(2) හා 22(3) උපවගන්ති උල්ලංඝනය කිරීම:

මෙම පුද්ගලයා විසින් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 22වැනි වගන්තියේ (2) හා (3) උපවගන්ති උල්ලංඝනය කර ඇති බව නිරීක්ෂණය වේ.

iii. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කළ හැකි වැරදි සිදු කිරීම (උපලේඛන 'අ'):

පනතේ උපලේඛනයේ "අ" කොටසේ අංක 5, 7 හා 8 යන වැරදි සිදු කිරීම මඟින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පමණක්ම දඬුවම් කළ හැකි වැරදි සිදු කර ඇත.

(5. පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාවක යම් විවාදයක් හෝ කටයුතු පිළිබඳ යම් ව්‍යාජ හෝ අවචර්තික වාර්තාවක් සිතාමතා පළ කිරීම, නැතහොත් මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේ දී හෝ කාරක සභාවේ දී පවත්වන ලද යම් කථාවක් සිතාමතා වැරදි ලෙස නිරූපණය කිරීම.

7. පාර්ලිමේන්තුවේ කටයුතු සහ එහි ස්වභාවය සම්බන්ධයෙන් යම් අපහාසාත්මක ප්‍රකාශයක් පළ කිරීම.

8. මන්ත්‍රීවරයකු වශයෙන් යම් මන්ත්‍රීවරයකුගේ ක්‍රියා කලාපය ගැන යම් අපහාසාත්මක ප්‍රකාශයක් පළ කිරීම.)

iv. කාරක සභා කටයුතු ප්‍රකාශයට පත් කිරීම (උපලේඛන 'ආ' 9):

ඉහත කී උල්ලංඝනයන් මඟින් පනතේ උපලේඛනයේ "ආ" කොටසෙහි 9හි සඳහන්, "පාර්ලිමේන්තුවේ කාරක සභාවක කටයුතු කිසිවක් පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමට පෙර ඒවා ප්‍රකාශයට පත් කිරීම" යටතේ පාර්ලිමේන්තුව විසින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කළ හැකි වරදක් සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ වාගේම දෙවෙනි කාරණයක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම සඳහා පැමිණීමේදී නියමිත ඇඳුම් පිළිවෙත - dress code එක - අනුගමනය නොකිරීම සහ කාරක සභා රැස්වීම අවසන් වීමට පෙර අවසරයකින් තොරව කාරක සභා පරිශ්‍රයෙන් ඉවත්ව යාම.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා ලේකම්ගේ අංක PS/LEG/COPE/288 (I)/10/01 හා 2025.08.15 දිනැති කැඳවීම්

ලිපිය ප්‍රකාරව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහාචාර්ය චිත්‍රා වෙඩික්කාර මහත්මිය ද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමට සහභාගි වීමට පාර්ලිමේන්තු පරිශ්‍රයට පැමිණෙන ලදී. එහිදී ඇය කැඳවීම් ලිපියේ 05 වන ඡේදය මඟින් ලබා දී තිබූ උපදෙස් උල්ලංඝනය කරමින්, එනම් නියමිත ඇඳුම් පිළිවෙත - dress code එක - අනුගමනය නොකර කාරක සභා රැස්වීමට සහභාගි වීම සඳහා පැමිණ සිටි අතර ඒ හේතුවෙන් ඇයට කාරක සභා කාමර අංක 05 පිටත කොටසේ රැඳී සිටින ලෙස දැනුම් දී තිබියදී කාරක සභා රැස්වීම අවසන් වීමට පෙර කිසිදු අවසරයකින් තොරව කාරක සභා පරිශ්‍රයෙන් පිටව ගොස් තිබුණි.

එසේම උක්ත කැඳවීම් ලිපිය ප්‍රකාරව කාරක සභා රැස්වීමට සහභාගි වූ එම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික වාස්තු විද්‍යාඥ ජයන්ත පෙරේරා මහතා ද කාරක සභා රැස්වීම අවසන් වීමට පෙර කිසිදු අවසරයකින් තොරව කාරක සභා රැස්වීමෙන් ඉවත්ව ගොස් ඇත.

මෙහිදී උක්ත නිලධාරින් දෙදෙනා පාර්ලිමේන්තුව ඉදිරියට හෝ යම් කාරක සභාවක් ඉදිරියට හෝ පැමිණෙන ලෙස කෙරෙන යම් නියමයක්, සභාපතිවරයා විසින් හෝ කථානායකවරයා විසින් නැතහොත් කාරක සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන විධානයක් අනුව ලේකම්ගේ අත්සන යටතේ නියමිත ආකාරයෙන් ලබා දුන්නා වූ සිතාසියක් යටතේ පැමිණෙන පුද්ගලයන් අනුගත විය යුතු 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 22වැනි වගන්තිය කඩ කර ඇත. එබැවින්, පනතේ උපලේඛනයේ "ආ" කොටසෙහි;

i. මේ පනත යටතේ පාර්ලිමේන්තුවේ යම් නියමයකට හෝ යෝජනා සම්මතයකට නැතහොත් මේ පනත යටතේ විධිමත් ලෙස කරන ලද සභාපතිවරයාගේ හෝ කථානායකවරයාගේ හෝ යම් මන්ත්‍රීවරයකුගේ නියමයකට අවනත වීම සිතාමතා පැහැර හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

ii. පාර්ලිමේන්තුව විසින් හෝ තත්කාර්ය සඳහා විධිමත් ලෙස බලය දෙනු ලැබූ යම් කාරක සභාවක් විසින් පැමිණීම සඳහා හෝ ලියවිලි, පොත්, වාර්තා හෝ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා හෝ කරන ලද යම් නියමයකට පනතේ 13වැනි වගන්තියේ හා 15වැනි වගන්තියෙන් විධිවිධාන සැලැස්වෙන පරිදි පැමිණීමෙන් හෝ ඉදිරිපත් කිරීමෙන් නිදහස් කරනු ලැබුවහොත් මිස, සිතා මතා අවනත නොවීම යන පාර්ලිමේන්තුව විසින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කළ හැකි වැරැදි සිදු කර ඇති බව පෙනී යයි.

මේ අනුව, කාරක සභා රැස්වීම අවසන් වීමට පෙර නොදන්වා පරිශ්‍රයෙන් ඉවත්ව යෑමෙන් සිතා මතා අවනත නොවීම හා පාර්ලිමේන්තුවේ කාරක සභාවක් විසින් දුන්නා වූ සිතාසියට අනුගත නොවීම, කාරක සභාවක් හමුවට පැමිණෙන පුද්ගලයන් අනුගත විය යුතු 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 22 වගන්තිය කඩ කිරීමක් යැයි හැඟේ.

මේ අනුව පාර්ලිමේන්තුවේ කාරක සභාවක් ඉදිරියේ කාරක සභා සභාපති විසින් කරුණු විමසීම හා නිලධාරින් කරුණු දැක්වීම, ප්‍රසිද්ධ මාධ්‍ය හමුවක් ඉදිරියේ විවේචනය කිරීම, පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය තුළ අහිතකර පූර්වාදර්ශයක් බවට පත් විය හැකි බැවින් පාර්ලිමේන්තු ක්‍රියාවලියේ අඛණ්ඩතාව සහ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා සමස්ත පුරවැසියන් අනුගත විය යුතු 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත කඩකිරීමක් මෙන්ම වරප්‍රසාද උල්ලංඝනය කිරීමකි. එසේම පාර්ලිමේන්තුවේ බලය දැඩි ලෙස අවමානයට ලක් කිරීමකි.

මෙය පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය තුළ අහිතකර පූර්වාදර්ශයක් බවට පත් විය හැකි බැවින්, පාර්ලිමේන්තු ක්‍රියාවලියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා මෙය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු බවට 2025.10.22වැනි දින පස් වරු 1.30ට පාර්ලමේන්තුවේ කාරක සභා කාමර අංක 05දී රැස් වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් තීරණය කර ඇති බැවින්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සහ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩ කිරීමට එරෙහිව පියවර ගැනීමට කටයුතු සලසන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා තිදෙනා විසින් ඉදිරිපත් කරන ලද වරප්‍රසාද කඩවීම පිළිබඳ ප්‍රශ්න පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා විසින්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමනි, අපි ඒ කාරණය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ඒක තමයි. හැබැයි ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට, අමාත්‍යවරයකු හැටියට මෙහිදී මගේත් වරප්‍රසාද කඩ වෙනවා නේ. ඒ ප්‍රකාශය ගැන කෙටියෙන් පැහැදිලි කිරීමේ අවශ්‍යතාවක් මට දැන් තිබෙනවා. මොකද, එහෙම නැත්නම් සමාජයට යනවා, එතුමාගේ වරප්‍රසාද මම කැඩුවා වාගේ හැඟීමක්. නමුත්, ඇත්ත කාරණය මොකක්ද බලමු.

ගරු කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරු, එතුමන්ලාට ආරක්ෂාවක් නැහැ කියන කාරණය පිළිබඳ සාකච්ඡාවක් ඔබතුමාගේ මූලිකත්වයෙන් පැවැත්වූවා. අපි දන්නවා, ඒ ගැන මාධ්‍යයේත් පළ වූ බව. එම සාකච්ඡාවේදී ඔබතුමා මුලසුන හෙබවූවා. මා දන්නා විධියට ඒකට සමගි ජන බලවේගයේ මහ ලේකම් ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා, ගරු රවූෆ් හකීම් මන්ත්‍රීතුමා, ගරු ෂාණක්කියන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා සහ ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා, ඒ වාගේම හමුදාව, පොලීසිය ඇතුළු විශාල පිරිසක් සම්බන්ධ වුණා. ඇත්තටම ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා එතැනදී මෙය කියලා තිබුණා. එතුමන්ලාගේ පැත්තෙන් මේවා එළියට ආවා. තර්ජනය

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

කොහෙන්ද එන්නේ කියලා අහන කොට මරික්කාර් මන්ත්‍රීතුමා කියලා තිබෙනවා, "මම නාම යෝජනා කමිටුවේ හිටියා, ඉතින් මම නාම යෝජනා නොදීපු කට්ටියගෙන් පක්ෂය ඇතුළෙන් මට තර්ජනයක් තිබෙනවා" කියලා. ඉතින් ගෙදර ඇතුළෙන් තිබෙන තර්ජනය ගැන කියපු එක මම මාධ්‍යයට කිව්වා. මහ ලේකම්තුමා හෘදය සාක්ෂියට එකඟව කථා කරනවා නම් එතුමා කියයි, එහෙම එකක් කියැවුණා කියලා. ඒකෙන් අමුතු වරප්‍රසාදයක් කඩ වෙලා නැහැ. එතුමාගේ වරප්‍රසාද කඩ වෙලා තිබෙන්නේ පක්ෂය ඇතුළෙන්. ඒ හින්දා පක්ෂය අතුළේ ඉන්න කට්ටිය බැඳලා තියන්න. ඒකයි ඇත්ත ප්‍රශ්නය. ඒ මිස සමන්ත විද්‍යාරත්න නිසා වරප්‍රසාද කඩ වෙලා නැහැ නේ.

මම ගරු කථානායකතුමාගෙන් අහනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කථා කරන ඒවා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මෙතැන කියන්නේ කොහොමද කියලා. කවුද විපක්ෂයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නියෝජනය කරන්නේ? එහෙම නම් ඒවාත් ආරක්ෂා වෙලා තිබෙනවාද? මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, එතැන රහස් එළියට එන්නේ කොහොමද කියලා කථානායකතුමා හැටියට සොයන්න කියලා. මරික්කාර් මන්ත්‍රීතුමාට තර්ජනය තිබෙන්නේ එතුමාගේම පක්ෂය ඇතුළෙන්. එතුමා ඒක ඒ සාකච්ඡාවේදී කියලා තිබෙනවා. ඒ සාකච්ඡාවේ මූලාසනයේ හිටියේ ගරු කථානායකතුමා හින්දා මම මාධ්‍යයට කිව්වා, ඕනෑ නම් ගිහිල්ලා ගරු කථානායකතුමාගෙන් අහන්න, එතුමා මේකේ ඇත්ත කියයි කියලා. එතුමා විතරක් නොවෙයි, ඔබතුමන්ලාටත් කියන්න පුළුවන්. ඔබතුමන්ලාත් කියන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත කෙරෙහි. විශේෂයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා ප්‍රශ්න රාශියක් ඉදිරිපත් කළා. පාර්ලිමේන්තුවේ තිබෙන කාරක සභා සියල්ල වැදගත් අතර, විශේෂයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මහජන මුදල් භාවිතය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට පැවරී තිබෙන බලය ප්‍රයෝගිකව ක්‍රියාත්මක කරන ප්‍රධාන කාරක සභා තුනෙන් එකක්. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවත් ඒ අතර තිබෙනවා. ඇත්තටම එතැන කරන්නේ investigative job එකක්. පොලීසියක්, හමුදාවක්, පර්යේෂණ අංශ ආදිය නැතිව කරන දෙයක්.

ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ වරප්‍රසාද කඩවීම පිළිබඳ ප්‍රශ්නයට අනිවාර්ය වශයෙන්ම ඔබතුමාගේ ප්‍රමුඛතාව දෙන්න කියලා. ඒකේ පළමුවෙනි කොටසේ සඳහන්ව තිබුණා පාර්ලිමේන්තුව සහ එහි නිලධාරීන් විවේචනය කළ පුද්ගලයන් සම්බන්ධව. එයට ඉඩ දිය යුතු නැහැ. ඔබතුමා ඒකට උපරිම බරකින් මැදිහත් වෙන්න කියලා සභානායක කාර්යාලය පැත්තෙනුත් ඉල්ලා සිටින්න අපි කැමැතියි. මොකද, පාර්ලිමේන්තුව ජනතා ඡන්දයෙන් පත් වුණු එකක්. මේ මන්ත්‍රීවරුන් 225දෙනාම මිනිසුන්ට වග කියන අය. ඒකට challenge කරන්න පුළුවන් බලවතෙක් එළියේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම.

## පාර්ලිමේන්තුවේ කටයුතු
### பாராளுமன்ற அலுவல்
### BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(5)හි විධිවිධාන ප්‍රකාරව, 2025 නොවැම්බර් 15 සෙනසුරාදා, 17 සඳුදා, 18 අඟහරුවාදා, 19 බදාදා, 20 බ්‍රහස්පතින්දා, 21 සිකුරාදා, 22 සෙනසුරාදා, 24 සඳුදා, 25 අඟහරුවාදා, 26 බදාදා, 27 බ්‍රහස්පතින්දා, 28 සිකුරාදා, 29 සෙනසුරාදා සහ 2025 දෙසැම්බර් 01 සඳුදා, 02 අඟහරුවාදා, 03 බදාදා සහ 05 සිකුරාදා "විසර්ජන" පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
### பாராளுமன்ற அமர்வு
### SITTINGS OF THE PARLIAMENT

## I

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධාන ප්‍රකාරව, "විසර්ජන" පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා 2025 නොවැම්බර් 17 සඳුදා, 24 සඳුදා සහ 2025 දෙසැම්බර් 01 සඳුදා යන වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30 ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගරු සමන්ත විද්‍යාරත්න අමාත්‍යතුමා මගේ නම සඳහන් කරලා ඇහුවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සිද්ධ වුණු දේවල් මම කොහොමද මේ සභාවට ඇවිල්ලා

කියන්නේ කියලා. මම වරප්‍රසාද ප්‍රශ්නයක් නඟලා, සිද්ධ වුණු කාරණයක් පිළිබඳව කථා කළා. එච්චරයි කරලා තිබෙන්නේ. මම ඒක ඇතුළේ සිදු වෙච්ච වෙන ඕපාදූප කියලා නැහැ. ඇමතිතුමාගේ ඔළුව හොඳ නැද්ද කොහේද.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, ඔබතුමා එක්ක එම closed-door meeting එකේ කථා කරපු දේවල් මෙතුමා කථා කරන්නේ, මෙතුමා ඒ meeting එකේ සාමාජිකයෙක්ද? මෙතුමා ඒකට ආවාද? මෙතුමා, ඔබතුමා පාවලා දුන්නා. හරිද? එතුමා කිව්වේ කථානායකතුමාගෙන් අහන්න කියලා. හරියට ඔබතුමා ගිහිල්ලා එතුමාට ඒ විස්තර කිව්වා වාගේ නේ. ඕනෑ එකටයි, එපා එකටයි හැම එකකටම හොට දා ගෙන යන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනා අංක 3, ගරු සභානායකතුමා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු කථානායකතුමනි, ඔළුව හොඳ නැහැයි කියලා ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා.

ගරු කථානායකතුමනි, මට මේ ගැන පැහැදිලි කිරීමට අවස්ථාව දෙන්න. එතුමන්ලාට අවස්ථාව දුන්නා වාගේම මටත් අවස්ථාව දෙන්න. මම මරික්කාර් මන්ත්‍රීතුමාගෙන් අහන්නේ මේකයි. පක්ෂ අභ්‍යන්තරයෙන් තර්ජනයක් තිබෙනවා කියලා ඔබතුමා කිව්වාද, නැද්ද? මට ඒක ඔබතුමන්ලාගේ පක්ෂයෙන් කියන්නේ. *[බාධා කිරීම්]*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මට mike එක දෙන්න කියන්න. මම මෙච්චර දවස් කට වහගෙන හිටියා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකුමනි,- *[බාධා කිරීම්]* දෙවැනි යෝජනාව,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුවේ රැස්වීම් යෝජනා අංක 2 සිට තිබෙන යෝජනා ටික ඉදිරිපත් කරන්න.

## II

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන" පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා 2025 නොවැම්බර් 15 සෙනසුරාදා, 18 අඟහරුවාදා සිට 20 බ්‍රහස්පතින්දා දක්වා ද, 22 සෙනසුරාදා, 25 අඟහරුවාදා සිට 27 බ්‍රහස්පතින්දා දක්වා ද, 29 සෙනසුරාදා සහ 2025 දෙසැම්බර් 02 අඟහරුවාදා, 03 බදාදා යන වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.00 සිට අ.භා. 12.30 දක්වා ද අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30 ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, "විසර්ජන" පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා 2025 නොවැම්බර් 21 සිකුරාදා සහ 28 සිකුරාදා යන වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## IV

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන" පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා 2025 දෙසැම්බර් 05 සිකුරාදා වෙන් කළ දිනයෙහි පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.00 සිට අ.භා. 12.30 දක්වා ද අ.භා. 1.30 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2026, දෙවන වර කියවීමේ විවාදය. පස්වන වෙන් කළ දිනය.

## විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

*කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.*
*ඊට අදාළ ප්‍රශ්නය - [ නොවැම්බර් 07]*
*"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]*
*ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.*

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 07]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக" .- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [07th November]*
*"That the Bill be now read a Second time".- [The Hon. Anura Kumara Dissanayake]*
*Question again proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
To start the Debate, the Hon. Gayantha Karunathilleka. You have 15 minutes.

[පූ.භා. 11.11]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, අය වැය දෙවන වර කියවීමේ විවාදයේ දී අද දින විපක්ෂය වෙනුවෙන් විවාදය ආරම්භ කරන්නට මට අවස්ථාව ලැබීම ගැන මම අතිශයින්ම සතුටු වෙනවා.

ගරු කථානායකතුමනි, වර්තමාන රජයේ දෙවැනි අය වැය ලේඛනයට පුරා පැය හතරහමාරක් තිස්සේ සවන් දෙද්දී මට සිහිපත් වුණේ අපේ ගම්වල සැණකෙළි පවත්වනකොට දකින්න ලැබෙන මාරක ළිඳේ මෝටර් සයිකල් පදින සංදර්ශනය. ගරු කථානායකතුමනි, මාරක ළිඳේ පදින මෝටර් සයිකල් එක start කළාම මුළු සැණකෙළි භූමියටම සද්දෙ ඇහෙනවා. සෙනඟ උඩට ඇවිල්ලා බලාගෙන ඉන්නවා, මෝටර් සයිකල් එක සද්දේ දා ගෙන වේගයෙන් වට කිහිපයක් ගිහිල්ලා නතර වෙනතෙක්. ඊට පස්සේ මිනිස්සු පහළට එන ගමන් කියනවා සද්දේ දා ගෙන ගියාට කැරකිලා තිබෙන්නේ එක තැන නේ කියලා. මේ අය වැයත් පැය හතරමාරක සද්දේ දාලා එකතැනක නැවතිච්ච එකක් හැටියට තමයි අද ජනතාව කථා වෙන්නේ.

ගරු කථානායකතුමනි, එදා මෙදාතුර පැවති හැම ආණ්ඩුවක්ම අය වැය ලේඛන ඉදිරිපත් කරනවා. වසරකට පස්සේ ආපසු හැරිලා බැලුවාම යෝජනා වැඩි ප්‍රතිශතයක් ක්‍රියාත්මක වෙලා, සුළු ප්‍රමාණයක් විතරක් ඉටු නොවී තිබෙන්න පුළුවන්කමක් තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවේ පළමුවැනි අය වැයේ සඳහන් යෝජනා බොහොමයක්ම නොකෙරුණු ගනයට තමයි වැටෙන්නේ. 2025 අය වැයෙන් වෙන් කරපු ප්‍රාග්ධන වියදම්වලින් සියයට 60කට වඩා වියදම් කරන්න මේ ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා. 2025 අය වැයට යෝජනා 54ක් ඉදිරිපත් කළා. එයින් යෝජනා 16ක් ම ලබාගෙන තිබෙන ප්‍රගතිය සියයට 25ට වඩා අඩුයි. ගරු කථානායකතුමනි, ඒකෙන්ම පෙනෙනවා, ආණ්ඩුවේ නොහැකියාවේ තරම. ගිය අවුරුද්දේ අය වැයේ ප්‍රගතිය බලනකොට ඉතාම පැහැදිලිව පෙනෙනවා, තමුන්නාන්සේලාගේ කථාව දෝලාවෙන් වුණාට කොර ගගහා පයින් තමයි ගමන ඇවිල්ලා තිබෙන්නේ කියන එක.

ගරු කථානායකතුමනි, පසුගිය අය වැය කථාවේදී කියපු සමහර යෝජනා අකුරක්වත් වෙනස් නොකර මේ අය වැයටත් ඇතුළත් කරන්න සිද්ධ වුණා. මම උදාහරණ කිහිපයක් පෙන්වලා දෙන්න කැමැතියි. ආයෝජන සඳහා ජාතික තනි වෙළඳ කවුළුවක් නිර්මාණය කරනවා කියලා 2025 අය වැයේත් කිව්වා, මේ පාර අය වැයේත් කියනවා. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය පිළිබඳ පනතක් ගේනවා කියලා ගිය අය වැයේත් කියලා, ඒ විධියටම මේ අය වැයේත් කියනවා. ආයෝජන ආරක්ෂණ පනතක් ගේනවා කියලා ගිය අය වැයේත් කියලා, ඒ විධියටම මේ අය වැයේත් කියනවා. රේගු පනතක් ගැන ගිය අය වැයේත් කියලා, මේ අය වැයේත් කිව්වා. ඩිජිටල් ආර්ථික පනතක් ගැන ගිය අය වැයේදීත් කියලා මේ අය වැයේදීත් ආණ්ඩුවට කියන්න සිද්ධ වුණා.

ගරු කථානායකතුමනි, එහෙම බලනකොට තමුන්නාන්සේලා ඔළු ගෙඩි 159ක් තබාගෙන, තුනෙන් දෙකක ජන වරමකුත් තබාගෙන මේ එකක්වත් කර ගන්න බැරි වෙච්ච ආණ්ඩුවක් බවට පත්වෙලා තිබෙනවා. 2025 යෝජනා නැවත 2026 අය වැයට ඇතුළත් කළා වාගේ 2027 අය වැයටත් ඇතුළත් කරන්න තමුන්නාන්සේලා කටයුතු කළත්, ඒ ගැන අපි නම් කිසිසේත්ම පුදුමයට පත් වෙන්නේ නැහැ. මොකද, මේ ආණ්ඩුවේ කියුම් සහ කෙරුම් ගැන මේ වෙනකොට අපටත් ජනතාවටත් හොඳ අවබෝධයක් තිබෙන නිසා.

ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා බලයට එන්න පෙරත්, බලය ගත්තාට පසුවත් නිතරම කියපු තේමා පාඨයක් තිබෙනවා. ඒ තමයි රට ඩිජිටල්කරණය තුළින් අනාගතයට ගෙන යනවා කියන එක. තමුන්නාන්සේලා වර්තමාන සහ අනාගත පරම්පරාවට ඩිජිටල්කරණය සඳහා මේ පාර අය වැයෙන් වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 16ක් වුණාට, වාහන ගෙන්වන්න රුපියල් බිලියන 12.5ක් වෙන් කරලා තිබෙනවා. රටේ අනාගත පරපුරට ඩිජිටල් යුගයට ගමන් කරන්න රුපියල් බිලියන 16යි, ජනතාවට නැති කිසිම වරප්‍රසාදයක් අපට මොකටද කියපු අයට brand new වාහන ගන්න සහ රජයේ අවශ්‍යතාවලට වාහන ගෙන්වීම සඳහා රුපියල් බිලියන 12.5ක් වෙන් කරලා තිබෙනවා. වාහනවලට රුපියල් බිලියන 12.5යි. ඩිජිටල්කරණයට රුපියල් බිලියන 16යි.

ගරු කථානායකතුමනි, ඊළඟට මම කියන්න කැමැතියි, මේ රජය බලයට ගේන්න සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරපු ප්‍රධාන බලවේග ගණනාවක් පිළිබඳව අය වැය සකස් කරද්දී රජයට අමතක වෙච්ච එක ගැන. අපි මතක් කරන්න කැමැතියි, ඉතිහාසයේ කිසිම දවසක නැති විධියට මේ රජය බලයට ගේන්න ගුරුවරු දේශපාලන වශයෙන් සංවිධානය වුණු බව. එදා තමුන්නාන්සේලා ගුරුවරු දිනාගන්න ඉදිරිපත් කරපු ප්‍රධානම සටන් පාඨය තමයි, ගුරු වැටුප් විෂමතාව ඉවත් කරනවා කියපු එක. ගරු සභාපතිතුමනි, අපි එක්සත් ජාතික පක්ෂයේත් ඉඳලා තිබෙනවා. ඒ වාගේම අපි සමගි ජන බලවේගය හැටියට අද ඉන්නවා. අපට කවදාවත් ගුරුවරු දේශපාලන ආයුධයක් වුණේ නැහැ. මොකද, අපි දැනගෙන හිටියා, ගුරුවරයා සටන් බිමට

කැඳවීමෙන් හානිය වෙන්නේ අපේ දරුවන්ට බව. ගරු කථානායකතුමනි, අපි මේ අය වැය විවාදයේදී දැනගන්න කැමැතියි, මේ රජය බලයට ගේන්න ප්‍රමුඛ කාර්යභාරයක් කරපු ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව ඉවත් කරන්න මේ අය වැයෙන් කරලා තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියලා. කරුණාකරලා අපට ඒ ගැන පැහැදිලි කරන්න කියලා රජයේ වගකිවයුත්තන්ගෙන් ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, එදා දේශපාලන වේදිකාවේ කිව්වා, "ගැහැණු අපි එක මිටට" කියලා. අපි හිතුවා, මේ අය වැයෙන් කාන්තාවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරයි කියලා; ඒ ගැන පරිච්ඡේද ගණනාවක් කථා කරයි කියලා අපි බලා ගෙන හිටියා. මොකද, අපේ රටේ ජනගහනයෙන් සියයට 52කට වැඩිය ඉන්නේත් කාන්තාවෝ නිසා. නමුත්, මේ අය වැය තුළ අලින් ගැන සඳහන් කරපු තරම්වත් කාන්තාවන් ගැන කථා කරන්න ජනාධිපතිතුමාට බැරි වුණා. අලින්ගේ ප්‍රශ්නයත් බරපතළයි. නමුත් අලි ගැන පිටු ගණනක්,ඡේද ගණනක් කථා කළාට, කාන්තාවෝ ගැන එහෙම කථා කළේ නැහැ. ඒක අපට පුදුමයට හේතුවක්.

ඒ වාගේම තමයි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශයේ 103වැනි පිටුවේ සඳහන් වෙනවා, පාසල් දරුවන්ගේ පොත් සහ පාසල් උපකරණවලට පනවා තිබෙන VAT එක සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න කටයුතු කරනවා කියලා. ජනතාවට ලොකු බලාපොරොත්තුවක් ලබා දුන්නා, මේ VAT එක සම්පූර්ණයේම zero කරනවා කියලා. නමුත්, මේ අය වැයෙන්වත්, පළමු වතාවට ඉදිරිපත් කරපු අය වැයෙන්වත් ඒක කරන්න ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

මේ වන විටත් අපේ රටේ අධ්‍යාපනයේ විශාල විෂමතාවක් පවතින බව අපි පිළිගන්නට ඕනෑ. අද වෙද්දී අධ්‍යාපනය තීරණය කරන සාධකයක් බවට මුදල් පත් වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ආර්ථික අපහසුතා නිසා අධ්‍යාපනය බිඳ වැටුණු දරුවන් තුළ ඇති වෙන අසහනය පන්ති වෛරයක් බවට පත් වෙන ආකාරය හොඳටම දන්නා පිරිසක් තමයි අද මේ බලයේ ඉන්න ජනතා විමුක්ති පෙරමුණේ උදවිය. ඒ අසහනයට පත් තරුණ පිරිස තමයි අතීතයේ තමුන්නාන්සේලාගේ දේශපාලන ආයුධ බවට පත් වුණේ. එම නිසා, මේ රජයට ලොකු යුතුකමක්ව පැවතුණා, ඡන්දය කාලයේ පොරොන්දු වුණු පරිදි පාසල් උපකරණ සහ පාසල් දරුවන්ගේ පොත්පත්වල VAT එක ඉවත් කිරීමේ පොරොන්දුව ඉෂ්ට කරලා පෙන්වන්න. අය වැය දෙකක් ඉදිරිපත් කරලාත්, තවම ඒක කරලා පෙන්වන්න බැරි වුණා.

ගරු කථානායකතුමනි, එදා වැටුප් විෂමතා ඉවත් කරන්න කියලා ගුරුවරු පාරට බැස්සුවේ JVP එක. අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක් වෙන් කරන්න කියලා ගුරුවරු පෙළපාළි යන්නත්, ශිෂ්‍යයන් පාරට බස්සන්නත් මුල් වෙච්ච උදවිය තමයි අද මේ ආණ්ඩුවේ ඉන්නේ. අගමැතිනිය ඇතුළුව ආචාර්යවරු, මහාචාර්යවරු ගණනාවක් අද ඇමතිකම් දරනවා. ඒ පාගමන්වලට පවා ගිය උදවිය අද ඇමති මණ්ඩලයේත් ඉන්නවා. නමුත්, අධ්‍යාපනයට වෙන් කරපු මුදල කොච්චරද කියන එක ප්‍රකාශ කරන්නත් අපට කනගාටුයි.

ඒ වාගේම විවිධ සටන් පාඨ හරහා පෞද්ගලීකරණයට විරුද්ධව මේ රටේ වැඩිම වෘත්තීය සමිති වැඩ වර්ජන සංඛ්‍යාවක් මෙහෙයවා තිබෙන්නේත් අද රට පාලනය කරන ජනතා විමුක්ති පෙරමුණ. අද ඒ බලවේග කොහොම පෙනුණත්, එදා ඒ හැම බලවේගයක්ම තමුන්නාන්සේලාට පෙනුණේ හොඳ, මුවහත් ආයුධ හැටියටයි. ගරු කථානායකතුමනි, නමුත් පුදුමයට කරුණ නම් අද ඒ බලවේග එම ඉල්ලීම් කරනකොට තමුන්නාන්සේලා උත්තර දෙන්න ලෑස්ති වෙන්නේ "හැප්පිලා බලමු" කියන තියරි එකෙන්. ඒක තමයි අද අපට පෙනෙන්න තිබෙන්නේ.

ඇති කරපු අනෙක් system change එක තමයි, එදා රැකියා විරහිත උපාධිධාරින් පාරට බස්සන්න නායකත්වය දීපු උදවිය බලයට ඇවිල්ලා අවුරුද්දක් යනකොට අය වැය කථාවේදී කියනවා, පාරේ ඉන්නේ නැතිව ගිහින් පාඩම් කරලා විභාග පාස් වෙලා එන්න කියලා. මේවා, ඒ ජනතාව බලාපොරොත්තු වෙච්ච උත්තරද කියලා අපට අහන්න සිද්ධ වෙනවා. ගරු කථානායකතුමනි, ඉතිහාසයේ මේ තරම් අකෘතඥ ආණ්ඩුවක් අපි දැකලා තිබුණේ නැහැ. නැගපු ඉණිමගට මේ තරම් ඉක්මනට පයින් ගහන හැටි අපි දැකලා තිබුණේ නැහැ. තමන් බලයට පත් කරන්න දරදිය ඇදපු උදවියට අද සලකන හැටි ගැන අපට කනගාටුයි. ගරු කථානායකතුමනි, රැකියා විරහිත උපාධිධාරින්ටත්, වැඩ වර්ජනවල නිරත වෙලා හිටපු වැඩ බිමේ ජනතාවටත්, වෘත්තීය සමිතිවලටත් එදා ගැලවුම්කරුවන් ලෙස පෙනී හිටපු උදවිය තමයි දැන් "හැප්පිලා බලමු" තියරිය අනුගමනය කරන්නේ.

ගරු කථානායකතුමනි, අද අපි ආණ්ඩුවේ හිටියත්, විපක්ෂයේ හිටියත්, රටේ කොහේ හිටියත් අපි ඔක්කෝම නිදහසේ හුස්ම ගන්නේ අපේ විරෝදාර රණවිරුවෝ නිසාය කියන එක අපට නම් අමතක කරන්න බැහැ. නමුත්, මේ වතාවේ අය වැය ඉදිරිපත් කරද්දි රණවිරුවන් අමතක වීම ගැනත් අපි කනගාටු වෙනවා. IMF එකේ කොන්දේසිවලටත් එහා ගිහිල්ලා බදු ආදායමක් අරගෙන තිබෙන වෙලාවක අඩු තරමින් රණවිරු මා පිය රැකවරණ දීමනාව වශයෙන් කලින් ලබා දුන් සොච්චම් රුපියල් 750 දීමනාව වෙනුවට තව කීයක් හරි වැඩි කර දෙයි කියලා හෝ සාධාරණ දීමනාවක් ලබා දෙයි කියලා රණවිරුවන්ගේ පවුල්වල උදවිය අය වැය පිළිබඳව බලාපොරොත්තු තබා ගෙන හිටියා. නමුත්, මේ අය වැයෙන් ඒ බලාපොරොත්තු ඔක්කෝම සුන් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. මේ වතාවේ අය වැය සකස් කරද්දි අංශ ගණනාවක්ම සම්පූර්ණයෙන්ම අමතක කරලා තිබෙනවා. රටට කිසිම බරක් නැතුව, රටේ තේ නිෂ්පාදනයෙන් විශාල ප්‍රමාණයකට දායකත්වයක් සපයන ලක්ෂ සංඛ්‍යාත කුඩා තේ වතු හිමියෝ අපේ රටේ ඉන්නවා. එම කුඩා තේ වතු හිමියන් සම්පූර්ණයෙන්ම අය වැයේදී අමතක කරලා තිබෙනවා. කුරුඳු ගොවීන් අමතක කරලා, ඒ වාගේම රබර් වගාකරුවන් අමතක කරලා තමයි මේ අය වැය හදලා තිබෙන්නේ. මේ පිරිස් අමතක කරලා අපි කොහොමද නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නඟන්නේ කියලා මම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, පසුගිය වසරේ දත්ත දිහා බැලුවාම පෙනෙන දෙයක් තමයි, ආනයන වියදම්වලින් සියයට 51ක් ආහාරපානවලටයි අපි වියදම් කරලා තිබෙන්නේ. හාල්, පොල්, ලූණු මේ සේරම පිටරටින් ගෙනෙන්න පසුගිය කාලයේ කටයුතු කළා. ගරු කථානායකතුමනි, රටක් සංවර්ධන මාවතේ යනවා නම්, ආනයනවලින් වැඩි ප්‍රතිශතයක් වෙන් වෙන්න ඕනෑ, පරිභෝජන භාණ්ඩ ආනයනය කරන්න නොවෙයි, නිෂ්පාදන ආර්ථිකය දියුණු කරන්න අවශ්‍ය උපකරණ ගෙන්වීමටයි කියලා අපි කල්පනා කළ යුතුව තිබෙනවා. ගරු කථානායකතුමනි, බලයට එන්න ඉස්සෙල්ලා ජනාධිපතිතුමා කිව්වා වාගේ, රජයක් ඕනෑ නැහැ ඔය දේවල් කරන්න. පිටකොටුවේ තොග මුදලාලි කෙනෙකුට වුණත් ඔය වැඩේ කරන්න පුළුවන් කියලා එතුමා ම කිව්වා. ගරු කථානායකතුමනි, මේ අය වැය සකස් කරලා තිබෙන්නේ ආර්ථික සංවර්ධනයට වඩා ආර්ථිකය නඩත්තු කිරීමේ ඉලක්ක සපුරා ගැනීමටයි. ඒක අය වැය දිහා සම්පූර්ණයෙන් බලනකොට හොඳට පැහැදිලිව පෙනෙනවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ගරු කථානායකතුමනි, IMF එකේ උපදෙස්වලටත් එහා ගිහිල්ලා, මේ ආණ්ඩුව ජනතාවට බදු ගහලා තිබෙනවා. අපේ විපක්ෂ නායකතුමා ගණන් හිලව් එක්ක පෙරේදා පෙන්වලා දුන්නා, IMF එකේ ඉලක්කයට වඩා කොච්චර ප්‍රමාණයක් ජනතාවගේ බොටුව මිරිකලා බදු අරගෙන තිබෙනවාද කියලා. VAT එක සහ සමාජ ආරක්ෂණ බද්ද ඇතුළු බදු දැල මේ අය වැයෙන් ප්‍රසාරණය කරලා තිබෙනවා. මේ හේතුවෙන් දවසකට රුපියල් ලක්ෂයක වෙළඳාමක් හරි සේවාවක් හරි සපයන කෙනෙක් අලුතින් VAT එක සහ සමාජ ආරක්ෂණ බද්දට අහු වෙනවා. මොකද, පවතින බදු බරට අමතරව, සාමාන්‍ය මිනිස්සුන්ට බර පටවපු බද්දක් හැටියට ඒක ඉස්සරහට ක්‍රියාත්මක වෙනවා.

අපේ රටේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් කොරෝනා වසංගතයෙන් පසුව විශාල බිඳ වැටීමකට පත් වුණා. ඒ අයට ගත්ත ණය ගෙවා ගන්න බැරි වුණා. ඒ සමහරුන්ගේ දේපළ වෙන්දේසි කළා. ඒ ව්‍යාපාරවලට යළි නැඟී සිටින්න මේ බදු සීමාව බාධාවක් වාගේම, VAT එක ඇතුළු ඒ සියල්ල ගෙවන්නේ පාරිභෝගිකයෝ බවත් අපි අමතක කරන්න නරකයි.

ගරු කථානායකතුමනි, මේ බදු ප්‍රසාරණය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට විතරක් නොවෙයි, තවත් බොහෝ පිරිසකට බලපානවා. මම කැමැතියි, එක උදාහරණයක් කියන්න. ජාත්‍යන්තර පාසල්වලට දරුවන් යවන දෙමව්පියන්ටත් සියයට 20.5ක අමතර බද්දක් මේකෙන් පස්සේ පැනවෙනවා. තව ගොඩක් අය ගැන කියන්න පුළුවන්. නමුත් වේලාව මදි.

ඒ වාගේම තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශනයේ 194 වෙනි පිටුවේ සඳහන් කාරණා කිහිපයක් ගැන කිව යුතුව තිබෙනවා. ඒකේ කියනවා, "නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරනු ලබන අතර එය මහජනතාව වෙත ඉදිරිපත් කර, සංවාදයකින් අනතුරුව අවශ්‍ය වෙනස්කම් සිදුකොට ජනමත විචාරණයකද සමඟ සම්මත කර ගනු ඇත" කියලා. ඒකේම පොරොන්දු වෙනවා, විධායක ජනාධිපති ආණ්ඩු ක්‍රමය අහෝසි කොට පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා විධායක බලතල රහිත ජනාධිපතිවරයෙක් පත් කරන හැටි. නව පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දෙනවා කියලා තමයි ජන වරමක් ගත්තේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over now.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මම තව එක විනාඩියක් ඔබතුමාගෙන් ඉල්ලනවා.

ඉතින්, අපි ඒවා ගැන අහන්න කැමැතියි. නමුත් දෙවැනි අය වැය ඉදිරිපත් කරලාත් ඒ කිසිවක් ගැන සඳහන් වෙලාත් නැහැ; කිසිම මුදලක් වෙන් කරලාත් නැහැ. ඒවා කඩවුණු පොරොන්දු බවට පත් වෙන්නද යන්නේ කියන එක ගැන අපට සැකයක් තිබෙනවා.

ඒ වාගේම අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න කැමැතියි. මේ රජය බලයට එන්න පෙර ජනතාවට කිව්වා, වසරක් ඇතුළත පළාත් සභා ඡන්දය පවත්වනවා කියලා. එදා අපේ පක්ෂයේ මහ ලේකම්තුමා ජනාධිපතිතුමා අය වැය ඉදිරිපත් කරනකොට ඇහුවා, පළාත් සභා ඡන්දය ගැන. එතුමා කියනවා, මෙන්න මෙහෙම. "අපි ලෑස්තියි. ඡන්දය පවත්වන්න මේ අය වැයෙන් රුපියල් බිලියන 10ක් වෙන් කරලා තිබෙනවා" කියලා. "ඡන්දය පවත්වන්නේ කවද්ද කියලා මට තීරණය කරන්න බැහැ. ඡන්දය පවත්වන්නේ කවදාද කියලා තීරණය කරන්නේ මේ පාර්ලිමේන්තුව. තමුන්නාන්සේලා මට නීතියක් හදලා දෙන්න" කියලා එතුමා කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
තව විනාඩියක් දෙන්න. විනාඩියකින් මම ඉවර කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතකොට විනාඩි දෙකයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
හැමදාම කරීක ලැයිස්තුව හදන මම, අද විනාඩියක් ගත්තාට අසාධාරණයක් නැහැ, කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට ගන්න පුළුවන්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මිනිත්තුවකින් මම ඉවර කරන්නම්.

ගරු කථානායකතුමනි, සමස්ත විපක්ෂයේ සෙසු නායකයන් එක්කත් කථා කරලා, අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් ඉක්මනින් මේ සඳහා කමිටුවක් පත් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලන්න බලාපොරොත්තු වෙනවා. තමුන්නාන්සේලා වසරකින් පළාත් සභා ඡන්දය තියනවා කියපු පොරොන්දුව කඩිනමින් ඉෂ්ට කරන්න. ඒ සඳහා අපි සම්පූර්ණයෙන් සහාය දෙන්නම්. පැවති ක්‍රමයට හරි ඡන්දය තියලා ජනතාවට අවස්ථාවක් දෙමු, පළාත් සභාව ස්ථාපනය කරන්න.

අවසාන වශයෙන් මෙන්න මේ ටික මම කියනවා. මහපොළ ශිෂ්‍යත්වය ගැන දෙපැත්තේම මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් කථා කළා. මම ඒ ගැන අවංකව සතුටු වෙනවා. මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය ඇති කළේ කොයි ආණ්ඩුවෙන්ද, කොයි වාගේ කෙනෙක්ද කියන එක නොවෙයි වැදගත් වෙන්නේ. කවුරු ආණ්ඩුවක් කළත් ඒකේ වටිනාකම වටහා ගැනීම ගැන අපි සතුටු වෙනවා. මහපොළ පටන් ගත්තේ මගේ ගමේ නියාගම විජිත මහා විද්‍යාලයෙන්. මහපොළ100 වැනි සංවත්සරය තිබුණේ මම නියෝජනය කරන ඇල්පිටිය ආසනයේ ආනන්ද විද්‍යාලයේ. ලලිත් ඇතුළත්මුදලි මැතිතුමා බොහොම කීර්තිමත් දේශපාලනඥයෙක්. ශිෂ්‍යත්වයේ වටිනාකම දන්නා, උගත්කමේ වටිනාකම දැන ගත්ත කෙනෙක්. ඒ නිසා ඒ ගැනත් අපි සතුටු වෙන බව ප්‍රකාශ කරමින්, මට අමතර විනාඩි දෙක තුනක් ලබාදීම ගැනත් ඔබතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Sunil Handunnetti.  You have 20 minutes.

[පූ.භා. 11.28]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ ආණ්ඩුවේ දෙවන අය වැය විවාදයේදී අදහස් ප්‍රකාශ කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

මුලින්ම කියමන් දෙකක් ගැන මම කියන්නම්. ගරු කථානායකතුමනි, රුසියානු කියමනක් තිබෙනවා, "වස්කා නම් බළලා ඇහුම්කන් දෙයි, එහෙත් දිගටම කාගෙන යයි" කියලා. අපි දන්නා තවත් කියමනක් තිබෙනවා, "බොරුවට නිදාගෙන ඉන්න අය නැඟිට්ටවන එක අමාරුයි, ඒකට උත්සාහ කරන්න එපා" කියලා. මගේ කථාවේදී මම පැහැදිලි කරන්නම්, මේ කියමන් දෙක මම මෙතැනට අදාළ කර ගත්තේ ඇයි කියලා.

මේ දවස් ටිකේ අය වැය විවාදයේදී ඇසුණු, මේ අය වැය ගැන විපක්ෂයේ තිබෙන ප්‍රධාන විවේචන කිහිපයක් අපි ගනිමු. එකක් තමයි, බදු ගහලා තිබෙනවා, ආණ්ඩුව භාණ්ඩාගාරය උතුරන්න ආදායම එකතු කරගෙන තිබෙනවා, හැබැයි ඒවා ජනතාවට බෙදලා දෙන්නේ නැහැ කියන එක. දෙවැනි එක තමයි, ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට වාහන ගන්නවා කියන එක. මේ පාර්ලිමේන්තුවෙන් එළියට වීසි වෙච්ච කෙනෙක් මාධ්‍ය සාකච්ඡාවක් තියලා කියනවා මම දැක්කා,  වෘත්තිකයන්ගේ වාහන පර්මිට් එක නවත්තලා ජනතා විමුක්ති පෙරමුණේ කාඩර්වරුන්ට ආණ්ඩුව වාහන 1,750ක් අරන් දෙන්න හදනවා කියලා. ඒ එක්කම කියනවා, 2027දී -මේ 2026 අය වැය- දේපළ බද්දක් එන්න නියමිතයි කියලා. බලනකොට ඒ ඔක්කෝගෙන්ම තේරෙන දේ තමයි, විපක්ෂයට මේ අය වැය පිළිබඳව, අය වැයේ දිශානතිය පිළිබඳව, අය වැයේ අරමුණු පිළිබඳව කථා කරන්න දෙයක් නැහැ කියන එක.

සුපුරුදු විධියටම මේ අය කියන තවත් දෙයක් තමයි, අපි IMF එක කියනවාටත් වඩා  IMF එකේ වුවමනාවට මේ අය වැය හදලා තිබෙනවා කියන එක. මෙහෙමයි. හැම ආණ්ඩුවක්ම IMF එකත් එක්ක වැඩ කරන්න පටන් ගත්ත කාලයේ ඉඳලා IMF එකේ එකඟතා, නිර්දේශ එක්ක වැඩ කරලා තිබෙනවා. පසුගිය ආණ්ඩුත් එහෙමයි. ඔබතුමන්ලාගේ ආණ්ඩුත් එහෙමයි. ඔබතුමන්ලාට බැරි වෙච්ච දේ තමයි, IMF එක ඉදිරිපත් කරපු නිර්දේශ, කොන්දේසි හා මොනවා හරි එකඟතා රටේ ජනතාවගේ යහපත වෙනුවෙන්, ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් හරියට යොදාගන්න බැරි වෙච්ච එක. ඒ, ඔබතුමන්ලා ඒකට අකැමැති නිසා නොවෙයි. ඔබතුමන්ලා ඒකට කැමැතියි. මේ කවුරුවත් කථා කරද්දි කිව්වේ නැහැ නේ, අපි IMF එක ඉදිරිපත් කරපු එකඟතාවලට අකැමැතිව වැඩ කළා කියලා. "අපේ ආණ්ඩුවට IMF එක ඉදිරිපත් කරපු දේවල් ක්‍රියාත්මක කරන්න අපි විරුද්ධ වුණා, ඒක නිසා මම කැබිනට් මණ්ඩලයෙන් එළියට බැස්සා" කියලා කවුරුත් කිව්වේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා ඒකට කැමැතියි. නමුත් ප්‍රශ්නය මේකයි. ඔබතුමන්ලාට ඒවා ක්‍රියාත්මක කරගන්න යාන්ත්‍රණයක් තිබුණේ නැහැ, ක්‍රමයක් තිබුණේ නැහැ, පැවති ආණ්ඩුවලට ඒ සඳහා කළමනාකරණයක් තිබුණේ නැහැ, කොටින්ම ගත්තොත් විනයක් තිබුණේ නැහැ.

ගරු කථානායකතුමනි, ආර්ථිකයක් හසුරුවද්දි වැදගත්ම දේ තමයි, ආර්ථික විනය, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය. ඒවා එතුමන්ලා කිව්ව වාක්‍ය විතරයි, ක්‍රියාවට නැඟුණේ නැහැ. අපි මොකද කළේ? අපේ ආණ්ඩුව ඒ ඇති කර ගත්ත එකඟතා ක්‍රියාත්මක කරලා ඒවා රටේ ජනතාවගේ යහපත වෙනුවෙන් යොදා ගත්තා. ඒකේ වැරැද්දක් නැහැ. හරි නම් එතුමන්ලා දැන් ඒ ගැන සතුටු වෙන්න ඕනෑ. ඒ අයට කරන්න බැරි වෙච්ච දේ අවුරුද්දක් ඇතුළත අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය කළා, ඒ සිද්ධ කිරීම විසින් රටේ ආර්ථිකය අද ස්ථාවර තැනකට ගෙනැල්ලා තිබෙනවා කියලා. ඒකයි වැදගත් වන්නේ.

අපි දැන් කරමින් ඉන්නේ මොකක්ද? අපි දැන් කරමින් ඉන්නේත් එතුමන්ලා ක්‍රියාවට නඟන්න උත්සාහ කරපු රටේ රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලීකරණය වෙනුවට, විකුණා දැමීම වෙනුවට ඒ රාජ්‍ය ව්‍යාපාර ලාභ ලබන තත්ත්වයට පත් කරගන්න නිසි ලෙස කළමනාකරණය කරන එක. ඒක නරකද? ඒක IMF එක යෝජනා කළත්, අපි කිව්වත් නරක දෙයක් නොවෙයි. අපි අපේ රාජ්‍ය ව්‍යාපාරවල තිබෙන වියදම්, නාස්තිය, දූෂණය ඉවර කරලා clean කරනවා. ඒක නරක දෙයක් නොවෙයි. බදු තාර්කීකරණය අපි කරලා තිබෙනවා. බදු තාර්කීකරණය නරක දෙයක් නොවෙයි.

ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව කිව්වොත්, රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලීකරණය හරහා විකිණීම වෙනුවට ආයතන 10ක ව්‍යවස්ථාපිත ගෙවීම් සම්පූර්ණයෙන්ම භාණ්ඩාගාරය භාරගෙන ඒ බර ඒ ආයතනවලින් නිදහස් කරලා තිබෙනවා. ඒ, මගේ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබෙන සීමාසහිත ලංකා සීනි සමාගම ඇතුළුව. එතුමන්ලා කිව්වේ, ශ්‍රී ලන්කන් ගුවන් සමාගම රුපියලකටවත් ගන්න කෙනෙක් නැහැ කියලායි. එම ආයතනය විකුණන්න ලැයිස්තුගත කරලා තිබුණේ. දැන් මේ අය වැයෙන් ඩොලර් මිලියන 174ක් වෙන් කරන්න යෝජනා කර තිබෙනවා, ඒ ණය පියවා නිදහස් කරන්න. ඒක වැරදිද? මම එතුමන්ලාගෙන් අහනවා, ඒක හොඳ දෙයක්ද, නරක දෙයක්ද කියලා.

පෞද්ගලීකරණය කරනවා වෙනුවට ශ්‍රීලන්කන් ගුවන් සමාගම රාජ්‍යය යටතේ තියාගෙන දියුණු කිරීම නරක දෙයක් කියලා ඔබතුමන්ලා කියනවාය කියලා මම හිතන්නේ නැහැ. ඒක වැරදි දෙයක් කියලා ඔබතුමන්ලා කියන්නේ නැහැ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යෝජනා කළත්, අපි එකඟතාවට ආවත්, අපේ පැත්තෙන් යෝජනා කළත් ඒක නරක දෙයක් කියලා ඔබතුමන්ලා කියනවාය කියලා මම විශ්වාස කරන්නේ නැහැ.

ඒ වාගේම රාජ්‍ය ව්‍යාපාරවලට දීලා තිබුණු ඇපකර නිරවුල් කරනවා. ඒක නරක දෙයක් කියලා IMF එක කියනවාය කියා ඔබතුමන්ලා කියන්නේ නැහැ. ඔබතුමන්ලා හිටියත් ඒක ක්‍රියාත්මක කරනවා. හැබැයි, ඔබතුමන්ලාට ඒක කරගන්න බැරි වුණා.

ඒ වාගේම රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම සඳහාත් මෙවර අය වැයේ යෝජනාවක් තිබෙනවා. ඒ, IMF එක කියලා නොවෙයි. හැබැයි, අපි ඒක යෝජනා කරනවා. ඒකට ඔබතුමන්ලා විරුද්ධ වෙනවා කියලා මම හිතන්නේ නැහැ. මම දැක්කා, සමහර මන්ත්‍රීතුමන්ලා ඒ ගැන හොඳ කියලා තිබෙනවා.

බදු සම්බන්ධයෙන් උදාහරණ කිහිපයක් මම කියන්න ලෑස්තියි, ගරු කථානායකතුමනි. අපි කොහොමද බදු තාර්කිකකරණය කළේ? බදු සම්බන්ධයෙන් හැම අය වැයකම තිබුණේ මෙන්න මෙහෙම දෙයක්. එක්කෝ සිගරට් බද්ද වැඩි කරනවා, එක්කෝ මත්පැන් බද්ද වැඩි කරනවා, එක්කෝ ගෑස් මිල වැඩි කරනවා, එක්කෝ තෙල් මිල වැඩි කරනවා, එක්කෝ විදුලි

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

බිල වැඩි කරනවා. එහෙම නැත්නම් ඍජුව පනවන බදුවල බඩු මිල වැඩි කරනවා. හැබැයි, ඒ වෙනුවට අපි මොකද කළේ? 2025 සැප්තැම්බර් 30 වෙනකොට ලියාපදිංචි බදු ගෙවන සාමාජික ප්‍රමාණය 2024 වසරට සාපේක්ෂව ලක්ෂ 3කින් වැඩි කරගෙන තිබෙනවා. බදු ගෙවන්න ඕනෑ අය, බදු ගෙවන ප්‍රමාණය වැඩි කරගෙන තිබෙනවා. ඒක නරක දෙයක් නොවෙයි. IMF එක කිව්වත්, ඔබතුමන්ලා කිව්වත් ඒක නරක දෙයක් නොවෙයි. IMF එක ඔබතුමන්ලාටත් ඒක කියන්න ඇති. හැබැයි, කරගන්න බැරි වුණා. ඒ, ක්‍රියාවලියේ තිබුණු ගැටලු නිසා, කළමනාකරණයේ තිබුණු ගැටලු නිසා, නායකත්වයේ තිබුණු ගැටලු නිසා. මම කියන්නේ ඒකයි.

වාර්ෂික පිරිවැටුම් සීමාව 2026 අප්‍රේල් සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් මිලියන 60 ඉඳලා රුපියල් මිලියන 36 දක්වා අඩු කර තිබෙනවා. ඒකෙන් වැට් එකේ බදු පරාසය වෙනස් කරලා තිබෙනවා. අපි කවුරුත් පිළිගන්නවා, අප ආරම්භ කරන සංවර්ධන ගමන යන්න ආදායම් අවශ්‍යයි කියලා. මල නොතලා රොන් ගන්නා සේ ඒ බඩුවලට අදාළ වැට් එක පනවලා, ඒක නිසා බඩු මිලට එකතු කර තිබෙන මුදල රජයට ගන්නවා. ඒක IMF එක කිව්වාය කියලා වැරදි දෙයක් නොවෙයි. ඔබතුමන්ලා හිටියත් ඒක ගන්නවා. හැබැයි, ඔබතුමන්ලාට ගන්න බැරි වුණා. ඔබතුමන්ලාට ක්‍රියාත්මක කරගන්න බැරි වෙච්ච දේ තමයි අද ජනතාවගේ කැමැත්තෙන් අපි මේ ක්‍රියාවට නඟලා තිබෙන්නේ.

ඒ වාගේම අපි ජාතික තීරු බදු ප්‍රතිපත්තිය ක්‍රියාවට නඟනවා. මෙතැන ඉන්න විපක්ෂයේ මන්ත්‍රීවරු කියන්න, ජාතික තීරු බදු ප්‍රතිපත්තිය වැරදිද, නරකද කියලා? ඒක හොඳ දෙයක් නම් ඒක කරන එකේ වැරැද්දක් නැහැ. ආනයනික රෙදි මත අය කරන සෙස් බද්ද ඉවත් කරලා වැට් එක පනවනවා. Level playing field එකක් දෙනවා. ඒකෙන් දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කරනවා. මම කියන්නේ නැහැ, ඒක කවුරුවත් මෙතැනදී විවේචනය කළා කියලා. ඒ ගැන විපක්ෂයට විවේචනයක් තිබෙනවා නම් දැන් කියන්න. මේ යෝජනාව අපි ක්‍රියාත්මක කරනවා.

අපි 2024 - 2025 දක්වා කාලයේ ආදායම වැඩි කරගෙන තිබෙන්නේ අලුතින් බදු පනවලා නොවෙයි. විපක්ෂ නායකතුමා හරි කවුරු හරි කිව්වාද, මේ කාලය ඇතුළත අපි මෙන්න මේ බද්ද අලුතින් පනවා ආදායම වැඩි කරගත්තා කියලා? රුපියල් බිලියන 900ක බදු කාර්යක්ෂමතාව ඇති කරලා, බදු ගෙවන ජනතාව උනන්දු කරලා, බදු යාන්ත්‍රණය ශක්තිමත් කරලා සහ ව්‍යාපාරික පරිසරය හදලා අපි බදු එකතු කරගෙන තිබෙනවා. දැන් ඔබතුමන්ලා කියන්නේ මොකක්ද? "ඔයගොල්ලන් එකතු කළා නම් වියදම් කරන්න" කියනවා. හරි, අපි වියදම් කරනවා. හැබැයි ඒ අපේ ආණ්ඩුව වට්ටාගෙන නොවෙයි, මේ ආර්ථිකය වට්ටාගෙන නොවෙයි. මේ කිසිම ඇමතිවරයෙකුගේ දේශපාලන ප්‍රතිරූපය පුම්බා ගන්න අපි බදු ආදායම් වියදම් කරන්නේ නැහැ. ඒක නිසි සැලැස්මකට අනුව අපි ක්‍රියාත්මක කරනවා.

මේ අය වැයේ වැඩියෙන්ම තිබෙන්නේ මොනවාද? බදු ආදායම ආරක්ෂා කරගෙන පරිස්සමින් වියදම් කිරීම. අපේ බොහෝ යෝජනා තිබෙනවා, ශක්‍යතා අධ්‍යයනවලට යොමුවන. 2026දී අපි විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරනවා, ශක්‍යතා අධ්‍යයනවලට - feasibility reports - ගරු කථානායකතුමනි. ඇයි, ඒ? ඉවක් බවක් නැතුව වියදම් කරන්න අපට වගකීමක් නැහැ. එහෙම වගකීමක් ජනතාව අපට පවරා නැහැ. අපේ මේ අය වැයේ සම්පූර්ණ දිශානතිය තිබෙන්නේ ආර්ථිකය ස්ථාවර කිරීමේ ගමන ආරම්භ කිරීමටයි, ගරු කථානායකතුමනි. අන්න ඒ කාරණය වෙනුවෙන් තමයි ජනාධිපති අනුර දිසානායක සහෝදරයා ඔබතුමන්ලා මොන විවේචන ඉදිරිපත් කළත් මේ ස්ථාවර ගමන යන්නේ. ඒ නිසායි එතුමා ආරම්භ කරපු ගමන නවත්වන්න බැරි.

ගරු අනුර දිසානායක ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව අය වැය කථාව ඉදිරිපත් කරමින් මෙන්න මෙහෙම කියනවා. අය වැය කථාවේ පිටු අංක 56හි මෙසේ සඳහන් වෙනවා:

> "මේ අපි යන ගමනේ දී සතුරන්ගේ වියරු කෑගැසීම් අපට නෑසෙන බවත්, රටේ පුරවැසියන්ගේ අධිෂ්ඨානශීලී බලාපොරොත්තු සහගත දෑස් පමණක් අපට පෙනෙන බවත් සිහිපත් කරනවා."

මම අර රුසියානු කියමන කිව්වේ ඔන්න ඕකට. රුසියානු කියමනක් තිබෙනවා, "වස්කා නම් බළලා ඇහුම්කන් දෙයි, එහෙත් ඌ කාගෙන යයි" කියලා. බළලුන්ට කෑම දැම්මාම අපි ඒක දකිනවා. අපි මොන බාධාව කළත් බළලා කනවා, නවත්වන්නේ නැහැ. හැබැයි, පොඩ්ඩක් කන දීලා අහගෙන ඉන්නවා. එච්චරයි. අපේ ගමනත් එහෙම තමයි. දැන් බලන්න, මොකද වෙලා තිබෙන්නේ කියලා.

අධිවේගී මාර්ග පුළුල් කිරීමට, සමස්ත මාර්ග පද්ධතියට රුපියල් මිලියන 342,000ක් වෙන් කරලා තිබෙනවා. රුපියල් මිලියන 342,000ක් වෙන් කරලා තිබෙන්නේ කාගේ සල්ලිද? ඒ ජනතාව අරපරිස්සමින් අපට දුන්නු බදු මුදල්. කඩවත-මීරිගම අධිවේගී මාර්ගය, රඹුක්කන-ගලගෙදර අධිවේගී මාර්ගය, කුරුණෑගල-දඹුල්ල අධිවේගී මාර්ගය ඉදිකිරීම පිළිබඳවත් මෙවර අය වැයේ සඳහන් කර තිබෙනවා. ලබන වසරේ ගෙවන්න තිබෙන ණය මුදල් ඉතුරු කරගෙන මේ වසරේ රඹුක්කන-ගලගෙදර මාර්ගය හදනවා. අපි ලබන වසරේ ගෙවන්න තිබෙන ණය මේ වසරේ ගෙවලා මුදල් ඉතුරු කරගෙන ඒ මාර්ගය හදනවා. ඒ මොකටද? අධිවේගී මාර්ග අවශ්‍යයි. අධිවේගී මාර්ග පද්ධතියෙන් ආර්ථිකයට අලුත් පණක් දෙනවා. හැබැයි, මේවා කලින් කරපු විධිය ගැන අවශ්‍ය නම් අපට වෙනම විවාද කරන්න පුළුවන්. කටුනායක අධිවේගී මාර්ගයෙන්, දක්ෂිණ අධිවේගී මාර්ගයෙන් කරපු ගසාකෑම් පිළිබඳව අපි වෙනම කථා කරමු.

ඊළඟට, බලශක්තිය ගනිමු. බලශක්තිය අලුත් කරන්න, වැඩි කරන්න විශේෂයෙන්ම green hydrogen energy වාගේ ඒවා දැන් අපි අත්හදා බලනවා. ඒවා ඊළඟ අවුරුද්දට අපට ඕනෑ. අපේ සංවර්ධන සැලැස්මට ඒවා ඕනෑ. ඒ වෙනුවෙන් අපි මුදල් වෙන් කරලා තිබෙනවා.

මඩකලපුව, මාතර, කොළඹ, කොලොන්නාව යන හැම ප්‍රදේශයකම නාගරික ජල ගැලීම් පාලනයට විශාල මුදල් ප්‍රමාණයක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි සැලැස්මක් නැතුව කොච්චර සංවර්ධනය කළත් වැඩක් නැහැ, බිල්ඩින් හැදුවත් වැඩක් නැහැ, පොඩි වතුර පහරකට, ජල ගැලීමකට හසුවෙලා ඒවා විනාශ වෙනවා නම්. එතකොට ආයෝජකයන් එන්නේ නැහැ. කර්මාන්ත පවත්වා ගෙන යන්න බැහැ.

පානීය ජල පහසුකම් වෙනුවෙන් රුපියල් මිලියන 85,700ක් වෙන් කරලා තිබෙනවා. මේ මුදල් වියදම් කරන්නේ ජනතාව වෙනුවෙන්. දැන් ඔබතුමන්ලා අපට කියන්නේ වියදම් කරන්න නේ. ඉතින්, පාරවල් හදන්න රුපියල් මිලියන 342,000ක්, පානීය ජලය දෙන්න රුපියල් මිලියන 85,700ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. මේවාට වියදම් කරනවා තමයි. මේවාට තමයි වියදම් කරන්නේ. ඒ, සංවර්ධනය වෙනුවෙන්. ගරු කථානායකතුමනි, පොදු ප්‍රවාහනයට රුපියල් මිලියන 67,200ක් - කෝටි 6,720ක්- ලබන අවුරුද්දේ මාස 12ට වියදම් කරන්න අපි සැලසුම් කරලා තිබෙනවා. අපි ඒ මුදල වියදම් කරනවා තමයි.

දැන් කැබ් රථ ගේනවා කියනවා නේ. සමහර අය කියනවා, ඒවා විශාල අර්බුද කියලා. ඒවා විශාල අර්බුද නොවෙයි. අපට මේ අවුරුද්දේ ඉතුරු වෙච්ච මුදල්වලින් අපි මේ කටයුතු කරන්නේ. සමහරු කියනවා, තවම අය වැය සම්මත වුණේ නැහැ නේ, කොහොමද ඇණවුම් කරලා තිබෙන්නේ, ටෙන්ඩර් කැඳවලා තිබෙන්නේ කියලා. ඒවා කරන්නේ මේ අවුරුද්දේ මුදල්වලින්. මේ අවුරුද්දේ මුදල්වලින් වියදම් කරන්න අපට කාගෙන්වත් බාධාවක් නැහැ. අපි ලබන අවුරුද්දට මුදල් අනුමත කර ගන්න කටයුතු කරමින් යනවා. අපට මේ අවුරුද්දේ මුදල් ඉතුරු වෙලා තිබෙනවා. ඔබතුමන්ලාට ඒක පොඩි විපරීත තත්ත්වයක් වෙන්න පුළුවන්. මොකද, මේ වාගේ අත්දැකීමක් විපක්ෂයේ අයට නැහැ. ඒ අය මුදල් ඉතුරු කරලා නැහැ. අය වැය ඉවර වෙනකොට ඔක්කොම මුදල් ඉවරයි. ඌන උපයෝජිත ගොඩනැඟිලි යළි භාවිතයට ගන්නවා. ඇමතිවරුන්ගේ නිල නිවාසවල ඉඳලා රට පුරාම නටබුන් වාගේ ඌන උපයෝජිත රජයේ ඉඩම්, රජයේ ගොඩනැඟිලි තිබෙනවා. ඒවා සැලැස්මකට අනුව ගරු කථානායකතුමනි, අපි භාවිතයට ගන්නවා. ග්‍රාමීය මාර්ග හදන්න රුපියල් මිලියන 24,000ක්, ග්‍රාමීය පාලම්වලට රුපියල් මිලියන 2,500ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒවා ගැන බලන්න.

ඒ වාගේම මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන කර්මාන්ත වෙනුවෙන් විතරක් රුපියල් බිලියන 120ක් වෙන් කරලා තිබෙනවා. ඒ, මෙවර අය වැයෙන්. ඒකෙන් කියන්නේ මොකක්ද? කර්මාන්ත ප්‍රවර්ධනයට රුපියල් බිලියන 19ක්, සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත වෙනුවෙන් රුපියල් බිලියන 55ක්, ශ්‍රම බළකාය වර්ධනය කරන්න රුපියල් බිලියන 7.6ක්, සංචාරක පහසුකම් වෙනුවෙන් රුපියල් බිලියන 3.1ක්, වෙළෙඳ පහසුකම් වෙනුවෙන් බිලියන 0.7ක්, සම්පූර්ණ තැපැල් සේවා වෙනුවෙන් රුපියල් බිලියන 29.5ක් වෙන් කරලා තිබෙනවා. ඒවා මොනවාටද? ගරු විපක්ෂ නායකතුමනි, සුළු, මධ්‍යම, කුඩා ව්‍යවසායන්ට ණය දෙන්න විතරක් රුපියල් මිලියන 80,000ක් වෙන් කරලා තිබෙනවා. ලංකා ඉතිහාසයේ වැඩිම මුදල් ප්‍රමාණයක් සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර වෙනුවෙන් වෙන් කරපු අය වැය තමයි, මේ අය වැය. ඒකට රුපියල් බිලියන 80ක් වෙන් කරලා තිබෙනවා. කල්පනා කරලා බලන්න. මේ වෙන් කරලා තිබෙන්නේ, අවුරුදු පහකට නොවෙයි, ලබන අවුරුද්දට. ඔබතුමන්ලා මේ අය වැය දෙසැම්බර් මාසයේ සම්මත කළාට පස්සේ, ජනවාරි මාසයේ ඉඳලා අලුතින් ව්‍යාපාර ආරම්භ කරන්න සිටින, අලුතින් කර්මාන්ත ආරම්භ කරන්න සිටින, අලුතින් අපනයන ක්ෂේත්‍රයට එන්න ඉන්න, කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ කර්මාන්ත ආරම්භ කරන්න සිටින හැම දෙනාටම ණය පහසුකම් දෙන්න, අපි රුපියල් බිලියන 80ක අරමුදලක් හදලා තිබෙනවා. ඒ එක එක අමාත්‍යාංශවලට වෙන වෙනම නොවෙයි, ඔක්කොම ඒකාබද්ධ කරලා. මේක ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක්. ඒ නිසා තමයි අපි ඔබතුමන්ලාට කියන්නේ, සුපුරුදු අය වැය විවේචනය මේකට අදාළ නැහැ කියලා.

අපි කලින් අවුරුද්ද ගත කළා, ආර්ථිකයේ පැවතුණු අස්ථාවර තත්ත්වය ඉවත් කර ස්ථාවර කරගන්න. අද අපි පටන් ගන්නවා, ගමන ආරම්භ කරන්න. ඒ ගමන ආරම්භ කරද්දී අද ඔබතුමන්ලාට ඒකට එක එක වචන කියනවා. ඔබතුමන්ලා කලබල වෙනවා. ඒක ස්වාභාවිකයි. ඔබතුමන්ලා කියනවා, දැන් තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්ති නොවෙයි, දැන් තිබෙන්නේ NPP එකේ ප්‍රතිපත්ති නොවෙයි, දැන් දකුණට යනවා කියලා. ඕනෑ විධියකට හිතා ගන්න. ඔබතුමන්ලා එක පැත්තකින් කියනවා, මේක චීනයට අරගෙන යනවා කියලා. මේක neo-liberal කියලා. අනෙක් පැත්තෙන් කියනවා, ගමේ ශාඛා සමිතිවල ඉඳලා ඔක්කොම ඒකාබද්ධ කරලා, ඔක්කොම සමිති දමාගෙන තනි පක්ෂ පාලනයකට යනවා කියලා. අනුර දිසානායක ජනාධිපතිතුමා හිට්ලර් වෙන්න හදනවා කියනවා. මට නම් තේරෙන්නේ නැහැ, neo-liberal ක්‍රමයට යන එකයි, හිට්ලර් වෙන්න යන එකයි. අපේ ආර්ථික ගමන ගැන ඔබතුමන්ලා නොදැන කියවන්න ගියාම වෙන පටලැවිල්ල තමයි මේ තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have only two more minutes.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

විශේෂයෙන්ම සදාහරිත ජීවිතයක් වෙනුවෙන් රුපියල් බිලියන 53ක් වෙන් කරලා තිබෙනවා. ආබාධිත පුද්ගලයන්ට ප්‍රවේශය ඇති කරන්න, මේ ආදී විවිධ දේවල් වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. වෙන එකක් තියා, වීදියේ ඉන්න සුනඛයන් සම්බන්ධයෙන් පවා රුපියල් මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා. මොකද, ඒක බරපතළ ප්‍රශ්නයක්, කොළඹ වාගේ නගරවල. නාගරික ප්‍රදේශවල සුරතලයට ඇති කරන බල්ලෙක් නැති වුණොත්, ඊළඟට අවශ්‍ය වැඩකටයුතු කරගැනීමේදී ගැටලු ඇති වනවා. අය වැයෙන් ඒ මිලියන 100 වෙන් කරලා තිබෙන්නේ, වීදි සුනඛයන් වෙනුවෙන් සහ ඒ සුනඛයන්ට අවශ්‍ය සුනඛාගාර හදන්න. කල්පනා කරලා බලන්න. දැන් කියනවා, මේක මිනිස්සු අතහැරපු අය වැයක් කියලා. මිනිස්සු නොවෙයි, මේක සතා සිවුපාවා ගැන පවා හිතපු අය වැයක්. අලි ඇතුන් ගැන පවා හිතපු අය වැයක්. කල්පනා කරලා බලන්න.

මම විශේෂයෙන්ම මතු කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ දවස්වල අපට විශාල ප්‍රසිද්ධියක් ලබා දෙනවා, සීනි සම්බන්ධ කරගෙන. ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න, ඔබතුමාට ඒ ගැන කියන්න. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, අපි දුඹුරු සීනි විතරක් නොවෙයි, උක් පැණි, උක් හකුරු, උක් ගස් ආදී උක් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කරන්න, පෙරේදා නුගේගොඩ outlet එකක් දැම්මා. ඒකේදී මම ඉල්ලීමක් කළා, මාධ්‍යවේදීන්ගෙන් සහ සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයන්ගෙන් මේක ප්‍රචලිත කරන්න උදවු කරන්න කියලා. ඇත්තටම ඒ ප්‍රචාරය වෙනුවෙන් මම ගොඩක් ස්තුතිවන්ත වෙනවා. සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයන් අපට විශාල සහයෝගයක් දුන්නා. කොච්චර සහයෝගයක් දුන්නාද කිව්වොත්, මට දැන් කියන්නේ, "දුඹුරු සීනි පියා" කියලා. මම ඒකට සතුටුයි. මොකද, "සුදු සීනි පියා" කියනවාට වඩා "දුඹුරු සීනි පියා" කියනවාට මම කැමැතියි. මොකද, දන්නවාද ඒකට හේතුව? අපි අවුරුදු පහකදී ලංකාවට සුදු සීනි ගෙනාපු විධිය බැලුවොත්, 2020 වර්ෂයේ මෙට්‍රික්ටොන් මිලියන 579යි, වියදම රුපියල් මිලියන 42,739යි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, your time is over.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම අවසන් කරනවා ගරු කථානායකතුමනි, එක විනාඩියක් දෙන්න.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

මේ ආදී වශයෙන් අවුරුදු පහේ එකතුව රුපියල් බිලියන 353ක්. රුපියල්වලින් ගත්තොත් අපි වියදම් කරලා තිබෙනවා, රුපියල් මිලියන 353,467ක්. ඒක ඇමෙරිකානු ඩොලර්වලින් බැලුවොත්, ඩොලර් මිලියන 1,500කට වැඩියි. ඒ කියන්නේ, අපි IMF එකෙන් ගන්නා ණය ප්‍රමාණයෙන් භාගයක විතර ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා, සුදු සීනි ගෙන්වන්න. අපි සුදු සීනි මෙට්‍රික්ටොන් මිලියන 2,502ක් මේ අවුරුදු පහට ගෙනැල්ලා තිබෙනවා. අපේ විදේශ විනිමය වියදම් කරගෙන අපි මොනවාද මේ ගෙනැල්ලා තිබෙන්නේ? අපේ රටේ දුඹුරු සීනි ප්‍රචලිත කරන්න කියලා අපි කියන්නේ ඇයි? ඒ විදේශ විනිමය ඉතුරු කරන්නයි. සීනි සඳහා වියදම් වන සියලු විදේශ විනිමය ටික ඉතිරි කර ගන්න අපට බැරි වෙයි. නමුත්, අපට යම් ප්‍රමාණයක් හරි ඉතිරි කරන්න පුළුවන්. මම කියන්නේ ඒකයි. අපි සුදු සීනි ගෙනැල්ලා ලෙඩ ගන්නේ මොකටද? මිනිස්සුන්ට සෞඛ්‍යසම්පන්න ජීවිතයක් අවශ්‍යයි. ඒ නිසා දුඹුරු සීනි ප්‍රවර්ධනය කිරීම වැරදි ද? මම මේ පාර්ලිමේන්තුවේ ඉන්න වෛද්‍යවරු වශයෙන් කටයුතු කරන මන්ත්‍රීවරුන්ගෙන් අහනවා, ඔබතුමන්ලා පිළිගන්නේ දුඹුරු සීනිද, සුදු සීනිද? කල්පනා කරලා බලන්න.

ගරු කථානායකතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුවේ කැන්ටින් එකට ගන්න අවසර දෙන්නේ දුඹුරු සීනිද, සුදු සීනිද? ඔබතුමා නිර්දේශ කරන්නේ මොකක්ද? මේ රටේ සෑම මනුස්සයෙකුටම දුඹුරු සීනි මිලදී ගන්න බැරි එක වෙනම එකක්. ඒ හින්දා අද අපි අඩු මිලට, supermarketsවල නැති අඩු මිලට දුඹුරු සීනි දෙන්න තීරණය කරනවා. අපි දුඹුරු සීනි සතොස ජාලය හරහා රට පුරාම බෙදා හරිනවා. ඒ නිසා මට "දුඹුරු සීනි පියා" කියන එක ගැන සතුටුයි, "සුදු සීනි පියා" කියනවාට වඩා. මට ඒ ප්‍රචාරය ලබා දෙනවාට අපේ මාධ්‍ය සගයන්ට මම ස්තුතිවන්ත වෙනවා. මේ ප්‍රචාරය දිගටම ලබා දීලා රට පුරාම මේක ප්‍රචලිත කරමු.

අවසාන වශයෙන් මම මේ කථාවත් කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා අය වැය කථාව අවසාන කළේ මෙන්න මේ වාක්‍යය ඉදිරිපත් කරලා. මට ඒක යළිත් සිහිපත් කරන්න අවසර දෙන්න.

"වෙනස් කළ නොහැකි දේවල් පිළිගැනීමට සන්සුන්භාවයත්, කළ හැකි දේවල් වෙනස් කිරීමට ධෛර්යයත්, කළ වෙනස දැන ගැනීමට ප්‍රඥාවත් ඔවුන්ට ලබා දෙන්න" කියා කථාවක් තිබෙනවා. අපි ඒ යථාර්ථය අවබෝධ කර ගත් ආණ්ඩුවක්. වෙනස් කළ නොහැකි දේ, -ඒ කියන්නේ මේ විපක්ෂයේ වාගේ කට්ටිය- පිළිගැනීමට සන්සුන්භාවයත්, කළ හැකි දේවල් වෙනස් කිරීමට ධෛර්යයත් අපි දෙනවා. අපි භය නැතිව ඒ දේවල් වෙනස් කරනවා. වෙනස දැන ගැනීමට ප්‍රඥාවක් තිබෙන ආණ්ඩුවක් මේ ඉන්නේ. එම නිසා ඒ යථාර්ථය තේරුම් අරගෙන අපේ මේ ඉදිරි ගමන ගෙන යන පළමුවැනි ජයග්‍රාහී අය වැය තමයි අපි මේ පාර්ලිමේන්තුවේ මෙවර සම්මත කරන්නේ කියන දේ අවධාරණය කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. (Dr.) Rizvie Salih. You have 11 minutes.

[11.51 a.m.]

**ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. (Dr.) Rizvie Salih - Deputy Speaker and Chair of Committees)
Hon. Speaker, I rise to express my views during the Second Reading of the Appropriation Bill for 2026 presented to this House by the Hon. President in his capacity as the Minister of Finance, Planning and Economic Development on the 07th of November, 2025.

At the outset, I wish to commend the Hon. President and his team at the Ministry of Finance, Planning and Economic Development for presenting a forward-looking Budget, which seeks not only to consolidate our economic stability, but also to rekindle the faith that people have on governance, so as to deliver progress and justice for all.

Sir, this Budget is being debated at a time when our nation stands at the crossroads of economic revival and renewal. The economic reforms of the past year has placed us on the path of fiscal stability. Now, the Budget, 2026 seeks to translate that stability into tangible benefits for our citizens through education, healthcare, employment and national unity.

Let us remember that a Budget is not merely a financial document, but a reflection of our moral and social priorities; it tells the people where we wish to take this country and what values we stand for, as leaders entrusted with their confidence.

The Budget, 2025 outlines a prudent approach, increasing revenue collection through widening of the tax net, improved tax compliance and digitalization, while ensuring that expenditure is channelled towards productive sectors such as education, health and infrastructure development for the benefit of people of all walks of life. This delicate balance between fiscal discipline and social responsibility must remain the guiding philosophy of our economic management. It is in keeping with this perspective that the Budget, 2026 has been put together.

We particularly welcome the Government's commitment to uplift the public sector and bring dignity back to the Public Service. The second stage of the public sector salary increase would be paid to all public servants from January, 2026. An amount of Rs. 110 billion has been provided for this. Also, the second stage of the pension revision for those who retired before 2020 would be paid from July, 2026, for which Rs. 20,000 million has been allocated. In addition, the interest-free festival advance, which stood at Rs. 10 000, has been increased to Rs. 15 000.

The nation welcomes the approval given to recruit 75,000 individuals to positions such as technical officers, law enforcement officers, revenue officers et cetera to maintain essential public services. What deserves

applause in this endeavour is that such recruitments and promotions would be carried out only in accordance with prescribed examinations and service requirements, free from political interference so as to provide equal opportunity to all.

Another very welcome aspect of the Budget, 2026 is the granting of a daily wage increase of Rs. 400 to our estate workers. This, to me personally, is a heartening feature of this Budget. Having worked at the Nuwara Eliya Hospital for four years, which was the beginning of my career as a medical officer, I noted that that hospital caters for 75 per cent of the estate sector workers, who are the backbone of our world renowned "Ceylon Tea". Although they are a vital contributor to our national economy and foreign exchange earnings, they have, unfortunately, long remained a relatively unappreciated segment of our working class. This increase in daily wages granted to them is actually a tribute to those hands which pick the world renowned "two leaves and a bud" that goes to make the best tea in the world.

The allocation from the Budget, 2026 to make provision to continue with the Rs. 6,000 paid to a family towards expenses for stationery is commendable. It is a shot in the arm and an encouragement for the school children and their families.

The allocation of Rs. 11,000 million for improving the facilities and infrastructure of the medical faculties of the Sabaragamuwa, Ruhuna, Uva Wellassa and Eastern Universities is a move in the right direction. Then, the Proposal in the Budget, 2026 to increase the Mahapola allowance by a further Rs. 2,500 to what was granted in 2025, taking the total amount of what they would receive to Rs. 10,000 monthly is a great boost to our future generation of graduates and the educated class of this country. These, Sir, are long-term commitments that would shape the next generation of Sri Lanka.

As a medical doctor for over 37 years, I am deeply encouraged by the allocation in this Budget to strengthen our national health services, especially, the establishment of a 16-storey Cardiology Unit. Though the present Cardiology Unit does a herculean task, catering to a vast number of patients who call over there, unfortunately, it is constrained by space and infrastructure. This initiative, Sir, is both timely and visionary. Heart diseases account to 40 per cent of our national mortality! The decision to expand the capacity through a dedicated National Cardiac Unit will save lives, reduce waiting lists and train a new generation of specialists. It also demonstrates something very vital; it demonstrates this Government's view on healthcare not as an expenditure, but as an investment in our human capital. This move represents not just a progress in infrastructure, but a milestone in extending compassion and public service.

Also, the assistance that will be granted to Thalassemic patients is commendable. Thalassemic patients - Sir, you know very well - are those who are born to Thalassemic minor parents. When both parents are Thalassemic minor, they have a 25 per cent chance of having a Thalassemic major baby. It is a big burden even for a very well-to-do family. I know a couple of well-to-do Thalassemic families, whose children, with the best of care, could not survive beyond 25 years of age. Among our general population, their survival is nothing more than 13 to 15 years. They have to have chelation therapy to remove excess iron. At least five days a week, they have to have regular blood transfusions. So, this Budget has made provision for a grant of Rs. 10,000 for a deserving family who have Thalassemic children. I would personally suggest to this Legislature that we make genetic screening of susceptible population in this country mandatory and send them for counselling, in case both parents are found to be Thalassemic minor. However, I would refrain from saying that they should be discouraged from getting married, but they should be educated about the risks and no legal provision should be brought in at the moment to prevent their marriage.

Sir, we all are aware of the growing threats posed by synthetic drugs. Another decisive and commendable measure in this Budget is the allocation of funds to strengthen the Government's war on narcotics. This is a battle to save the very soul of our nation, a battle to save our school children and for the safety of all our communities. We are all aware of the growing threat posed by synthetic drugs that destroy young lives and the not-so-young lives, undermining the moral fabric of our society. The Budget's financial commitment to this national effort signifies that this Government is not treating it as a law enforcement problem alone, but also as a public health and social challenge. As a physician, I have seen the devastation those drugs cause in the mind, the body and within families. Therefore, I strongly endorse the decision to enhance rehabilitation centres, improve public health education on addiction and support preventive health programmes.

Sir, beyond these sectors, the Budget reflects renewed commitment to inclusive growth, ensuring that its benefits reach every region, every community and every family. The focus on SMEs, digital infrastructure and agricultural modernization shows that we are preparing the ground for an economy that empowers entrepreneurs, encourages innovation and values productivity.

Sir, fiscal credibility is as important as fiscal content. The international community has acknowledged that Sri Lanka has begun to restore trust through responsible governance. We must ensure - and, it is certain - that every rupee allocated reaches its intended purpose, whether it be for a school in Monaragala, a hospital in Jaffna or a housing complex in Puttalam.

Sir, the Budget, 2026 is not the end of reform; it is a continuation of nation rebuilding. It provides the framework for a resilient economy, a healthier nation and a disciplined society.

Sir, I would like to conclude by reminding this House that while the masses would judge how sincere and transparent the Government has been in implementing this Budget, they would also judge what valuable suggestions and constructive criticism came from the Opposition to once again make Sri Lankans smile.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The next speaker is the Hon. Kaveenthiran Kodeeswaran. You have 13 minutes.

[பி.ப. 12.02]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ சபாநாயகர் அவர்களே, 2026ஆம் ஆண்டுக்காக NPP அரசாங்கத்தால் சமர்ப்பிக்கப்பட்ட இந்த வரவுசெலவுத் திட்டத்தை, IMFஇன் - சர்வதேச நாணய நிதியத்தின் பல்வேறு நிபந்தனைகளுக்கு அமைய இந்த நாட்டின் பொருளாதாரத்தை மையப்படுத்தி, அபிவிருத்தியை மையப்படுத்தி, முதலீட்டை மையப்படுத்திக் கொண்டுவரப்பட்ட ஒரு வரவு செலவுத்திட்டமாகவே நாங்கள் பார்க்கின்றோம். இந்த வரவு செலவுத்திட்டத்தில் அதிகளவு நன்மையான விடயங்கள் உள்ளடக்கப்பட்டிருக்கின்றன. இருந்தாலும்,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, you may continue.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Leader of the Opposition?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මා ඉදිරිපත් කරන මේ කාරණයට පිළිතුරක් දෙන ලෙසට ඔබතුමා උපදෙස් දෙන්න කියලා. මොකද, මම මේ කාරණය ගැන දිගින් දිගටම ඇහුවත් මට තවම උත්තරයක් ලැබුණේ නැහැ. මේ කාරණය, online loan ලබා දීමෙන් සිදු වන හානිය ගැනයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, online loan මාෆියාවට හසුවෙලා පසුගිය දවසක අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙලගෙදර ගම්මානයේ හිමායා සෙව්වන්දි කියන තරුණිය සිය දිවි නසා ගත්තා, suicide කර ගත්තා. මේක ලංකාවම දැනගන්න ඕනෑ, පාර්ලිමේන්තුවත් දැන ගන්න ඕනෑ. මේ තමයි අපේ රටේ ක්‍රියාත්මක වන online මාෆියාව: CashMate, DrCash, Smart Credit, SkyWallet, DaraLoan, සහන මිතුරු Wallet, Freedom-Cash, CashGedara, MegaLoan, LoanPal, MyKredit, InsCash, Kreditone 1+ and Clickredit, MegaWallet. මේවායින් අපේ රටේ ජනතාව සූරා කනවා. මම මේ කාරණය මතු කරන්නේ මොකද දන්නවාද? මේ ඔක්කෝම අනීතිකයි, illegal; කිසිම නීතියක් අනුව නොවෙයි මේ online loan මාෆියාව ක්‍රියාත්මක වෙන්නේ. මේ මාෆියාව නිසා අර කියපු දැරිය සිය දිවි නසාගෙන තිබෙනවා. මේ, එක සිය දිවි නසා ගැනීමක් විතරයි. මම රජයෙන් ඉල්ලීමක් කරනවා, මගේ මේ ප්‍රශ්නයට කරුණාකරලා හෙට උදේම උත්තරයක් දෙන්න කියලා. මේ illegal online loan මාෆියාව නැති කරන්න රජය ගන්නා පියවර කියන්න. නම් සහිතවම මම දැන් කරුණු කිව්වා. මම මේ ලිපිය **සභාගත*** කරනවා. කරුණාකරලා මේ සඳහා ගන්නා පියවර මොකක්ද කියන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, that matter should draw the attention of the Hon. Deputy Minister of Finance and Planning.

Hon. Kodeeswaran, sorry about that interruption. Now, would you proceed with your speech? I will give you whatever time that was lost.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நீங்கள் மேலதிகமாக இரண்டு நிமிடங்கள் எனக்குத் தரவேண்டும் என்பதை இந்த இடத்திலே குறிப்பாகக் கூற விரும்புகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Allowed.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

விசேடமாக, IMFஇன் நிபந்தனைகளுக்கு அமைவாக மேற்கொள்ளப்பட்ட இந்த வரவு செலவுத்திட்டத்தை அரச செலவினங்கள், நிதிசார் கட்டுப்பாடுகள், முதலீடுகள், வேலைவாய்ப்புகள் போன்றவற்றை மையப்படுத்திச் சமர்ப்பிக்கப்பட்ட ஒன்றாகவே நாங்கள் பார்க்கின்றோம். இந்த வரவு செலவுத்திட்டத்திலே குறிப்பாகச் சுகாதாரம் தொடர்பான விடயங்களுக்குக் கூடுதலான முக்கியத்துவம் கொடுக்கப்பட்டிருக்கின்றது. அவ்வாறு சுகாதாரத் துறைக்கு விசேடமாக நிதி ஒதுக்கப்பட்டமைக்கு கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றி சொல்லக் கடமைப்பட்டிருக்கின்றேன்.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

சுகாதாரத் துறைக்கு ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்ற 555 பில்லியன் ரூபாய் மொத்தச் செலவினத்திற்கு ஒதுக்கப்பட்ட நிதியிலே 12.5 சதவீதமாகக் காணப்படுகின்றது. குறிப்பாக, 82 தள வைத்தியசாலைகளின் அபிவிருத்திக்காக 31,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருக்கின்றது. இந்த நிதியில் திருக்கோவில் ஆதார வைத்தியசாலைக்குக் கூடுதலான நிதிகளைச் செலவழிக்க வேண்டும். ஏனென்றால், கடந்த மார்ச் மாதத்தில் சமர்ப்பிக்கப்பட்ட 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்திலும் இந்த ஆதார வைத்தியசாலைக்குத் தேவையான கட்டடங்கள் மற்றும் ஆளணி வசதியைச் செய்து தரவேண்டும் என்று கூறியிருந்தோம். இது தொடர்பில் கௌரவ அமைச்சர் அவர்களிடமும் மாண்புமிகு ஜனாதிபதி அவர்களிடமும் விடுக்கப்பட்ட வேண்டுகோளுக்கமைய, கௌரவ அமைச்சர் அவர்கள் திருக்கோவில் ஆதார வைத்தியசாலையைப் பார்வையிட்டிருந்தார். அந்த வைத்தியசாலையின் நான்கு மாடிக் கட்டிடத்துக்கான நிதியைத் தள வைத்தியசாலைகளுக்கு ஒதுக்கப்பட்ட நிதியிருந்து ஒதுக்கியிருப்பது பற்றிய விடயத்தை அவர் நேற்று முன்தினம் என்னிடம் கூறியிருந்தார். உண்மையாகவே அதற்காக அவருக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன்.

திருக்கோவில் ஆதார வைத்தியசாலை அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற வைத்தியசாலைகளில் பழைமையானதாகும். அங்கு ஆளணிப் பற்றாக்குறை கூடுதலாகக் காணப்படுகின்றது. கடந்த ஆட்சிக் காலத்திலே இந்த வைத்தியசாலை புறக்கணிக்கப்பட்ட ஒரு நிலையில் இருந்திருக்கின்றது. ஆனால், தற்போது வந்திருக்கின்ற இந்த அரசாங்கம் அந்த வைத்தியசாலைக்கான சகல வேலைத்திட்டங்களையும் செய்யும் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. ஏனென்றால், அதற்கான உறுதிமொழியை கௌரவ அமைச்சர் அவர்களும் மாண்புமிகு ஜனாதிபதி அவர்களும் எங்களுக்குத் தந்திருக்கின்றார்கள். அதற்கான வேலைத்திட்டங்களுக்கு இந்த வரவு செலவுத்திட்டத்தினூடாக நிதி ஒதுக்கியிருப்பது அந்த மக்களுக்கு நன்மையளிப்பதோடு, எங்களுக்கும் மகிழ்ச்சியைத் தருகின்றது.

அடுத்தாக, போக்குவரத்துத் துறைக்கு அதிகளவான நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. போக்குவரத்து வசதிகளைப் பொறுத்தவரை அம்பாறை மாவட்டத்தின் பல்வேறு பிரதேசங்களிலும் உள்ள கிராமிய வீதிகள் புனரமைக்கப்பட வேண்டியிருக்கின்றது. உதாரணமாக, அலிகம்பை பிரதேசத்தின் 23 கிலோமீற்றர் வீதி, அதுபோல், திருக்கோவில், நாவிதன்வெளி ஆகிய பிரதேசங்களிலுள்ள வீதிகளைப் புனரமைக்க வேண்டிய கடமையும் பொறுப்பும் கௌரவ அமைச்சர் அவர்களுக்கு இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயங்களைக் கருத்திற்கொண்டு, அவற்றின் புனரமைப்புத் தொடர்பில் கூடுதலான செயற்பாட்டைச் செய்ய வேண்டுமென்று இந்த இடத்திலே குறிப்பாகக் கூற விரும்புகின்றேன்.

மேலும், இந்த வரவு செலவுத்திட்டத்தினூடாக நீர்ப்பாசனத் துறைக்கு 91,700 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. அதிலே 650 சிறிய குளங்கள் மற்றும் 350 கிலோமீற்றர் வாய்க்கால்களின் புனரமைப்பு, அருவித்தொடர் முறைமையை மேம்படுத்தல் போன்ற விடயங்களும் உள்ளடக்கப்பட்டிருக்கின்றன. இதற்காக 8,350 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருக்கின்றது. இதிலே விசேடமாக அம்பாறை மாவட்டத்தில் ஒருங்கிணைக்கப்பட்ட நீர்ப்பாசன அபிவிருத்தித் திட்டங்களை மேற்கொள்ள வேண்டியிருக்கின்றது. ஏனென்றால், இந்த நாட்டின் 20 சதவீதமான நெல் உற்பத்தியைப் பெறக்கூடியதாக, விவசாயத்துக்கு உரிய ஒரு பிரதேசமாக அம்பாறை மாவட்டம் காணப்படுகின்றது. அதாவது, அம்பாறை மாவட்டத்தின் நெல் உற்பத்தியானது நாட்டின் மொத்த நெல் உற்பத்தியின் 20 சதவீதமாகக் காணப்படுகின்றது. விசேடமாக, சேனநாயக்க சமுத்திரத்தின் வலதுகரை வாய்க்கால், பெரியகளப்பு மற்றும் ஏனைய குளங்களான கஞ்சிகுடிச்சாறு, ரூபஸ், சாகாமம் ஆகிய குளங்களின் ஊடாக ஒருங்கிணைக்கப்பட்ட நீர்ப்பாசனத் திட்டத்தை வலுப்படுத்துகின்றபொழுது, மேலதிகமாக அம்பாறை மாவட்டத்தில் 10 சதவீதமான நெல் உற்பத்தியை நாங்கள் பெருக்கிக்கொள்ள முடியும். அதாவது, 8,500 ஏக்கரில் 2 போகம் செய்யக்கூடிய வயல் நிலங்களையும் அதற்கான வளங்களையும் அதிகரித்துக்கொள்ள முடியும்.

இந்த விடயத்தை நாங்கள் Sectoral Oversight Committee meetingஇலும்கூட விவசாய அமைச்சர் அவர்களுக்குத் தெளிவுபடுத்தியிருந்தோம். அதனடிப்படையிலே, கௌரவ அமைச்சர் அவர்களும்கூட இந்த விடயங்களைக் கவனத்தில் எடுத்துக்கொள்வதாக உறுதியளித்தார். அதுமட்டுமல்ல, விசேடமாக Chinese Governmentஇன் delegation இந்தப் பாராளுமன்றக் குழுக் கூட்டத்திற்கு வந்திருந்தபொழுது, இதற்கான நிதியளிப்பையும் அதன் பூர்வாங்க நடவடிக்கைகளையும் செய்வதாகக் கூறியிருந்தார்கள். அதற்காக Chinese Governmentஇற்கு நாங்கள் நன்றி சொல்லக் கடமைப்பட்டிருக்கிறோம். பெரியளவிலான இந்த அபிவிருத்தித் திட்டம் இந்த நாட்டில் அதிகளவிலான விவசாய உற்பத்தியை - நெல் உற்பத்தியை - மேற்கொள்வதற்கு உண்மையில் சிறந்ததொன்றாக இருக்கிறது. முன்மொழியப் பட்ட இந்தத் திட்டத்துக்கு Chinese Government உறுதுணை வழங்குவதாகச் சொல்லியிருப்பது உண்மையாகவே பாராட்டுக்குரிய விடயமாகக் காணப்படுகின்றது.

இவ்வளவு நன்மைகள் இந்த வரவு செலவுத்திட்டத்தில் உள்வாங்கப்பட்டு இருந்தாலும், சில விடயங்களுக்கு, குறிப்பாக கல்வி சார்ந்த விடயங்களுக்கு மொத்த ஒதுக்கீட்டிலே 6.1 சதவீதம்தான் ஒதுக்கப்பட்டு இருக்கின்றது. அபிவிருத்தியடைந்த வளர்ந்த நாடுகளைப் பார்க்கும்போது அந்த நாடுகளில் 10-20 சதவீதம் கல்விக்காகச் செலவழிக்கப்படுகின்றது. ஆனால், இங்கு கல்வி ரீதியான செயற்பாடுகளுக்கு ஒதுக்கப்பட்ட நிதியானது மிகக் குறைவாகக் காணப்படுகின்றது. இதனை நாங்கள் அதிகரிக்க வேண்டும். குறிப்பாக, கல்வி சார்ந்த விடயங்களுக்காக ஒதுக்கப்பட்ட நிதியிலே புதிய கண்டுபிடிப்புக்கள், புதிய ஆராய்ச்சிகள், புதிய ஆராய்ச்சி மையங்களை உருவாக்குவதற்கு எந்தவிதமான நிதியும் ஒதுக்கீடு செய்யப்படவில்லை. வளர்ச்சியடைந்த நாடுகள் புதிய புதிய கண்டுபிடிப்புகளை, புதிய புதிய ஆராய்ச்சிகளை மேற்கொள்வதற்காகப் பல்கலைக்கழகங்களுக்கும் உயர் கல்வி நிறுவனங்களுக்கும் கூடுதலான நிதியை ஒதுக்குகின்றன. ஆராய்ச்சி மையங்களை உருவாக்கி நாட்டின் பலதரப்பட்ட அபிவிருத்தி வேலைத்திட்டங்களை, புதிய கண்டுபிடிப்புகளை, புதிய தொழில்நுட்பங்களை, புதிய ஆராய்ச்சிகளை மேற்கொள்கின்றன. ஆனால், இந்த வரவு செலவுத்திட்டத்தில் கல்விக்காக ஒதுக்கப்பட்ட நிதியிலே புதிய ஆராய்ச்சித் திட்டங்களுக்கு நிதி ஒதுக்கப்படவில்லை. ஒரு நாடு வளர்ச்சியடைய வேண்டுமென்றால், நாட்டின் மொத்த உள்நாட்டு உற்பத்தியின்மூலம் ஒரு நிலையான அபிவிருத்தியை அடைய வேண்டுமென்றால், அந்த நாட்டில் புதிய புதிய கண்டுபிடிப்புகள் மேற்கொள்ளப்பட வேண்டும். அந்த வகையில், இந்த அரசு கல்வித் துறையில் கூடுதலான கவனத்தைச் செலுத்தி, அதற்குக் கூடுதலான நிதியை ஒதுக்கீடு

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

செய்ய வேண்டுமென்று இந்த இடத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இந்த அரசினால் 'புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு' அமைக்கப்பட்டிருப்பதை அரசாங் கத்தின் மிகப் பெரிய தவறாக நாங்கள் பார்க்கின்றோம். ஏனென்றால், இந்த அரசு இடதுசாரி அரசு! அதாவது, சமத்துவத்தை ஏற்படுத்த வேண்டுமென்று இவர்கள் சொல்லி வருகின்றார்கள். குறிப்பாக, இனங்களுக்குச் சமத்துவம், மதங்களுக்குச் சமத்துவம், மொழிகளுக்குச் சமத்துவம் என்று சொல்லப்படுகின்றது. ஆனால், இந்த அமைச்சு "புத்தசாசன அமைச்சு" என்றே குறிப்பிடப்பட்டு இருக்கின்றது. ஏனைய இந்துக் கலாசார அமைச்சோ, முஸ்லிம் விவகாரங்களுக்கான அமைச்சோ அல்லது கிறிஸ்தவ விவகாரங்களுக்கான அமைச்சோ உள்வாங்கப்படவில்லை. இதிலிருந்து இந்த அரசு ஒருதலைப்பட்சமாகச் செயற்படுவதைக் காண முடிகின்றது. இது உண்மையாகக் கண்டிக்கப்பட வேண்டிய ஒன்றாக இருக்கின்றது. ஏன், இந்தப் புத்தசாசன, சமய மற்றும் கலாசார அமைச்சரிடம் நேற்றைய தினம் எதிர்க்கட்சித் தலைவர்கூட கேள்வி கேட்டார், "புத்தசாசன, சமய மற்றும் கலாசார அமைச்சுக்கு என்ன முன்னுரிமையை நீங்கள் கொடுத்தீர்கள்?" என்று.

ஆகவே, இங்கு பார்க்கின்றபொழுது, ஆளுங்கட்சியாக இருந்தாலும் சரிதான், எதிர்க்கட்சியாக இருந்தாலும் சரிதான், உங்களது இனம் சார்ந்து, உங்களது மதம் சார்ந்து சிந்திக்கின்றவர்களாகத்தான் நீங்கள் இருக்கின்றீர்கள். அந்த வகையில்தான் எதிர்க்கட்சித் தலைவரும் "என்ன முன்னுரிமையை புத்தசாசன, சமய மற்றும் கலாசார அமைச்சுக்குக் கொடுத்தீர்கள்?" என்று கேட்டார். நீங்கள் தனியாக புத்தசாசன அமைச்சை உருவாக்கி இருக்கின்றீர்கள். ஏனைய மதங்களுக்கான, ஏனைய மொழிகளுக்கான, இனங்களுக்கான அமைச்சுகள் உருவாக்கப்படவில்லை. ஆகவே, நீங்கள் 'ஒரே குட்டையில் ஊறிய மட்டைகள்'தான் என்பதை இந்த இடத்தில் குறிப்பாகக் கூற விரும்புகின்றேன். இதிலே நீங்கள் மாற்றத்தைக் கொண்டுவர வேண்டும்.

விசேடமாக, 'கார்த்திகை வீரர்கள்' ஞாபகார்த்த தினம் இன்றைய நாளில் அனுஷ்டிக்கப்படுகின்றது. அதாவது, இடதுசாரிக் கொள்கையோடு போராடிய ஒரு மாவீரரான ரோஹண விஜேவீரவின் நினைவு தினம் அனுஷ்டிக் கப்படுகின்றது. இந்த நாளிலேயே அவர் இலங்கை அரச படையினால் கொல்லப்பட்டார். ஜே.வி.பீ. தோழர்கள் பல்லாயிரம் பேர் கொல்லப்பட்டனர். அவர்களுக்கு இன்று நினைவஞ்சலி செலுத்தப்படுகின்றது. இடதுசாரிக் கொள்கையோடு போராடிய வீரன் என்ற வகையில், நானும் அவருக்கு எனது அஞ்சலியைச் செலுத்த விரும்புகின்றேன்.

இதேவேளை, இந்தக் கார்த்திகை மாதத்தில் வடக்கு, கிழக்கில் 'மாவீரர் நாள்' அனுஷ்டிக்கப்படுகின்றது. வடக்கு, கிழக்கிலே 32க்கும் மேற்பட்ட மாவீரர் துயிலும் இல்லங்கள் உள்ளன. எமது இனத்துக்காக, விடுதலைக்காகப் போராடிய மாவீரர்கள், பொதுமக்கள் புதைக்கப்பட்ட அந்தப் புனிதமான - கண்ணியமான - இடங்களைப் பாதுகாக்க வேண்டிய கடமைப்பாடு எமக்குள்ளது. இந்த அரசு, வடக்கு, கிழக்கிலே உள்ள 32க்கும் மேற்பட்ட துயிலும் இல்லங்களையும் அங்கு வாழுகின்ற தமிழ் மக்களிடம் பொறுப்புக் கொடுக்க வேண்டும். அந்த இடங்களை அங்கீகரிக்க வேண்டும். அந்த இடங்களிலே இராணுவப் பிரசன்னத்தை அகற்ற வேண்டும். அந்த இடங்களை ஆட்கொண்டிருக்கின்ற இராணுவத்தினரை அங்கிருந்து அகற்றி, மக்கள் சுயாதீனமாக, சுயமாக நினைவுகூரலை மேற்கொள்வதற்காக அந்த இடத்தைக் கொடுக்க வேண்டும். இந்த அரசு, அந்த இடங்களை அங்கீகரித்துப் பொதுமக்களிடம் கொடுக்கும்போது, நீங்கள் நிதி ஒதுக்கத் தேவையில்லை. நாங்கள் - தமிழர்கள் - அதற்கான நிதியை ஒதுக்கி, அந்தப் புனிதமான இடங்களைப் பாதுகாப்போம் என்பதை இந்த இடத்தில் தெளிவாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன். விசேடமாக, இந்த அரசாங்கம் அதற்கான நடவடிக்கைகளை முன்னெடுக்க வேண்டுமெனக் கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Susil Ranasinghe. You have 11 minutes.

[අ.භා. 12.19]

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාව ආරම්භ කිරීමට ප්‍රථම අම්පාර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණයකටත්, අද විවාදය ආරම්භ කරමින් කථා කළ ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණා කිහිපයකටත් පිළිතුරු සපයන්න මම කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අය වැය කථාව කියන්නේ, මෙතැන සමස්ත අය වැයම කියවන එක නොවෙයි. පාර්ලිමේන්තුවේ දීර්ඝ කාලයක් තිස්සේ කටයුතු කරන මන්ත්‍රීවරු ඒ ගැන දන්නවා කියලා මම හිතනවා. නමුත් මේක වැරදීමකින් වෙනවා කියලා මම හිතන්නේ නැහැ. අම්පාර දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් හින්දු ආගම සඳහා කිසිම දෙයක් කරලා නැහැ කියලා. අය වැය කථාව තුළ හින්දු ආගම සම්බන්ධයෙන් වචනයක්වත් කියැවුණේ නැති වුණත්, "අමාත්‍යාංශ අනුව ප්‍රධාන වියදම් සංරචක" ලේඛනය තුළ සාරාංශ කරලා තිබෙනවා, අමාත්‍යාංශ අනුව මුදල් වෙන් කරලා තිබෙන්නේ කොහොමද කියලා. එම නිසා ගරු මන්ත්‍රීතුමා මේ පොත බලන්න. මෙම ලේඛනයේ 38වැනි පිටුවේ, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ මුදල් වෙන් වුණු ආකාරය තිබෙනවා. හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙනුවෙන් රුපියල් මිලියන 146ක් වෙන් කරලා තිබෙනවා කියලා එහි සඳහන් වෙනවා. ඒ වාගේම එම පිටුවේම තව ටිකක් පහළට යනකොට, හින්දු ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපන කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 42ක් වෙන් කරලා තිබෙනවා. එම නිසා ඔබතුමාගේ ස්ථාවරය වැරැදියි. එම නිසා මෙම ලේඛන අධ්‍යයනය කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

"අය වැය කථාව" කියන්නේ, අය වැයේ තිබෙන යම් strategic plan එකක්, එහෙම නැත්නම්, අය වැයේ මොන මොන හැරවුම් ලක්ෂ්‍යද තිබෙන්නේ, අය වැයෙන් බර තැබිය යුතු ස්ථාන මොනවාද සහ අය වැයෙන් වෙන් කළ මුදල්වලට අමතරව මුදල් ප්‍රතිපාදන වෙන් කරන්නේ මොනවාටද කියන කරුණු

සම්බන්ධයෙන් ඉදිරිපත් කරන කථාවක්. එම නිසා අය වැය කථාවෙන්ම මේ දේවල් මනින්න එපා. මේ ලේඛන ලබා දීලා තිබෙන්නේ ඒ සඳහායි.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා, මේ අය වැයෙන් කුරුඳු සඳහා මුදල් වෙන් කරලා නැහැ, රබර් වගාව සඳහා මුදල් වෙන් කරලා නැහැ, කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් මුදල් වෙන් කරලා නැහැ කියලා. නමුත්, "අමාත්‍යාංශ අනුව ප්‍රධාන වියදම් සංරචක" පොතේ 26වැනි පිටුවේ, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සඳහා වෙන් කළ මුදල් පිළිබඳව සඳහන් වෙනවා.

අය වැය කථාව කියන්නේ මොකක්ද, අය වැය කියන්නේ මොකක්ද, අය වැය ඇස්තමේන්තුව කියන්නේ මොකක්ද කියලා ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා හොඳටම දන්නවා. එම නිසා මේවාත් පරිශීලනය කරලා ඒ දේවල් කියන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒක එතුමාට වෙච්ච වැරදීමක් කියලා මම හිතන්නේ නැහැ. ඒක වැරදීමක් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ යෝජනාවේ රබර් සඳහා සහනාධාරවලට විතරක් රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. කුඩා තේ වතු සංවර්ධන සභාව සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා. එතකොට රුපියල් මිලියන 1,500ක්. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට මේ විධියට රුපියල් මිලියන 1,500ක් අත හැරෙන්නේ කොහොමද? ඒකයි තිබෙන ප්‍රශ්නය. ඒ නිසා මේ පිළිබඳව කථා කරද්දී වගකීමෙන් කථා කරන්න කියලා අපි ඉල්ලා සිටින්න කැමැතියි. ඒ වාගේම එතුමා කිව්වා, රබර් සඳහා මොකුත් කළේ නැහැ; කුරුඳු සඳහා මොකුත් කළේ නැහැ කියලා. මේ ලේඛනයේ කුරුඳු සඳහා, රබර් සඳහා සහ කුඩා තේවතු හිමියන් සඳහා වෙන් කරපු මුදල් සියල්ලම සඳහන් කර තිබෙනවා. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 102ක් වෙන් කර තිබෙනවා. එම නිසා ඒ සංඛ්‍යා දත්ත සහිතව අධ්‍යයනය කරලා කථා කරන්න කියලා ඉල්ලා සිටින්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රජයක් විධියට අපට හම්බ වුණේ එක පැත්තකින් ආර්ථික පදනම් බිඳ වැටිච්ච, අනෙක් පැත්තෙන් සාමාජීය වශයෙන් අස්ථාවර වෙච්ච, දේශපාලන වශයෙන් අස්ථාවර වෙච්ච රටක්. එම නිසා ඒ වගකීම තමයි අපට දරන්න සිද්ධ වුණේ. 2025 අය වැයේදී ජනාධිපතිතුමාට සැලසුම් කරන්න ඕනෑ වුණේ, සැලසුම් කළ යුතුව තිබුණේ අස්ථාවර වෙච්ච අපේ රට ස්ථාවර කරන්නේ කොහොමද කියලායි. ඒ අනුව තමයි එතුමා 2025 අය වැය ඉදිරිපත් කළේ. 2025 වසරේ අපට තිබුණු අභියෝගය තමයි අපේ රට ස්ථාවර කරන එක. අපේ රට ආර්ථික වශයෙනුත්, සාමාජීය වශයෙනුත්, දේශපාලන වශයෙනුත් ස්ථාවර කරන එක තමයි අපේ ප්‍රමුඛ කාර්යය වුණේ.

අපි ආර්ථික වශයෙන් මොනවාද කළේ කියන කාරණයේදී, අපි කියන දේවල්වලට අමතරව විශ්වවිද්‍යාලවල ඉන්න විද්වතුන්, වෙනත් විද්වතුන්, ආර්ථික ක්ෂේත්‍රය ගැන දන්නා මධ්‍යස්ථ මතධාරීන් කියන කථා විතරක් නොවෙයි අද අපට අහන්නට ලැබෙන්නේ. දේශපාලන වශයෙන් අපට ප්‍රතිවිරුද්ධ විපක්ෂයේ බොහෝ දෙනෙකුත් අද කියනවා, භාණ්ඩාගාරය පිරී ඉතිරී යන මට්ටමට මේ රජය විසින් ආර්ථිකය ස්ථාවර කළා කියලා. විශේෂයෙන්ම ආර්ථික කඩා වැටීමකින් පසුව, 2025 අවුරුද්දේ රට ආර්ථික වශයෙන් ස්ථාවර වුණාය කියන එක තහවුරු කිරීම සඳහා ඒ ප්‍රකාශම ප්‍රමාණවත් වෙයි කියා මා හිතනවා.

අපි දැන් දේශපාලන වශයෙන් ස්ථාවර වෙලා තිබෙන්නේ. ඒ කියන්නේ, රටක් විධියට අපි ස්ථාවර වෙලා තිබෙන්නේ. සමාජයීය වශයෙනුත් අපි ස්ථාවර වෙමින් තිබෙන්නේ. ඒ නිසා 2025 අවුරුද්දේ ඉදිරිපත් කළ අය වැයේ අභිමතාර්ථ මුදුන් පමුණුවා ගෙන, රට දේශපාලන, ආර්ථික සහ සමාජයීය වශයෙන් ස්ථාවර කරගෙන තමයි අපි 2026 අය වැයට ළඟා වන්නේ.

2026 අය වැයේ අරමුණ කුමක් විය යුතුද? අපි දන්නවා, අපේ රට මේ මට්ටමින් තිබෙන්න ඕනෑ රටක් නොවෙයි කියලා. ලෝකයේ දියුණුම රටක් බවට, ඉහළින්ම වැජඹෙන්න පුළුවන් රටක් තරමට දියුණු කරන්න පුළුවන් විභවතාවක් තිබෙන රටක් තමයි, අපේ රට. අපේ රටේ පිහිටීම අතින් ගත්තාම, අපේ රටේ සිටින මානව සම්පත අතින් ගත්තාම, අපේ රටේ තිබෙන සම්පත් අතින් ගත්තාම අපට එතැනට යන්න පුළුවන් බව පෙනී යනවා. ඒ නිසා 2026ට ඉදිරිපත් කරන අය වැය, මේ ස්ථාවර කරපු රට සංවර්ධන ඉලක්ක කරා ගෙන යන්නේ කොහොමද කියන දැක්ම, සැලසුම, ඒ ගැඹුරු අධ්‍යයනය, අවබෝධය සහිතව ඉදිරිපත් කරන අය වැයක් වෙන්න ඕනෑ. මා හිතනවා, 2026ට ඉදිරිපත් කර තිබෙන අය වැය තුළ එය ඉතා හොඳින් පිළිබිඹු වෙලා තිබෙනවා කියා. එය පෙනෙන්නත් තිබෙනවා. ආර්ථිකය සම්බන්ධයෙන්, රට සම්බන්ධයෙන් පූර්ණ වශයෙන් ගෙන ගැඹුරින් අධ්‍යයනය කරන්න පුළුවන්, විශ්ලේෂණය කරන්න පුළුවන්, අර්ථ දක්වන්න පුළුවන් විශ්ලේෂකයන්, ආර්ථික විද්‍යාඥයන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, විවිධ කණ්ඩායම්, සමාගම්, පුද්ගල චරිත යනාදී සියලු අංශ විසින් කරනු ලබන විශ්ලේෂණ සහ ඔවුන් ඉදිරිපත් කරන කරුණුවලින් හරි පැහැදිලියි, මේ අය වැය අපි ඒ තැනට ගෙනැල්ලා තිබෙනවාය කියන කාරණය.

අපේ රට සංවර්ධනය කරන්න නම්, අපේ සමාජ ස්තර සම්බන්ධව, ඒ කියන්නේ පහළම ග්‍රාමීය ජනතාවගේ ජීවන මට්ටමේ සිට ඔවුන්ගේ ජීවන විලාසයේ සිට ඉහළම සමාජ, ආර්ථික කණ්ඩායම දක්වා වන සියලු කණ්ඩායම්වල ජීවන රටාව පිළිබඳ දැක්මක්, අධ්‍යයනයක්, අවබෝධයක් අපට තිබෙන්න ඕනෑ. ඒ වාගේම තමයි කුඩා ව්‍යවසායකත්වයේ සිට මහා පරිමාණ ව්‍යවසායකත්වය දක්වා වන පිරිස ආර්ථිකය තුළ හැසිරෙන්නේ කොහොමද, ඔවුන් ආර්ථිකයට දක්වන දායකත්වය මොකක්ද කියන එක පිළිබඳවත් අපට හොඳ අවබෝධයක්, කියවීමක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම අපේ රට දියුණු රටක් බවට පත් කරනවා නම්, 2026ට ඉදිරිපත් කළ අය වැය ඒ සඳහා වන උපාය මාර්ගික සැලැස්ම සහිත, ඒ සඳහා පියවරක් තබන අය වැයක් වෙන්න ඕනෑ. ඒ තත්ත්වය මේ අය වැය තුළ අන්තර්ගත වෙලා තිබෙනවා. ඒ නිසා, පිටු 56ක් තිබෙන, පැය 4යි, විනාඩි 20ක් ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැය කථාව නිකම් එහෙන් මෙහෙන් පාවිච්චි කරපු වචන ඇතුළත් එකක් නොවෙයි; ගැලරියට ඉදිරිපත් කළ කථාවක් නොවෙයි. එය අධ්‍යයනය කරන්න කියලා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලන්න කැමැතියි. විපක්ෂයට විතරක් නොවෙයි, විශ්වවිද්‍යාලවල ඉන්න ශිෂ්‍යයන්ට, ආචාර්යවරුන්ට, විවිධ ක්ෂේත්‍රවල සිටින විද්වතුන්ට මෙය ඒ අර්ථයෙන් ගෙන විශ්ලේෂණය කරන්න, විග්‍රහ කරන්න කියා අපි ඉල්ලනවා.

අපි දන්නවා, අපට ආර්ථික වශයෙන් යා යුතු දුරක් තිබෙන බව. ඒ සඳහා වන උපායමාර්ගික දැක්ම මෙහි තිබෙනවා. ආයෝජන කැඳවා ගන්නේ කොහොමද, කොච්චර විදේශ ආයෝජන කැඳවා ගන්න ඕනෑද, අපේ ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා අප යා යුත්තේ මොන තැනටද කියන කාරණා මෙහි සඳහන් වෙනවා. කෘෂි කර්මාන්තයේ යෙදෙන කුඩා ව්‍යවසායකත්වයේ සිට green hydrogen දක්වාත්, ඒ වාගේම ලෝකයේ අද අලුත් - නවමු - තාක්ෂණය සහිතව එන data centres ඇති කිරීම දක්වාත් වන අලුත් යෝජනා, අලුත් ව්‍යාපෘති, අලුත් දැක්මක්, උපායමාර්ග මෙහි ඇතුළත් වනවා.

මට ලැබී තිබෙන වෙලාව සීමිත නිසා කථාව සීමා කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම දැක්කා, විපක්ෂයේ මන්ත්‍රීවරු

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

ඊයේත් පාර්ලිමේන්තුවේදී දුප්පත්භාවය ගැන සඳහන් කළා. "දුප්පතුන් වෙනුවෙන් මොනවත් ඉදිරිපත් කර නැහැනේ, මොනවාද දුප්පතුන් වෙනුවෙන් කළේ" කියලා ඔවුන් අහනවා. "බදු එකතු කර ගත්තා, නමුත් දුප්පතුන්ට දෙන්නේ නැහැනේ" කියනවා. අපි දන්නවා, අපේ රටේ දුප්පත්කම කියන එක හැම දාම මාර්කට් කළා, දේශපාලන බලය ගන්න. ඒ වාගේම දේශපාලන බලය රඳවා ගන්නත් දුප්පත්කම භාවිත කළා. නමුත් අපේ උපායමාර්ගය ඒක නොවෙයි. අපි දේශපාලන බලය ගන්න හෝ දේශපාලන බලය රඳවා ගන්න දුප්පත්කම පාවිච්චි කරන්නේත් නැහැ, තවදුරටත් පාවිච්චි කරන්න ඉඩ දෙන්නේත් නැහැ.

දුප්පත්කම තුරන් කිරීම සඳහා අපේ රජයේ ප්‍රධාන අරමුණු 3ක් තිබෙනවා. ඉන් එකක් තමයි, ග්‍රාමීය දුප්පත්භාවය නැති කිරීම. අපට ඕනෑ කරන්නේ එම ජනතාව දුප්පත්භාවයෙන් ඉහළට එසවෙන, ඔවුන්ට දුප්පත්භාවයෙන් එළියට එන්න පුළුවන්, ඔවුන් සවිබල ගැන්වීම සඳහා වන වැඩ පිළිවෙළක්. ඒ නිසා දුප්පතුන් සවිබල ගැන්වීම සඳහා, ග්‍රාමීය දුප්පත්භාවය නැති කිරීම සඳහා වන යෝජනා ඕනෑ තරම් මෙම අය වැය යෝජනා තුළ ඇතුළත් වනවා. ව්‍යවසායකත්වය සංවර්ධනය කරන හැටි, ඒ වාගේම ඒ අයට ණය ලබා දීමේ යෝජනා ක්‍රම, "ප්‍රජාශක්ති" වැනි යාන්ත්‍රණයක් හරහා ගමට මුදල් ගලාගෙන යන්නේ කොහොමද කියන කාරණා මෙම අය වැය තුළ අන්තර්ගත වෙලා තිබෙනවා. රුපියල් මිලියන 25,000ක් එම කටයුතු සඳහා වෙන් කරලාත් තිබෙනවා.

ඒ වාගේම නිවාස ව්‍යාපෘති සම්බන්ධයෙන් දිගටම සාකච්ඡා වුණා. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් ඒ සම්බන්ධ සංඛ්‍යා දත්ත ඉදිරිපත් කළා. එතුමා පාර්ලිමේන්තු පුස්තකාලයට ගිහින් ඔළුවත් නවාගෙන ගණන් හදමින්, රූප අඳිමින් සිටියා, රුපියල් මිලියනයකින් ගෙයක් හදන්නේ කොහොමද කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ වසරට රුපියල් මිලියන 3,500ක පමණ මුදලක් වෙන් කළා, අඩු ආදායම්ලාභීන්ට නිවාස හදා දීමේ වැඩසටහනට. අපි ඒ තෝරා ගැනීම කරන්නේ මෙහෙමයි. ගෙයක් හදාගත යුතු කෙනෙක් ගමේ ඉන්නවා කියා හිතමු. ඔහුට ගෙයක් හදාගන්න ඕනෑ, නමුත් ආදායමක් නැහැ. අපි ඒ නිවැරදි පුද්ගලයා තෝරාගෙන ඔහුට ගෙයක් හදාගන්න රුපියල් මිලියනයක ආධාර මුදලක් දෙනවා. ඊට අමතරව ඔහුගේ පවුලේ අය ඔහුට උදවු කරනවා, ගමේ අය උදවු කරනවා. ගමේ වඩු බාස් කෙනෙක් ඉන්නවා නම් නිවසට දොරක් හදාගන්න ඔහු උදවු කරනවා, ළඟපාත හාඩ්වෙයාර් එකක් තිබෙනවා නම් ඔහුට සිමෙන්ති කොට්ට කිහිපයක් දෙනවා. ඒ අනුව ඔහුට ප්‍රජා දායකත්වයත් ලැබෙනවා. සමහර තැන්වලට ජාතික ජන බලවේගය විධියට අපි ස්වේච්ඡාවෙන් උදව් කරලා තිබෙනවා. අඩු ආදායම්ලාභීන්ට නිවාස හදා දීමේ වැඩසටහනට අපි මේ වසරට වෙන් කළ රුපියල් මිලියන 3,500 හරහා රටේ නිවාස ඉදිකිරීම අලුත් තැනකට ඇවිල්ලා තිබෙනවා. ඒ අත්දැකීම, ඒ වැඩ පිළිවෙළ, ඒ ක්‍රමය සාර්ථක වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ලබන වසරටත් අපි රුපියල් මිලියන 10,200ක් ඒ වෙනුවෙන් වෙන් කරලා තිබෙන්නේ. ඒක හැල්ලුවට ලක් කරන්න එපා. කොළඹ ඉඳගෙන, කොළඹ ජීවිත දිහා බලාගෙන විග්‍රහ කරන්න එපා, ගමේ දුප්පතුන්ගේ ජීවිත. ඔවුන්ට ආධාරයක් අවශ්‍යයි. ඔවුන්ට ඒ මුදලින් ගෙයක් හදාගන්න පුළුවන්. ඔවුන්ට රුපියල් මිලියනයක් ලබා දීමෙන් - රුපියල් ලක්ෂ 10ක් ලබා දීමෙන් - අපි අරමුණු කරන්නේ ඔවුන් බලගන්වන්නයි, ඔවුන් මේකට පොලඹවන්නයි, ප්‍රජා දායකත්වය සහිතව ගෙයක් හදා ගැනීමේ කටයුත්ත කරන්නයි. එවැනි වැඩ පිළිවෙළක් අපි ආරම්භ කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, your time is up.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
තව කාරණයක් කියලා මගේ කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා, "කථාව දෝලාවෙන් - ගමන පයින්" කියලා. මම නිවාස ඇමති නිසා ඊයේ-පෙරේදා දවසක නිවාස ව්‍යාපෘතියක් බලන්න ගියා, 2015 - 2019 කාලයේ ක්‍රියාත්මක වෙච්ච. ගෙවල් 24ක් හදන්න පටන් අරගෙන තිබෙනවා කිව්වා. මමත් පොඩි වකිතයකින් එතැනට ගියා, ගෙවල් 24ක් හදන්න තිබෙනවා, 15ක්වත් හදලා ඇති, ඒ ජනතාව ඒවායේ පදිංචි වෙලා ඇති, කොහොමද ඒ අයත් එක්ක කථා කරන්නේ, ඒ ප්‍රශ්න ටික මිදුලේම ඉඳලා කථා කරලා එනවා කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතැනට ගියාට පස්සේ මට දකින්න ලැබුණා, ගෙවල් 24න් එක ගෙයයි හදලා තිබෙන්නේ කියලා. ඒකත් ඉඩම් කෑල්ලක් හම්බ වෙච්ච කෙනා වෙන කෙනෙකුට ඒක විකුණලා, ඒ ඉඩම මිලට ගත් කෙනා තමයි ඒ ගෙදරත් හදලා තිබෙන්නේ. ඒ ගෙවල් 24ම හදලා නැහැ.

Foundation දාලා තිබෙනවා, භාගෙට භාගයක් කැලෑවෙන් වැහිලා. ඔහොම තමයි වැඩ කරලා තිබෙන්නේ. ප්‍රේමදාස මහත්තයා 1994දී තමයි, මිහින්තලාවේ ගම් උදාව හැදුවේ. ඒ, මීට අවුරුදු 30කට කලින්. ප්‍රේමදාස මහත්තයාගේ පුතා නිවාස ඇමති විධියට අවුරුදු පහක් හිටියා. මම තමයි ඊයේ-පෙරේදා දවසක ගිහිල්ලා ඒ ගම් උදා භූමියේ ඔප්පු ටික දුන්නේ. කෙරුවාව ගැන කථා කරන්න එන්න එපා. අපි දන්නවා, වැඩ කරන හැටි. අපි දන්නවා, අමාත්‍යාංශ මෙහෙයවන හැටි. අපි දන්නවා, නිලධාරින් එක්ක කටයුතු කරන හැටි. අපි ඒ පරිචය සහිතව තමයි මේ කටයුතුවලට මැදිහත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ වෙන් කළ මුදල්වලින් කොහොමද රටේ සංවර්ධන කටයුතු කරන්නේ කියන එක ගැන අපට අවබෝධයක් තිබෙනවා. ඒ ඉලක්ක වෙත යන්න අපි අධිෂ්ඨාන කරගෙන ඉන්නවා, අපි ඒ ඉලක්ක වෙත යනවා කියන පණිවුඩය දෙමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sugath Thilakaratne. You have 10 minutes.

[අ.භා. 1.00]

**ගරු සුගත් තිලකරත්න මහතා (ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுகத் திலகரத்ன - விளையாட்டுத்துறைப் பிரதி அமைச்சர்)
(The Hon. Sugath Thilakaratne - Deputy Minister of Sports)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ දෙවන අය වැය පිළිබඳ විවාදය පැවැත්වෙන මේ මොහොතේ ඒ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

මේ අය වැය ගැන කථා කරනකොට මම මුලින්ම කියන්න ඕනෑ, අපි ආර්ථික විනයක් සහිතව මෙවර අය වැය ඉදිරිපත් කර තිබෙන බව. විශේෂයෙන්ම මෙය පුරවැසි අය වැයක් ලෙස අපට හඳුන්වන්න පුළුවන්. මොකද, සාමූහික ප්‍රයත්නයක් ලෙස අපේ රටේ සමස්ත පොදු ජනතාව ඔසවා තබන්න කටයුතු කරමින්, සෑම ජන කොට්ඨාසයකම සුරක්ෂිතභාවය තහවුරු කරන්න කටයුතු කරමින්, දුප්පත්කම තුරන් කරන්න කටයුතු කරමින් අපි මෙවර අය වැය ඉදිරිපත් කරලා තිබෙන නිසා. ඒ වාගේම පොහොසත් රටක, ලස්සන ජීවිතයක් ප්‍රාර්ථනා කරමින් යන මේ ගමනේදී ආර්ථික, සමාජයීය හා සංස්කෘතික වශයෙන් අපේ රට ගොඩනහන්න අපි කටයුතු කරනවා. අපි මේ රට භාර ගනිද්දී මේ රටේ තිබුණේ බිඳ වැටුණු ආර්ථිකයක්. අපි ඒ බිඳ වැටුණු ආර්ථිකය 2025 වර්ෂය තුළදී ක්‍රම ක්‍රමයෙන්, පියවරෙන් පියවර ඉදිරියට අරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම ඒ සඳහා වන ආර්ථික උපාය මාර්ග සහිතව තමයි අපි මෙවරත් අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික වර්ධනය සඳහා අපි යොදා ගත් උපාය මාර්ග කිහිපයක් සලකා බලමු. විශේෂයෙන්ම නිෂ්පාදන ආර්ථිකය බලගැන්වීම, අපනයනය ඉහළ දැමීම, digitalization, දුප්පත් බව තුරන් කිරීම, දේශීය හා විදේශීය වශයෙන් ආයෝජන කැඳවා ගැනීම සඳහා වන කරුණු කාරණාත්, ඒ වාගේම සෑම ජන කොටසක්ම සුරක්ෂා කිරීම සඳහා වන කරුණු කාරණාත් එක් රැස් කරගෙන තමයි අපි මෙවර අය වැය සකසා තිබෙන්නේ. මෙවර අය වැයෙන් ලබා දුන් සහන පිළිබඳව අපි ගොඩක් දුරට කථා කළා. සියලු අංශ සඳහා වෙන් කරලා තිබෙන මුදල් පිළිබඳවත් අපි කථා කළා.

ඒ වාගේම මේ දිනවල විශේෂ මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා, වතු කම්කරු ජනතාවට අපි වැඩි කරලා දුන් මුදල. රුපියල් 1,350ක්ව තිබුණු වතු කම්කරු දෛනික වැටුප, අපි රුපියල් 1,750 දක්වා වැඩි කළා. ඒ සඳහා රුපියල් 200ක මුදලක් අපි රජයෙන් ලබා දෙනවා, පැමිණීමේ විශේෂ දිරි දීමනාවක් ලෙස. මේ වනකොට ඒ දිරි දීමනාව සම්බන්ධයෙන් විපක්ෂයෙන් ඉතා කුහක ලෙස, දැඩි ලෙස ප්‍රහාර එල්ල කරන බවක් තමයි අපට දකින්නට තිබෙන්නේ. විශේෂයෙන්ම අද "ඩේලි මිරර්" පුවත් පතේ වාර්තාවක් තිබෙනවා, රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය වතු කම්කරුවන්ට ඒ මුදල ගෙවීම නීති විරෝධියි කියලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට, විගණකාධිපති දෙපාර්තමේන්තුවට සහ ප්‍රසම්පාදන ආයතනවලට මේ කරුණු විමසා දන්වා යවා තිබෙන බව. ඇත්තටම ඒක සජබයේ මතයද කියලා මම අහන්න කැමැතියි, විපක්ෂ නායකතුමාගෙන්. මොකද, පසුගිය වසරේ ජනාධිපතිවරණයට ප්‍රථම විපක්ෂ නායකතුමා කියනවා මට ඇහුණා, වතු කම්කරුවන් වතු හිමියන් කරනවා කියලා. ඉතින් ඒ නිසා ආණ්ඩුවක් විධියට අපි එහෙම රුපියල් 200ක මුදලක් ලබා දීම හොඳද, නරකද කියලා අපි දැනගන්න කැමැතියි. අද වනකොට බදුල්ලේ වතු කම්කරුවන් සියලුදෙනා පාරට ඇවිල්ලා පොල් ගහන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා, ඔවුන්ට මේ රුපියල් 200 දීමනාව ලබා දීමට විරෝධය පළ කිරීමට එරෙහිව. ඇත්තටම ඔවුන් අපේ රටේ පුරවැසියන්.

සංවර්ධනය ග්‍රාමීය මට්ටම දක්වා යන විධියට තමයි අපි මේ අය වැය හදලා තිබෙන්නේ. ඒක තමයි අපි කියන්නේ, මේ අය වැය ස්ථාවරත්වය සඳහා ගෙන යන්නේ ඉතාම විනයානුකූලව කියලා. අපට මේ අය වැය තුළ තව සාධනීය කරුණු කිහිපයක් එළිදක්වන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංචාරක ක්ෂේත්‍රය ගත්තොත්, 2030 වනකොට අපේ ඉලක්කය වෙලා තිබෙනවා, ඩොලර් බිලියන අටක ආදායමක් ලබා ගැනීම. අපි අපේක්ෂා කරන ඉලක්කයට යන්න ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම ඇතුළු කටයුතු කරන්න අපට සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම අපි සංචාරකයන් මිලියන හතරක ඉලක්කයක් ළඟා කර ගන්නත් බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් මේ සඳහා අපි වෙන් කරන ලද මුදල් සංචාරක ආයතන ප්‍රතිව්‍යුහගත කරන්න, අවශ්‍ය යටිතල පහසුකම් හදන්න, මානව සම්පත් සංවර්ධනය කරන්න සහ විශේෂයෙන්ම අපේ රටේ තිබෙන සංචාරක ස්ථාන පිළිබඳ ප්‍රචාරණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය වෙනවා. සංචාරක ආකර්ෂණීය ස්ථාන යථා තත්ත්වයට පත් කරලා, හොඳ සංචාරක ආකර්ෂණයක් ඇති කර ගැනීම සඳහා රුපියල් මිලියන 800ක මුදලක් මෙවර අය වැයෙන් අපි වෙන් කරලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, අපේ රටේ ආර්ථිකය අපි බලාපොරොත්තු වෙන ඉලක්කයට ගෙන එන්න පුළුවන් වේවි කියලා. අපි දීර්ඝ කාලීන සැලැස්මකට යන්නේ, සියයට හතක ආර්ථික වර්ධනයක් බලාපොරොත්තුවෙන්. ඒ යන ගමනේදී අපට සංචාරක කර්මාන්තය පිළිබඳ ලොකු විශ්වාසයක් තියා ගන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සොබාදහම කේන්ද්‍ර කර ගත් සංචාරක කර්මාන්තයක් වාගේම අපේ ඓතිහාසික උරුමයන් කේන්ද්‍ර කර ගත් සංචාරක කර්මාන්තයක් තමයි අපේ රටේ තිබෙන්නේ. අපේ රටේ තිබෙන සොබා සුන්දරත්වය විඳීමට වාගේම ඓතිහාසික ස්ථාන නැරඹීමට තමයි විශේෂයෙන්ම විදේශිකයන් අපේ රටට පැමිණෙන්නේ. ඒවායේ තිබෙන ප්‍රෞඪත්වය, ඒවායේ වටිනාකම් පිළිබඳව ඔවුන් ඉගෙන ගන්නවා. සංචාරක කර්මාන්තය වෙනුවෙන් මෙවර අය වැයෙන් අපි රුපියල් මිලියන 3,500ක මුදලක් වෙන් කර තිබෙනවා. විශේෂයෙන් ඒ යටතේ සංචාරක කර්මාන්තය වෙනුවෙන් බස්නාහිර පළාතට මුදල් වෙන් වෙලා තිබෙනවා, බස්නාහිර පළාතේ වෙරළ තීරය, හැමිල්ටන් ඇළ සහ මීගමු කළපුව සංවර්ධනය සඳහා. බස්නාහිර පළාත් වෙරළ තීරය ගත්තොත්, කිලෝමීටර 120ක පමණ ප්‍රමාණයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මීගමු කළපුව ගත්තත්, හෙක්ටෙයාර 6,332ක විශාලත්වයක් පවතිනවා. මේවා සංවර්ධනය කිරීම සඳහා අපට විශාල වශයෙන් මුදල් ලැබී තිබෙනවා. විශේෂයෙන් මීගමුව ආශ්‍රිතව අපට හොඳ සංචාරක කලාපයක් පටන් ගන්න පුළුවන්. මේ වනකොට කළපුව දැඩි ලෙස පරිසර හානියකට ලක් වෙලා තිබෙනවා, දූෂණය වෙලා තිබෙනවා. මිනිස් ක්‍රියාකාරකම්වලින් තමයි මේ පරිසරය දූෂණය වෙලා තිබෙන්නේ. Plastic, fibre හා oil වර්ගවලින් මේ කළපුව දූෂණය වෙලා තිබෙනවා. ඉතින්, අපට මේ දේවල් clean කරගන්න වෙනවා, විශේෂයෙන් Clean Sri Lanka වැඩසටහන යටතේ. ඒ වාගේම අපට වෙරළ පාවිච්චි කරන්න පුළුවන්, වෙරළ ක්‍රීඩා සඳහා. එතකොට ක්‍රීඩා ආර්ථිකයෙනුත් අපට, අපි බලාපොරොත්තු වන ඉලක්කවලට යන්න හැකියාව ලැබෙනවා. මෙවැනි කරුණු කාරණා එක්ක තමයි අපි මෙවර අය වැය හදලා තිබෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, ලස්සන රටක් හදන්න.

විශේෂයෙන්ම අපේ තේමා පාඨය වන "ජවසම්පන්න පුරවැසියෙක් - ජයග්‍රාහී ජනතාවක්" නිර්මාණය කිරීම සඳහා කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වෙනුවෙන්

[ගරු සුගත් තිලකරත්න මහතා]

ක්‍රීඩා සංස්කෘතිය ප්‍රචලිත කිරීමට රුපියල් මිලියන 1,800ක මුදලක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඊට අමතරව තවත් රුපියල් මිලියන 800ක් වෙන් කිරීමට යෝජනා කර තිබෙනවා. ඉතින්, අපි මේ ක්‍රීඩා සංස්කෘතිය වර්ධනය කිරීම තුළින් බලාපොරොත්තු වෙන්නේ අපේ රටේ සෑම ජන කොටසක්ම නීරෝගීමත් පිරිසක් බවට පත් කිරීමයි. මොකද, මේ වෙනකොට අපේ රටේ බෝ නොවන රෝගවලට ගොදුරු වෙලා සිටින ප්‍රතිශතය වැඩියි. ඒ සඳහා කුඩා දරුවාගේ සිට වැඩිමහලු පුද්ගලයන් දක්වාම අපට මේ ක්‍රීඩා සංස්කෘතියට ඇඳාගන්න සිද්ධ වෙනවා. මේ වෙන් කර තිබෙන මුදල ඒ සඳහා විශාල ආයෝජනයක් වෙයි කියා මා හිතනවා. ඒ තුළින් අපේ ජීවිතවලට විශාල වටිනාකමක් ලැබෙයි කියාත් මා විශ්වාස කරනවා. මොකද, අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් ගත්තත්, බෝ නොවන රෝග කළමනාකරණය සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඉතින්, මේ සියලුම දේවල් අපි රටේ සමස්ත ප්‍රජාව වෙනුවෙන් තමයි ඉදිරිපත් කර තිබෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, පොහොසත් රටක ලස්සන ජීවිතය හදන තැනට මේ අය වැය සාර්ථකව ගෙනයන්න අපට පුළුවන් වෙයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව මම මෙහෙම අවසන් කරන්නම්. මේ අය වැය යෝජනා මඟින් අපේ රටේ ආර්ථිකය පෝෂණය කරමින්, ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට අපි විශේෂයෙන් බලාපොරොත්තු වෙනවා. අපේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට සියලු පාර්ශ්වයන්ගේ සහයෝගය අපි විශේෂයෙන් බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, ස්වයංපෝෂිත ආර්ථිකයක් ළඟා කර දීමට අප සියලු දෙනා එකාවන්ව, විශ්වාසයෙන් කටයුතු කළ යුතු යැයි මා යෝජනා කරනවා. ඒ විශ්වාසය සමඟ මගේ කථාව මා අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Palani Thigambaram. You have eight minutes.

[பி.ப. 1.11]

**ගරු පලනි දිගම්බරම් මහතා**
(மாண்புமிகு பழனி திகாம்பரம்)
(The Hon. Palani Thigambaram)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் இரண்டாவது வரவு செலவுத்திட்ட விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதில் மகிழ்ச்சி யடைகின்றேன். இந்த அரசாங்கம் வரவு செலவுத்திட்டத்தின் ஊடாக, மலையகப் பெருந்தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வினை அறிவித்திருக்கின்றது. பெருந்தோட்டக் கம்பனிகள்மூலம் அடிப்படைச் சம்பளத்தில் 200 ரூபாயை உயர்த்துவதற்கும், அரசாங்கத்தின்மூலம் ஊக்குவிப்புக் கொடுப்பனவாக 200 ரூபாயை வழங்குவதற்கும் நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது. உண்மையிலே இது வரவேற்கக்கூடிய விடயமாகும்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நல்லாட்சி அரசாங்கக் காலத்தில் பெருந்தோட்டத் தொழிலாளர்களுக்கு அரசாங்கத்தினூடாகச் சம்பள உயர்வை வழங்குவதற்கு முயற்சிகளை எடுத்தோம். ஆனாலும், அது கைகூடவில்லை. இந்த அரசாங்கம் 200 ரூபாயை வழங்க முன்வந்திருக்கின்றது. இந்தத் திட்டம் நடைமுறைக்கு வந்தால், அது சிறந்த விடயமாக இருக்கும். அதுவும் ஊக்குவிப்புத் தொகையாக இல்லாமல் அடிப்படைச் சம்பளத்தில் அதிகரித்து வழங்கப்பட்டிருந்தால், மக்கள் உங்களைக் கொண்டாடியிருப்பார்கள். ஒரு நாளைக்கு 200 ரூபாய் என்பது 2026ஆம் ஆண்டில் மட்டுமா அல்லது தொடர்ச்சியாக வரவு செலவுத்திட்டத்தின்மூலம் இவ்வாறு நிதி ஒதுக்கீடு செய்யப்படுமா? என்பதைத் தெளிவுபடுத்த வேண்டும்.

மலையக மக்களின் வாழ்க்கையில் முன்னேற்றம் ஏற்படுவதற்கு எந்த அரசாங்கம் நல்ல திட்டங்களைக் கொண்டுவந்தாலும், அந்தத் திட்டங்களுக்கு எங்களுடைய முழுமையான ஆதரவை வழங்குவோம். ஆனால், மலையகப் பெருந்தோட்ட மக்களுக்குத் தொடர்ச்சியாக அரசாங்க உதவியோடு சம்பள உயர்வை வழங்குவது சாத்தியமா? என்பதையும் தெளிவுபடுத்த வேண்டும். இந்த நிலை தொடர்ந்தால், இன்னும் குறிப்பிட்ட காலத்துக்குள் பெருந்தோட்டத் தொழில் துறை முற்றாக அழிந்துவிடும் அபாயமுள்ளது. எனவே, பெருந்தோட்டத் தொழில் துறையைப் பாதுகாக்கும் வகையில் மறுசீரமைப்புச் செய்வது அவசியமாகும். மலையகப் பெருந்தோட்ட மக்களுக்குக் காணிகளைப் பிரித்துக் கொடுத்து, அவர்களைச் சிறு தோட்ட உரிமையாளர்களாக மாற்றுவதே இதற்கான தீர்வாகும். நாங்கள் அதனையே தொடர்ச்சியாக வலியுறுத்தி வருகின்றோம்.

இந்த வரவு செலவுத்திட்டத்தில் நுவரெலியா மாவட்டத்தில் ஹட்டன் நகரத்தை அபிவிருத்தி செய்வதற்கு நிதி ஒதுக்கீடு செய்வதாகக் கூறப்பட்டுள்ளது. நல்லாட்சிக் காலத்தில் ஹட்டன் புகையிரத நிலையத்தைச் சுற்றிப் போடப்பட்டிருந்த தகர வேலிகளை அகற்றிப் புதிய கட்டிடம் ஒன்றை நிர்மாணித்தோம். ஆனால், ஆட்சி மாற்றத்தின் காரணமாக எங்களால் தொடர்ச்சியாக அந்த அபிவிருத்திப் பணிகளை முன்னெடுக்க முடியாமல் போயுள்ளது. நுவரெலியா மாவட்டத்தின் பிரதான நகரமாக விளங்குகின்ற ஹட்டன் நகரம் அபிவிருத்தி செய்யப்பட வேண்டியது கட்டாயமானது. முறையான கழிவு அகற்றுதல், பேருந்து நிலைய அபிவிருத்தி, வடிகால் அமைப்பு, வாகனத் தரிப்பிடம் என்பன இதில் இடம்பெறும் என நம்புகின்றோம்.

வைத்தியசாலைகளை அபிவிருத்தி செய்வதற்கும் தரம் உயர்த்துவதற்கும் நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. நுவரெலியா மாவட்டத்தில் சிறுநீரக நோயால் பாதிக்கப் பட்ட மக்கள் இரத்தச் சுத்திகரிப்பு - dialysis - செய்வதற்காக கண்டி வைத்தியசாலைக்குச் செல்ல வேண்டியிருக்கின்றது. இவர்களின் நிலை கவலையாக இருக்கின்றது. இதற்கான வசதியை கிளங்கன் வைத்தியசாலையில் ஏற்படுத்திக் கொடுத்தால் அவர்கள் அச்சிகிச்சையை இலகுவாகப் பெற்றுக்கொள்ள முடியும்.

நுவரெலியா மாவட்டத்தில் உள்ள சில பிரதேச சபைகள் மற்றும் பிரதேச செயலகங்களுக்குப் போதுமான நிரந்தரக் கட்டிட வசதிகள் இல்லை. எனவே, அவற்றினை அமைத்துக் கொடுக்க இந்த அரசாங்கம் நடவடிக்கை எடுக்கவேண்டு மெனக் கேட்டுக் கொள்கின்றேன்.

இந்த அரசாங்கத்தில் உள்ள மலையகப் பிரதிநிதிகள் ஏனைய மலையகப் பிரதிநிதிகளை மன்னிப்புக் கேட்கச் சொல்வதையும், பதவி விலகச் சொல்வதையுமே வழக்கமாகக் கொண்டுள்ளனர். எங்களது ஆட்சிக் காலத்தில் அதிகமான வேலைத்திட்டங்களை நாங்கள் மலையக மக்களுக்காகச் செய்துள்ளோம். எங்களது ஆட்சிக் காலத்தில் உருவாக்கிய

பிரதேச சபைகளைத்தான் உங்களுடைய உறுப்பினர்கள் இன்று ஆட்சி செய்து கொண்டிருக்கின்றார்கள். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பிரதேச சபைகளால் பெருந்தோட்டப் பகுதிக்குச் சேவை செய்ய முடியாது என்றிருந்த 33வது சரத்தைத் திருத்தியதன் காரணமாக இன்று எந்தத் தடையும் இல்லாமல் இவர்களால் பெருந்தோட்டப் பகுதிக்கு நிதி ஒதுக்கீடு செய்து அபிவிருத்திப் பணிகளை முன்னெடுக்க முடிகின்றது. எங்களுடைய ஆட்சிக் காலத்தில் மக்களுக்காக உருவாக்கிய பிரதேச செயலகங்களைத்தான் உங்களுடைய தேவைக்காக நோர்வூட்டில் இருந்து ஹட்டன் நகருக்கு மாற்ற முயற்சிக்கின்றீர்கள்.

நல்லாட்சிக் காலத்தில் இயற்கை அனர்த்தங்கள் ஏற்பட்டபோது, அவர்களுக்கான தனி வீடுகளை உடனடியாக நிர்மாணிக்க நடவடிக்கை எடுக்கப்பட்டது; எரிந்த கூரையினை மீண்டும் திருத்த நாங்கள் நடவடிக்கை எடுக்கவில்லை. மலையக மக்களுக்கு அபிவிருத்திப் பணிகளை முறையாக முன்னெடுப்பதற்கு ஓர் அதிகாரசபையினை உருவாக்கினோம். ஆனால், இன்று மூடுவதற்கான அரச நிறுவனங்களின் பட்டியலில் அந்த அதிகாரசபையும் உள்ளது. மலையகத்தில் carpet பாதைகளைத் தேசிய மக்கள் சக்தி அரசாங்கம்தான் முதன்முதலாக முன்னெடுக்கவில்லை. நல்லாட்சிக் காலத்தில் அதிகமான carpet பாதைகளை நாங்கள் அமைத்துள்ளோம்.

இந்த அரசாங்கம் செய்யும் நல்ல திட்டங்களுக்கு எங்களுடைய ஆதரவை வழங்குவோம். அதேபோல் இந்த அரசாங்கத்தில் அங்கம் வகிக்கின்ற மலையகப் பிரதிநிதிகள் பேச்சில் மாத்திரம் அரசியல் செய்யாது, அபிவிருத்திப் பணிகளை முன்னெடுக்க வேண்டும். இன்று பாராளு மன்றத்தில் பதவி விலகக் கூறுகின்ற மக்கள் பிரதிநிதிகள்தான், உள்ளூராட்சிச் சபையில் ஆட்சி அமைக்க ஒன்றாக இருந்தார்கள் என்பதும் மக்களுக்குத் தெரியும்.

பெருந்தோட்ட மக்களின் சம்பள விடயத்தில் போலவே மலையக மக்களின் நீண்டகாலப் பிரச்சினையாக இருக்கின்ற காணிப் பிரச்சினைக்குத் தீர்வு காணும் வகையில் 10 பேர்ச் காணிகளை வழங்க நடவடிக்கை எடுக்க வேண்டும்.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයෙන් ආණ්ඩුව වතු කම්කරු ජනතාවට රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබීම ගැන අපි සතුටු වනවා. ඒ අයට දීමනාවක් දෙන්නත් යෝජනා කර තිබෙනවා. කවුරු හරි ඇමතිවරයෙක් ඉන්නවා නම් කියන්න, මේ දීමනාව දවස් 25ක් ආවත් දෙනවාද, නැත්නම් එක දවසක් ආවත් දෙනවාද කියලා. මොකද, විපක්ෂයේ සමහර කණ්ඩායම් - මට ඕනෑ නම් නමත් කියන්න පුළුවන් - නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා මේකට විරුද්ධයි, ජනතාවගේ බදු සල්ලිවලින් වතු කම්කරුවන්ට මේ ප්‍රතිපාදන ලබා දෙනවා කියලා. ඒගොල්ලන් දැන ගන්න ඕනෑ, වතු කම්කරු ජනතාව අවුරුදු 200ක් මේ රටට හම්බ කරලා දීලා තිබෙනවා කියලා. ඒක ඒගොල්ලන්ට දෙන්නේ නැත්නම් කාටද දෙන්නේ? එම නිසා විවේචනය කරන්න එපා. ඔයගොල්ලන්ගේ ආණ්ඩු කාලයේ දෙන්න බැරි වුණා. හැබැයි ඒක මේ ආණ්ඩුව ලබා දෙනවා නම් ඒකට අපි සතුටු වෙන්න ඕනෑ. ඒගොල්ලන්ට සහයෝගය දෙන්න ඕනෑ. වතු කම්කරු ජනතාවගේ වැටුප් වැඩි කිරීම ගැන ජනාධිපතිතුමාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Madhura Senevirathna. You have 11 minutes.

[අ.භා. 1.17]

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඓතිහාසික අය වැය විවාදයට සහභාගී වීමට කාලය ලබා දීම ගැන මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විපක්ෂයෙන් ප්‍රශ්න කිහිපයක් නැඟුණු නිසා පිළිතුරු දීලාම ඉන්න එක හොඳයි කියලා මම හිතනවා. ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් නැඟුවා, නෝර්වුඩ් ඉඳලා හැටන්වලට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගෙනෙන්න ලෑස්ති වෙනවා කියලා. අපේ ප්‍රතිපත්තිය තමයි, ගමට රාජ්‍ය සේවය ගෙනියන එක. ඒ නිසා ඒක කිසිසේත්ම වෙන්නේ නැහැ. කඳුකරය නියෝජනය කරන මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම පාර්ලිමේන්තුවේ ඉන්නවා.

අවුරුදු 200කට පස්සේ වන මේ ඓතිහාසික පඩි වැඩිවීම වෙනුවෙන් ප්‍රතිපත්තිමය එකඟතාවක් තිබෙන නිසා, ඔබතුමන්ලා අපේ ආණ්ඩුවත් එක්ක එකඟ වෙලා අය වැයේදී අපට පක්ෂව ඡන්දය දෙයි කියලාත් ඒ කඳුකර ජනතාව බලාගෙන ඉන්න බව අපි කියන්න කැමැතියි.

2026 අය වැය ගත්තොත්, මේක අපට 2025 අය වැයත් එක්ක සම්බන්ධ නොකර ඉන්න බැහැ. අපි බලයට ආවේ කොහොමද, ඒ වන විට රට තිබුණේ මොන වාගේ තැනකද? මම පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් සියලුදෙනාට යෝජනාවක් කරනවා. අපි බලමු, මේක compare කරලා. විවිධාකාර ආණ්ඩුවල පසුගිය අය වැය එක්කත් බලමු. මම මේක කියන්නේ විශේෂ හේතුවක් නිසා. අපි පළමුවෙනි අය වැයෙන් පටන් ගත්තේ කඩා වැටෙමින් තිබුණු රටක ආර්ථිකය ස්ථාවර කිරීමේ කාර්යය. අපි කඩා වැටෙමින් තිබුණු රට ස්ථාවර කරලා, අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. දැන් ඔන්න අපි මේ අවුරුද්දේම 2026 වසර සඳහා අය වැය -අපේ දෙවැනි අය වැය- ඉදිරිපත් කළා. සමහර රටවල් කඩා වැටීමකින් පස්සේ යථා තත්ත්වයට පත් වෙන්න අවුරුදු 10ක් ගත වුණා. උදාහරණයක් ගත්තොත්, ග්‍රීසිය 2007 වසරේ කඩා වැටුණාට පස්සේ යථා තත්ත්වයට පත් වෙන්න අවුරුදු 10ක් ගියා. අපි හිටපු තත්ත්වය මොකක්ද? ජනතාව බලාපොරොත්තු වුණා මේ පද්ධතියේ වෙනසක්. ආර්ථික දර්ශක පහළ වැටුණු, ණය පොලී අනුපාතය ඉහළ නැඟපු, ණය බර වැඩි වුණු, උද්ධමනය ඉහළ ගිය, විදෙස් විනිමය සහ සංචිත බිඳ වැටුණු, සංචාර ව්‍යාපාරය බිඳ වැටුණු, විදේශ ආයෝජන, විදේශ සේවා බිඳ වැටුණු රටක් තිබුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා බදු ප්‍රතිපත්තියත් වුණේ මොකක්ද? කාලයක් තිබුණා, ෆයිල් 600කින් සියයට 69කට අදාළව විතරක් බදු අය කරගත්තු. ධනවත් ව්‍යාපාරික පෙළැන්තියක් හිටියා බදුවලින් වියුක්ත වුණු. අන්න එහෙම රටක් තමයි අපි භාර ගත්තේ. එදා බෙහෙත් හිඟයක් තිබුණා; දූපත්කම සියයට 25ක ප්‍රමාණයක තිබුණා; පාරිභෝගික දර්ශක අනුව මාසික ආදායම සියයට 60කින් අඩු වෙලා තිබුණා. සියයට 77ක් මොන යම් හෝ ආකාරයකින් ආහාර උද්ධමනයට පාත්‍ර වෙලා තිබුණා. ආහාර සුරක්ෂිතතාව සියයට 28යි. ලෝක ආහාර සංවිධානය කියන විධියට සියයට 78ක් කෑම ගන්න එක අඩු කරලා හිටියා. මන්දපෝෂණය සියයට 17යි. ඉතින්, ඔන්න ඔහොම රටක් තමයි අපි භාර ගත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ තත්ත්වය කොච්චර බරපතළද කිව්වොත්, නිවෙස්වල සියයට 89ක් දෙනා එක්කෝ ණය අරගෙන තිබුණා, එක්කෝ තමන්ගේ දේවල් විකුණා තිබුණා, නැත්නම් පොලියට සල්ලි අරගෙන තිබුණා.

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

අන්න එහෙම තත්ත්වයක් යටතේ තිබුණු රටක් ගොඩ ගන්න අප ගත්තේ අවුරුද්දයි. ග්‍රීසියට අවුරුදු 10කට ගෙනෙන්න බැරි වුණු තත්ත්වයකට මේ අවුරුද්ද ඇතුළත අපි මේ රට ගෙන ආවා.

මම කියන්නම්, අප ඇති කරගත් ඉලක්ක මොනවාද සහ ඒ ඉලක්කවලට අප කොහොමද ගියේ කියලා. ඒ සඳහා සමහර වෙලාවට දැඩි ආර්ථික ප්‍රතිපත්තිවල ඉන්නත් අපට සිදු වුණා. මෙහිදී මූල්‍ය විනය කියන එක ඉතාම වැදගත් කාරණයක්. එවැනි වැදගත් කාරණා තුනක් තිබෙනවා. මූල්‍ය විනය, ව්‍යවස්ථාපිත වංචා හා දූෂණ නැති කිරීම සහ උද්ධමනය නැති කිරීම කියන කාරණා තුනත් එක්ක අපට පුළුවන් වුණා, රුපියල් ට්‍රිලියනයක් භාණ්ඩාගාරයේ ඉතිරි කර ගන්න. ඒත් එක්කම අපි ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව යන ආයතන හරහා ආදායම වැඩි කර ගත්තා. මා කලින් කියපු විධියට ආදායම් බදු නොගෙවා එළියේ හිටපු පිරිස අපි බදු දැලට හසු කර ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලයක් තිබුණා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10කවත් බදු ආදායමක් උපයාගන්න බැරි වුණු. මොකද, මා ඉහත කී කොටසින් විතරයි බදු අය කර ගත්තේ. ඒ හේතුවෙන් අපි විශාල බදු ආදායමක් අහිමි කර ගනිමින් හිටියේ. අපි ඒ කොටසත් කොහොම හරි බදුවලට ඇතුළු කර ගත්තා. අපි හිතනවා, නව ඩිජිටල්කරණයෙන් පසුව බදුවලින් ලොකු ආදායමක් ගන්න අපට පුළුවන් වෙයි කියලා; සාමාන්‍ය මහ ජනතාවට බදු සහන දෙන්න පුළුවන් වෙයි කියලා සහ VAT අඩු කරන්න පුළුවන් වෙයි කියලා. අපි ගිය වර අය වැයෙන් පසුව VAT අඩු කළා.

රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංවිධානය කරන්නත් අපට සිදු වුණා. ණය ප්‍රතිව්‍යුහගත කිරීම ඉතාම සාර්ථකව සිදු වුණා. විශේෂයෙන් ගත්තොත්, අප ළඟ තිබෙන සංචිත වැඩිවීමත් එක්ක ද්විපාර්ශ්වික වෙළෙඳ ගනුදෙනු සම්බන්ධයෙන්, ද්විපාර්ශ්වික ණය අඩු කිරීම - haircuts - සම්බන්ධයෙන් රටවල් අපත් එක්ක නිශ්චිත එකඟතාවක හිටියා. විදෙස් ආයෝජන එන්න එන්නම වැඩි වෙන්න පටන් ගත්තා. සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන ආදායමේ ඓතිහාසික වැඩි වීමක් අපි දකිනවා. මේ සියල්ල එක්ක ආර්ථික පැත්ත විතරක් නොවෙයි, සුබසාධනයත් ඒ ගමන්ම වැඩි කරන්න, ශුද්ධ ආර්ථිකය ගමට ගෙන යන්න අපට ඕනෑ. ඉතින් අපි මෙන්න මෙහෙම දෙයක් කළා. සියල්ලන්ටම ගැළපෙන විධියට මේ ආර්ථිකය ගමට ගෙන යන ඓතිහාසික වැඩක් අපි කළා. අස්වැසුම ප්‍රතිලාභයත් අපි දිගටම දුන්නා. වැටුප් වැඩි කිරීම් බොහොම අමාරුවෙන් වුණත් අපි කළා. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ ආබාධ සහිත පුද්ගලයන් -ආන්තික පුරවැසියන්- අපි අමතක කළේ නැහැ. වතුකරයේ ජනතාව නඟා සිටුවීමේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කළා. අප මේ කටයුතු කළේ, වංචාව, දූෂණය නැති කිරීම සහ දැඩි මූල්‍ය විනය ඇති කිරීම මූලික ප්‍රතිපත්තියක් විධියට සලකමින්. විශේෂයෙන් අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත ආදිය භාවිතයට ගනිමින් තමයි අපි ඒ දේවල් කළේ. ඒ දේවල් එක්ක අපට ළඟා කරගන්න පුළුවන් වුණු දෙයක් තිබුණා. ආර්ථික ස්ථාවරත්වයක්, සාධාරණ සහ විනිවිදභාවයක් සහිත රටක් විධියට අප ඉදිරියට යන බව වෙනත් රටවලට පෙන්වන්න පුළුවන් හැකියාවක්, අවස්ථාවක් අපට ලැබුණා. මේක තමයි අපේ විධිය. මා කියන්නේ දේශපාලනය අමතක කරලා මේවා ගැන අධ්‍යයනය කරන්න කියලායි. ඒ තත්ත්ව දෙක ගැන අධ්‍යයනය කරන්න; සංසන්දනය කරන්න. එසේ compare කරන කොට තමන්ටම අදහසක් ගන්න පුළුවන් මේවා කොහොමද වුණේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කාරණා හයක් ඔස්සේ ඉස්සරහට යනවා. ඒවා තමයි, තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක්, අපනයන විවිධාංගීකරණය, ණය තිරසරභාවය, නිෂ්පාදන ආර්ථිකය, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම සහ ඩිජිටල්කරණය ප්‍රවර්ධනය. අපි හිතනවා අප ගොඩ නඟාගෙන තිබෙන මේ ස්ථාවර ආර්ථික වේදිකාව ඔස්සේ අර කියපු කාරණා හයට යන්න අපට පුළුවන් කියලා. තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනය, අපනයන විවිධාංගීකරණය ආදි ඒ කාරණා සියල්ල සහිත රටක් අපි හදනවා. ප්‍රශ්නයකුත් නැඟුණා අපි කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට - SMEsවලට - උදව් කරන්නේ නැද්ද කියලා. අපි එය කරනවා. අපි එහි විවිධාකාර පාර්ශ්ව හඳුනාගෙන තිබෙනවා. කෘෂිකාර්මික ක්ෂේත්‍රය ඉන් එකක්. තරුණ සහ කාන්තා පිරිස ද ඇතුළුව සියලු ව්‍යවසායකයන් වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා.

මේ කටයුතු කරන ගමන්ම අපි මහපොළ සහ ශිෂ්‍යාධාර දීමනා වැඩි කළා; ශිෂ්‍යයන්ට ලබා දෙන ණය ප්‍රමාණයත් වැඩි කළා. වතාවක් මේ පාර්ලිමේන්තුවේදී කියැවුණා විදේශ ශිෂ්‍යත්වවලට මුදල් වෙන් කළාට මොකුත් වුණේ නැහැ කියලා. ඒ සම්බන්ධයෙන් මතු වුණු කාරණාවලට මීට පෙරත් උත්තර දුන්නා. අපි කියන්න කැමැතියි, ලෝකයේ තිබෙන ලොකුම විශ්වවිද්‍යාලවලට Z අගය වැඩිම ශිෂ්‍යයන් යවන්න අප දැන් ලැහැස්ති කර තිබෙන බව. ඒ අවබෝධතා ගිවිසුම්වලට අත්සන් කරන ගමන් තමයි අප මේ ඉන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිෂ්පාදන ආර්ථිකය වැඩිදියුණු කරන්න බැහැ, රටේ සංවර්ධන ඉලක්ක පර්යේෂණ හා බද්ධ කළේ නැත්නම්. අපි පළමුවෙනි වතාවට රුපියල් බිලියන 21ක් පර්යේෂණ සහ සංවර්ධන කාර්යයට මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Madhura Senevirathna, your time is up.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
මට තවත් විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේක තමයි ආර්ථිකය එක පාර පිම්මක් ගන්නා, boost වෙන අවස්ථාව. අපි මෙහිදී කෘෂිකර්මය, ආර්ථිකය, අධ්‍යාපනය සහ මහජන සේවාවන්ද වැඩිදියුණු කරනවා.

සාරාංශ කරලා කිව්වොත්, අපි 2025දී ගමනක් යන්න පටන් ගත්තා. ඒ ගමන් මඟ ගැන තමයි අපි කිව්වේ. දැන් අපි ස්ථාවරයි. දැන් අපි එකින් එකට ඉලක්කගත ආර්ථිකයක් පවත්වාගෙන යනවා. අපි හිතනවා, රටක අය වැය කියන්නේ සියල්ලන්ගේම අනාගතය වෙනුවෙන් පොදුවේ හදන සැලැස්මක් කියලා. ඒ නිසා පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අය වැය දිහා නිසි විධියට බලන්න. ඒ සඳහා පොත් 10ක් විතර තිබෙනවා. ඒ පොත් පත් බලා නිගමනයකට එළඹෙන්න. අපි සාධනීය විවේචන පිළිගන්නවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. T.K. Jayasundara. You have nine minutes.

[අ.භා. 1.29]

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අය වැය විවාදයට සහභාගි වෙන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අය වැයක් කියන්නේ මොකක්ද කියන එක අපේ ගරු ජනාධිපතිතුමා අය වැය කථාව කරමින් කිව්වා. ඒ කරපු ප්‍රකාශයෙන් කොටසක් ඉදිරිපත් කරලා ඒ පිළිබඳ හැඳින්වීමක් කරන්න මම කැමැතියි. 2026 අය වැය කථාවේදී ගරු ජනාධිපතිතුමා මෙසේ කියනවා:

> "රටක අයවැයක් යනු අප උපයන දේ, අප වියදම් කරන දේ සහ ජාතියක් ලෙස අප ණයට ගන්නා දේ මනින ගිණුම්කරණ අභ්‍යාසයක් පමණක් නොවේ. එය හුදෙක් ලියවිල්ලක් පමණක් නොවේ. එය අපගේ සංවර්ධන ඉලක්ක සපුරා ගනිමින් රාජ්‍ය මූල්‍ය තිරසරභාවය සමතුලිත කිරීමට අවශ්‍ය දුෂ්කර සහ විනිවිද පෙනෙන භුවමාරුවල පිළිබිඹුවක්. කොටින්ම, සියලුම පුරවැසියන්ගේ අයිතිවාසිකම් සපුරාලීම සඳහා අවශ්‍ය වන මූල්‍යමය ප්‍රතිපාදන බෙදා වෙන් කරනු ලබන්නේ අයවැය තුළින් බව අපි විශ්වාස කරනවා. ඒ අනුව එය රටකට හෙට දවස ගැන සම්මුතියක්!"

ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවෙන් ගත්තු මේ උද්ධෘතයට අදාළවයි මම මේ කථාව කරගෙන යන්නේ. අය වැයක් කියන්නේ රටක දීර්ඝ කාලීන සැලැස්මක කොටසක්.

ඒ දීර්ඝ කාලීන සැලැස්මක කොටසක් ගැන කථා කරනකොට රටක දේශපාලන දර්ශනය, ආර්ථික න්‍යාය පිළිබඳ දාර්ශනික කථා බහක් මේ පාර්ලිමේන්තුවේ ඇති වෙන්න ඕනෑ. ඒකට ආණ්ඩු පක්ෂයෙන් වේවා, විපක්ෂයෙන් වේවා සාරගර්භ සාකච්ඡාවක් අවශ්‍යයි. නමුත්, ඒ සාරගර්භ සාකච්ඡාවක් විපක්ෂය පැත්තෙන් කෙරෙන්නේ නැති බවක් අපි දකිනවා. මම කල්පනා කරලා බැලුවා ඇයි එහෙම වෙන්නේ කියලා. අද උදේ අපේ විපක්ෂයේ ගාල්ල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමෙක් කථා කළා, මේ අය වැය මාරක ළිඳේ මෝටර් සයිකල් ධාවනයකට සමාන කරලා. මමත් කියන්න හදන්නේ ඒකම තමයි. මාරක ළිඳේ මෝටර් සයිකලේ කැරකි කැරකි තිබුණේ කොහොමද කියලා තමයි මම මේ කියන්න හදන්නේ. මගේ අතේ තිබෙනවා, 1977 නොවැම්බර් මාසයේ 15වෙනි දා රොනී ද මැල් මහත්මයාගේ අය වැය කථාව. රොනී ද මැල් මහත්මයා කියන්නේ එක්සත් ජාතික පක්ෂයේ පරමාදර්ශය. ජේ.ආර්. ජයවර්ධන මහත්තයලා, රණසිංහ ප්‍රේමදාස මහත්තයලා වාගේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන අය, අද ඉන්න විපක්ෂයට මඟ පෙන්වපු අය; පරමාදර්ශී අය. එදා රොනී ද මැල් මැතිතුමා කියපු දෙයක් මම මතක් කරන්න කැමතියි. එදා රොනී ද මැල් මහත්මයා මෙන්න මෙහෙම කියනවා:

"දැනටමත් ප්‍රකාශ කර ඇති පරිදි විශේෂයෙන් අපේ තරුණ පරපුර ඇතුළු අපේ මහජනතාවට අවශ්‍යව ඇත්තේ රැකීරක්ෂා මිසක් පිනට ලැබෙන දේවල් නොවන බවත්, සදාකාලික වශයෙන් අපට හිඟන ජාතියක් වී සිටිය නොහැකි බවත්, අපේ රජයේ විශ්වාසයයි. කෙසේ වෙතත්, ක්‍රියාකාරී ලෙසත් පුළුල් වශයෙන් රැකීරක්ෂා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන තෙක් ඵලදායී වෘත්තියක් නොමැති පුද්ගලයන්ට එක් අයෙකුට රුපියල් පනහක මාසික ජීවනාධාරයක් ගෙවීමේ යෝජනාවක් 1978 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක කිරීමට අපි යෝජනා කරමු."

මේ, 1977 එක්සත් ජාතික පක්ෂ අය වැය ලේඛනය කියනකොට කියපු කථාව. හැබැයි, ඊට අවුරුදු 47කට පස්සේත් මේ රට කැරකිලා තිබෙන්නේ එකම තැන තමයි. එක්සත් ජාතික පක්ෂය වේවා, ඒකෙන් බිහි වෙච්ච සජබය වේවා, ඒකෙන් බිහි වෙච්ච, අද ඒකත් එක්ක සහෝදරත්වයෙන් ඉන්න පොහොට්ටුව වේවා මේ ඔක්කෝම එක තැන කැරකිලා තිබෙන්නේ. ඒ නිසා අපට කියන උදාහරණය ඇත්තටම ගැළපෙන්නේ මෙච්චර කල් රට පාලනය කරපු පාලකයන්ට. මේ අය වැය ගැන එක්සත් ජාතික පක්ෂයට හෝ සජබයට හෝ පොහොට්ටුව පක්ෂයට හෝ සාරගර්භ විවේචනයක් කරන්න බැරි ඇයි? මේ තුළින් තේරෙනවා ඒගොල්ලන්ගේ ඒ දේශපාලන දර්ශනය අවුරුදු 44කට පස්සේත් අසාර්ථක වෙච්ච එකක් කියලා. ඒගොල්ලන්ගේ ලුම්පන් ආර්ථික මොඩලය දැන් සුන්බුන් වෙලා තිබෙන්නේ. ඒකේ ප්‍රතිඵල තමයි දැන් මේ ඇවිල්ලා තිබෙන්නේ. විපක්ෂයට න්‍යායක්, දර්ශනයක් නැහැ. කියමනක් තිබෙනවා, න්‍යායෙන් තොර භාවිතය අන්ධයි, භාවිතයෙන් තොර න්‍යාය වඳයි කියලා. අද විපක්ෂයත් අන්ධ ලෙස කටයුතු කරන දේශපාලන ව්‍යාපාර විධියට තමයි අපට පෙනෙන්නේ. ඒගොල්ලන්ගේ න්‍යාය තමයි "අපි යන්නේ කොයි පාරේ, අප්පච්චිලා ගිය පාරේ" කියන එක. ඒ අනුව තමයි ඒගොල්ලන් යන්නේ. අන්ධවීමත් එක්කම එනවා ඒ අයගේ වරප්‍රසාද අහිමිවීමේ වෛරයක්. ඒ නිසා තමයි කිසිම හරයක් නැතිව, කිසිම සාධනීය නොවන වෛරසහගත විවේචන අපට එල්ල කරන්නේ. ඉතින් අපි මේ ගැන පුදුම වෙන්න දෙයක් නැහැ. අපේ වෑත්තෑවේ හාමුදුරුවෝ ලියපු ගුත්තිල කාව්‍යයේ කවියක තිබෙනවා, බුදු හාමුදුරුවෝත් එක්ක එකට ඉඳලා, එකට ජීවත් වුණ, ඒ සමාජයේම හිටපු දෙව්දත් තෙර බුදුහාමුදුරුවන්ට විරුද්ධ වුණේ කොහොමද කියලා.

" ඉඳ ඉඳ එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර
අහෝ! දෙව්දත් නොදිටි මොක්පුර"

ඒ නිසා පුදුම වෙන්න දෙයක් නැහැ. ඒ වාගේ අයටත් එවැනි විවේචන තිබෙනවා නම් විපක්ෂයෙන් මේ කරන මේ විවේචන ගැන අපට පුදුම වෙන්න දෙයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ වෙලාවේ කථා කරන්න කැමතියි, අපේ රජයේ වැඩ පිළිවෙළ මොකක්ද, අපේ මූලික ප්‍රතිපත්තිය මොකක්ද කියන එක. අපි මේ රටට යෝජනා කරන ආර්ථික ක්‍රමය තමයි ජන සහභාගිත්ව ආර්ථිකය. ජන සහභාගිත්ව ආර්ථිකයක දී අපි මොකක්ද බලාපොරොත්තු වෙන්නේ? එතැනදී සියලු ජනතාව ආර්ථිකයට සහභාගි වෙනවා. සියලු ජනතාව ආර්ථිකයට බද්ද කර ගන්නවා. ඒ විතරක් නොවෙයි, ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට සාධාරණව බෙදෙනවා. මේක තමයි අපේ මූලධර්මය. අපි ඒ මූලධර්මය ගැන කථා කරනකොට, සියලු ජනතාව ආර්ථිකයට දායක කර ගන්නකොට ජනතාව දිහා බලන්නේ මොන ඇහෙන්ද? ජනතාවගේ වටිනාකම අපි තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා අපි මේක දකින්නේ මානව ප්‍රාග්ධනයක් විධියට. ශ්‍රමය විතරක් නොවෙයි, එතැනින් එහාට ගිය මානව ප්‍රාග්ධනයක් විධියට. මානව ප්‍රාග්ධනයක් කියන්නේ, මානව සම්පතක්. ඒක අපි කොහොමද මෙතැනින් බලාපොරොත්තු වෙන්නේ? සාමූහිකව ඉන්න ජනතාවක්, තෘප්තිමත්ව ඉන්න ජනතාවක්, සහකම්පනයෙන් යුක්ත ජනතාවක්, නීරෝගී ජනතාවක්, උගත් ජනතාවක් අපි බලාපොරොත්තු වෙනවා. මෙන්න මේ මානව සම්පත තමයි අපි රට ගොඩ නැඟීමේ දී මූලික සිද්ධාන්තය, මූලික ප්‍රධාන පාර්ශ්වකරුවා බවට පත් කරන්නේ.

වතු කම්කරුවාගේ වැටුප රුපියල් 1,750 දක්වා වැඩි කිරීම අපි දකින්නේ ඒ අර්ථයෙන්. මෙච්චර කල් ශ්‍රමය සූරා කන භාණ්ඩයක් හැටියට ඒ ජනතාවට සලකපු ඒ අතීතය ඇතුළේ අපි මේවා දැක්කේ නැහැ. ඒ නිසා තමයි අපි, ඒ ජනතාව අපේ රටේ සම්පතක් විධියට දකින්නේ. අපේ රටේ මානව සම්පත පාවිච්චි කළ බවට 2005 වසරෙන් උදාහරණයක් දෙන්න පුළුවන්. සුනාමියෙන් විනාශ වුණු ගාල්ල දක්වා දුම්රිය මාර්ගය මේ රටේ මානව සම්පත පාවිච්චි

[ගරු ටී.කේ. ජයසුන්දර මහතා]

කරලා නැවත ගොඩ නැඟුවා. ඒකට නායකත්වය දුන් වෘත්තීය සමිති නායකයෙකු වන සුමතිපාල මානවඩු කියන ඒ වීර චරිතය අපි අද දවසේ මතක් කරන්න ඕනෑ. එතුමා ජනතාවත් එක්ක එකතුවෙලා ඒ දුම්රිය මාර්ගය හැදුවා. ඒ වාගේ දේවල් මුදල්වලින් කරන්න බැහැ. ඒ තමයි අපි මානව සම්පත පාවිච්චි කරපු විධිය.

ඒ විතරක් නොවෙයි. අද ගොඩක් දෙනා කථා කරනවා, රුපියල් ලක්ෂ 10කින් නිවාස හදන්නේ කොහොමද කියලා. ඇත්තටම එතැන තිබෙන්නේත් මානව සම්පත කියන විශ්ව කර්මය. අපි, 2025දී නිවාස 2,850ක් හදන්න සැලසුම් කළා. මේ වෙනකොට ඒ නිවාස 1,000ක් විවෘත කරලා තිබෙනවා. අපි කොහොමද ඒ නිවාස හදන්නේ? අපි ඒක පෞද්ගලිකවම අත් විඳිනවා. ගම්වල මිනිස්සු ලවා වැලි ටික ගොඩ දමාගෙන, ගහක් ඉරා ගෙන, ඒ අයගේ උදවු අරගෙන, ගමේ තිබෙන අපේ කොට්ඨාස සභාවේ අයගේ සහයෝගයත් ඇතිව තමයි ඒ නිවාස හදන්නේ. පරණ ක්‍රමයට, කොන්ත්‍රාත් න්‍යාය අනුව කටයුතු කරපු අයට මේක හිතා ගන්න බැහැ. ගසාකන දේශපාලනය පුරුදු වෙච්ච අයට මේක හිතාගන්න බැහැ. දැන් අපි මානව ප්‍රාග්ධනයත් එක්ක එකතු වෙච්ච අලුත් සංස්කෘතියක් ගොඩ නඟලා තිබෙනවා. ගමක පාරක් හදනකොට වෙන දා වාගේ අවුරුද්දෙන් දෙකෙන් කැඩෙන, මුදල් ගසා කන, කොමිස් ගහන දේශපාලන සංස්කෘතිය වෙනුවට, ඒ ආර්ථික න්‍යාය වෙනුවට අවුරුදු 40ක්, 50ක්, 60ක් නොකැඩී තිබෙන පාරවල් හදන හැටි අපි සමාජයට කියා දෙමින් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ මානව සම්පත ගැන කියනකොට අපි මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ රටේ අවුරුදු 40න් එහා -60 දක්වා- වයසේ පසුවන ජනතාව නිතරම වාගේ මියැදෙනවා, බෝ නොවන රෝගවලින්. අපි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන්නත් කලින් මේ අවුරුද්දෙම පටන් ගත්තා, ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන නියමු ව්‍යාපෘතිය. ඇත්තටම මම කියන්න කැමැතියි, ගාල්ල දිස්ත්‍රික්කයේ මගේ ආසනය වන හිනිදුම ආසනයේ මාපලගම තමයි මුලින්ම ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන ව්‍යාපෘතිය පටන් ගත්තේ. ඒ, මීට මාස කිහිපයකට ඉස්සෙල්ලා. මේ වෙනකොට 5,000ත් 6,000ත් අතර ජනතාවකට ඒ තුළින් සේවය ලබා දෙනවා.

අපි ඒ විධියට මානව සමාජයක් ගොඩ නඟමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. එයින් ලැබෙන ප්‍රතිලාභය ජනතාවට සාධාරණ ලෙස බෙදී යන වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒක තමයි "ප්‍රජා සංවර්ධන සභාව" කියන්නේ. ග්‍රාම නිලධාරි වසම් 14,022කට සාධාරණ ලෙස සම්පත් බෙදී යන ආකාරය මේ වැඩ පිළිවෙළට ඇතුළත් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ලංකාවේ ගංවතුර ආපදාවලට ලක්වන ගාල්ල, කොළඹ, අම්පාර, මන්නාරම, පුත්තලම වාගේ දිස්ත්‍රික්ක ගැනත් අපි හිතලා තිබෙනවා. ඒ වාගේම, ගිං ගඟ සහ කළු යන ගංගාවල ගංවතුර පාලනය කිරීමට ශක්‍යතා අධ්‍යයනයක් කරන්නත් උත්සාහ කර තිබෙනවා.

අපේ රටේ තේ කර්මාන්තය වෙනුවෙන් 2025 වර්ෂයේදී වෙන් කළේ රුපියල් මිලියන 1,355යි. නමුත්, 2026 වර්ෂය වෙනුවෙන් අපි තේ කර්මාන්තයට රුපියල් මිලියන 1,755ක් වෙන් කර තිබෙනවා.

අපි ගම ඇතුළේ ඉන්න සියලුදෙනාම ව්‍යවසායකයන් බවට පත් කරන, කාන්තාවන්ගේ, තරුණයන්ගේ ශක්තිය එකට එකතු කරලා නිෂ්පාදන ක්‍රියාකාරිත්වයට එකතු කරන වැඩ පිළිවෙළක් දක්වා මෙය ගෙනයමින් ඉන්නවා. මෙවැනි තත්ත්වයක් මේ මවුබිමේ ගොඩ නැඟෙන වෙලාවේ, මේ සාධනීය අවස්ථාවේ සතුටු වෙන්න බැරි විපක්ෂයක්, සතුටු වෙන්න බැරි ජනතාවක් මොකටද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. T.K. Jayasundara, your time is up.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ෆේස්බුක් එකේ තිබුණු පුංචි කවියක් කියලා මගේ කථාව අවසන් කරන්නම්. ඒ කවියේ තිබුණු අවසාන වචනය මම කියන්න කැමැති නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ කථාව බලපු කෙනෙක් ඒකට comment එකක් විධියට තමයි මේ කවි පන්තිය ලියා තිබුණේ. ඒකේ අවසානයට තිබෙන වචනය මේ සභාවට නොගැළපෙන නිසා ඒ වචනය අයින් කරලා අපේ රටේ ඉතිහාසයේ තිබුණු රස කැවිල්ලක නමක් දැම්මා. කවියා, මේක ලියා තිබුණේ පොඩි කේන්තියකින් වාගෙයි.

ලැග ලැග පල් වගුර
මිස දිවු දනන් එක්කර
ජනී ජන පෙළනු හැර
අහෝ අය වැය නොදුටු ලැතර

මම දැම්මා, අන්තිමට ලැතර කියලා. ඒක අපේ රටේ කෑමක නමක්. නමුත්, අවසානයට තිබුණේ අකුරු තුනක වචනයක්. ඒක මෙතැන කියන්න හොඳ නැහැ කියලා මම හිතුවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. R. M. Ranjith Madduma Bandara. You have 13 minutes.

[අ.භා. 1.39]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, JVP-NPP ආණ්ඩුවේ දෙවැනි අය වැය ජනාධිපතිතුමා පැය හතරහමාරක් තිස්සේ ඉදිරිපත් කළා. අපි දැක්කේ නැහැ, ඒ අය වැයෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට, ධීවර ක්ෂේත්‍රයට, මේ රටේ වැඩ කරන ජනතාවට, ව්‍යාපාරිකයන්ට සහ අධ්‍යාපනයට වෙච්ච සේවයක්. මුදල් වෙන් කිරීමක් හෝ සංවර්ධනයක් අපි දැක්කේ නැහැ. ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් 159දෙනාම කිව්වා, "අවුරුදු 76ක් මේ රට විනාශ වුණා, අපි තමයි මේ රට ගොඩ ගත්තේ" කියලා. අවුරුදු 76ක් තුළ මේ රටට ලැබුණු දේවල් ජනතාව දන්නවා. ජේවීපී එක පටන් ගෙන අවුරුදු 60ක් වෙනවා. ඒගොල්ලෝ මේ අවුරුදු 60 තුළ මොකක්ද කළේ? හැම රජයක්ම කරන කරන දේට විරුද්ධ වුණා. මේ රටේ ආර්ථික ප්‍රතිපත්තිය හරියන්නේ නැහැ, ජනතා විමුක්ති පෙරමුණේ වමට බර සමාජවාදී ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා එදා කිව්වා. එදා එක්සත් ජාතික පක්ෂයේ - දැන් සමගි ජන බලවේගයේ- ආර්ථික ප්‍රතිපත්තිය අවුරුදු 76කට පස්සේ දැන් මෙතුමන්ලා පිළිගෙන තිබීම ගැන අද අපි සන්තෝෂ වෙනවා. මේ කරපු විනාශයට තමුන්නාන්සේලා වග කියන්න ඕනෑ.

ඇමෙරිකාව ගැන කථා කරනකොට කිව්වා, ඇමෙරිකන් ගැතියෝ කියලා. ඉන්දියාව ගැන කථා කරනකොට කිව්වා, ඉන්දියන් ව්‍යාප්තවාදීන් කියලා. පිටරටවල වෙළෙඳ ගිවිසුම්

අත්සන් කරද්දි ඒ හැම එකකටම විරුද්ධ වුණා. අපට මතකයි, ඉන්දියාවේ ආයෝජන ගැන දිගින් දිගටම විරුද්ධ වුණා. කොළඹ වරායේ නැඟෙනහිර පර්යන්තය හදන්න විරුද්ධ වුණා. සාම්පූර් තාප බලාගාරයට විරුද්ධ වුණා. ඉන්දු ලංකා ගිවිසුමට විරුද්ධ වුණා. පළාත් සභා ක්‍රමය එනකොට, මේ රටේ ජාතික ප්‍රශ්නයට උත්තරයක් දෙනකොට මේගොල්ලෝ මොනවාද කළේ? දහ පහළොස්දාහක් මැරුවා. මිනිස්සුන්ට ඡන්දය දමන්න දුන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. එට්කා ගිවිසුම, සීපා ගිවිසුම ඇතුළු හැම එකකටම විරුද්ධ වුණා. එදා වැඩියෙන්ම හිටියේ පාරේ. මේ රටේ වැඩ කරන ජනතාව පාරට ගත්තා. අපි මේ රටේ අධ්‍යාපනය ගැන කථා කරනකොට, එදා අධ්‍යාපන ධවල පත්‍රිකාව ගෙනෙනකොට මේගොල්ලෝ විරුද්ධ වුණා. අද ඒ ධවල පත්‍රිකාවම තවත් විධියකින් ගෙනැල්ලා තිබෙනවා. එහෙම නම්, මේ අවුරුදු 76 තුළ මේ රටට දූෂණයෙන්, වංචාවෙන් යම් විනාශයක් කරලා තිබෙනවාද කියලා කවුරු හරි ඇහුවොත් අපි කියනවා, එල්ටීටීඊ එකයි, ජේවීපී එකයි මේ රටේ සංවර්ධනයට ඊට වැඩිය විනාශයක් කරලා තිබෙනවා කියලා.

අද තමුන්නාන්සේලා අපේ ආර්ථික ප්‍රතිපත්තිය පිළිගෙන තිබෙනවා. තමුන්නාන්සේලා අපේ විදේශ ප්‍රතිපත්තිය පිළිගෙන තිබෙනවා. තමුන්නාන්සේලා අපේ අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිගෙන තිබෙනවා. ජේවීපී එක පාරට බැහැලා මේවාට විරුද්ධ වුණේ නැතිනම් අද මේ රට තිබෙන්නේ මීට වැඩිය හොඳ තැනක. මේ රට විනාශ වීමට තමුන්නාන්සේලාත් වග කියන්න ඕනෑ.

IMF එක ගෙනෙනකොට කිව්වා, "IMF එකට අපි විරුද්ධයි" කියලා. අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා විරුද්ධ පක්ෂයේ ඉඳලා මේවාට විරුද්ධ වුණා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? මේගොල්ලෝ IMF එක කියන කියන තාලයට නටනවා. අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා කිව්වේ, මනුෂ්‍යවාදී විධියට, ජනතාවට වැඩක් කරන්න පුළුවන් විධියට IMF ගිවිසුම ගැන කථා කරලා, අපි ඒ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නවා කියලා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද නිෂ්පාදන ආර්ථිකයක්ද මේ රටේ තිබෙන්නේ? නැහැ. අපි අහනවා, කෘෂිකර්ම ආර්ථිකය වර්ධනය වෙලා තිබෙනවාද, කාර්මික ආර්ථිකය වර්ධනය වෙලා තිබෙනවාද, ඉදිකිරීම් කර්මාන්තය වැඩි දියුණු වෙලා තිබෙනවාද කියලා. ඒ සියල්ල කඩා වැටිලා තිබෙද්දි තමුන්නාන්සේලා කරන්නේ මිනිස්සුන්ගේ බෙල්ලත් මිරිකලා බදු ගන්න එක. මොනවායින්ද, මේ බදු ගන්නේ? බදු ගන්නේ සීනි කිලෝවෙන්, පිටි කිලෝවෙන්, හාල් කිලෝවෙන්. *[බාධා කිරීමක්]* මේවායින් බදු අරගෙන කියනවා, "රටේ අතිරික්තයක් තිබෙනවා, අපි මේවා දියුණු කළා" කියලා.

මම මේ පාර්ලිමේන්තුවේ අවුරුදු තිස්ගණනක් ඉඳලා තිබෙනවා. අඩුවෙන්ම වැඩ කරපු ආණ්ඩුව තමයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුව. තමුන්නාන්සේලා පසුගිය අවුරුද්දේ වෙන් කරපු මුදලින් සියයට 30යි වැඩ කරලා තිබෙන්නේ. රට තුළ මුදල් සංසරණය වෙන්නේ නැහැ. ජනතාවගේ සාක්කුවේ මුදල් නැහැ. එහෙම නම් අපට කියන්න තිබෙන්නේ රජය පොහොසත් වෙලා තිබෙනවා, ජනතාව දුප්පත් වෙලා තිබෙනවා කියලා. අද වනකොට ජනතාවට ජීවත් වෙන්න අමාරුකම් තිබෙනවා. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කිව්වා, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලට පනවා තිබෙන සියයට 18ක VAT එක අයින් කරනවා කියලා. අඩු කළාද? සල්ලි තිබෙනවා නම්, මේවා අඩු කරන්න එපා යැ.

පාසල් ළමයින්ට, අධ්‍යාපනයට තමයි ලෝකයේ මුල් තැන දෙන්නේ. මොනවාද කිව්වේ අධ්‍යාපනය ගැන? පොත්පත්වලට, බඩුවලට තිබෙන සියයට 18ක VAT එක අයින් කරනවා කිව්වා. මට මතකයි, ගරු සුනිල් හඳුන්නෙත්ති අපේ මිත්‍ර ඇමතිතුමා කිව්වා, "අපි වරායෙන් ගොඩ බාන මිලට ඩීසල්, පෙට්‍රල් දෙනවා" කියලා. දැන් දෙනවාද? දැන් බදුත් ගහලා, තමුන්නාන්සේලා අපි දුන්න ගාණටත් වැඩියෙන් දෙන්නේ. ලයිට් බිල අඩු කරනවා කිව්වා. ලාභ තිබෙනවා නම්, ලයිට් බිල අඩු කරන්න ඕනෑ. ඉතුරු තිබෙනවා නම්, ලයිට් බිල අඩු කරන්න; වතුර බිල අඩු කරන්න. තමුන්නාන්සේලා අද IMF එකේ රූකඩයක් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ පාලනය යටතේ මේ රටේ දුප්පත්කම වැඩි වෙලා තිබෙනවා. 2019දී අපි රට භාර දෙනකොට මේ රටේ දුප්පත් කියන අය හිටියේ සියයට 10ට අඩුවෙන්. දැන් සියයට 35ක් ඉන්නවා.

2016න් පස්සේ රජයේ සේවයට බඳවා ගත්ත අයට විශ්‍රාම වැටුප් නැහැ කියලා තමුන්නාන්සේලාගේ ජනාධිපතිවරයා බොහොම වේගයෙන් කථා කළා. බොරු කියලා බලයට ආවේ. අපි කනගාටු වෙනවා. මොකද, මේ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට, රජයේ සේවකයන්ට, ජනතාවට අසත්‍ය ප්‍රකාශ කළා. මේ පාර්ලිමේන්තුවේ සාමාන්‍යයෙන් බොරුවක් කිව්වොත්, අපි ඉදිරිපත් කරනවා නේ, point of Order එකක්. එහෙම නේද? එහෙම නම් ජනාධිපතිතුමා ගැනත් අපට ඒක ඉදිරිපත් කරන්න පුළුවන්.

රජයේ සේවකයන් බඳවා ගැනීම සම්බන්ධයෙන් එතුමා සඳහන් කළා. ඒ වාගේම එතුමා මගේ නමත් කිව්වා. මොකද, මම රාජ්‍ය පරිපාලන ඇමතිවරයා විධියට හිටිය නිසා. අපි 2017.08.25 දින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2017 නිකුත් කළා. එම චක්‍රලේඛය අනුව රජයේ නිලධාරින් සඳහා පත්වීම් ලිපි දෙද්දී අපි මෙහෙම කියා තිබෙනවා: "මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය" නමුත් ජනාධිපතිතුමා කිව්වා, විශ්‍රාම වැටුපක් නැහැ කියලා. "ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ" ඒකත් හරි. ඊළඟට කිව්වා, "ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය." කියලා. මොකක්ද මේකේ වුණේ? අලුත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් ගැන කථා කළා. අපි වෘත්තීය සමිතිත් එක්ක කථා කළා. රජය තීන්දු කළා, පරණ විශ්‍රාම වැටුප් ක්‍රමය තියන්න ඕනෑ කියලා. මේ චක්‍රලේඛයේ තිබෙනවා, "මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය" කියලා. අපි W&OP එකට සල්ලි අය කරගෙන තිබෙනවා. විශ්‍රාම වැටුපට දායකත්වය දීලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමාට අපි කියනවා, මේ රටේ ජනතාවට බොරු කියලා බලය ගත්තා වාගේ පාර්ලිමේන්තුවට ඇවිල්ලාත් බොරු කියන්න එපා කියලා. ඒ අයට විශ්‍රාම වැටුප් හිමියි. එහෙම නැහැ කියලා කොහේවත් නැහැ. මම කියන්නේ මේ චක්‍රලේඛය ඉවත් කරලා නැවත විශ්‍රාම වැටුප් ලබලා දෙන බව කියන්න අවශ්‍යතාවක් නැහැ කියලා. මොකද, මේ චක්‍රලේඛයේ එය තිබෙනවා. මෙම චක්‍රලේඛය මා **සභාගත*** කරනවා, මේ ජනාධිපතිතුමා බොරුවට, වංචාවට ජනතාව රැවටීමට කියපු කාරණය නිසා.

දැන් කියන්න දෙයක් නැහැ. රටේ වර්ධනයක් නැහැ. රැකියා දෙන්න බැහැ. කියපු පොරොන්දු ඉෂ්ට කරන්න බැහැ. මත් කුඩු අල්ලනවා කියලා ප්‍රචාරයක් ගියා. බැලින්නම්, අහු වෙන්නේ ආණ්ඩුවේ කට්ටිය. අහු වෙන්නේ ආණ්ඩුවේ කට්ටිය. දැන් මත් කුඩු කථාව නැහැ. ඒ ටික අපි කියන්නම් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයේදී. මොකද, තවත් විස්තර තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැඩියෙන්ම රජයේ සේවකයෝ තමයි මේ ජනතා විමුක්ති පෙරමුණට ඡන්දය දුන්නේ. කොහොමද, රජයේ සේවකයන්ගේ පඩි වැඩි කරලා තිබෙන්නේ? අපි බැලුවා ගිය අය වැයෙන් රජයේ සේවයේ පහළ කෙනෙකුට වැඩි වෙලා තිබෙන්නේ රුපියල් 6,800යි. රුපියල් 5,000ක් රනිල් වික්‍රමසිංහ මහත්මයා අත්තිකාරම් දුන්නා. එතකොට රුපියල් 1,800යි. රජයේ සේවකයෝ කොහොමද රැවැට්ටුවේ? සියලු දීමනා මූලික වැටුපට එකතු කරනවා කිව්වා. මූලික වැටුපට එකතු කළාම ප්‍රතිලාභය ලැබෙන්නේ පෙන්ෂන් ගියාම. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව නැහැ, එදාට. එදාට තිබෙන්නේ අපේ ආණ්ඩුව. අපිට තමයි ඒවා ගෙවන්න වෙන්නේ. අවුරුද්දකට පෙන්ෂන් යන්නේ 25,000යි. මේ රටේ රජයේ සේවකයෝ 1,450,000ක් ඉන්නවා. ඒ ප්‍රතිලාභ අපටයි දෙන්න වෙන්නේ. තමුන්නාන්සේලා රජයේ සේවකයෝ රැවැට්ටුවා.

මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. සුබෝධිනී වැටුප් කොමිසමේ නිර්දේශ අනුව ගුරුවරුන්ගේ වැටුප් වැඩි කරනවා කියලා තමුන්නාන්සේලා කිව්වා. ගුරුවරු එදා පාරට බැහැලා කටයුතු කළා, හැම නගරයකින්ම, හැම ඉස්කෝලයකින්ම. පසුගිය ආණ්ඩුව තුනෙන් එකක් වැටුප් වැඩි කළා. ඔවුන්ට අද මොකක්ද වුණේ? ඉතිරි තුනෙන් දෙක තියා මොකුත්ම නැහැ. තමුන්නාන්සේලා ගුරුවරු රැවටුවා. මම හිතන විධියට, අද පාසලකට ගියොත් ගුරුවරු ඉන්නේ තමුන්නාන්සේලාට විරුද්ධවයි.

ඒ විතරක් නොවෙයි. විදුහල්පති දීමනා සහ දුෂ්කර සේවයේ නිරත ගුරුවරුන්ගේ දීමනා ගෙවන්න වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 1,000යි. තමුන්නාන්සේලා විශාල බොරු ටිකක් කියලා තමයි අද බලයට ඇවිල්ලා තිබෙන්නේ. රජයේ සේවකයන්ගේ නිවාස ණයවලට වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 500යි. එක්කෙනෙකුට ගන්න පුළුවන් ණය මුදල රුපියල් ලක්ෂ 50යි. එතකොට සියදෙනෙකුටයි ණය දෙන්න පුළුවන් වන්නේ. මෙන්න, අය වැය යෝජනාවලින් රජයේ සේවකයෝ රවටන හැටි. ආපදා ණය සඳහා වෙන් කර තිබෙන මුදල රුපියල් මිලියන 10,000යි. රජයේ සේවකයෝ ඉන්නවා, ලක්ෂ 14 ½ක්. අපේ ආණ්ඩුව තියෙද්දි ඕනෑනම් ඒ ලක්ෂ 14 ½ටම ආපදා ණය ගන්න පුළුවන් තත්ත්වයක් තිබුණා. එහෙමයි අපේ ආණ්ඩුව වැඩ කළේ. දැන් මේ මුදල් සියල්ල දුන්නත් ලක්ෂ 4කටයි ආපදා ණය දෙන්න පුළුවන් වන්නේ. රජයේ සේවකයෙක් ගෙයක් හදාගනිද්දි, බඩුවක් ගනිද්දි, ළමයෙකුගේ අධ්‍යාපන කටයුත්තකදි මේ ආපදා ණය ගන්නවා. ඒක ඔවුන්ගේ අයිතිවාසිකමක්. ඒකත් දැන් කඩාකප්පල් කරලා තිබෙනවා.

අපි මේ කාරණයත් අහනවා. මේ රටේ විධායක ශ්‍රේණියේ සිටින රජයේ සේවකයෝ වන දොස්තරවරුන්ට, ඉංජිනේරුවරුන්ට, විදුහල්පතිවරුන්ට, විශ්වවිද්‍යාල පරිපාලනයේ ඉන්න අයට වාහන බලපත්‍රයක් දුන්නා. ඇයි, ඒ බලපත්‍රය දුන්නේ? ඒගොල්ලන්ට පඩියක් දෙනවා, ගෙයක් දොරක් හදාගන්න, ආර්ථිකය ශක්තිමත් කරගන්න. ඒ වාගේම වාහන බලපත්‍ර 19,000ක් නිකුත් කරලා තිබෙනවා. ජනාධිපතිතුමා එදා කියනවා, ඒ එකක්වත් දෙන්නේ නැහැ කියලා. රජයේ සේවකයන් සියයට 75කගේ ඡන්දය නම් ගත්තා. මන්ත්‍රීවරුන් විධියට අපි කියනවා, අපට වාහන පර්මිට් ඕනෑ නැහැ කියලා. විධායක ශ්‍රේණියේ සිටින රජයේ සේවකයෝ අද රට යනවා. අද දොස්තරවරුන්ගේ පුරප්පාඩු රාශියක් තිබෙනවා, විශේෂයෙන් ගම්බද රෝහල්වල. අද රටේ සිටින ඉංජිනේරුවන් සංඛ්‍යාව සීමා වෙලා තිබෙනවා. 11,000ක් ඉන්න ඕනෑ විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලයේ 6,500යි ඉන්නේ. ඉතුරු ටිකත් රට යවන්නද හදන්නේ? අපි ඉල්ලා සිටිනවා, පසුගිය ආණ්ඩුවලින් රජයේ සේවකයන්ට නිකුත් කරපු මේ වාහන බලපත්‍ර 19,000 යටතේ වාහන ගෙන්වීමේ අවස්ථාව ඔවුන්ට ලබා දෙන්න කියලා. අපට ඕනෑ නැහැ. අද මොනවාද කරන්නේ? අද ඒවා දෙන්නේ නැතුව අධික බදු පනවා වාහන ගෙනැල්ලා කියනවා, බදු ආදායම රුපියල් බිලියන 550යි කියලා. එහෙනම් රජයේ සේවකයන්ගේ පොකට් එකට ගහලා තමයි මේ රුපියල් බිලියන 550 අරගෙන තිබෙන්නේ.

අපට තව දේවල් තිබෙනවා, කථා කරන්න. කෘෂිකර්ම ක්ෂේත්‍රය ගැන එම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන දවසට අපි කථා කරන්නම්. මම කියනවා, පැය හතරහමාරක් කථා කළාට ගොවියාටත්, රජයේ සේවකයාටත්, ධීවරයාටත්, පෞද්ගලික අංශයටත්, ව්‍යාපාරිකයාටත් මේ අය වැයෙන් ප්‍රතිලාභයක් නැහැ කියලා. ජනාධිපතිවරයාගෙන් එදා අපි මේක ඇහුවා.

මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පළාත් සභා මැතිවරණය පවත්වන්න. හැබැයි බයයි, පළාත් සභා මැතිවරණය තියන්න. ජනාධිපතිතුමා අපට කියනවා, පනත සංශෝධනය කරන්න කියලා. ආසන 159ක් දීලා තිබෙන්නේ පනත් සංශෝධනය කරන්න තමයි. මහ මැතිවරණයට පසුව පළාත් පාලන මැතිවරණයේදී ආණ්ඩුවට ඡන්ද ලක්ෂ 23ක් අඩු වුණා. තව ලක්ෂ 25ක් අඩු වෙනවා, පුළුවන් නම් බය නැතුව මැතිවරණය පවත්වන්න. අපි අභියෝග කරනවා, තමුන්නාන්සේලා සියයට 3ට නොවෙයි, සියයට 6ට විතර අඩු කරනවා කියලා. මැතිවරණය පවත්වන්න. මැතිවරණවලට බය ආණ්ඩුවට එම අභියෝගය කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Chaminda Lalith Kumara. You have nine minutes.

Order, please! Will an Hon. Member propose the Hon. Kaveenthiran Kodeeswaran to the Chair?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. KAVEENTHIRAN KODEESWARAN took the Chair.*

[අ.භා. 1.54]

**ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ අය වැය විවාදයේදී අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා විතරක් නොවෙයි, ඒ වෙනුවෙන් වෙහෙසුණු මොළ ගණනාවක් තිබෙනවා. ජනාධිපතිතුමා, අපේ නියෝජ්‍ය ඇමතිතුමා සහ රජයේ නිලධාරින් ඇතුළු සියලුදෙනාගේ අත්දැකීම් සියල්ලත් එකතු කරගෙන රට ඉදිරියේ 2026 වර්ෂයට විශිෂ්ට අය වැය වාර්තාවක් ඉදිරිපත් කරලා, රට ඒකට සූදානම් කිරීමට අදාළ අදහස් සාකච්ඡා කරන වෙලාව තමයි මේක. හැබැයි මෙච්චර වැදගත් ලියවිල්ලක් ලියනවා විතරක් නොවෙයි, 2025 අය වැය මඟින් ඒක ප්‍රායෝගිකව ඉටු කර පෙන්වා තිබෙනවා. තවත් මාසයකින් තව වැඩ ගොඩක් රට තුළ සංවිධානය වෙමින් පවතිනවා. ඒ මුදල්වලින් ශතයක්වත් අහක නොයන විධියට හැම ව්‍යාපෘතියක් සඳහාම ගම් මට්ටමින් අධීක්ෂණ නියෝජිතයන් පත් කරලා, එය ප්‍රායෝගිකව භාවිතාවට නඟලා, ජනතාවත් එක්ක අත්වැල් බැඳගෙන මේ රට හැදීමේ ආරම්භය අපි මේ අවුරුද්දේ තැබුවා. ඒකේ ප්‍රතිඵලත් එක්ක, ඒ අත්දැකීමත් එක්ක තමයි 2026 අය වැය මේ සභාවට, මේ රටට ඉදිරිපත් කළේ. හැබැයි කනගාටුවට කාරණාව තමයි, මෙච්චර වැදගත් ලියවිල්ලක්, මෙච්චර විද්‍යාත්මක ලියවිල්ලක් මේ රටට ඉදිරිපත් කරලා තිබියදී, අපේ ජනාධිපතිතුමා පැය හතරහමාරක පමණ කාලයක් හිටගෙනම, එක දිගට මේ අය වැය ඉදිරිපත් කරලා ඒකේ හරය මුළු ලෝකයටම කියද්දි, ඒක අහගෙන හිටපු විපක්ෂය අනේ අද මොනවාදෝ දොඩවනවා. අපට ඒ ගැන කනගාටුවක් තිබෙනවා. පැය හතරහමාරක් කියන්නේ, පොඩි කාලයක් නොවෙයි. එතුමා පැය හතරහමාරක් හිටගෙන අය වැය කියවද්දි අපට පැය හතරහමාරක් ඉඳගෙන ඉඳලා මහන්සි හිතුණා. හැබැයි දේශපාලනයේ යෙදෙන්නේ, මහන්සියක් දැනෙන අය නොවෙයි. අපි කැප කරන්න ඕනෑ සියල්ල කැප කරලා, අපේ මහන්සිය ගැන හිතන්නේ නැතුව අවශ්‍ය නම් ජීවිතත් පරිත්‍යාග කරලා ආපු ගමනක්, මේක. ඒ ගමනේදී මේ රටේ අනාගත පරම්පරාව අපේ මහන්සියේ අයිතිය භුක්ති විඳින නිසා, මතු සමාජය ඒවා භුක්ති විඳින නිසා ඒක මහන්සියක් හැටියට අපි සලකන්නේ නැහැ. හැබැයි සියලු කැප කිරීම් එක තැනකට එකතු කරලා, බලයත් අරගෙන ආණ්ඩුවක් පිහිටුවලා, මේ සියලු වුවමනාවක්ම, සියලු දැක්මක්ම ප්‍රායෝගික කරන්න හදන අවස්ථාවේ තමයි මේ අය වැයට විපක්ෂයේ මහත්වරු නිවැරදි නොවන විවේචන ගොඩක් ඉදිරිපත් කරන්නේ.

අද විවාදය ආරම්භ කරමින් විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා පෙන්වා දුන්නා, මේක මාරක ළිඳේ කැරකෙන මෝටර් සයිකලයක් වාගේ එක තැන කැරකෙනවා කියලා. හැබැයි, එතුමන්ලාට තමයි කැරකිල්ල හැදිලා තිබෙන්නේ. මට මතකයි, ඒක කියපු අවස්ථාව. මාරක වංගුවක් නම් තිබෙනවා, විපක්ෂයට. ආපහු උඩුකුරුඤ්ඤං ගහනවා මිසක් විපක්ෂයට ගොඩ යැමක් නැහැ, මේ මාරක වංගුවෙන්.

"ජාතික අයවැය 2026 - පුරවැසි අයවැය" කියලා පින්තූරත් සමඟ යම් පැහැදිලි කිරීමක් කරපු පොතක් තිබෙනවා. මේක පින්තූර සමඟ හරි කියවා ගන්න, කියවපු නැති අය. මේක පහසු කර දීම පිණිස භාෂා තුනෙන්ම පොත් කිහිපයක්ම මුද්‍රණය කර දී තිබෙනවා. ඒ නිසා හරියට කියවලා ඒ තර්කවලට එන්න කියලා අපි ඉල්ලනවා. මොකද, ඔබතුමන්ලාගේ ඒ තර්ක, ඒ පෙන්වීම ජනතාව ඇති වෙනකම් අත්විඳලායි තිබෙන්නේ; ඔබතුමන්ලාගේ භාවිතාව අත්විඳලායි තිබෙන්නේ. ඒ නිසා මේකේ මොකුත් නැහැ කියපු අය පින්තූර බලලා හරි කමක් නැහැ, හෙට මේ සභාවට එන්න ඉස්සර වෙලා මේවා තේරුම් අරගෙන එන්න කියලා මා ඉල්ලා සිටිනවා.

අපි අහලා තිබෙනවා, ඉතිහාසයේ හිටපු "මද්දුම බණ්ඩාර' කියලා විරුවෙක් ගැන; පොඩි දරුවෙක් ගැන. අපි කුඩා කාලයේ ඉඳන් හරි ආදරෙන් මද්දුම බණ්ඩාර කියන වීරයා ගැන ඇහුවා. හැබැයි ඒ නාමකරණය කොහොම පාවිච්චි වුණත්, මෙතැනදී අවභාවිත වුණු විධිය අපි දැක්කා. මේ පොතේ පැහැදිලි කර දී තිබෙනවා, කෘෂිකාර්මික අගයදාම මූල්‍යකරණය සහ වාණිජකරණය ගැනත්, අනෙක් පැත්තෙන් තරුණයන් කෘෂිකර්මයට සම්බන්ධ කර ගැනීම සඳහා වූ ණය යෝජනා ක්‍රම ගැනත්. කෘෂිකාර්මික අංශයේ විවිධ වැඩසටහන් වෙනුවෙන් මේ අය වැයේ ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ණය යෝජනා ක්‍රම සහ දිරි ගැන්වීම් ගොඩක් මෙහි තිබෙනවා. එහෙම තිබියදී ඒවා පෙනී පෙනී නැහැ කිව්වාම, අනේ, මද්දුම බණ්ඩාර හිටියා නම් හිතයි, මේ වාගේ හාදයෝ වෙනුවෙන්ද මම ජීවිතය පූජා කළේ කියලා. ඒ නිසා අපි ඒවා ඉවත දමා රටේ ජනතාවත් එක්ක අපේ ගමන යන්න සූදානම් වෙන්න ඕනෑ.

මට ඉස්සරහ පේළියේ ඉඳගෙන ඉන්නවා, අපේ දිස්ත්‍රික්කය වන ගම්පහ දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කමිටුවේ අධීක්ෂණ මන්ත්‍රීතුමා. ඒ වාගේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති වශයෙන් ඉන්නවා, නියෝජ්‍ය අමාත්‍ය ආදරණීය මහින්ද ජයසිංහ සහෝදරයා. ඒ අයගේ අධීක්ෂණයෙන් යුතුව ගම්පහ දිස්ත්‍රික්කයේත් ගොඩක් වැඩ කෙරුණා; දැනටත් කෙරෙමින් තිබෙනවා. හැම කුඹුරකටම, හැම යායකටම, හැම පොල් ඉඩමකටම එහෙම නැත්නම් වෙනත් අපනයන භෝග සහිත හැම තැනකටම අපි ස්වේච්ඡාවෙන් නියෝජිතයන් දෙනවා.

එක් නියෝජිතයෙක් නොවෙයි, වසමකට දහදෙනෙක් විතර අපි දෙනවා. අපි එහෙම සූදානම් කරලා තිබෙනවා, ආණ්ඩුවේ නිලධාරියාට - කෘෂිකර්ම උපදේශකවරයාට - කෘපනිස මහත්මයාට, අපනයන භෝග නිලධාරියාට, සංවර්ධන නිලධාරියාට - සහාය දෙන්න. අපි මීරිගම ආසනයේ විතරක් දැනට ගොවිජන සේවා මධ්‍යස්ථාන තුනම එකතු කරලා, ඒ අයත් එක්ක කථා කරලා, අපේ සහයෝගය ඔවුන් එක්ක බෙදා ගනිමින් කටයුතු කරනවා. යෝධ ජන සහභාගිත්වයක් සමඟ තමයි අපි මේ සියලු දේවල් ප්‍රායෝගිකව කරන්න අත්වැල් බැඳ ගන්නේ කියන එකයි මම මේ කියන්න හදන්නේ. ඒ ක්ෂේත්‍රයේ වුණත්, සංචාරක ක්ෂේත්‍රයේ වුණත්, අනෙක් සියලුම ක්ෂේත්‍රවල වුණත් ජනතාව එක්ක එක්කහු වෙලා තමයි අපි මේ ගමන යන්නේ. එහෙම බලවේගයක් සමඟ තමයි අපි කටයුතු කරන්නේ. අපි 159දෙනායි; ජනාධිපතිතුමා සමඟ 160යි. ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලාත් දහස් ගණනක් ඉන්නවා. රටේ ප්‍රසිද්ධ, ගමේ ප්‍රසිද්ධ අයටත් එහා ගිය මහා බලවේගයක් මේ රට හදන්න අත්වැල් බැඳගෙන ඉන්නවා; ස්වේච්ඡාවෙන් කැප කිරීම් කරමින් ඉන්නවා. එහෙම ව්‍යාපාරයකට අභියෝග කරන්න ඔබතුමන්ලාට තිබෙන හැකියාව ගත්තොත්, අන්න ඒක තමයි මාරක වංගුව. අනාගතයක් නැහැ, විපක්ෂයට. හැබැයි, අපි ජනතාව ඉදිරියේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන තේමාව යටතේ දීපු පොරොන්දු අකුරින් අකුර ඉෂ්ට කරන්න තමයි පුරවැසි අය වැයක් ඉදිරිපත් කරලා, දැන් මේ රට ඉදිරියේ පෙනී සිටින්නේ. කොහොම වුණත්, අපි විවිධ ක්ෂේත්‍රවලට අදාළව ව්‍යාපෘති වෙන් කරලා තිබෙනවා. විෂ මත්ද්‍රව්‍ය තුරන් කිරීම පිළිබඳව වුණත්, ජාතික ආරක්ෂාව ගැන වුණත්, මහජන ආරක්ෂාව ගැන වුණත්, සංචාරක පහසුකම් ගැන වුණත් -සියලු ක්ෂේත්‍රවලට අදාළව- එහෙමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හාරන්න හාරන්න රත්තරන් මතු වෙන ආකරයක් වාගේ තමයි මේ ලියවිල්ල; මේ අය වැය ප්‍රකාශය. මේ රටට ඒ තරම් වටිනා දෙයක් මේ අය වැය

[ගරු චමින්ද ලලිත් කුමාර මහතා]

ලේඛනයේ තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ අය වැය ලේඛනය ප්‍රායෝගික කර ගත්තොත්, තව මාස හත අටක් යනකොට මේ රටේ ජනතාව මෙහි ප්‍රතිඵල හොඳටම තෙළනවා, ප්‍රතිලාභ ලබනවා කියලා අපි දන්නවා. එවැනි අය වැයක් ඉදිරිපත් කර තිබියදී ඒක හරියට කියවා ගන්නේ නැතුව, එහෙම දැක්මක් නැතුව එදා JVP එක ගැන කියමින්, JVP එක LTTE එකට සමාන කරමින්, විවිධ විකෘති මතවාද ඉදිරිපත් කරමින්, ඒ ගැන වැරදි මතයක් හැදුවා විතරක් නොවෙයි. එදා ඒ අරමුණ වෙනුවෙන් පෙනී සිටි ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු අපේ සහෘදයන් සියලුදෙනා ඝාතනය කරලා, අවුරුදු 36ක් ගත වන මේ වෙලාවේ, අපි ඒ අරමුණු වෙනුවෙන් කැප වෙන වෙලාවේ, දුෂ්ට අක්ෂයේ හිටපු, සියලු පාගා දැමීම් කරපු -සියලු දේවල් කරපු- ඒ නියෝජනය බවට පත් වෙච්ච එතුමන්ලා අද කරුණු දැක්වූවාට මේ ගමන නතර වෙන්නේ නැහැ. බල්ලෝ කොච්චර බිරුවත් තවලම ඉදිරියට ඇදෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපිටත් ගමේදී අත්දැකීමකට මුහුණ දෙන්න සිදු වුණා. ඒ ගැනත් කියන්න මට විනාඩියක කාලයක් ඕනෑ. පසුගිය දවසේ මාවත් පෞද්ගලිකව නම් කරලා, අනෙක් පැත්තෙන් අපේ දේශපාලන ව්‍යාපාරයටත් විවේචනයක් කරලා, ව්‍යාජ චෝදනා ඉදිරිපත් කරමින්, විෂ මත්ද්‍රව්‍ය පිළිබඳව බොරු චෝදනා නඟමින්, ලොකු මඩ ව්‍යාපාරයක් කරගෙන ගියා. මේ රට ඉදිරියේ තිබෙන විෂ මත්ද්‍රව්‍ය ව්‍යාපාරය විනාශ කරලා ඊළඟ පරම්පරාව බේරා ගන්න, රට බේරා ගන්න මේ ආණ්ඩුව කරන කැප කිරීමට කාව හෝ අල්ලාගෙන මඩ ගහන පිරිසක් ඉන්නවා. අපි ඔවුන්ට අනුකම්පා කරනවා. ඒ වාගේම අපට කරපු සියලු විවේචන අලුයම හෙළූ කෙළ පිඩක් සේ අපි ඉවත දමනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up. Please wind up.

**ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආරම්භයේදී මගේ කාලයෙන් විනාඩියක් අහිමි වුණා, මූලාසනය මාරු වෙද්දී.

අපි කියනවා, එහෙම චෝදනා නඟලා අපේ ගමන නවත්වන්න බැහැ කියලා. ඔය යූටියුබ් නාළිකා හරහා, විවිධ සමාජ මාධ්‍ය හරහා තමන්ගේ බඩ වියත රැක ගන්න හදන පිරිසකුත් ඉන්නවා. අනෙක් පැත්තෙන් හම්බ කරනවා වාගේම, තව පිරිසක් වෙනුවෙන් පෙනී ඉඳලා අපේ ව්‍යාපාරයට තනි තනිවත්, පොදුවේ එකතු වෙලාත් ගහන්න හදන පිරිස් එක්ක අපට පෞද්ගලික විරෝධයක් නැහැ. නමුත් අපේ මතයට එරෙහිව ඔවුන් කරන වැඩවලට අදාළව,- භයකට නොවෙයි, වෙනත් කිසි දෙයකට නොවෙයි. අපි මීරිගම පොලීසියට පැමිණිලි කරලා, පරිගණක අපරාධ අංශයටත් අපේ පැමිණිල්ල ඉදිරිපත් කරලා තිබෙනවා. අපේ පැමිණිල්ල සීඅයිබී 157/151 යන අංකයෙන් ඉදිරිපත් කළා. ඒ පීඩාව ඇති වුණු අවස්ථාවේදී ආදරයෙන් අපව අමතලා - ඇමතුවේ නැතත් කම්පාවට පත් වෙලා - හැම ආකාරයෙන්ම හොයා බලපු ඒ ජනතාවට අපේ ස්තුතිය පළ කරනවා. පටු කුමන්ත්‍රණකාරී විවේචනවලින් සැලෙන්නේ නැතුව ජනතාවට සියලු වරප්‍රසාද, ජයග්‍රහණ ලබා දෙමින් අපි මේ ආණ්ඩුව ඉදිරියට අරගෙන යනවා කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Sunil Kumara Gamage. You have been allotted 14 minutes.

[අ.භා. 2.05]

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ අය වැය විවාදයට එක් වෙන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

අපි මේ ඉදිරිපත් කර තිබෙන පුරවැසි අය වැය සම්බන්ධයෙන් කථා කරනකොට, මේ අය වැයේ විශේෂ කාරණා ගණනාවක් තිබෙනවා. මම හිතන විධියට, අපේ විපක්ෂයට ඒවා පෙනෙන්නේ නැතුව ඇති. අපි පොඩ්ඩක් ඒවා පෙන්වා දෙන්න උත්සාහ ගනිමු. නමුත් මම හිතන විධියට, මේ වාගේ දේවල් සම්බන්ධයෙන් අන්ධයන්ට පෙනීම ලබා දෙන්න අමාරුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අය වැය ඉදිරිපත් කරනකොට, පුනරාවර්තන වියදම් ලෙස රුපියල් බිලියන 5677කුත්, ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් බිලියන 1,380කුත් මුළු වියදම විධියට වෙන් කරගෙන තිබෙනවා. අපි රටක් භාර ගන්නකොට, යම්කිසි ක්‍රියාවලියක් ඇතුළේ වසර ගණනක් ගිහිල්ලා තිබෙන රටක් අපිට ලැබෙන්නේ. එහෙම නැතුව අපි අලුතින්ම රටක් භාර ගන්නවා නොවෙයි. ඒ කාල සීමාවේදී පවත්වාගෙන ගිය ක්‍රියාවලියක් තිබෙනවා, ඒකේදී වෙච්ච දේවල් තිබෙනවා, ඒක ඇතුළේ තිබුණු ආර්ථික ගනුදෙනු තිබෙනවා. ඒ සියල්ල එක්ක තමයි අපිට ඉදිරියට යන්න තිබෙන්නේ. එහෙම බැලුවාම අපි හැමදාම කියනවා වාගේ අප හිර කරපු තැනක් තිබුණා. ඒ තැන තමයි, අපි අනවශ්‍ය විධියට අධික ලෙස ණය අරගෙන, ණය උගුලක හිරවීම. ඒක නැවත මම මතක් කරන්න ඕනෑ. මොකද, ඒකෙන් ගැලවිලා අපට යන්න බැහැ. ඒකෙන් ගැලවිලා අපිට අය වැය හදන්න බැහැ.

මේ අය වැයෙන් අපිට ණය වාරික හා පොලී ගෙවීම වෙනුවෙන් රුපියල් බිලියන 4,495ක් වෙන් කරන්න වෙලා තිබෙනවා. ඒක සරල නැහැ. ඒක වෙන් කරන්නේ නැතුව අපිට අය වැය හදන්න බැහැ. ඒක ප්‍රතිශතයක් විධියට ගත්තාම, මුළු ආදායමෙන් සියයට 85ක්. එතකොට අදටත් මුළු ආදායමෙන් සියයට 85ක විතර ප්‍රමාණයක් ඒ ණය වාරික හා පොලීවලට ගෙවමින් තමයි, මේ ආර්ථික සංවර්ධනය අපට අත්පත් කර ගන්න වෙන්නේ. වෙනත් විකල්පයක් නැහැ. ඒක නිසා අපි ඒ කාරණය නැවත මතු කරනවා, පරණ පවත් ඇදගෙනම ගිහින් තමයි, අපිට මේ ආර්ථිකය සංවර්ධනය කරන්න වෙලා තිබෙන්නේ කියන එක. ඒක ඇතුළේ මේ අවුරුද්දේ ප්‍රාග්ධන වියදම්වලට 2024 වර්ෂයේ වෙන් කරලා තිබුණේ, රුපියල් බිලියන 817යි. 2025දී රුපියල් බිලියන 1,033ක් අපි වෙන් කළා. ඒ වාගේම අපි මේ අවුරුද්දේ තවත් රුපියල් බිලියන 300ක් වැඩිපුර යොදලා තිබෙනවා. ඒ අනුව, රුපියල් බිලියන 1,380ක් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් යොදලා තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කියනවා, කෘෂිකර්මයටත් නැහැ, අධ්‍යාපනයටත් නැහැ, සෞඛ්‍යයටත් නැහැ, කිසිම එකකට නැහැ කියලා. එහෙම නම් මේ මුදල් වෙන් කරලා තිබෙන්නේ කොහේටද, මේ මුදල් එහෙම නම් මොනවා කරන්නද? ඒක නිසා මේ ගැන හදාරන්න ඕනෑ. නිකම් කටට එන දේවල් කියව-කියවා ගිහිල්ලා අය වැය විවාදයකින් අපට ඇත්ත ප්‍රතිඵලය ගන්න බැහැ.

මම දැක්කා, එක්තරා මන්ත්‍රීවරයෙක් අය වැය පටන් ගත් පළමුවැනි දවසේ voice-cut එකක් දෙනවා, මේ අය වැය ජනතාවට බදු පිට බදු ගහලා, ජනතාව පීඩාවට පත් කරපු අය වැයක් කියලා. ඒ මන්ත්‍රීතුමා දන්නේ නැහැ, මේ අය වැයෙන් අපි ජනතාවට බදු ගැහුවේ නැහැ කියලා. මේ අය වැය කවදාවත් ජනතාවට බදු පටවපු නැති අය වැයක්. මම ඒකත් පැහැදිලි කරන්නම්. එතකොට අර පරණ පුරුද්දට කියාගෙන, කියාගෙන ආපු එක ඔහේ කියාගෙන යනවා. ඒක ඇත්තද, එහෙම දේවල් මේකේ තිබුණාද, නැද්ද කියලා අදහසක් නැහැ. ඒක නිසා අපි කියන්නේ, මේ අය වැය අපේ ආණ්ඩුව හැදුවේ පරණ පව් කර ගහගෙන යන ගමන්, ඒවාත් බේරා ගෙන යන ගමන්, අපේ රට ආර්ථික සංවර්ධනයක් කරා ගෙනියන්නේ කොහොමද කියන තැන ඉඳලා. ඉතින් ඒක නිසාම අපේ මේ අවුරුද්දේ අය වැයේ විශේෂයක් තිබුණා. ඒකත් මම මතු කරන්න ඕනෑ. ජනතාවට බදු බර පටවන්නේ නැතුව හදපු අය වැයක් තමයි මේක. අනෙක් හැම අය වැයකදීම හැමදාම බදු වැඩි වෙනවා. හැමදාම අය වැයට පස්සේ භාණ්ඩවල මිල විශාල ප්‍රමාණයකින් වැඩි වෙනවා. සමහර කාලවලදී අය වැයට දවස් දෙක තුනකට ඉස්සෙල්ලා සමහර බඩු හංගනවා. මොකද, අය වැයෙන් මිල වැඩි වෙනවා කියලා දන්නවා. දැන් අපේ රටේ ආර්ථිකයේ එහෙම දේවල් සිද්ධ වෙන්නේ නැහැ. මම ඒකත් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ අය වැය තුළින් අපි බලාපොරොත්තු වෙනවා ආර්ථික ස්ථාවරභාවය ඇති කරන්න. මොකද, පසුගිය අවුරුද්ද ඇතුළේ අපි ලබා ගත්ත විශාලම ජයග්‍රහණය තමයි ආර්ථික ස්ථාවරභාවය ඇති කිරීම. අය වැය ලේඛනයක ප්‍රධානම අරමුණ වෙන්නේ, තමන්ගේ රටේ ආර්ථික ස්ථාවරභාවය තහවුරු කිරීම. අපි මේකට කියනවා, සාර්ව ආර්ථික ස්ථායීතාව, එහෙම නැත්නම් macroeconomic stabilization කියලා. ඒක තමයි අය වැය ලේඛනයක ප්‍රධාන අරමුණ. අය වැය ලේඛනයක ප්‍රධාන අරමුණ දැනගෙන තමයි අපි මේ අය වැය ලේඛන පිළියෙළ කරන්නේ. ඒ නිසා මේ macroeconomic stabilization තුළ, එහෙම නැත්නම් සාර්ව ආර්ථික ස්ථායීතාව ඇතුළේ තමයි උද්ධමනය පාලනය කරන්න වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක ඇතුළේ තමයි විනිමය අනුපාත පාලනය කරන්න වෙන්නේ. මේක ඇතුළේ තමයි අය වැය හිඟය පාලනය කරන්න වෙන්නේ. මේක ඇතුළේ තමයි වෙළඳ ශේෂය අපිට පාලනය කරන්න වෙන්නේ. මේක ඇතුළේ තමයි අපට පොලී අනුපාත වාගේ දේවල් පාලනය කරන්න වෙන්නේ. මෙන්න මේවාට ක්‍රියාමාර්ග අරගෙන තමයි අපිට ආර්ථිකයක් ස්ථාවර ආර්ථිකයක් බවට පත් කරන්න පුළුවන් වෙන්නේ. එම නිසා මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කරුණාවෙන් කියනවා, මේ අය වැය ලේඛනය මෙන්න මේකත් එක්ක හදාරන්න කියලා. අනේ, ආයෙත් 1988 කාලයේ ජේවීපී එකක් ගැන කථා කරන්න එපා. ඒක මේ අය වැය ලේඛනයත් එක්ක කිසි සම්බන්ධයක් නැහැ.

ඔබතුමන්ලා හදාරන්න, මේ අය වැය ඇතුළේ මේ දේවල් තිබෙනවා ද, නැද්ද කියලා. මේ අය වැය ලේඛනය ඇතුළේ පොලී අනුපාතයට මොකද වෙන්නේ? මේ අය වැය ලේඛනය ඇතුළේ විනිමය අනුපාතයට මොකද වෙන්නේ? මේ අය වැය ලේඛනය අපේ රටේ ආර්ථික ස්ථාවරභාවය තවදුරටත් ගෙනියනවා ද, නැද්ද? මෙන්න මේ සාකච්ඡාවට එන්න. අපි ඒ සඳහා ඔබතුමන්ලාට යෝජනා කරනවා. එහෙම ගත්තාම මේ බිඳ වැටුණු ආර්ථිකය ගොඩගන්න පුළුවන් මේ ක්‍රමවේදයෙන් විතරයි කියලා අපි දන්නවා.

අපි උදාහරණ කීපයක් බලමු. දැන් අපේ රටේ විනිමය අනුපාතය බලන්න. අපේ රටේ විශාල උච්චාවචනයන්ට දිනපතා ලක් වෙන විනිමය අනුපාතයක් තමයි තිබුණේ කියලා අපි දන්නවා. අපේ ආණ්ඩුව ආවාට පස්සේ පසුගිය වසර ඇතුළේ අපි විනිමය අනුපාත ස්ථාවර කරලා තිබෙනවා. කිසිම ආකාරයකින් විශාල උච්චාවචනයකට අපේ විනිමය අනුපාතය ලක් වෙන්නේ නැහැ. එතකොට තමයි විදේශීය ගනු දෙනු, විදේශීය වෙළඳ ගිවිසුම්වලට එළඹෙන්න පුළුවන් වන්නේ. එතකොට ගනු දෙනු පහසු වෙනවා; ආර්ථිකය පුරෝකථනය කරන්න පුළුවන්. ඒවා විශාල දේවල්. ඒක අපි මේ ආර්ථිකය තුළින් තහවුරු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික ස්ථාවරභාවය තියාගන්න අපි අපනයන ආදායම වැඩි කරගන්න ඕනෑ. අපි ඉලක්ක කළා, අපේ වාර්ෂික අපනයන ආදායම සියයට 7ට වැඩි කරගන්න. අපේ අපනයන ආදායම 2024 අවුරුද්දේ ඩොලර් මිලියන 8,506යි. 2025 අගෝස්තු වෙනකොට අපේ අපනයන ආදායම ඩොලර් මිලියන 9,100ක්. එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 7ක වැඩිවීමක්. අපේ ඉලක්කය තමයි, අපනයන ආදායම සියයට 7කින් වැඩි කරන එක. අපි අගෝස්තු මාසය වෙනකොට ඒ ඉලක්කය ළඟා කරගෙන තිබෙනවා. රටක ආර්ථිකය හසුරුවනවා කියන්නේ මේකටයි. අය වැය ලේඛනය පිළියෙළ කරනවා කියන්නේ මේකටයි. ඒ අය වැය ලේඛනය පාර්ලිමේන්තුවේ විවාද කරනවා කියන්නේ මේකටයි. මෙන්න මේවා අපි කථා කරමු. නිකම් හිස් වචන, බොරු කථා නොවෙයි අපට වැදගත් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පොලී අනුපාතයත් අපි කථා කරන ආර්ථික ස්ථාවරභාවයට අදාළ වෙන කරුණක්. පසුගිය ආණ්ඩු කාලයේ Treasury Bills - TB - පොලී අනුපාත සියයට 30ට ගිහිල්ලා තිබුණු ආකාරය අපි දැක්කා. රටක සියයට 30ක පොලී අනුපාතයක් තියාගෙන ආර්ථිකයක් ගෙනියන්න බැහැ; ආර්ථිකයක් ස්ථාවර කරන්න බැහැ. සමහර තැන්පතු හිමියන්ට සියයට 25ක පොලියක් හම්බ වුණා. එහෙම කරලා රටක ආර්ථිකය දුවන්න බැහැ. ඒ පොලී අනුපාත ලබා ගන්නා කෙනාට ඒකෙන් පොඩි වාසියක් ලැබෙන්න පුළුවන්; ඒ කෙනා තෘප්තිමත් වීමක් වෙන්න පුළුවන්. නමුත්, ඒවා ආර්ථිකයක් බිඳ වැටෙන ලකුණු. ඒ නිසා අපි මේ පොලී අනුපාතය දැන් ස්ථාවර තැනකට ගෙනැල්ලා තිබෙනවා. සියයට 8ක විතර මට්ටමකට පොලී අනුපාතය ඇවිල්ලා තිබෙනවා. අපි දැන් ඒවා ස්ථාවර කර තිබෙනවා. අපි කලින් අවුරුද්දේ හදපු අය වැය ලේඛනයේත්, මේ අවුරුද්දේ හදපු අය වැය ලේඛනය ඇතුළේත් අපි කරලා තිබෙන්නේ ඒවා. ඒවායින් තමයි අපේ රටේ ආර්ථිකය මනින්න ඕනෑ. ඒවායින් තමයි බලන්න ඕනෑ මේ අය වැය ලේඛන සාර්ථක ද, අසාර්ථක ද කියලා. ඒ නිසා අපි විශ්වාස කරනවා, අපි මේ අය වැය ලේඛනයේ ඒ ආර්ථික ස්ථාවරභාවයට අදාළ කරන කරුණු ගෙනැල්ලා තිබෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට විදේශ විනිමය ලැබීම් ඉහළ නංවා ගැනීමට මේ අය වැයෙන් අපි මොනවාද කරලා තිබෙන්නේ? ඔබතුමන්ලා බලන්න, පසුගිය අවුරුද්දේ අය වැය ලේඛනයත් එක්ක සසඳන විට විදේශ ප්‍රේෂණ ඇමෙරිකානු ඩොලර් මිලියන 4,844 ඉඳලා ඩොලර් මිලියන 5,812 දක්වා වැඩි වෙනවා. අපේ විදේශීය ප්‍රේෂණ වැඩි වුණොත් අපේ ඩොලර් සංචිතය -අපේ විදේශ සංචිතය- වැඩි වෙනවා. ඒවා තමයි අපේ අය වැය ලේඛන තුළින් අපි සැලසුම් කරන්නේ.

ඊළඟට, අපේ සංචාරක ව්‍යාපාරයත් දියුණු වෙලා තිබෙනවා. සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ ඉපැයීම් ගත්තොත්, සැප්තැම්බර් වෙනකොට ඩොලර් මිලියන 2,348 ඉඳලා ඩොලර් මිලියන 2,473 දක්වා වැඩි වෙලා තිබෙනවා. 2023 වසරේ සංචාරක ඉපැයීම් විධියට තිබුණේ ඩොලර් මිලියන 2,068යි. ඉතින්, මේක තමයි අපේ වර්ධනය. අපි කොහොමද සංචාරක ව්‍යාපාරය වර්ධනය

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

කළේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව ආවාට පස්සේ අපි අලුතින් කඳු හදලා, දිය ඇලි හදලා, කැළෑ හදලා, සත්තු ගෙනැල්ලා සංචාරක ව්‍යාපාරය වර්ධනය කළේ නැහැ. තිබුණු ටිකම තමයි තිබෙන්නේ. හැබැයි, ඒ තිබුණු ටික එහෙමම තිබියදී සංචාරකයෝ වැඩි වෙන්නේ කොහොමද? අපේ භාෂාවෙන් කිව්වොත්, සංචාරකයෝ වැඩි වෙන්න නම් රටක් හොඳ වෙන්න ඕනෑ. එතකොට තමයි ඒ රටට සංචාරකයෝ එන්නේ. කලින් තිබුණු දිය ඇලි, කඳු, ගංගා, ඒ ටිකම තමයි අපි ආණ්ඩුව ගත්තාමත් තිබෙන්නේ. හැබැයි, සංචාරකයෝ වැඩි වෙනවා. මොකද, අපි රට හොඳ තත්ත්වයට පත් කරලා තිබෙනවා. නීතිය ක්‍රියාත්මක වෙනවා. සංචාරකයෙකුට එන්න පුළුවන් පරිසරයක් අපි නිර්මාණය කරලා තිබෙනවා. අපි දන්නවා, පසුගිය කාලයේ සංචාරකයින් ආවාම මොනවාද ඒ අයට කළේ කියලා. බිරිඳ දූෂණය කරන්න ස්වාමිපුරුෂයා මරපු ආණ්ඩු හිතවාදීන් හිටපු රටක අපි හිටියේ. එතකොට සංචාරකයෝ එන්නේ නැහැ. අපි කළේ, සංචාරකයින් තුළ confidence හදපු එක. ඒ confidence හදන්න පුළුවන් හොඳ ආණ්ඩුවකට විතරයි. ඒකට තමයි ආණ්ඩු ඕනෑ වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒක කරලා තිබෙනවා. අපි අපේ වැඩේ ඒ පැත්තෙන් සාර්ථකව කරලා තිබෙනවා.

ඒ වාගේම අපට මතකයි, වතු කම්කරුවන්ට ලබා දුන් දීමනාව සම්බන්ධයෙන් පසුගිය දවස්වල මේ සභාව ඇතුළේ විශාල සාකච්ඡාවක් තිබුණු බව. මාර අපරාධයක්, ආර්ථික ඝාතනයක් කළා වාගේ තමයි වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කරපු එක ගැන කථා කළේ. ඒ මිනිසුන්ට ඒක දෙන්න ඕනෑ නැද්ද? මේක මාර වැඩක් නේ. අපි අය වැයක් ඉදිරිපත් කරන්නේ, ඒක ඇතුළේ ප්‍රතිපත්ති ඉදිරිපත් කරන්නේ, මොනවා හෝ පීඩාවකට පත් වුණු ජන කොටසක් ඉන්නවා නම්, විශේෂයෙන් සලකන්න ඕනෑ ජන කොටසක් ඉන්නවා නම්, ඒ කණ්ඩායමට අවශ්‍ය වෙන් කිරීම් කරන්නයි. ඉතින්, ඒ අය වැය තුළින් අර විශේෂ අපහසුතාවට, ජීවන බර දරාගන්න බැරුව සිටින, මේ රටේ ආර්ථිකයට විශාල විධියට දායක වන පිරිසකට යම් කිසි මුදලක් වෙන් කළාම, බුදු අම්මෝ! ඒකට ගෙනෙන ප්‍රශ්න කන්දරාව. මම හිතන්නේ, මේ විධියට මැදිහත් වන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලජ්ජා හිතෙන්න ඕනෑ. හැබැයි, සමහර මන්ත්‍රීවරු ඒක අගය කළා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කොච්චර කුහකද කිව්වොත්, ඔවුන්ට ඒ අගය කිරීමවත් කරන්න බැහැ. අඩුම ගණනේ මොකුත් නොකියා ඉන්න පුළුවන් නේ. එහෙමත් නැහැ.

මේ අය වැය සම්බන්ධයෙන් කථා කරන්න ගියොත් කරුණු ගණනාවක් කියන්න තිබෙනවා. මම නැවත මතක් කරනවා, මේ මුළු අය වැයම ගත්තොත්, බදු නොගහපු අය වැයක් විධියට තමයි අපි මේක දකින්නේ. ඒක නිසා, ජනතාවට බදු බර පටවපු නැති අය වැයක් අපි මේ අවුරුද්දේ ඉදිරිපත් කරලා තිබෙනවා කියලා අපි නැවත මතක් කරනවා. ඒ වාගේම සියයට 18ක VAT එක කියන්නේ 2024 ජනවාරි මාසයේ ගහපු බද්දක් කියන එකත් මම නැවත මතක් කරන්න ඕනෑ. එතැනින් පස්සේ ඒ VAT එක වෙනස් වුණේම නැහැ. ඒ නිසා අපි ජනතාවට මේ අය වැයෙන් කිසිදු බදු බරක් පටවලා නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Nalin Bandara Jayamaha. You have been allotted 13 minutes.

[අ.භා. 2.19]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් වර්තමාන ආණ්ඩුවේ දෙවැනි අය වැය ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

මේ ආණ්ඩුවේ පළමු අය වැය ඉදිරිපත් කරලා මේ වන විට වසරකට ආසන්න කාලයක් ගතවෙලා තිබෙනවා. අපි ඔබතුමන්ලාගේ පළමු අය වැය පිළිබඳව කථා කරද්දී, ඒක ක්‍රියාත්මක වුණාද කියන බරපතළ ප්‍රශ්නය අපට තිබෙනවා.

පසුගිය දවස්වලත් මන්ත්‍රීවරු ගණනාවක් කථා කළා, මේ ආණ්ඩුවේ පළමුවැනි අය වැයෙන් වෙන් කළ මුදල්වලින් කොපමණ ප්‍රමාණයක් භාවිත කළාද කියන කාරණය සම්බන්ධව. අපිත් ආණ්ඩුවල හිටියා. ඒ නිසා අපි දන්නවා වෙනත් කාලවල අවුරුද්ද අතරමැද පරිපූරක ඇස්තමේන්තු පවා ඉදිරිපත් කරලා එක එක වැය ශීර්ෂවලට අදාළව අමතරවත් මුදල් අනුමත කරවා ගන්නා බව. හැබැයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවට වෙන් කළ මුදල් ටිකවත් වියදම් කර ගන්න බැරි අවස්ථා ගණනාවක් තිබෙනවා. සමහර ස්ථානවල වියදම් කර තිබෙන ප්‍රමාණය සියයට බින්දුවයි. සමහර ඒවාට අදාළව සියයට 10ටත් අඩුවෙනුයි මුදල් වියදම් කරලා තිබුණේ. වෙන දෙයක් ඕනෑ නැහැ. අපි දන්නවා, පසුගිය අය වැයේදී ගරු ජනාධිපතිතුමා කිව්වා, කඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය, දුම්රිය ස්ථානය කේන්ද්‍ර කරගෙන දැවැන්ත සංවර්ධන කේන්ද්‍රස්ථානයක් නිර්මාණය කරනවා කියලා. අඩුම ගණනේ කඹුත්තේගම එම ව්‍යාපෘතියටවත් වෙන් කළ මුදල්වලින් එක මිලියනයක්, දෙකක්වත් වියදම් කළාද කියන ප්‍රශ්නය අපට අහන්න වෙනවා. අපි කවුරුත් දන්නවා නේ, කඹුත්තේගම කියන්නේ ගරු ජනාධිපතිතුමාගේ ගම බව. ඒ වෙන් කරපු මුදල්වත් වියදම් නොකළ තත්ත්වයක් තමයි අපට මේ අය වැය දිහා බැලුවාම පෙනී යන්නේ. ඒවාට අදාළ සංඛ්‍යාලේඛනත් තිබෙනවා. පසුගිය අය වැයේ විස්තර ටික බැලුවාම අපට පැහැදිලිවම කියන්න තිබෙන්නේ, මේ අය වැයත් පසුගිය අය වැයේම ප්‍රතිබිම්බයක් පමණක්ය කියන කාරණයයි.

Fitch Ratings ආයතනය කියන්නේ මොකක්ද කියලා අපි දැක්කා. ණය ශ්‍රේණිගත කිරීම අනුව අප ඉන්නේ CCC plus කියන ස්ථානයේ. මේ අය වැය මූලික කරගෙන රටක් විධියට අපව ශ්‍රේණියෙන් උසස් කරන්න පුළුවන්ද කියලා අපි බලාගෙන හිටියා. හැබැයි, ඔවුන් මොකක්ද කිව්වේ? අය වැය හිඟය 2024 වසරේ තිබුණේ සියයට 4.5ක් ලෙසයි. 2025දී අය වැය හිඟය සියයට 5.1 දක්වා වැඩි වෙලා තිබෙනවා. ප්‍රාථමික ගිණුමේ ශේෂය 2024 වසරේ 2.3ක් ලෙසයි තිබුණේ. ඒක 2.5ක වාගේ පොඩි ප්‍රමාණයකින් තමයි වැඩි වෙලා තිබෙන්නේ. ඒ අනුව බැලුවාම අපට මේ අය වැයත් පෙනෙන්නේ, සාම්ප්‍රදායිකව සංඛ්‍යාලේඛන ටිකක් ඉදිරිත් කරපු අය වැයක් විධියටයි.

අලුත් ආණ්ඩුවක් ආවා. අවුරුද්දක කාලයක් ගත වුණා. අවුරුදු 76ක ශාපයක් ගැන කියලා ආපු ආණ්ඩුවක්, මෙය. හැබැයි, මේ පාර්ලිමේන්තුවෙන් එක පනතක් හෝ ගෙනැල්ලා අලුත් ප්‍රතිසංස්කරණයක් සිදු කළාද, අලුත් ආර්ථික වැඩ පිළිවෙළක්, අලුත් ආර්ථික ගැම්මක් ගන්න පුළුවන් අණ පනත්, නීති රීති මේ රටට හඳුන්වා දුන්නාද කියන බරපතළ ප්‍රශ්නය අපට තිබෙනවා.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට අද මොකක්ද වෙලා තිබෙන්නේ? අපට මතකයි, මේ ආණ්ඩුව මැතිවරණ කාලයේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් ගැන කථා කළේ මොනවාද

කියලා. VAT එකට යටත් වන ආදායම් සීමාව මිලියන 30ට පමණ අඩු කරන්න යෝජනා කර තිබෙනවා. ඒකෙන් වෙන්නේ මොකක්ද? දවසකට ලක්ෂයකට එහා ගනුදෙනු කරන ව්‍යාපාරික ස්ථානවලටත් VAT එක ගෙවන්න වෙනවා. මගේ බිංගිරිය ආසනයේත් කුඩා හන්දිවල සාමාන්‍ය කඩ තිබෙනවා. ඒවායේ දිනකට ලක්ෂයකට එහා ගනුදෙනු කරනවා. බිබිලදෙනිය හන්දිය, උඩුබද්දාව හන්දිය, හොරතපොළ හන්දිය, වීරපොකුණ, තාරණ වාගේ තැන්වල එවැනි සාමාන්‍ය කඩ තිබෙනවා. මේ විධියට අපේ දිස්ත්‍රික්කය තුළින් ඕනෑ තරම් උදාහරණ කියන්න පුළුවන්. ඒවා කුඩා කඩ. ඒවායේ දවසකට රුපියල් ලක්ෂයකට එහා ගනුදෙනු සිදු කරනවා. අනේ, ඒ සුළු ව්‍යාපාරිකයනුත්, සුළු ව්‍යවසායකයනුත් VAT දැලට ඇතුළු කර තිබෙනවා, මේ ජනාධිපතිතුමා. අපට මතකයි වත්මන් ජනාධිපතිතුමා ඒ දවස්වල මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට විරුද්ධව කථා කළා. නමුත්, අද අපට පෙනෙනවා, මේ ජනාධිපතිතුමා VAT එක පහළ සීමාවට අරගෙන ඇවිල්ලා තිබෙන බව.

මේ රටේ ප්‍රධාන ව්‍යාපාර ගණනාවක් තිබෙනවා. මම ඒවායේ නම් කියන්න කැමැති නැහැ. ඒවා සුපිරි වෙළෙඳසැල්. ඒ සුපිරි වෙළෙඳසැල්වලට තමන්ගේ ව්‍යාපාර තවදුරටත් පුළුල් කරන්න ඉඩ හසර සකස් කරන්නද, එහෙම නැත්නම් අලුතින් තවත් සුපර්මාර්කට් ජාල හදන්න බලාපොරොත්තු වන දැවැන්ත ව්‍යාපාරිකයන්ට ඒ අවස්ථාව උදා කර දෙන්නද ගමේ ඉන්න පොඩි මුදලාලිගේ, පොඩි ව්‍යාපාරිකයාගේ, සුළු ව්‍යවසායකයාගේ VAT සීමාව පහළට අරගෙන ඒ ව්‍යාපාරිකයනුත් VAT දැලට හසු කරන්න උත්සාහ කරන්නේ? මේකෙන් වෙන්නේ මොකක්ද? ඒ කුඩා ව්‍යාපාර ටික වැසී යනවා. ගොඩක් වෙලාවට කුඩා ව්‍යාපාරවල මුදලාලි ඉන්නවා, තවත් සේවකයෙක්, දෙදෙනෙක්, තුන්දෙනෙක් ඉන්නවා. ගනුදෙනු කරන්නේත් ඒගොල්ලෝ, බඩු කිරන්නේත් ඒගොල්ලෝ, මුදල් ගන්නේත් ඒගොල්ලෝ, බඩු හදන්නේත්, අනෙක් කටයුතු කරන්නේත් ඒගොල්ලෝ. අද මේ හේතුව නිසා ඔවුන්ට අමතර සේවකයන් ගන්නත් සිදු වෙලා තිබෙනවා, බඩු මිල වැඩි කරන්න සිදු වෙලා තිබෙනවා. ගමේ ඉන්න අහිංසක මිනිසුන්ට වෙනදා අඩු මිලට භාණ්ඩ ලබා දුන්නා. නමුත් දැන් ඒ මිනිසුන්ට සිදු වෙලා තිබෙන්නේ ඒ බඩු මිලට VAT එකත් එකතු කරලා ගෙවන්නයි.

අනේ, අනුර කුමාර දිසානායක මහත්මයාගේ ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවෙන්ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මූලික කරගෙන, ඔවුන් ඉලක්ක කරගෙන VAT එක ගහලා තිබෙන්නේ කියන බරපතළ ප්‍රශ්නය අපට තිබෙනවා. පසුගිය කාලයේ මහා බොරුවට පුරාජේරු දෙඩුවා, අපේ හර්ෂ ද සිල්වා මහත්මයා කියපු දෙයක එක කෑල්ලක් අල්ලාගෙන. ඒ තමයි, භාණ්ඩාගාරය ඉතිරිලා ගිහින් කියන එක. භාණ්ඩාගාරයේ මුදල් යම් ප්‍රමාණයක් වැඩි වෙලා තිබෙනවා. හැබැයි එය ගිය අවුරුද්දට සාපේක්ෂව පොඩි වැඩිවීමක්. ඒ වැඩි වීම වුණේ කොහොමද? ඒ වැඩිවීම වුණේ වාහන ආනයන සීමාව ලිහිල් කරලා, වාහන ආනයනය කරන්න අවස්ථාව දුන්නු නිසා. ඒ නිසා විශාල වශයෙන් රටට වාහන ආවා. අපේ රටෙන් ඩොලර් බිලියන දෙකක් එළියට ගියා. භාණ්ඩාගාරයට විශාල මුදල් ප්‍රමාණයක් ආවා. එහෙම නැතුව ආණ්ඩුව කරපු වෙනත් විශ්වකර්ම වැඩක් හින්දා නොවෙයි එහෙම වුණේ. හැබැයි, ඒ ලැබුණු අමතර මුදල 2026දී ලැබෙන්නේ නැහැ. එතරම් වාහන ප්‍රමාණයක් 2026දී ආනයනය කරන්නේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලාගේ ඉලක්කවලට යන්න පුළුවන් තත්ත්වයක් අද පෙනෙන්නේ නැහැ.

මේ ආණ්ඩුව ආවාම අපි කිව්වා මේ ආණ්ඩුවට නිශ්චිත කාලයක් දෙන්න ඕනෑ කියලා. එහෙම හිතලා, අපි අවුරුද්දක් කල් දුන්නා. අපි පාරට බැස්සේ නැහැ. වැඩ වර්ජනවලට ගියේ නැහැ. අපි උද්ඝෝෂණවලට උසි ගැන්වූයේ නැහැ. හැබැයි, ගොවියා අද උද්ඝෝෂණවලට ඇවිල්ලා තිබෙනවා; ආර්ථික මධ්‍යස්ථාන ටික වැහිලා තිබෙනවා. මොකද ඒ? අද ගොවියාගේ ප්‍රශ්නවලට විසඳුම් නැහැ. අද පොහොර ප්‍රශ්නයට විසඳුමක් නැහැ. වී මිල පිළිබඳ ප්‍රශ්නයට විසඳුමක් නැහැ. දුප්පත්කම නැති කරන්න වැඩ පිළිවෙළක් නැහැ. මම දැක්කා, ඊයේ පෙරේදා මන්ත්‍රීවරයෙකු කියලා තිබෙනවා, සෘජු විදේශ ආයෝජන බිලියන 5ක් ආවා කියලා. බිලියනයක්වත් ඇවිල්ලා නැහැ. බොරු සංඛ්‍යාලේඛන තමයි එතුමා කියලා තිබෙන්නේ. මේ තිබෙන්නේ, අද මම අපේ Research Office එකෙන් ගත්තු තොරතුරු. මේ ආණ්ඩුව මේ අවුරුද්දකට ආසන්න කාලය තුළ එක තැන පල්වුණා හැර වෙන දෙයක් වෙලා නැති බව අපට පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැබිරථ එක්දහස් ගණනක්ද කොහේදෝ ගෙන්වන බවක් දැන් කියනවා. හැබැයි, විශේෂඥ වෛද්‍යවරුන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, මහාචාර්යවරුන් විශාල සේවයක් කළත් විශේෂඥ වෛද්‍යවරුන්ටවත්, ආචාර්ය, මහචාර්යවරුන්ටවත් වාහනයක් ලැබෙන්නේ නැහැ. ඔවුන්ට ලැබුණු එකම දේ තමයි වාහන පර්මිට් එක. ඔවුන්ගේ වෘත්තිය කරගෙන යන්න, ඔවුන්ට ඒ වෘත්තියේ රැඳෙන්න, පිට රට නොයා අපේ රට තුළ ඉඳන් තමන්ගේ සේවාව රටේ ජනතාවට ලබා දෙන්න පොළඹවපු එක හේතුවක් තමයි ඒ වාහන පර්මිට් එක. අද වන විට ඒ වාහන පර්මිට් එකත් නැති කරලා තිබෙනවා. අනුර දිසානායක මැතිතුමා ජනාධිපතිවරණය වෙලාවේ වෘත්තිකයන් කැඳවලා -වෛද්‍යවරුන්, විශේෂඥ වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්- කැඳවලා කිව්වා අපට මතකයි, "අපි ඔයගොල්ලන්ගේ වාහන පර්මිට් එක දෙනවා" කියලා. එහෙම කියපු එතුමා අවුරුද්දකට පස්සේ මේ සභාවට ඇවිල්ලා මුදල් ඇමතිතුමා විධියට අය වැය කථාව කරන ගමන් කියනවා, "ආපහු වාහන පර්මිට් බලාපොරොත්තු වෙන්න එපා" කියලා. අපට වාහන පර්මිට් ඕනෑ නැහැ. ගෝඨාභය රාජපක්ෂ වාහන පර්මිට් දුන්නේත් නැහැ. අපට වාහන පර්මිට් ඕනෑ නැහැ. හැබැයි, විශේෂඥ වෛද්‍යවරුන්ට, ඒ වාගේම වාහන පර්මිට් එකක් ලැබිය යුතු රාජ්‍ය නිලධාරින්ට වාහන පර්මිට් එක දීමට කටයුතු කරන්න. දැනටත් වාහන පර්මිට් විශාල ප්‍රමාණයක් අල්මාරිවල, ඇඳ යට, මෙට්ට යට තිබෙනවා. ඒ අයට ඒ වාහන ගෙනෙන්න අවස්ථාව දෙන්න. මොකද ඒ වෘත්තියට ලැබුණු අවස්ථාවක්, ඒක. ඒ වෘත්තියට ලැබුණු වටිනාකමක්, ඒක. ඒ පුද්ගලයෝ තම වෘත්තියේ රැඳී ඉන්න, එහෙම නැත්නම් ඒගොල්ලන් වෙනත් වෘත්තීන්වලට නොයා රාජ්‍ය සේවයේ රැඳී ඉන්න ඒ වාහන පර්මිට් එකත් හේතුවක් වුණා.

මේ පාර්ලිමේන්තුවට ආපු ආණ්ඩුවේ මන්ත්‍රීතුමන්ලාත් කිව්වා, "අපට වාහන පර්මිට් ඕනෑත් නැහැ, වාහන ඕනෑත් නැහැ, ඩබල් කැබ් ඕනෑත් නැහැ, බස් එකේ ගිහිල්ලා වැඩ කරන්නම්" කියලා. එහෙම කරන්න බැහැ. මොකද, රාජ්‍ය සේවය, එහෙම නැත්නම් පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය කියන්නේ බරපතළ වගකීමක් සහිත ඒවා. ඔබතුමන්ලාට දැන් තමයි තේරෙන්නේ, කොච්චර වැඩ කොටසක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කරන්න තිබෙනවාද කියලා. ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා යන්නේ නැහැ හෙලිකොප්ටරයෙන්. අපි කියන්නේ එහෙම යන්න ඕනෑ කියලායි. මොකද, ජනාධිපතිතුමාගේ කාලය කෝටියක් වටිනවා. ඒ නාස්ති වෙන කාලය අවම කර ගන්න ඕනෑ. ඒවායේ යන්න ඕනෑ. ඔබතුමන්ලා වාහන පාවිච්චි කරන්න ඕනෑ. ඔබතුමන්ලා ගමට යන්න ඕනෑ. ඔබතුමන්ලාගේ ඡන්දය දුන්නු මිනිස්සුන්ට වැඩ කරන්න ඕනෑ. මහජන දින තියන්න ඕනෑ. අපි කියන්නේ ඒකයි. *[බාධා කිරීමක්]* ඊයේ පෙරේදා කථා වුණා, Business Class හොරාට upgrade කරගෙන කියලා. Business Classවල යන්න ඕනෑ. ගරු කථානායකතුමා මාත් එක්ක රට ගියා, Economy Class එකේ. එහෙම නොවෙයි, එතුමා විවේකීව ගිහිල්ලා, ඒ අදාළ වැඩවලට සම්බන්ධ වෙන්න ඕනෑ. ඉඳලා හිටලා රට යනවා වාගේ නොවෙයි නේ. ඒවායේ යන්න ඕනෑ. ඒවා පාවිච්චි කරන්න ඕනෑ.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ඒවා රටට බරක් නොවෙයි. ආණ්ඩුවේ ඔබතුමන්ලාට දැන් ටික ටික ඇත්ත වැටහීගෙන එන බවක් අපි දකිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙන්න මේක හින්දා තමයි මම නියම වැඩක් පසුගිය ජනාධිපතිවරණයට කලින් ඇටෙව්වේ. ඒ මොකක්ද දන්නවාද? මම කිව්වා, අපේ ආර්ථික කමිටුවටයි, ඒ අයගේ ආර්ථික කමිටුවටයි විවාදයකට එන්න කියලා. මේ පණිවුඩය දැකපු ගමන් ඒ පැත්තෙන් බැලුවා, "මේකට ගියොත් නම් කෙළවෙනවා" කියලා, 'ටක්' ගාලා ඒක කැරකෙව්වා වෙනත් පැත්තකට.

ආර්ථික කමිටුවත් එක්ක විවාදයට ආවේ නැහැ. ඒ ආර්ථික කමිටු දෙක එදා විවාද කළා නම්, මේ රටේ මිනිස්සු දැන ගන්නවා, රට හදන්න පුළුවන් කාටද කියලා. මේගොල්ලන්ට රට හදන්න බැහැ කියන එක පෙන්වන්න තමයි මම ඒ දවස්වල ඒ ගේම් එක ගහන්න හැදුවේ. හැබැයි ඒක මඟ හැරියා. නලින්ද ජයතිස්ස මහත්මයායි මමයි තැන් තැන්වල හම්බ වෙලත් ඒ ගැන කළා. අන්තිමට ආර්ථික කමිටු දෙක වෙනුවට නායකයන්ගේ විවාදයක් කරමු කිව්වා. නමුත් මම එදා සැලසුම් කරපු විවාදය පැවැත්වුවා නම් මේ රටේ මිනිස්සු දැන ගන්නවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික වැඩ පිළිවෙළක් තිබෙන්නේ කාටද, ඒ ආර්ථික වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන් කාටද කියලා. එදා ඒක උපක්‍රමශීලිව මඟහැරලා හැංගුණු නිසා තමයි අපේ රටේ ජනතාවට බලා ගන්න බැරි වුණේ වැඩ කරන්න පුළුවන් කාටද කියලා. අද හැබැයි තේරිලා තිබෙනවා, මේ ගොල්ලන්ට වැඩ කරන්න බැහැ කියලා.

2018දී මම බිංගිරිය අපනයන සැකසුම් කලාපය පටන් ගත්තා. එතැන අක්කර 1,000ක්. රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, අගමැතිවරයා විධියට ඒ අවස්ථාවේ මට ලබා දුන් සහයෝගයට. නමුත් ඔබතුමන්ලාට බැරුව ගියා ඒ අක්කර 1,000ට එක ආයෝජනයක් ගෙන එන්න, මේ අවුරුද්ද ඇතුළත. හැබැයි, ආර්ථික කලාප 10ක් හදනවා කිව්වා. නලින්ද ජයතිස්ස ඇමතිතුමා ගිහිල්ලා එතැන visit කළා. මෙතැන ඉන්නවා, බස්නායක මන්ත්‍රීතුමා. එතුමා දන්නවා, ඒක කොච්චර ලොකු ව්‍යාපෘතියක්ද කියලා. අද රටේ ආයෝජන කලාපයක් ඇතුළත තිබෙන ලොකුම ව්‍යාපෘති තුනෙන් තුන්වැනි එක තිබෙන්නේ බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ. ඒ තමයි, Synergy Pharmaceuticals Corporation එක. ඒක ඩොලර් මිලියන 140කට ආසන්නයි. අපි ඒ විධියේ වැඩ කරලා තිබෙනවා. ඔබතුමන්ලා ගිහිල්ලා බලන්න. මොකද, වැඩ කරන්න පුළුවන් කණ්ඩායමක් මෙතැන ඉන්නවා කියලා පෙනෙන්නේ නැහැ. කයිය ගහන්න පුළුවන් කණ්ඩායමක් නම් ඉන්නවා. ඒ අයට තවම එක ආයෝජනයක් ගෙනෙන්න බැරි වෙලා තිබෙනවා. තවම එක ඩොලර් එකක් ගෙනෙන්න බැරි වෙලා තිබෙනවා, බිංගිරිය අපනයන සැකසුම් කලාපයට. අපි ඒ අවශ්‍ය වටපිටාව හදලා තිබෙනවා. අපි ආයෝජන ගෙනැල්ලා තිබෙනවා. අපි වැඩ කරලා තිබෙනවා. ආදර්ශ ව්‍යාපෘතියක් විධියට අද ඔබතුමන්ලාට ඒ ව්‍යාපෘතිය බලන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, your time is up now.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මම අවසන් කරනවා. තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපට පෙනෙන විධියට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා බැණ බැණ හරි කජු සීයා ගෙනැල්ලා නතර කළ තැනින් එහාට යන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා මේ 2026 අය වැයත් සංඛ්‍යාලේඛනයක් විතරයි. පැය හතරහමාරක් ජනාධිපතිතුමා බයිලා ගැහුවාට ඒකේ හරයක් නැහැ. ඒක හිස් ලියවිල්ලක්. ක්‍රියාත්මක කරන්න බැරි, ක්‍රියාත්මක නොවන, බලාපොරොත්තුවක් නැති ලියවිල්ලක් පමණයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. (Dr.) Hiniduma Sunil Senevi. You have 14 minutes.

[අ.භා. 2.32]

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජයේ දෙවැනි අය වැය, දෙවන වර කියැවීමේ විවාදයට මේ විධියට සහභාගි වෙන්නේ ඉතාම සතුටකින් බව මා මුලින්ම කියන්න ඕනෑ. මේ රට පරිවර්තනයකට බඳුන් කරමින් ජාතික ජන බලවේග රජයක් පිහිටෙව්වාට පසුව අපි අපේ ප්‍රථම අය වැය ඉදිරිපත් කරලා, අපේ රට යම් තිරසර මාවතකට අරගෙන, මෙන්න, දෙවැනි අය වැයත් ඉදිරිපත් කරලා තිබෙනවා.

එදා අය වැය කථාව ඉදිරිපත් කරමින් ගරු ජනාධිපතිතුමා කිව්වා ඔබතුමන්ලාට මතක ඇති, අපට අහිමි දශකයක් නිර්මාණය වුණාය කියලා. ඒ අහිමි දශකය සුළුවෙන් තක්සේරු කරන්න පුළුවන් එකක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අහිමි දශකය ඇතුළේ පුදුමාකාර ව්‍යසනයක් ගැබ් වෙලා තිබෙන බව කියන්නට ඕනෑ. ඒක නිර්මාණය වුණේ, මූලික වශයෙන්ම පසුගිය රජයන්වල අදූරදර්ශී ආර්ථික පිළිවෙත් නිසායි. ඔබතුමන්ලා අමතක කරන්න එපා, අපි මහා ප්‍රයත්නයක් දරලා ඒ අඳුරු යුගයෙන් මේ රට හරි පාරට ගන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් එක වසරකින් නිර්මාණය කළාය කියන එක. නමුත් ඒක පහසු දෙයක් නොවෙයි. ඒ නිර්මාණය කිරීම ඇතුළේ ගැබ් වෙලා තිබෙනවා, අපි ඉදිරිපත් කළ, අපි හඳුන්වා දුන්, අපි අපේ ජීවිතයෙන්ම ඔප්පු කරලා තිබෙන නව දේශපාලන පරිවර්තනය. ඒ එක්කම මම කියන්න ඕනෑ, ආර්ථිකය ඒ විධියට හරි පාරට, ස්ථාවරත්වයකට ගත්තාට, එහෙම හරි පිල්ලට දමා ගැනීමේදී දුෂ්කර, සියුම්ව බිඳ වට්ටපු සංස්කෘතික ජීවිත අඩවියකුත් එක්කයි අපි රට භාර ගත්තේ කියන එක. එබඳු රටක් ගොඩනඟන්න ඉලක්කම් විතරක් නොවෙයි ඕනෑ කරන්නේ. ඒකට දර්ශනයකුත් ඕනෑ. විශේෂයෙන්ම ආර්ථික දර්ශනයක් ඕනෑ. 2025 අය වැය විවාදයට එකතු වෙමින් මම එදාත් සඳහන් කළා, අපේ ප්‍රථම අය වැයේ දාර්ශනික ප්‍රවේශය කොයි වාගේද කියලා. පසුගිය වසරේ අපි බොහෝ පදනම් දැම්මා. මේ වසරේ ඒ අත්තිවාරම් මත අපි ප්‍රාර්ථනා කරපු පොහොසත් රටේ සහ ලස්සන ජීවිතයේ බිත්ති බැඳෙන්න පටන් අරගෙන තිබෙනවා.

ඒක සිද්ධ වෙන්නේ අය වැය දර්ශනය නිසා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අය වැය දර්ශනය දැකගන්න විපක්ෂය අසමත් වෙලා. මේ අය වැය විවාදයේදී පසුගිය දිනවල විපක්ෂය පැත්තෙන් ඇහුණු සරලමතික විහිළු තහළු ගැන කල්පනා කළාම

හිතෙනවා, විපක්ෂයේ නිසාම මඩ, අවලාද නගන්න වීම එක් අතකට පුරුවේ අවාසනාවක් කියලා. හැබැයි, ඒගොල්ලන්ගේ වචනවලින්ම සත්‍ය එළියට ඇවිත් අවංකව සුබ පැතුණු තැන්, හොඳ කියවුණු තැන් ඕනෑ තරම් තිබුණා. ඒක තමයි ඇත්ත, කට බොරු කිව්වත් දිව බොරු කියන්නේ නැති හින්දා. අපි අපට ලැබුණු මේ රටේ තත්ත්වය විශ්ලේෂණය කර ගත්තා. විඳවන ප්‍රශ්න මෙන්ම, එළඹෙන අනාගත අනතුරු දැක්කා. ඒවාට අදාළ මූලික පනත් කෙටුම්පත් ගෙනැල්ලා නීතිය ශක්තිමත් කළා. දැන් ඒ ශක්තිමත් කරපු නීතිමය තත්ත්වයේ ප්‍රතිඵල ලැබෙන්න පටන් අරගෙන තිබෙනවා. භාණ්ඩාගාරය රුපියල්වලින් පිරෙව්වේ, ඩොලර්වලින් සංචිත ශක්තිමත් කළේ අපේ රටේ මිනිස්සු සූරා කාලාම නොවෙයි. අපි බදු ගෙවන්න ඕනෑ බව අපි දන්නවා. හැබැයි, කාටවත් කියැවෙන්නේ නැහැ, බදු ගෙවීම පැහැර හැරපු බදු හොරුන්ගෙන් බදු එකතු කරගෙන තමයි මේ තරම් රුපියල් ට්‍රිලියන ගොඩනැඟුණේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතක් වෙනවා අපට සුබ පතපු නැති සමහර ආර්ථික විශේෂඥයන් පවා පසුගිය දවස්වල ඍජුව සඳහන් කරලා තිබුණා, අපි විශ්වාස කළේ නැහැ මේ රජය මේ විධියට බදු එකතු කරයි කියලා, හැබැයි ඒක සිද්ධ වෙලා තිබෙනවා කියලා. ඒක තමයි ඇත්ත. අපේ දේශපාලන සංස්කෘතියේ නාස්තිය, දූෂණය නැති නිසා අපි ඉතිරි කරපු, එකතු කරපු ප්‍රමාණය සුළුපටු නැහැ. අපි, පනත් කෙටුම්පත් මඟින් නීතිය ශක්තිමත් කර ගත් නිසා, නීතිය මත රට පාලනය වන නිසා ඒක දැකලා තමයි දැන් අපරාධකාරයෝ භාර වෙන්නේ. අද වෙනකොට මහා මන්දිරවලට අයිතිකරුවන් නැතිවෙලා රජයට පැවරෙන්නේ ඒ නිසායි. දර්ශනයක් මත ගමනක් යන විට මෙහෙම තමයි ප්‍රතිඵල ලැබෙන්නේ.

ඔබ සියලුදෙනාට මතක ඇති, එදා අය වැය කථාව ඉදිරිපත් කරමින් ගරු මුදල් ඇමතිතුමා -ජනාධිපතිතුමා- සඳහන් කළා, අපේ රටේ ආර්ථික දේහයේ විනාශය සිදු වුණේ ඩොමිනෝ ක්‍රමයකට කියලා. ඔබ දන්නවා, ඒ රූපකය කොයි වාගේද කියලා. ඒවා එක පේළියට වුණේ. මූල්‍ය විනය නැති වුණාම හොරකම ඇති වෙනවා. එතැනින් පිරිහුණු රාජ්‍ය සේවයක් හැදෙනවා. එතැනින් ජනතාව විඳවනවා. ඊළඟට අසහනය ඇති වෙනවා, රට එපා වෙනවා. බුද්ධිමතුන් රට හැර යනවා. විදේශ ප්‍රේෂණ එවන්නේ නැති වෙනවා. එහෙමයි රට වැටුණේ. කොහොමද අපි නැවත මේ රට ගොඩනඟන්න ඕනෑ? වැටුණේ ඒ ක්‍රමයට නම්, නැඟිට්ටවන්න වෙන්නෙත් ඒ ඩොමිනෝ ක්‍රමයටම ආපස්සට නීති ශක්තිමත් කරලා, විවිධ තැන් නිවැරදි කරලායි. දැන් භෞතික සම්පත් සහ මානව සම්පත් වැඩි කරගෙන, ඒවා හදාගෙන, ඒවාට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ අරගෙන, බදු එකතු කිරීමේ ක්‍රියාවලිය නිවැරදි කරගෙන, නීතිය මත පාලනයක් හදාගෙන, ආචාර ධර්ම හදාගෙන තිබෙනවා. මෙහෙම තමයි අපි මේ අවුරුද්ද තුළ මේ තත්ත්වය නිවැරදි කරගත්තේ. ඔබ දන්නවා, මෙය එක පෙළට, එක දිගට මැදිහත් වෙන්න ඕනෑ මැදිහත්වීමක් බව. මේ හැම තැනටම අපි වැඩ කළා. ඒ වැඩ කිරීම ඇතුළේ තමයි 2025ට වෙන් කළ ප්‍රතිපාදන වියදම් වුණේ. මොකද, දැන් විපක්ෂය උත්සාහ කරමින් ඉන්නවා අපි වැඩ කළේ නැහැ, මුදල් වියදම් කරගන්න අසමත් වුණා කියලා පෙන්වන්න. මේ වියදම් කරපු මුදල් ප්‍රමාණය වියදම් වෙච්ච තැන් ගැන සියුම්ව කල්පනා කළොත්, ඔබට අහුවෙනවා ඒ තැන් 7ක්,8ක් නිවැරදි කරලා තමයි අර එක් වැටීමක් නැඟිට්ටවන්න අපට සිද්ධ වුණේ කියලා. මේ දර්ශනය මත තමයි 2026 අය වැයේ තර්කය, උපක්‍රමික න්‍යායික දර්ශනය අපි හදාගෙන තිබෙන්නේ. මේවා තමයි එක් අතකට කුහක වෙන්නේ නැතිව දකින්න ඕනෑ අය වැයේ ශක්තිමත් පදනම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති, එදා අය වැය කථාව ඉදිරිපත් කරමින් ජනාධිපතිතුමා පරණ අවුල්වලට කිව්වේ පරණ පව් කියලා. මේ සමහර අඩච්චලට මිලියන ගණන් ගෙවලා තමයි අපි ඊළඟ පියවර තබන්න සූදානම් වුණේ. ඒ මිලියන ගණන්වලින් ගෙවපු වන්දිය නොවන්න අපට තිබුණා ලොකු හුස්මක් අරගෙන, ලොකු ඉදිරි පිම්මක් අරගෙන 2025 වසර ඉස්සරහට මෙහෙයවන්න. ඔබට මතක් වෙනවා නම්, මධ්‍යම අධිවේගී මාර්ගයේ සම්පූර්ණ කරපු නැති තැන්වලට අදාළ බිඳ වැටුණු ගිවිසුම්වලට පසුගිය දවස්වල අපි කොයි තරම් වන්දි ගෙව්වාද කියලා. ඒ සල්ලි කෙළින්ම අපේ අධ්‍යාපනයට, අපේ පර්යේෂණවලට වියදම් කරන්න තිබුණා නම් අපට මේ 2026 අය වැය තවත් පිම්මකින් ඉදිරියට ගිහිල්ලා ඉදිරිපත් කරන්න තිබුණා.

අපි ඉදිරිපත් කරපු අය වැයේ පදනම් දර්ශනය කාරණා 6ක් මත විග්‍රහ කරන්න පුළුවන්. ඒ කාරණා 6ම විග්‍රහ කරන්න මේක වෙලාවක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කිසිදු ජන තීරුවක් අත්හරින්නේ නැතිව ස්ථායි කිරීම මේ කාරණා අතරින් එකක්. මේ 2026 ප්‍රතිපාදන වෙන් කිරීම්වලට අදාළ තර්කය ඔබ දැකගන්නට ඕනෑ. ඒ දර්ශනය අප දැක බලාගන්න ඕනෑ. ඔබ නිකම් කල්පනා කර බලන්න මේ එක් කාරණයක්. ආබාධසහිත ජන ප්‍රජාවට වෙන් කළ මුදල සහ ඒකට පිටුපසින් තිබෙන ශිෂ්ට සම්පන්න දර්ශනය කොයි වාගේද කියලා. සමස්ත ජනගහනයෙන් සියයට 7ක ප්‍රමාණයක් කියන්නේ සුළුපටු ප්‍රමාණයක් නොවෙයි. ඒ ප්‍රජාව නියෝජනය කරමින් ජාතික ජන බලවේග රජයේ අපේ ආදරණීය මන්ත්‍රී සහෝදරයෙක් පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ ඉතිහාසයේ පළමු වතාවට. අස්වැසුම වැඩසටහන හරහා ආබාධ සහිත පුද්ගලයන් 140,000ක් පමණ පිරිසකට රුපියල් 10,000 බැගින් වූ සහනාධාරයක් ලබා දීම වෙනුවෙන් රුපියල් මිලියන 19,000ක ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

කාලය මදි නිසා තව එක කාරණයක් විතරක් මම කියන්නම්. ආබාධ සහිත ප්‍රජාවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දුම්රිය ස්ථාන, බස් නැවතුම් පොළ, අධිකරණ, පොලිස් ස්ථාන වැනි පොදු ස්ථාන වෙත ප්‍රවේශ වීමේ සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1,000ක ප්‍රතිපාදන වෙන් කිරීමට යෝජනා කර තිබෙනවා. මේක කොච්චර ශිෂ්ට සම්පන්න දෙයක් ද කියලා විපක්ෂයේ මහත්වරුන්ට පෙනෙන්නේ නැත්තේ ඇයි කියලා එක අතකට අපි අහන්න ඕනෑ නැහැ. මොකද, ඒගොල්ලන් මේක දකින්නේ නැහැ. මේවා තමයි විශේෂිත තැන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දියුණු රටවලට දියුණුයි කියලා අපි කියන්නේ සියලු ජන ප්‍රජාව අත් නොහැර, බහිෂ්කරණය නොකර, මිනිසුන් හැටියට භාරගෙන සමාජයේ සංවර්ධයට සහ ජන ජීවිතයට එකතු කර ගන්නා නිසායි. ඔබතුමන්ලා දන්නවා, මේ වාගේ ප්‍රජාව අපේ රටේ පොදු ස්ථානවලදී මොන තරම් අපහසුතාවට පත් වනවාද කියලා. අපි ඒක මේ අය වැයෙන් දකිනවා. ඒ නිසා ඒ අය වෙනුවෙන් දැවැන්ත මුදලක් වියදම් කරනවා.

ඔබට මා එක උදාහරණයක් කියන්නම්. අදටත් සබරගමුව විශ්වවිද්‍යාලයේ -මම අවුරුදු 25ක් උගන්වපු පීඨයේ- පීඨාධිපතිතුමා මුණ ගැහෙන්න ආබාධ සහිත දරුවෙකුට යන්න බැහැ. ඒ තරම් පඩි පෙළවල් ගොඩක් තිබෙන්නේ. ඒක දැකලා නැහැ, ඒක හදලා නැහැ. ඒ නිසා තමයි මේ වැදගත් වෙන් කිරීම් අපි අගය කළ යුතු වෙන්නේ. ඒවා තමයි මෙවර අය වැය ලේඛනයේ යටින් තිබෙන අය වැය දර්ශනය. ඒ වාගේම අයිතිවාසිකම් දිනා ගන්න උද්ඝෝෂණය කරන්න ඕනෑ නැහැ.

කලින් අපි ප්‍රශ්නය දකින්න ඕනෑ. ඔටිසම් දරුවන්ට වාගේම වීදි සුනඛයන් වාගේ සාමාන්‍යයෙන් කෙනෙකුට පෙනෙන්නේ නැති ක්ෂේත්‍ර සඳහා වෙන් කර තිබෙන මුදල ඔබ දැක්කා. ඒක ඇතුළේ තමයි අපේ රජයේ සියුම් දර්ශනය තිබෙන්නේ. ඒ කිසිදු ක්ෂේත්‍රයක් අත් නොහැර මනුෂ්‍යත්වයේ නාමයෙන් ඒවා උසස් මිනිස් සබඳතා හැටියට තේරුම් අරගෙන වැඩ කරන බව පෙන්වන්න වෙනවා.

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

අධ්‍යාපනය වෙනුවෙන් අතිවිශාල මුදලක් වෙන් වෙනවා. අධ්‍යාපනය වෙනුවෙන් වෙන් වන මුදල ඇතුළේ මහපොළ හා ශිෂ්‍යාධාර දීමනාවටත්, මහාචාර්ය ඒකක සඳහාත් මුදල් වෙන් කර තිබෙනවා. සබරගමුව විශ්වවිද්‍යාලය ඇතුළු විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨවල මහාචාර්ය ඒකකවලට වෙන් කරන මුදලුත් මෙතැන තිබෙනවා. ජීව විද්‍යාවට "A" 3 ක් ගත්ත රජරට සරසවියේ හිටපු වෛද්‍ය පීඨ සිසුන් මහාචාර්ය ඒකකයක් ඉල්ලා පාරේ ඔළු පළා ගත්ත හැටි ඔබට මතක් වෙන්න ඕනෑ. එහෙම නම් අප තේරුම් ගන්නට ඕනෑ, ඒ ප්‍රශ්නය අපි ඉස්සරහ තිබෙන බව; ඒ ප්‍රශ්නය විසඳන්න මුදල් වෙන් වෙන්නට ඕනෑ බව. මොකද, එතැනින් තමයි වෛද්‍යවරුන් බිහි වෙන්නේ. එතැනින් තමයි අපේ රට එසවෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, you have only two more minutes.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

Thank you. මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම හෘද රෝහල ඔබට මතක ඇති. ඒක විශාල ආයෝජනයක්. රත්නපුර දුම්රිය මාර්ගයත් විශාල ආයෝජනයක්. ඒක අත්හැරලා තිබුණේ. රත්නපුරයෙන් ඇමතිවරු, මන්ත්‍රීවරු රොත්තක් බිහි වුණා. නමුත්, ඒ කිසි කෙනෙක් මේකට අත තිබ්බේ නැහැ, ඡන්ද නැති වෙන නිසා; මැතිවරණ කල්පනාව නිසා. ඔබට මා කියන්න ඕනෑ, සබරගමුව විශ්වවිද්‍යාලයට විශිෂ්ට බුද්ධිමතුන් බඳවා ගන්න එක කල් යන්නේ, ඒ සම්මුඛ පරීක්ෂණ අසාර්ථක වෙන්නේ යන්න මාර්ගයක් නැති නිසා, එහේට යන්න කාලය ගත වන නිසා. මේවා තමයි සංවර්ධනය ඇතුළේ තිබෙන බැඳීම්. මේවා දැක ගන්නට ඕනෑ.

පර්යේෂණ සහ සංවර්ධනය සඳහා රුපියල් බිලියන 21ක් මෙවර වෙන් වෙනවා.

අවසාන වශයෙන් මේ කාරණයත් මා කියන්නට ඕනෑ. අපේ රජය කාර්යභාරය සම්පූර්ණ කිරීමට අසමත් කියලා නිතර ඒත්තු ගන්වන්න උත්සාහ කරපු එක, සම්පූර්ණ සාවද්‍ය, අවංක බවින් තොර ප්‍රකාශයක්. විපක්ෂය කියනවා ඇහුණා, හින්දු කටයුතුවලට ප්‍රතිපාදන වෙන් වුණා මදි; වැඩ කෙරුණේ නැහැ කියලා. ඒ පිළිබඳව මට ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න පුළුවන්. අපි ගිය අවුරුද්දේ ජනවාරි මාසයේ වැඩ පටන් ගත්තේ ජාතික තෛපොංගල් සැමරුම යාපනයට වෙන් කරලා. මා සඳහන් කරන්නට ඕනෑ, ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයේ සබරිමලෛ අයියප්පන් දෙවිදුන් වැඳ පුදා ගන්න හින්දු බැතිමතුන් යන වන්දනා ගමන රජය පිළිගත් පූජනීය වන්දනා ගමනක් ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත් කළ බව. ආණ්ඩු කීයක් තිබුණාද? නමුත්, ඒ කිසිදු ආණ්ඩුවකින් මේ ප්‍රශ්නය දැක්කේ නැහැ. කෝවිල් සංවර්ධනය, දහම් අධ්‍යාපනයට ඕනෑ තරම් මුදල් වෙන් කෙරුණා. "ශ්‍රී ලාංකික දිනය" ජාතික උත්සවය පැවැත්වීම සඳහා රුපියල් මිලියන 300ක් වෙන් වෙලා තිබෙනවා. මේ දෙසැම්බර් මාසයේ 12, 13, 14වැනි දා වනකොට ඒ රුපියල් මිලියන 300 වියදම් කරලා ඉවර වෙනවා. පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අදාළව කෙරුණු වැඩ මට ඕනෑ තරම් පෙන්වන්න පුළුවන්. සීගිරිය ඇතුළු ජනප්‍රිය ගමනාන්තවලට විකල්ප ගමනාන්ත කිහිපයක් අපි හැදුවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, your time is over. Please wind up now.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මගේ අමාත්‍යාංශයට අයත් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව කියන දෙපාර්තමේන්තු හතරම ඉතාම හොඳින් ඒ මුදල් යොදවලා තිබෙනවා. මම ඊයේ මේ සභාවට පැහැදිලි කළා, දෙසැම්බර් මාසයේ 3වැනි සතිය වනකොට සියයට 90ක මූල්‍ය හා භෞතික ප්‍රගතියක් මගේ අමාත්‍යාංශය වෙනුවෙන් තහවුරු කරනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. ශ්‍රී ලංකාවේ තේ සංස්කෘතික භූ දර්ශනය, UNESCO එක ලෝක උරුමයක් හැටියට හඳුන්වා දී තිබෙනවා. දැන් එය තාවකාලික ලැයිස්තුවට ඇතුළත් වෙලා තිබෙනවා. මේ ගැන මහා සම්මන්ත්‍රණයක්, පර්යේෂණ සැසියක් මේ මස 15 සහ 16 දිනවල නුවරඑළියේදී පැවැත්වෙනවා. මේවාට තමයි සල්ලි වියදම් වුණේ. UNESCO එකේ ලෝක මතක පොතට අපි පානදුරා වාදයේ මුල් පිටපත් ටික සහ ගාල්ලේ ත්‍රිභාෂා සෙල් ලිපිය ඇතුළත් කළා. මේවා ශිෂ්ටාචාරමය වශයෙන් ගත්තාම ආයෝජන. මේවාට තමයි වියදම් කළේ; ආයෝජනය කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා මෙම අය වැයේ දර්ශනය දකින්න, මේ පදනම දකින්න කියලා මම කියනවා. ඒක ඇතුළේ තමයි අපේ ගමන සලකුණු වෙලා තිබෙන්නේ. අපි ඊළඟ වසරේ ඊළඟ පිම්ම අරගෙන අපේ රට අප පැතූ පොහොසත් රට බවට පත් කර, ජනතාවට ලස්සන ජීවිතයක් නොඅනුමානව ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නවතිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Dinindu Saman Hennayake. You have 11 minutes.

[අ.භා. 2.47]

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Dinindu Saman Hennayake - Deputy Minister of Youth Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද නොවැම්බර් මාසයේ 13වැනි දා. නොවැම්බර් 13වැනි දා කියන්නේ, අපට මතක හිටින සුවිශේෂී දවසක්. අපේ පක්ෂයේ නායක, ආදරණීය රෝහණ විජේවීර සහෝදරයා ඝාතනය කරලා අදට අවුරුදු 36ක් වෙනවා. මේ වනකොට රෝහණ විජේවීර සහෝදරයාගේ දර්ශනයේ තිබෙන මූලික කියවීම සමාජය ඇතුළේ නැවත නැවත කථා බහකට ලක්වන වට පිටාවක් නිර්මාණය වෙලා තිබෙනවා.

මිනිසුන්ට පරිත්‍යාග කිරීම් සම්බන්ධ ඉහළම ඉගැන්වීම් කළ දේශපාලන ව්‍යාපාරයක් විධියට අපි මෙය දැක්කා. හැම දේම තමන්ට ගොඩගහ ගන්න, හැම දේම තමන්ගේ කර ගන්න මිනිසුන් ඉන්න වට පිටාවක, අනෙකාගේ ජීවිතය වෙනුවෙන්, අනෙකාගේ ජීවිත ජයග්‍රහණය වෙනුවෙන්, වෙනත් මනුස්සයෙක් වෙනුවෙන් තමන්ගේ ජීවිත පරිත්‍යාග කළ දේශපාලන ව්‍යාපාරයක, ඒ සහෝදරයා ඇතුළු කණ්ඩායම සිහිපත් කරන අද දවසේ මට මේ කථාව ඉදිරිපත් කරන්නට ලැබීම භාග්‍යයක් කියලා මා විශ්වාස කරනවා.

අපට තිබුණා දේශපාලන දර්ශනයක්. ඒ දර්ශනය ඇතුළේ එදා ඉඳලා අපි කථා කළේ සාධාරණ සමාජයක්, යුක්තිගරුක දේශයක් සහ නිවහල් මිනිසෙක් බිහි කිරීම කියන කාරණා. අදටත් ජාතික ජන බලවේගයේ දේශපාලන ප්‍රතිපත්තිය ඇතුළේ මේ කාරණා තුන අපි දකිනවා. අපි හැම වෙලාවේම විශ්වාස කරනවා, මේ රටේ සාධාරණ සමාජයක් බිහි වෙන්න ඕනෑ කියලා. ඒ වාගේම යුක්තිගරුක දේශයක් හදන්න, නීතිය සැමට සමානව ක්‍රියාත්මක කරන්න, නීතියේ ස්වාධිපත්‍ය සමාන කරන්න අදාළ මැදිහත් වීම අප කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා. ඒ සඳහා වන දේශපාලන ගමනක් අපි යනවා. ඒ වාගේම කොන්ද කෙළින් තබාගෙන වැඩ කරන නිවහල් මිනිහෙක් ගොඩනගන්න, පෞරුෂය සහිත මිනිහෙක් ගොඩනගන්න අදාළ වට පිටාව නිර්මාණය කිරීමේ අවශ්‍යතාව අපට තිබෙනවා. අපි ඒක කරමින් යනවා. එතුමා තැබූ අඩිය, එතුමා බිහි කළ ඒ දේශපාලන ව්‍යාපාරය අද ජව සම්පන්නව නැඟිටලා තිබෙනවා. මේ ලංකාවේ සුවහසක් මිනිසුන් ඒ දේශපාලනය ඉතා හොඳයි, ඒ දේශපාලනය ක්‍රියාත්මක කළ යුතුයි කියන තැනට ඇවිත් තීන්දුව දීලා අප බලයට පත් කර තිබෙනවා. අපට අඩි තබන්නට එදා පාර කියපු ඒ තාරකා "ඉල් මහ විරු සමරුව" පැවැත්වෙන උතුම් අද දවසේ අප සිහිපත් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ඉදිරිපත් කර තිබෙන අය වැය ගැන මට දැනෙන්නේ සතුටක්. මොකද, මෙය අපි බලයට ඇවිත් වසරක කාලයක් ඇතුළත ඉදිරිපත් කළ අය වැයක්. අපට අසමත් නොවී, සමත් ආණ්ඩුවක් විධියට මෙම අය වැය ඉදිරිපත් කරන්න පුළුවන් වෙලා තිබෙනවා. එක පැත්තකින් ආර්ථිකය කඩාගෙන වැටුණු, රට බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කරපු, ආර්ථිකයේ අස්ථාවර වීම් ගොඩක් මැද තිබුණු රටක, සෙමින් නමුත්, ස්ථාවර ආර්ථිකයක් නිර්මාණය කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. සෙමින් නමුත් ස්ථාවර ආර්ථිකයක් නිර්මාණය කරන්න අප සමත් වෙලා තිබෙනවා. විපක්ෂයෙන්ම අද මහා භාණ්ඩාගාරය ඉතිරිලා යනවා කියන තැනට, ඒ කටවල්වලින් ඒ වචන එන තැනට ආර්ථිකය වෙනස් කරන්න, ආර්ථිකය නව මාවතකට ගෙනෙන්න අප සමත් වෙලා තිබෙනවා. ඒ එක්කම, භාණ්ඩාගාරය සතුව රුපියල් ට්‍රිලියන 1ක දේශීය සංචිතයක් තබා ගන්න අප සමත් වෙලා තිබෙනවා.

අපි ආණ්ඩුව භාර ගන්නකොට සමහරු කිව්වා, ඩොලර් එක රුපියල් 400ට යයි, රුපියල් 500ට යයි, තෙල් නැති වෙයි, ජනතාවට පෝලිම්වල ඉන්න වෙයි කියලා. එහෙම අඬ ඇඬියා කියපු විපක්ෂයට අද බලා ගන්න පුළුවන්, අඩු මිලට තෙල් මිලදී ගන්නා ජනතාව. එදා ඔවුන් ප්‍රාර්ථනා කළ එවැනි දේවල් සිදු නොවී ඩොලර් එක ස්ථාවර මට්ටමේ තියා ගෙන මේ අවුරුද්දක කාලය අපට ගත කරන්න පුළුවන් වෙලා තිබෙනවා. විදේශීය සංචිත බිලියන 6.2කට අධික ප්‍රමාණයක් අපි අද තියාගෙන ඉන්නවා, වාහන ගෙන්වන්න බිලියන 1.8කට වැඩි ප්‍රමාණයක් වියදම් කරමින්.

ආර්ථිකය හකුළුවන්නේ - සංකෝචනය - කරන්නේ නැතිව, ආර්ථිකය පුළුල්ව පවත්වාගෙන යමින්, මිනිස්සුන්ට අවශ්‍ය ප්‍රතිලාභ ලබා දෙමින් ආර්ථිකය සවිමත් කරන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒකයි මම කිව්වේ මේ තිබෙන්නේ, "සමත්කමේ වසරක්" කියලා. එක පැත්තකින් දේශීය ආයෝජන ප්‍රමාණය වැඩි කර ගන්නත්, විදේශීය ආයෝජන ප්‍රමාණය වැඩි කර ගන්නත් අපට හැකි වෙලා තිබෙනවා. ජනාධිපතිවරයා බලයට පත් වෙලා වසරක් ඇතුළත ඩොලර් බිලියනයක ආයෝජන ගේන්න සමත් වෙච්ච ආණ්ඩුවක් මේක. විදේශීය ශ්‍රමිකයන් අපේ රටට එවන මුදල ගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ සියයට 20කින් වැඩි කර ගන්න ආණ්ඩුවක් විධියට අපි සමත් වෙලා තිබෙනවා. සංචාරක කර්මාන්තය ඉහළ ගිහින්, ලක්ෂ 20කට ආසන්න සංචාරකයන් පිරිසක් දැනටත් මේ රටට ඇවිල්ලා තිබෙනවා. අපි බලාපොරොත්තු වූ ක්‍රමයට අපේ ආර්ථික දර්ශනය ගෙන යෑමේ ප්‍රතිඵලයක් විධියට මේ වන විට රට බංකොලොත්භාවයෙන් මුදා ගන්න අපි සමත් වෙලා තිබෙනවා. ණය ගෙවීම්වලදී Fitch Ratings, Moody's වාගේ ආයතන අද අප CCC+ කියන තැනට ඔසවා තිබෙනවා. ඒ විධියට ලංකාව ණය ගෙවිය හැකි රාජ්‍යයක් බවට පරිවර්තනය වෙලා තිබෙන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, මේ ආර්ථිකයේ සමත්කම් ඇතුළේ. හැබැයි, ඒ සමත්කම් කරද්දි කලින් බලයේ හිටපු අය කළා වාගේ ෂෝ දාන එක දේශපාලන ව්‍යාපාරයක් විධියට අපි කළේ නැහැ. කලින් රට පාලනය කළ අය කරපු විධියට පුංචි දෙයක් මහා ලොකුවට විශාල කර පෙන්වා මිනිස්සු රවටන වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කළේ නැහැ. අපි හැමෝම මහන්සි වුණා, ආර්ථිකය ගොඩ නඟන්න. ඒකේ අවසාන ප්‍රතිඵලය විධියට අද අපට හොඳ, ස්ථාවර ආර්ථිකයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ ආර්ථිකය නිර්මාණය වීමේ ප්‍රතිඵලය තමයි, 2026 අය වැය කියන්නේ. 2026 අය වැයේදී අපි සමත් වුණා, ලංකාවේ සියලු ක්ෂේත්‍රවලට අදාළව සහන ලබා දෙන්න, ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන්න, ඒ සියලු කටයුතු කරන්න.

බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට මා ඉතා සංවේදී වන කාරණයක් තිබෙනවා. අපි දන්නවා, කඳුකර ජනතාව, අපේ මලෙයහම් ජනතාව කොච්චර පීඩාවට පත් වෙලා ඉන්නවාද කියලා. ඒ, මට ඡන්දය දීපු ජනතාව. ඔවුන් මා වෙනුවෙන් ඡන්දය පාවිච්චි කරලා තිබෙනවා. ඉතින් මට වගකීමක් තිබෙනවා, ඒ ජනතාව වෙනුවෙන් පෙනී ඉන්න. අපි හැම දාම විශ්වාස කළා, අපේ දිස්ත්‍රික්කයේ ඉන්න, නගරය ඇතුළේ ඉන්න ජනතාව වාගේම කඳුකරයේ ලැයිම් කාමරවල ඉන්න ජනතාවටත් හොඳ ජීවිතයක් ඕනෑ කියලා. පොඩි කාලයක් නොවෙයි, අවුරුදු 200ක් තමන්ගේ රිරි මාංස මේ රටට දිය කර හැරලා, මේ රටට ඩොලර් උත්පාදනය කරන්න මහන්සි වෙලා, පටන් ගත්ත තැනම ජීවිතය තියාගෙන ඉන්න මිනිස්සු ඒ අය. ඒ, ඒ අය එක කාමරයක් ඇතුළේ පවුල් ජීවිතය ගත කරන මිනිස්සු. අම්මාත් ඒකේ, තාත්තාත් ඒකේ, දරුවෝත් ඒකේ, දරුවන්ගේ දරු පවුලත් ඒකේ, සියලුදෙනා එක කාමරයක් ඇතුළේ ජීවිත ගත කරනවා. මම මේ සභාවේ මන්ත්‍රීවරුන්ට කියනවා, පොඩ්ඩක් ඇස් වහගෙන කල්පනා කරලා බලන්න, අපට එහෙම ඉන්න පුළුවන්ද කියලා. අපට එහෙම ඉන්න බැහැ. ඔවුන් ඒ තරම් පීඩිත මිනිස්සු. අපි විශ්වාස කළා, ඒ මිනිස්සුන්ට හොඳ ජීවිතයක් දෙන්න ඕනෑ කියලා. ඔව්, අපට දේශපාලන ව්‍යාපාරයක් විධියට අවංක වුවමනාවක් තිබෙනවා, ඒ ජනතාවට හොඳ ජීවිතයක් දිය යුතුයි කියලා. ඒ වුවමනාව වෙනුවෙන් අපි පෙනී සිටිනවා. අදත් පෙනී සිටිනවා, හෙටත් පෙනී සිටිනවා.

අපි දැක්කා, ඒ වුවමනාව වෙනුවෙන් ගරු ජනාධිපතිතුමා කළ ප්‍රකාශය. අපි ගිය අවුරුද්දේ උත්සාහ කළා, රුපියල් 1,750ක දෛනික වැටුපක් ඒ වතු කම්කරු ජනතාවට ලබා දෙන්න. හැබැයි ඒ දීමනාව ගැන විවිධ සාකච්ඡා ඇති වුණා. අවසානයේ අපි අසමත් වුණා, ඒ දීමනාව දෙන්න. හැබැයි අපි මේ අවුරුද්දේ තීන්දුවක් ගත්තා, වතු හාම්පුතුන් සමඟ කළ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් විධියට

[ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා]

ඔවුන්ට දැනට දෙන රුපියල් 1,350ට අමතරව හාම්පුතුන්ගෙන් රුපියල් 200ක් සහ පැමිණීමේ දිරි දීමනාවක් විධියට ආණ්ඩුවෙන් රුපියල් 200ක් දෙන්න. වතු ජනතාවට, ඒ කඳුකර ජනතාවට හොඳ ජීවිතයක් ලබා දිය යුතු නිසා, ඔවුන්ට වටිනාකම දිය යුතු නිසා අපි තීන්දුවක් ගත්තා, ආණ්ඩුවෙන් රුපියල් 200ක මුදලක් ඒ ජනතාවට දෙන්න. ඒ රුපියල් 200 දෙන්න තීරණය කළාට පස්සේ කලබල වෙලා ඉන්නේ කවුද කියලා අද අපට පෙනෙනවා. එක්සත් ජාතික පක්ෂයේ නායකයා රුපියල් ලක්ෂ 166ක් වියදම් කළා, ට්‍රිප් යන්න; නෝනාගේ උපාධිය ගන්න යන්න. ඒ උපාධිය ගන්න යන්න එහෙම වියදම් කරද්දී, ඒක හරිම සාධාරණයි, ලංකාවේ මිනිස්සුන්ගේ සල්ලි එහෙම පාවිච්චි කරන්න පුළුවන් කියලා මොර දීපු විපක්ෂයේ ඉන්න අය දැන් මොකද කරන්නේ? මම දැක්කා ඊයේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා නැඟිටලා කථා කරලා කියනවා, වතු ජනතාවට රුපියල් 200 දීපු එක වැරදියි කියලා. කමක් නැහැ, තරුණ මන්ත්‍රීවරයෙක් එහෙම කථා කළාට අපට විවේචනයක් නැහැ, ඒක ඔහේ ගියදෙන්. ඒ වාගේම මම දැක්කා, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගේ මාධ්‍ය ප්‍රකාශක මොකක්ද කිව්වේ කියලා. හැබැයි මේ කථා කරන්නේ සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකගේ මාධ්‍ය ප්‍රකාශක. එතුමා කථා කරලා කියනවා, වතු ජනතාවට රුපියල් 200 දීපු එක වැරදියි කියලා. මම අද දැක්කා, සමාජ මාධ්‍යවල රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය කියලා තිබෙනවා, වතු ජනතාවට රුපියල් 200 දීම වැරදියි, ඒක ගැන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහින් නඩු දානවා කියලා. මම අහනවා, විපක්ෂයේ ප්‍රතිපත්තිය මේකද කියලා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඔබතුමන්ලා යන්න. රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමියට අපි කියනවා, ආණ්ඩුවක් විධියට කඳුකර ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් අපි පෙනී ඉන්නවා කියලා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයාගේ ස්ථාවරයත් එතුමා කියලා තිබෙන්නේ. ඒගොල්ලන් කැමැති නැහැ, වතුකරයේ ඉන්න කම්කරු ජනතාවට ආණ්ඩුවෙන් රුපියල් 200ක් දෙන එකට. අපි විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගෙන් අහනවා, ඔබතුමාගේ ස්ථාවරයත් ඒකද කියලා. විපක්ෂයේ ස්ථාවරය මොකක්ද කියලා විපක්ෂ නායකතුමා කොන්ද කෙළින් තියාගෙන කියන්න, මේකට කැමැතිද, අකැමැතිද කියලා. විපක්ෂ නායකතුමාගේ මාධ්‍ය ප්‍රකාශකගේ කටහඬින් ආවේ විපක්ෂ නායකතුමාගේ ස්ථාවරය කියලා අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය කරලා තිබෙන ප්‍රකාශය අපි දැක්කා. මේ ප්‍රකාශ කරන්නේ කඳුකරයේ සිටින අහිංසක දෙමළ ජනතාවගේ ජීවිතය වෙනුවෙන්, ජීවන තත්ත්වය වෙනුවෙන් දෙන රුපියල් 200 ගැන. මේ රටේ මොන්ටිසෝරිවල උගන්වන ගුරුවරුන්ට මම කියන්න කැමැතියි, ඔබට රජයෙන් ආධාරයක් දෙනවා, ඒකත් ඒ ක්‍රමයටම තමයි දෙන්නේ කියන එක. අපි මෙවර අය වැයෙන් ආබාධිත ප්‍රජාව සඳහා පෞද්ගලික ආයතනවලින් දෙන වැටුපෙන් කොටසක් දෙන්න තීන්දුවක් ගත්තා. ආබාධිත ප්‍රජාවට පෞද්ගලික අංශයෙන් රැකියාවක් දුන්නොත්, අපි -රජය විසින්- උපරිම වශයෙන් රුපියල් 15,000ක දීමනාවක් දෙනවා. මේකත් ඒ ක්‍රමයම තමයි. ඔයගොල්ලන් යන්න, ඔයගොල්ලන් ගිහිල්ලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කරන්න. ඒ පැමිණිලි කරන එක ඇතුළේ මොකක්ද තිබෙන්නේ? මේ කඳුකර ජනතාවට රුපියල් 200ක මුදල දෙන්න එපා කියලායි මේ කියන්නේ. අපි මේ රටේ කඳුකර ජනතාවට කියන්නේ මේකයි.

මේ රටේ මැයි දිනය තිබෙන දවස්වල කොළඹ මැයි දිනය කර ගන්න බැරි වෙද්දී ඔය සජබය රිංගුවේ, යූඑන්පී එක රිංගුවේ තලවකැලේට, බදුල්ලට බව. ඒගොල්ලන් මැයි දිනය කළේ ඒ ප්‍රදේශවල ඉන්න අහිංසක කඳුකර ජනතාව ගෙනැල්ලා. ඒ කඳුකර ජනතාව ඔවුන්ගේ ජීවිත කාලයේදීම සජබයට, යූඑන්පීයට, පොහොට්ටුවට තමයි ඡන්දය දීලා තිබෙන්නේ. මේ වතාවේ තමයි ඔවුන් අපට ඡන්දය දුන්නේ. ඒ ජනතාවට අපි කියනවා, ඔයගොල්ලන් ඡන්දය දීපු පක්ෂවල අය තමයි අද මෙහෙම කථා කරන්නේ, ඔයගොල්ලන් ඡන්දය දීලා මෙච්චර කල් දිවිහිමියෙන් රැකපු පක්ෂවල අය තමයි මේ රුපියල් 200 දෙන එකට විරුද්ධව කථා කරන්නේ කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Deputy Minister, your time is up. Please wind up.

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க)
(The Hon. Dinindu Saman Hennayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කඳුකර ජනතාව අද ඒ සටන පටන් අරගෙන තිබෙන්නේ. විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුන්ගේ අදහස දැන් සෘජුව කඳුකර ජනතාවට කියලා තිබෙනවා. එහෙම නොවෙයි, කොහොම අභියෝග ආවත් ආණ්ඩුවක් විධියට අපි කඳුකර ජනතාවට ඒ රුපියල් 200 දෙන එක නතර කරන්නේ නැහැ. අපි ඒක දෙනවා. ඒ වාගේම ඔවුන්ගේ ජීවිත ස්ථාවර කරන්න, ඔවුන්ගේ ජීවන තත්ත්වය ස්ථාවර කරන්න අවශ්‍ය සියලු මැදිහත්වීම් අපි කරනවා. ඔවුන්ගේ දුක අපට තේරෙනවා. ඒ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට ඔවුන්ගේ දුක මට හොඳින් තේරෙනවා. අපි ආදරණීය ඔබ සියලුදෙනාගෙන් ඉල්ලා සිටිනවා, විපක්ෂයේ මේ වෙස් මුහුණ ගලවමු කියලා. ඒකට කඳුකර ජනතාව එකතු වෙන්න, මැදිහත් වෙන්න, පාරට බහින්න, විපක්ෂය කරන මේ නරක අසික්කිත ක්‍රියාවට එරෙහිව පෙළ ගැසෙන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. D.V. Chanaka. You have been allotted 12 minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Sagarika Athauda to the Chair?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. KAVEENTHIRAN KODEESWARAN left the Chair, and THE HON. (MRS.) SAGARIKA ATHAUDA took the Chair.*

[අ.භා. 2.59]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම පළමුවෙන්ම සුබ පතන්න කැමැතියි, ඒ වාගේම ස්තුතිවන්ත වෙන්න කැමැතියි, ගරු ජනාධිපතිතුමා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා, අමාත්‍යාංශවල ලේකම්තුමන්ලා, අතිරේක ලේකම්තුමන්ලා, අධ්‍යක්ෂතුමන්ලා ඇතුළු සියලු නිලධාරින්ට, මෙවර අය වැය නිර්මාණය කරන්න දායක වුණාට. මේ, රටේ ඊළඟ අවුරුද්දේ අය වැය. මේ අය වැයට විවේචන තිබෙන්න පුළුවන්, හොඳ තිබෙන්න පුළුවන්. හැබැයි, ඒ වෙනුවෙන් කටයුතු කරපු සියලුදෙනාට පළමුවෙන්ම මා ස්තුතිවන්ත වෙනවා වාගේම, රජයට සුබ පතන්නත් කැමැතියි, මේ අය වැයේදිවත් සියයට 80ට උඩින් Capital Expenditure තියාගන්න හැකි වෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් රටේ ජනතාව අය වැය අහනකොට අය වැයේ තිබෙන දේවල් ඉටු වෙයි කියලා බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම Recurrent Expenditureවලින් කොහොමත් පඩිනඩි ගෙවනවා. හැබැයි, Capital Expenditure පැත්ත, ඒ කියන්නේ රටේ මුදල් සංසරණය වෙන පැත්ත අඩුම තරමින් සියයට 90ක්වත් වෙන්න ඕනෑ. ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමනි, මම හිතන්නේ අපේ පරණ අය වැය බැලුවොත් - මහින්ද රාජපක්ෂ මහත්තයා ඉදිරිපත් කළ 2010 ඉඳන් 2015 දක්වා වූ අය වැය ගත්තොත් - ඒ හැම අය වැයකම සියයට 95ට වැඩිය Capital Expenditure වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව රටේ ජනතාව වෙනුවෙන් වැඩ කරලා තිබෙනවා. එතකොට මුදල් සංසරණය රට ඇතුළේ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කියන්න කනගාටුයි, මේ අවුරුද්ද වෙනුවෙන් ගිය අවුරුද්දේ ගෙනා අය වැයෙන් සියයට 50ක්වත් මුදල් වියදම් කරලා නැහැ.

අවශ්‍ය බෙහෙත් ටික ගෙනෙන්න ඒ මුදල් ටික යොදවලා නැහැ. රෝහල් ටික හදන්න ඒ මුදල් ටික යොදවලා නැහැ. ටවර් 100ක් ගහනවා කිව්වාට 30යි හදලා තිබෙන්නේ, 70ක් හදලා නැහැ. අන්තිම අවුරුද්දේ ඉදිරිපත් කරපු අය වැයෙන් වෙච්ච පොරොන්දු ටික, ඒ අය වැය ලේඛනයේ තිබුණු කිසිම දෙයක් ඉටු වෙලා නැති බව අපට කනගාටුවෙන් වුණත් කියන්න වෙනවා. පසුගිය අය වැයෙන් වෙන් කළ මුදලින් සියයට 50ක් නම් වැය කර තිබෙන්නේ රටේ ජනතාවට බලන්න වෙනවා, මේ අය වැයේ පොරොන්දු මාලාවෙනුත් සියයට 50ද ඉටු වෙන්නේ කියලා.

ක්‍රීඩා ඇමතිතුමා කිව්වා, අපේ විපක්ෂයේ අයට මේ අය වැය ගැන පැහැදිලි කරලා දෙන එක හරියට අන්ධයන්ට අධ්‍යාපනය ලබා දෙන එක තරම් අමාරුයි කියලා. ඒ ප්‍රකාශය ගැන මම කනගාටු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. දෘශ්‍යාබාධිත ගරු මන්ත්‍රීතුමාත් සභාවේ ඉන්නවා. පළමුවැනි වතාවට දෘශ්‍යාබාධිත මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුව නියෝජනය කරන අවස්ථාවකදීත්, දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට අධ්‍යාපනය ලබා දෙන එක අමාරුයි, ඒගොල්ලන්ට උගන්වන එක අමාරුයි කියලා දැඩි අපහාසයක් කිරීම පිළිබඳව අමාත්‍යතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා රට වෙනුවෙන් වහාම සමාව ගන්න ඕනෑ. ඒ මන්ත්‍රීතුමාගේ මුහුණ බලාගෙන, එතුමා පිටුපස තබාගෙන ඒ විධියට අපහාස කිරීම ගැන අපි කනගාටු වෙනවා. ඒ වාගේම, අපි පක්ෂයක් වශයෙන් එය දැඩිව හෙළා දකිනවා. මේ රටේ දෘශ්‍යාබාධිත අය වෙන්න පුළුවන්, වෙනත් ආබාධ තිබෙන අය වෙන්න පුළුවන් ඒ සියලුදෙනාට සම තැන ලැබෙන්න ඕනෑ. පාර්ලිමේන්තුව පාවිච්චි කරලා කරපු ඒ ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මම ඔබතුමියගෙන් ඉල්ලීමක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේ පාර්ලිමේන්තුව තුළ එවැනි අපහාස සිදු කිරීමට කිසිසේත්ම ඉඩ දිය නොහැකියි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

එවැනි ජන කණ්ඩායම්වලට වැඩියෙන්ම සලකපු අය වැයක් මේක.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

හොඳයි. ඔබතුමා සලකයිද, නැද්ද කියලා අපට බලන්න වෙනවා. මොකද, පසුගිය අය වැයෙන් සියයට 50 නේ ඉටුවෙලා තිබෙන්නේ. ඒක හින්දා පළමුවෙන්ම ඇමතිවරුන්ගේ කට පොඩ්ඩක් වහලා තබා ගන්න.

ක්‍රීඩා ඇමතිතුමා කිව්වා, "මේක තමයි බදු නැති පළමුවැනි අය වැය" කියලා. ඇමතිතුමා විතරක් නොවෙයි, ජනාධිපති අනුර කුමාර දිසානායක මහත්මයාත් අය වැය ගේන්න මාසයකට කලින් කිව්වා, මේ අය වැයේ කිසිම බද්දක් නැහැ කියලා. මෙතැන මුදල් නියෝජ්‍ය ඇමතිතුමා හිටියා නම් මට ඒ ගැන අහන්න තිබුණා. Estimate එකේ රුපියල් බිලියන 150ක් VATවලින් බලාපොරොත්තු වෙනවා කියලා සඳහන් වෙලා තිබෙනවා. බදු ගහනවා කියන්නේ, VAT එක සියයට 18 තබාගෙන, සියයට 20 දක්වා වැඩි කරන එක විතරක් නොවයි. VAT එකට අයිති වන ප්‍රජාව වැඩි කිරීම තුළිනුත් VAT එක වැඩි වෙනවා. රුපියල් මිලියන 60ට තිබුණු සීමාව රුපියල් මිලියන 36ට අඩු කරනකොට දවසට රුපියල් ලක්ෂයක් හම්බ කරන ව්‍යාපාරිකයන් පවා මේ VAT එකට අහු වෙනවා.

අනෙක් එක, VAT එක කියන්නේ Income Tax එකට නොවෙයි. VAT කියන්නේ, indirect tax එකක්; වක්‍ර බද්දක්. වක්‍ර බද්දක් හැම තිස්සේම consumer තමයි ගෙවන්නේ. අන්තිමට මේක ගෙවන්න වෙන්නේ භාණ්ඩ හා සේවා ලබා ගන්නා පුද්ගලයාට. ඒ කියන්නේ මොකක්ද? මේ ආණ්ඩුව ගමේ තිබෙන සිල්ලර කඩේ ඉඳලා, පුංචි restaurant එකේ ඉඳලා, පුංචි ව්‍යාපාරයේ ඉඳලා මේ සියල්ලටම බදු ගහනවා.

මේ ආණ්ඩුව ආවේ direct tax වැඩි කරනවා, indirect tax අඩු කරනවා කියලා. එහෙම කියපු අය දැන් දිගින් දිගටම දුප්පත් මිනිස්සුන්ට තමයි බදු ගහන්න පටන්ගෙන තිබෙන්නේ. ඒකට කියන්නේ, කොළේ වහලා ගහනවා කියායි. ඒ කියන්නේ, අපි බදු ගහන්නේ නැහැ, හැබැයි threshold එක වැඩි කරනවා. අපි බදු ගහන්නේ නැහැ, හැබැයි, බදු ගෙවන ප්‍රමාණය, ඒ පිරිස වැඩි කරනවා. එක්කෝ, ඒක direct taxවලින් වැඩි කරන්න. හැබැයි, ඒක කළේ indirect taxවලින්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වාහන ගැන කථා කරනවා මම දැක්කා. මේ ගරු සභාවේ අග්‍රාමාත්‍යතුමිය හිටියා නම් වඩාත් හොඳයි. නමුත් එතුමිය දැන් එළියට ගිහිල්ලා. ගරු නියෝජ්‍ය

[ගරු ඩී.වී. චානක මහතා]

ඇමතිතුමනි, ඔබතුමන්ලා දිගින් දිගටම කිව්වා, "වාහන පර්මිට් දෙන එක නැවැත්තුවා" කියලා. නවත්වන්න පර්මිට් එකක් කොහේද තිබුණේ? පසුගිය වසර පහ තුළ පර්මිට් එකක් තිබුණේ කොහේද? මෙතැන අග්‍රාමාත්‍යතුමිය හිටියා නම් මට අහන්න තිබුණා, හරිනි අමරසූරිය අග්‍රාමාත්‍යතුමියට 2020දී පර්මිට් එකක් ලැබුණාද කියලා. ඒක ලැබුණා නම් නේ කියන්න ඕනෑ ඒක නැති කළා කියලා. මම ඒ කාරණයම අනුර කුමාර දිසානායක මහත්මයාගෙනුත්, විජිත හේරත් මහත්මයාගෙනුත් අහන්න කැමැතියි. මොකද, ඒ අය තමයි ඒ කාලයේ පාර්ලිමේන්තුවේ හිටියේ. ගරු අග්‍රාමාත්‍යතුමියට සහ එතුමන්ලා දෙදෙනාට පර්මිට් එකක් හම්බ වුණාද? ගෝඨාභය රාජපක්ෂ මහත්මයා පර්මිට් දුන්නේ නැහැ. එතුමා පර්මිට් දෙන එක නැවැත්වූවා. 2020දී තීරණයක් අරගෙන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පර්මිට් දෙන එක නැවැත්වූවා. හැබැයි, වෛද්‍යවරුන්ට දුන්නා. හමුදාවේ ඉන්න ආරක්ෂක අංශයේ ප්‍රධානීන්ට දුන්නා. ඒ වාගේම රාජ්‍ය සේවයේ ඉහළ නිලධාරීන්ට දුන්නා. ඉංජිනේරු මහත්වරුන්ට දුන්නා. හැබැයි, මේ වාහන පර්මිට් එක මන්ත්‍රීවරුන්ට දෙන එක නැවැත්වූවේ 2020දී. නවත්වපු පර්මිට් එකක දැන් නවත්වන්න දෙයක් නැහැ. ඒක නවත්වලා තිබුණේ. මම 2020දී පාර්ලිමේන්තුවේ හිටියා. මට පර්මිට් ලැබුණේත් නැහැ. මෙතැන හිටපු කිසිම කෙනෙකුට පර්මිට් හම්බ වුණේ නැහැ. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පර්මිට් ගැන කථා කරද්දී අනුර කුමාර දිසානායක මහත්තයා පොරොන්දුවක් දුන්නා.

2024 මැතිවරණය වෙලාවේ වාගේම ජනාධිපතිවරණය වෙලාවේ අපි හැම තැනකදීම කිව්වා, මේ ආණ්ඩුව ආවොත් ඒක නැති කරනවා කියලා. මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර වෛද්‍යවරු 22ක් ඉන්නවා නේද? අපේ හංසක විජේමුණි නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා. මම හිතන විධියට, පාර්ලිමේන්තුව ඇතුළේ වෛද්‍යවරු 22ක් ඉන්නවා. මේ ආණ්ඩුව බලයට ආවොත් අනිවාර්යයෙන්ම වෛද්‍යවරයාගේ පර්මිට් එකට වැඩේ දෙනවා දෙනවාමයි කියලා අපි කිව්වා; ඉංජිනේරු මහත්මයාගේ පර්මිට් එකට වැඩේ දෙනවා දෙනවාමයි කියලා අපි කිව්වා; රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ ඉන්න අයගේ පර්මිට් එකට වැඩේ දෙනවා කියලා අපි කිව්වා. මන්ත්‍රීවරුන්ගේ පර්මිට් එක කොහොමත් අයින් කරලා තිබුණේ. හැබැයි මොකක්ද, ජනාධිපතිතුමා කිව්වේ? ජනාධිපතිතුමා කියනවා, "රටේ ඉන්න දේශපාලනඥයන්ට පර්මිට් ඕනෑ නැහැ" කියලා. ඒක අපිත් කිව්වා. අපි පර්මිට් දුන්නේත් නැහැ. ඒ වෙලාවේ අපි හිටියේ ආණ්ඩු පක්ෂයේ. ලංකාවේ හමුදාවේ ඉන්න ඉහළ නිලධාරීන්ගේ, වෛද්‍යවරුන්ගේ, ඉංජිනේරුවන්ගේ පර්මිට් එක අනුර කුමාර දිසානායක අයින් කරනවා කියලා ආණ්ඩු පක්ෂයෙන් බොරුවක් කියනවා, "පිස්සුද, මම අයින් කරන්නේ නැහැ" කියලා එතුමා කිව්වා. එතුමා කිව්ව වචනවලින්මයි මම ඒක කිව්වේ.

ලංකාවේ වෘත්තීය ශ්‍රමය තිබෙන්නේ සියයට 15යි. එතුමාගේ වචනවලින්ම කිව්වොත්, ඉස්සෙල්ලාම එතුමා කිව්වේ සියයට 85ක් කියලා. ඉන්පසුව, නැහැ, නැහැ, 85 නොවෙයි 15යි කිව්වා. "මේ සියයට 15 ඇතුළේ ඉන්න අයට තිබෙන වරප්‍රසාද එකක්වත් මම අයින් කරන්නේ නැහැ. ඒක තවදුරටත් වැඩි කරනවා. පිටරට ඉන්න වෛද්‍යවරුන්ට ආරාධනා කරනවා ලංකාවට එන්න, පර්මිට් එක විතරක් නොවෙයි, තවත් වරප්‍රසාද දෙනවා" කියලා එතුමා කිව්වා. එහෙම තමයි එතුමා කිව්වේ. හැබැයි, දැන් එතුමා මොකක්ද කියන්නේ? දැන් අපි කියපු එකද ඇත්ත, ජනාධිපතිතුමා කියපු එකද? අනුර කුමාර දිසානායක මහත්තයා ඒ පර්මිට් එක නවත්වනවා කියලා එදා ඉඳන්ම අපි කිව්වා.

අපේ හංසක විජේමුණි නියෝජ්‍ය ඇමතිතුමා වෛද්‍යවරයෙක්. දීපු පර්මිට් 20,000කුත් තවම තිබෙනවා. ඒවා දීලා තිබෙන්නේ දේශපාලනඥයන්ට නොවෙයි. ඒවා දීලා තිබෙන්නේ වෛද්‍යවරුන්ට. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ප්‍රශ්නය තිබෙන්නේ වෛද්‍යවරයා විධායක ශ්‍රේණියේ නිලධාරියෙක් වුණාට වාහනයක් හිමි නැතිකමයි. ප්‍රාදේශීය ලේකම්තුමාට නම් වාහනයක් හම්බ වෙනවා. දිසාපතිතුමාට වාහනයක් හම්බ වෙනවා, එතුමාගේ සේවාව කරන්න. හැබැයි, හදිසි අවස්ථාවකදී රෝහලට යන්න වෛද්‍යවරයාට වාහනයක් හිමි නැහැ. ඒ අයට වාහනයක් දෙන්නේ නැහැ. ඔබතුමන්ලා වාහන 1,700 ගණනක් ගේනවා. හැබැයි, වෛද්‍යවරයාට වාහනයක් නැහැ. එක්කෝ අඩු ගණනේ ඒ අයටත් වාහන ටික,- මන්ත්‍රීවරු 225දෙනාට ගෙනෙන වාහන හරි කමක් නැහැ, ඉස්සෙල්ලාම වෛද්‍යවරුන්ට දෙන්න. ඊට පසුව ඔබතුමන්ලා බලන්න, දේශපාලනඥයා ගැන. හැබැයි, ඔබතුමන්ලා ඒ රාජ්‍ය නිලධාරීන්, හමුදාවේ උසස් නිලධාරීන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, SLAS officersලා ඇතුළු මේ සියලුදෙනා රැවටුවා. ඔබතුමන්ලා මේ සියලුදෙනාම රැවටුවා. එහෙම රවට්ටපු අය වැයක් තමයි මේ ඉදිරිපත් වෙලා තිබෙන්නේ.

අනෙක් කාරණය මේකයි. ටෙන්ඩරය ගැනත් අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ජාත්‍යන්තර ටෙන්ඩරයක් දින 42ක් තිබෙන්න ඕනෑ. සාමාන්‍යයෙන් ලංකා ඉතිහාසයේ ඉඳන්ම තිබෙන ලොකුම චෝදනාව තමයි, ටෙන්ඩරයක් හදනකොට එක සමාගමකට යන්න ඕනෑ විධියට specifications හදනවා කියන එක. කොහොමද ඇමතිතුමනි, මේ ටෙන්ඩරය? එක ටෙන්ඩරයක් දානවා, CC2500 ඉඳන් CC3000 කියලා. ඒකෙන් ලංකාවේ තිබෙන ප්‍රධාන සමාගම් දෙකක් කෙළින්ම එළියේ. මොකද, ඒගොල්ලන්ගේ වාහන **CC**2400. ඊට පසුව දානවා, කොළඹ area එකේ service stations ඇරෙන්න පිට service stations තුනක් තිබෙන්න ඕනෑ, අවුරුදු 10ක් පරණ වෙන්නත් ඕනෑ කියලා. එහෙම companies ටික හොයලා බැලුවාම එකම companyයකටයි ඒක තිබෙන්නේ. තනිකරම ඒ ටෙන්ඩරය හදලා තිබෙන්නේ එක company එකකට දෙන්න. එක company එකකට ටෙන්ඩරය හදලා, specifications හදලා තනිකරම ඒ සමාගමට ටෙන්ඩරය ලබා දෙන විධියට හදනවා. කවුරු හරි මේ ටෙන්ඩරය හදලා තිබෙන්නේ company එකකින්, එක කැබ් එකකට රුපියල් මිලියනය ගාණේ අරගෙන, මිලියන 1,700ක් හොරකම් කරන්න කියලා අනුර කුමාර මහත්තයා මේ සභාවේ හිටියා නම් කියන එක කියනවා. දවස් 42ක් තිබෙන්න ඕනෑ එක දවස් 12ට අඩු වෙනවා. එක company එකකට specification එක හදනවා. වාහන ගෙනෙනවා කිව්වාට සෞඛ්‍ය අමාත්‍යාංශය තවම ටෙන්ඩර් දාලා නැහැ නේ. Machines ගෙනෙන්න ටෙන්ඩර් දාලා නැහැ නේ. හැබැයි, මේ කැබ් රථ සම්බන්ධ ටෙන්ඩරය විතරක් හදිසියේ දාලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මහින්ද ජයසිංහ ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවේ හිටියා නම් හොඳයි. පඩි වැඩි කිරීම ගත්තොත්, මූර්ත වැටුප විධියට කීයක් ඇත්තටම හම්බ වෙනවාද? සාමාන්‍යයෙන් සේවකයාට හම්බ වෙන්නේ රුපියල් 56,145ක්. හැබැයි, අපි උද්ධමනයත් එක්ක ඒක ගණනය කළාම ඇත්තටම මිලදී ගැනීමේ හැකියාව තිබෙන්නේ රුපියල් 28,970යි. මම මේ තොරතුරු ගත්තේ Parliament Research Division එකෙන්. මේවා උද්ධමනයත් එක්ක ගණනය කරලා ගත්ත තොරතුරු. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය, මම අපේ ඇමතිවරුන්ගේ අවධානය යොමු කරනවා මේ කාරණයට. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය ගිය අවුරුද්දේ කරලාත් නැහැ, මේ අවුරුද්දේ කරලාත් නැහැ. දැන් අවුරුදු තුනක් තිස්සේ කරලා නැහැ. ඒ නිසා ඇත්තටම ආදායම් වියදම් හොයා ගන්න ක්‍රමයක් නැහැ. ඒක හින්දා අපි ඉල්ලීමක් කරනවා, එම සමීක්ෂණය කඩිනමින් කරන්න කියලා. මේ ගැන Parliament Research Division එකෙනුත් දිගින් දිගටම දැනුවත් කරලා තිබුණා. හැබැයි,

අද වෙනකම් ඒ සඳහා මුදල් යොමු වෙලාත් නැහැ, ඒ අවශ්‍ය කටයුතු කරලාත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අලුත්ම දත්ත වාර්තාව අනුව, එක පුද්ගලයෙකුගේ කැලරි අවශ්‍යතාව සඳහා විතරක් වියදම ලෙස රුපියල් 16,413ක් යනවා. එක පුද්ගලයෙකුගේ අත්‍යවශ්‍ය ආහාර ටික ගන්න යනවා, රුපියල් 16,413ක්. සාමාන්‍යයෙන් ලංකාවේ පවුල් ඒකකයක හතර දෙනෙක් ඉන්නවා කියලා තමයි අපි ගණන් හදන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්ත්පර 30ක් දෙන්න.

එතකොට, සාමාන්‍යයෙන් රුපියල් 65,500ක් ඕනෑ පවුල් ඒකකයකට කෑම ගන්න විතරක්. මේක ගෙවල් හදන ඒවා, වාහන ගන්න ඒවා, බයිසිකල් ගන්න ඒවා, අර ජපන් ඒවා ගන්න ඒවා, විට්ස් කාර් ගන්න ඒවා මොකුත් නැතුවයි. ඒ මොකුත් නැතුව රුපියල් 65,500ක් ඕනෑ. මම හිතන්නේ මේ ප්‍රමාණය දැන් වෙනකොට රුපියල් 100,000ටත් වැඩියෙන් ගිහිල්ලා ඇති. මොකද, මේ දත්ත අරගෙන නැහැ. ඒ හින්දා රාජ්‍ය සේවකයා අමාරුවෙන් ඉන්නේ.

ලූනු ගොවියාට ලූනු ටික විකුණා ගන්න බැරුව අමාරුවෙන් ඉන්නේ. වට්ටක්කා ගොවියාට වට්ටක්කා ටික විකුණා ගන්න බැහැ. අල ගොවියාට අල ටික විකුණා ගන්න බැහැ. මේ ප්‍රශ්න ටික විසඳුවේ නැත්නම් අනිවාර්යයෙන්ම ඒ ඔක්කෝම 21 නුගේගොඩට එනවා. ඒ හින්දා අපි ඉල්ලීමක් කරනවා, එදාට කට්ටිය අඩු වුණත් කමක් නැහැ ඔබතුමන්ලා ප්‍රශ්න ටික 21ට කලින් විසඳන්න කියලා. අල ගොවියාගේ, ලූනු ගොවියාගේ, උක් ගොවියාගේ, වට්ටක්කා ගොවියාගේ ප්‍රශ්න ටිකවත් මුදල් යොදවලා විසඳන්න කියලා ඉල්ලීමක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.13]

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, යම් යම් අය ඒ කාලයේ තනි තනිව පාලනය කරලා, එකතු වෙලා පාලනය කරලා, 2022 අප්‍රේල් 12වෙනි දා මේ රට බංකොලොත්භාවයට ඇදලා දැම්මා. ඒ ඇදලා දාලා, පරාද වෙලා විපක්ෂයට වැටුණාට පස්සේ, විපක්ෂයට වැටීමේ ශෝකය නිසා තමයි දැන් මෙතෙක් වෙලා මේ පාර්ලිමේන්තුවේ බෙරිහන් දුන්නේ; සද්දේ තිබුණේ. බොරු ගොඩක් කියලා, සද්දෙ දාලා ජනතාව රවට්ටන්න හැදුවාට, විපක්ෂය නියෝජනය කරන, මේ අය වැයට විරුද්ධව කථා කරන සියලුදෙනාට ජනතාව අදාළ පණිවිඩය දීලා ස්ථානගත කරලා තියෙන්නේ. ඒ නිසා ඔබට මේ වාරය - විපක්ෂය උරුමයි. මෙවැනි වසර තව තුනක්, හතරක් ඉදිරියට යද්දී සහතික වශයෙන් අපි කියනවා, විපක්ෂයේත් ඉන්න ටිකක් අමාරු වෙයි කියලා. ඒ නිසා විපක්ෂයටත් පුළුවන් නම් මෙහේට එන්න කියලා අපි යෝජනා කරනවා. සද්ද දැම්මාට, බෙරිහන් දුන්නාට ජනතාව රවට්ටන්න පුළුවන් කියා අපි විශ්වාස කරන්නේ නැහැ. ජනතාව හොඳට බුද්ධිමත්. 76 වසරක් හොඳට විමර්ශනය කරලා තමයි මේ රටේ ජනතාව 2024දී මේ අලුත් ආණ්ඩුව පත් කළේ; අලුත් ජනාධිපතිවරයා පත් කළේ. මෙතැනින් එහාට මේ රට ඉස්සරහට අරගෙන යන්නේ ජාතික ජන බලවේගය සහ මේ රටේ ජනතාවයි. ඒ නිසා ජනතාව රවටලා, ජනතාවට බොරු කරලා, ජනතාවට බොරු පොරොන්දු දීලා විනාශ කරපු රට නැවත ඔය ගොල්ලන්ට ලැබෙයි කියා විශ්වාස කරන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජාතික ජන බලවේගය විධියට අපි, 2024 ජනාධිපතිවරණයෙන් පසු මේ රට භාර අරගෙන 2026 වසර සඳහා ඉදිරිපත් කරන දෙවැනි අය වැයයි මේ. මේ අය වැය ඉදිරිපත් කරද්දී, අපි මූලික උපායමාර්ගික අරමුණු හයක් පෙරදැරි කරගෙන තමයි ඉදිරිපත් කරන්නේ.

පළමුවෙනි එක සැමට ප්‍රතිලාභ. ඉතිහාසයේ හැමදාම අසාධාරණයට ලක් වුණු මේ රට ගොඩනගපු, මේ රට කර තියාගෙන ගිය, මේ රටේ වැඩ කරපු ජනතාව, මේ රටට ආදරය කරපු ජනතාව බලා ගැනීම සඳහා වන අය වැයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. රට ගොඩනැගෙන ප්‍රමාණයට සාපේක්ෂව ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදිලා යන වැඩ පිළිවෙළක් තමයි අපි මේ අය වැය තුළින් ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේක ඉලක්කම් හරඹයක් පමණක් නොවෙයි.

ඊළඟ එක තමයි අපනයන විවිධාංගීකරණය. අපේ රට ගොඩනගන්න නම්, අපේ රට ඉස්සරහට අරගෙන යන්න නම් සහතික වශයෙන්ම අපේ රටේ ආදායම වැඩි කරන්න ඕනෑ. ආදායම වැඩි කරන්න නම් නිෂ්පාදනය විවිධාංගීකරණය කරලා ජනතාවට මේ නිෂ්පාදන ක්ෂේත්‍රයට ඇතුළුවීම සඳහා අවශ්‍ය පහසුකම් ටික, වැඩ පිළිවෙළ සලසන්න ඕනෑ, සැලසුම හදන්න ඕනෑ. අන්න ඒ අරමුණ සහිතව පෙළ ගස්සපු අය වැයක් තමයි අපි මේ 2026 වසර සඳහා ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඊළඟ එක තමයි ණය තිරසරකරණය. නහර පුප්පගෙන කෑ ගහපු මේ මහත්තුරු හැම දාම කරපු ප්‍රධානම දේ තමයි, ණය අරගෙන අය වැය ඉදිරිපත් කරලා රට පවත්වාගෙන ගිය එක. එක්කෝ චිකිණිල්ල හරහා හොයාගත්ත මුදලකින් වියදම ආවරණය කරගත්තා. එහෙම නැත්නම් ණයක් අරගෙන වියදම ආවරණය කරගත්තා, රටේ අය වැය පියවන්න. නමුත් අපි එතැනින් එහාට ගිහිල්ලා මේ රටේ ආදායම වැඩි කරන ගමන් ණය ගන්නවා. ගන්න ණය සැලැස්මක් ඇතුළේ වියදම් කරනවා. අන්න එහෙම වෙච්ච ණය තිරසරකරණයට පොළඹවපු අය වැයක් තමයි 2026 වසර සඳහා අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. එවැනි උපාය මාර්ග සැලැස්මක් ඇතුළේ ණය තිරසරකරණය අරමුණු කරගත්ත අය වැයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

ඊළඟ අරමුණ තමයි නිෂ්පාදන ආර්ථිකය වර්ධනය කිරීම. අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් විශාල ප්‍රමාණයක් රට පුරා විසිරිලා සිටිනවා. ඒ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සියලුදෙනා විනාශ කරපු අතීතයක් තමයි අපි හඳුනාගෙන තිබුණේ. දවසින් දවස, දවසින් දවස මේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ සිට මහා පරිමාණ කර්මාන්තකරුවන් දක්වා සියලුදෙනාගේ දේපළ වෙන්දේසි කරන තැනට තමයි මේ මහත්තුරු මේ රට ගෙනැල්ලා තිබුණේ. නමුත් ඔවුන් සඳහා වැඩ පිළිවෙළක් සහිතව තමයි මේ අය වැය අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේක ඒ වෙනුවෙන් ඉදිරිපත් කරපු අය වැයක්, මේ රටේ නිෂ්පාදන ආර්ථිකය නඟා සිටුවන අය වැයක්.

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

ඒ වාගේම, මෙය දිළිඳු බව තුරන් කිරීම සඳහා දැවැන්ත සැලැස්මක් ඇතුළේ පෙළ ගස්වපු අය වැයක්. මෙතෙක් මේ රටේ දිළිඳුකම තුරන් කරනවා කියලා කිව්වාට, මෙතෙක් මේ රටේ දිළිඳුකම නතර කරනවා, අවසන් කරනවා කියලා කිව්වාට හැම දාම කළේ සහනාධාර බෙදපු එක. සහනාධාර බෙදලා සහනාධාර හරහා ජනතාව රවට්ටලා ඒ ජනතාවගේ ඡන්ද ටික අරගෙන බලය රැක ගැනීම තමයි ඔවුන්ගේ අරමුණ බවට පත් වුණේ. දිළිඳුකම තුරන් කිරීම සඳහා, පිටුදැකීම සඳහා වන සැලැස්මක් හදාගන්න අසමත් වුණු පාලකයන් තමයි අපි පසුගිය කාලයේ දැක්කේ. ඒ වෙනුවට මේ අය වැයෙන් අපි අරමුණු කරනවා, ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීම සඳහා වන සැලසුම්සහගත වැඩ පිළිවෙළක් නිෂ්පාදන ආර්ථිකය ගොඩනැඟීම හරහා ඇති කරන්න. අන්න එහෙම අරමුණු කරගත්ත අය වැයක් තමයි අපි මේ 2026ට ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඒ වාගේම තමයි ඩිජිටල්කරණය. මේ රටේ වංචාව, දූෂණය නතර කිරීමේ සිට, මේ රට නව ලෝකයට ගැළපෙන ලෙස වෙනස් කිරීම සඳහා වන දැවැන්ත සැලැස්මක් සහිත ඩිජිටල් වැඩ පිළිවෙළක් අරමුණු කරගත්තු, ඩිජිටල්කරණය අරමුණු කරගත්තු, නවීකරණය අරමුණු කරගත්තු වැඩ පිළිවෙළක්, උපාය මාර්ගික සැලසුමක් එක්ක තමයි අපි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා මේ අය වැය කියවාගන්න ඕනෑ මෙන්න මේ උපායමාර්ගික සැලසුම් එක්ක මිසක්, මේකේ තිබෙන ඉලක්කම් දිහා බලලා නොවෙයි. හැබැයි, ගරු ජනාධිපතිතුමා පසුගිය 7වැනි දා මේ අය වැය ඉදිරිපත් කරපු දවසේ ඉඳන් අද දක්වා, විපක්ෂයේ ඉන්න ආර්ථික ඔස්තාර්ලාගේ සිට මේ කථා කරන අනෙක් අය දක්වා ඒ සියලුදෙනාම කථා කළේ මේකේ තිබෙන ඉලක්කම් ගැන. අය වැයක් කියන්නේ ඉලක්කම් පමණක් නොවෙයි. ඒකේ තිබෙනවා මහා සැලැස්මක්, මහා දැක්මක්, මහා වැඩ පිළිවෙළක්. අවාසනාවකට ඒ අය, ඒ අයගේ අය වැය ඇතුළේ දැක්කේ ඉලක්කම් පමණයි. ඒ නිසා තමයි ඒ අයට මේ රට ගොඩනැඟීම සඳහා සැලැස්මක් හදාගන්න බැරි වුණේ. මෙය එහෙම අරමුණු ඇති අය වැයක්. ඒ අය වැය තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ, 2026 වසර සඳහා. නමුත් විපක්ෂය තවමත් අසමත් වෙලා තිබෙනවා, මේ අය වැය කියවාගන්න. ඒ නිසා අපි කියනවා, මේ අය වැයේ අකුරු කියවලා, ඉලක්කම් කියවලා තේරුම් ගන්නවාට වැඩිය එහාට ගිහිල්ලා, අය වැයක් යනු කුමක්ද යන්න ඔළුවේ තබාගෙන කියෙව්වොත් හොඳටම ඒක තේරුම් ගන්න පුළුවන්, හොඳ සාකච්ඡාවක්, හොඳ විවාදයක් අපට මේ පාර්ලිමේන්තුවේ කරගන්න පුළුවන් කියලා.

අපි යෝජනාවක් කරනවා. ලබන 15වැනි දා පටන් ගන්නවා, අය වැය කාරක සභා අවස්ථාව; අමාත්‍යාංශවල අය වැය කථා කරන අවස්ථාව. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි කියනවා, පුළුවන් නම් මෙතැනින් එහාටවත් මේ අය වැය පිළිබඳව තේරුම් අරගෙන, මේ අය වැයෙන් ඉදිරිපත් කරපු අරමුණු තේරුම් අරගෙන, සැලසුම් තේරුම් අරගෙන සාකච්ඡාවට, විවාදයට එන්න කියලා. එහෙම වුණොත් මෙය සාධනීය විවාදයක් බවට පත් කර ගන්න පුළුවන් වේවි කියලා අපි විශ්වාස කරනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරුන් කථා කරද්දී හැම විටම වාගේ අපට මතු කරපු ප්‍රශ්නය තමයි, "ඔයගොල්ලන් මොනවද කළේ" කියන එක. "මේ ආණ්ඩුව පත් වුණා, 2024දී. ඔයගොල්ලන් මොනවාද කළේ. මොකුත් කළේ නැහැ" කියලා තමයි විපක්ෂයේ ඔබතුමන්ලා කියන්නේ. අප මොනවාද කළේ, ඔබතුමන්ලා මොනවාද නොකළේ කියන එකට උදාහරණ කිපයක් මම කියන්නම්. ඔබතුමන්ලා 2019දී නතර කරපු, කටුනායක ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීමේ දෙවන අදියරේ වැඩ ආරම්භ කරන්න අපි දැන් කටයුතු කර තිබෙනවා. JICA ආයතනයත් එක්ක සාකච්ඡා කරලා එහි වැඩ පටන් ගන්න සැලසුම් කරලා තිබෙනවා. ඔබතුමන්ලා 2019 - 2021 නතර කරපු මධ්‍යම අධිවේගී මාර්ගයේ වැඩ අපි පටන් ගෙන තිබෙනවා. මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමුවෙනි අදියරේ, එනම් කඩවත සිට මීරිගම දක්වා කොටසේ වැඩ අපි දැන් පටන්ගෙන තිබෙනවා. එතැනිනුත් එහාට ගිහිල්ලා මධ්‍යම අධිවේගී මාර්ගයේ තුන්වන අදියරේ, එනම් පොතුහැර සිට ගලගෙදර දක්වා වන කොටස සඳහා වන මූලික කටයුතු සූදානම් කරමින් තිබෙනවා. එතැනිනුත් එහාට ගිහිල්ලා යෝජිත කුරුණෑගල-දඹුල්ල අධිවේගී මාර්ගය සඳහා වන මූලික සැලසුම අපි සකස් කරමින් තිබෙනවා. එතැනිනුත් එහාට ගිහිල්ලා රුවන්පුර අධිවේගී මාර්ගය ආරම්භ කිරීම සඳහා වන මූලික සැලසුම ද අපි පටන් ගෙන තිබෙනවා. මම මේ කථා කරන්නේ, ඔබතුමන්ලා නතර කරපු ව්‍යාපෘති අතරින් අපි ආයෙත් පටන් ගත්තු ඒවා ගැනයි.

සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව ගත්තොත්, ඔබතුමන්ලා හෘද කැතීටරීකරණ ඒකක 5ක් ආරම්භ කරලා, 2021දී නතර කළා. ඒ 5ම අපි පටන් ගන්නවා. අනුරාධපුර මහ රෝහල, කුරුණෑගල මහ රෝහල, මහනුවර මහ රෝහල, බදුල්ල මහ රෝහල, ත්‍රිකුණාමලය මහ රෝහල තුළ හෘද කැතීටරීකරණ ඒකක 5ක් පටන් ගන්නවා. ඒ වෙනුවෙන් අපි - රුපියල් බිලියන 20කට අදාළව - JICA ආයතනය එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. 2019දී ඔබතුමන්ලා නතර කරපු වැඩ අපි දැන් පටන්ගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, රාජ්‍ය සේවයට බඳවා ගැනීම් ඔබතුමන්ලා නතර කළා. රෝහල් පද්ධතිය කඩාගෙන වැටුණා. 2019 - 2020 කාලයේදී NTS එකට උසස් පෙළ සමතුන් බඳවා ගැනීමත් නතර කළා. එතැනින් පසුව බඳවා ගත්තේ නැහැ. මේ වනකොට අපේ ආණ්ඩුව සම්මුඛ පරීක්ෂණ කරගෙන යනවා, 2020, 2021, 2022 උසස් පෙළ විභාගයට පෙනී සිටි අයගෙන්. හෙද සේවය සඳහා 2,665ක් බඳවා ගැනීම සඳහා වන මූලික කටයුතු අපි ආරම්භ කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
මට තවත් පොඩි කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

2021දී බඳවා ගැනීම් නතර කරන ලද හෙද උපාධිධාරින් නැවත බඳවා ගන්න අපි සැලසුම් කර තිබෙනවා. ඒ 878 දෙනෙකුට සම්මුඛ පරීක්ෂණ පවත්වා 700ක් බඳවා ගන්න තීරණය කරලා 553 දෙනෙකු දැන් වන විට බඳවාගෙන තිබෙනවා. ඉතිරි ටිකත් බඳවා ගන්න සැලසුම් කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මා වැරදි නම් ඒ බව ඔබතුමාට කියන්න පුළුවන්.

අපි මොනවාද කළේ කියලා ඇහුවා නේ. ඔබතුමන්ලා නතර කරලා තිබුණු, අප පටන් ගත්තු ඒවා ගැනයි මම කිව්වේ. මීට අමතරව, ගොඩක් ඒවා අපි පටන් ගෙන තිබෙනවා. ඔබතුමන්ලා 2019දී නවතා දමන ලද හෙද සොහොයුරියන්ගේ උසස්වීම් සඳහා 516ක් බඳවා ගැනීමට අපි සැලසුම් කර තිබෙනවා; සම්මුඛ පරීක්ෂණ අවසන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා 2012 - 2014 කාලයේ පටන් අරගෙන අත්හැර දමන ලද සෞඛ්‍ය ව්‍යාපෘති 40ක් වෙනුවෙන් අපි රුපියල් බිලියන 45ක් 2025 වසරේ වෙන් කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
මම කථාව ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

2026 වසරේ තවත් ව්‍යාපෘති 45ක් අපි අවසන් කරනවා. 2026 වසර අවසන් වනකොට රුපියල් බිලියන 100ක ව්‍යාපෘති, එනම් ඔබතුමන්ලා නතර කරපු ව්‍යාපෘති ආරම්භ කරන්න අපි පටන් ගෙන තිබෙනවා. තවත් කියන්න දේවල් තිබෙනවා. මට වෙලාව මදි නිසා කියන්න විධියක් නැහැ. ඔබතුමන්ලා නතර කරලා - අත්හැර දමලා- අප පටන් ගත්තු ව්‍යාපෘතිවලට අමතරව අප අලුතින් පටන් ගත්තු ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ අතර රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩි කිරීම, වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම, ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම, කෘෂි කර්මාන්තයට, කර්මාන්ත ක්ෂේත්‍රයට කරපු දේවල් කියනවා නම් දවසක් පුරා කියන්න තරම් කාරණා තිබෙනවා. එහෙම නම්, විපක්ෂයට මම කියනවා, අදවත් ගෙදර ගිහිල්ලා පුළුවන් නම් මේ අය වැය කියවලා මේ අය වැය ඇතුළේ තිබෙන හරය තේරුම් අරගෙන මේ 15වැනිදායින් පටන් ගන්නා අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයට සූදානම් වෙලා එන්න කියලා. දැන් අපට වෙලා තිබෙන්නේ විවාදයට කරුණු නැති නිසා එකම කරුණු ටික හැම දාම අප හැම කෙනාටම කියන්න සිදු වීමයි. පුළුවන් නම් ඔබතුමන්ලා මේ අය වැයේ තිබෙන, අපට එරෙහි කරුණක් දෙකක්, අපට අභියෝග කරන්න පුළුවන් කරුණක් දෙකක් සොයාගෙන එන්න. එහෙම වුණොත් ඔබතුමන්ලා එක්ක අපට විවාදයක් තිබෙනවා. නමුත්, දැන් අපට වෙලා තිබෙන්නේ මොකක්ද? ආණ්ඩුවට විපක්ෂය එක්ක විවාදයක් නැති වීමයි.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.26]

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අප රජය බලයට පත් වෙලා වසරක් ගෙවෙන මේ මොහොතේ 2026 වර්ෂය සඳහා වන අය වැය දෙවන වර කියවීමේ විවාදයේදී වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න ලැබීම මා ඉමහත් සතුටක් කොට සලකනවා.

අද මෙම ගරු සභාවේ විපක්ෂයේ සුළු පිරිසකට සීමා වෙලා සිටින මේ ගරු මන්ත්‍රීවරුන් දෙස බලන කොට, පසුගිය කාලයේ ඔබතුමන්ලා දේශපාලන වේදිකාවේ හඬ නඟපු විධිය අපට මතක් වෙනවා. පසුගිය කාලයේ ඔබතුමන්ලා අපට විවාදවලට ආරාධනා කළා මට මතකයි. එදා ඔබතුමන්ලා ජනතාව ඉදිරියේ ඉතාම වැරදි ආකාරයෙන් විවිධ ප්‍රකාශ කරමින් ඇහුවා, මාලිමාවේ ආර්ථික model එක මොකක්ද කියලා. මාලිමාවට රට හදන ආර්ථික model එකක් නැහැ කියන කරුණ තමයි ඔබතුමන්ලා ජනතාවට එත්තු ගන්වන්න උත්සාහ කළේ. නමුත් අපේ ආණ්ඩුව බලයට පත් වෙලා හරියටම වසරක් ගෙවෙන මේ මොහොතේ ඒ ප්‍රශ්නයට පිළිතුරු මේ ගරු සභාවෙන්ම ලැබීම ගැන අපි සතුටු වෙනවා. මහා භාණ්ඩාගාරය උතුරන්න සල්ලි තිබෙනවා කියලා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ම මේ විවාදයේදී ප්‍රකාශ කළා. ඉතින්, ඔබතුමන්ලාගේ මුවින්ම එය ඇහෙන කොට අපට මහත් ගෞරවනීය හැඟීමක් දැනෙනවා. මේ තමයි අපේ ආර්ථික model එකේ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ආර්ථික model එක කඩදාසිවලට සීමා වෙච්ච එකක් නොවෙයි. එය ක්‍රියාවෙන් ඔප්පු කරපු එකක්. අපේ ආණ්ඩුව බලයට පත් වෙච්ච පළමුවැනි අවුරුද්ද ඇතුළත මේ රටේ මෑත ඉතිහාසයේ පළමුවැනි වතාවට අය වැය පරතරය සැලකිය යුතු මට්ටමකින් අඩු කරන්න අපි සමත් වෙලා තිබෙනවා. දේශපාලන චුවමනා මත සිදු කළ අනවශ්‍ය ණය ගැනීම් අපි zero කරලා තිබෙනවා. ඒ සියල්ල කප්පාදු කරන්න අපි සමත් වෙලා තිබෙනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් බලා සිටින්නේ අපි අසමත් වනකල්. ඔවුන් ප්‍රාර්ථනා කළේ අපට ණය ගෙවා ගන්න බැරි වෙන්න කියලා. ඉතින්, ඔවුන්ගේ ප්‍රාර්ථනා සියල්ල බොඳ කරමින් 2028 වර්ෂය වන විට විදේශීය ණය ගෙවීම ක්‍රමානුකූලව ආරම්භ කිරීමට අවශ්‍ය මූල්‍ය විනය සහ සැලැස්ම අප මේ වන කොටත් සකස් කරලා අවසන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ඉදිරිපත් කරලා තිබෙන 2026 අය වැය ඉතාම ශක්තිමත් පදනමක් මත ගොඩ නැඟුණු අය වැයක්. රජය හඳුනා ගත් ප්‍රමුඛතා ලැයිස්තුව අනුව සෞඛ්‍ය, අධ්‍යාපන, කෘෂිකර්ම, ප්‍රජා යටිතල පහසුකම්, ප්‍රවාහන ඇතුළු සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නියමිත සංවර්ධන ඉලක්ක සපුරා ගන්න මෙවර අය වැයෙන් අපි ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. කොටින්ම කියනවා නම්, මෙවර අය වැය කොළඹ හතේ ජීවත් වන දැවැන්තම ව්‍යාපාරික ප්‍රජාවගේ සිට වතුකරයේ තේ දලු නෙළන අපේ අහිංසක අම්මා, තාත්තා දක්වා සතුටු වන අය වැයක්. නමුත් කියන්න කනගාටුයි, විපක්ෂයේ ඉන්න සමහර උදවිය වතුකරයේ අහිංසක අම්මලා, තාත්තලාට අය වැයෙන් යෝජිත මුදල දෙන එක වළක්වාලමින් මේ වන විට අල්ලස් කොමිසම වෙත, විගණකාධිපතිතුමා වෙත, ප්‍රසම්පාදන කොමිසම වෙත පැමිණිලි කර තිබෙනවා. තේ දලු නෙළන ඒ අම්මලාගේ අත් දෙක දිහා බලන්න. කුඩැල්ලෝ එල්ලිලා ලේ පෙරාගෙන ගෙදර ගිහින් සවසට රොටියක් පුච්චාගෙන කන මලයගම් ජනතාව ජීවත් වන නිවාසවල ගැටලු තිබෙනවා. ඒ අයට හරි හමන් පහසුකම් නැහැ.

එහෙම ජනතාවකට මේ රජයෙන් වෙන් කරපු රුපියල් 200ක දීමනාව වෙනුවෙන් මේගොල්ලෝ තවමත් කිඹුල් කඳුළු හෙළනවා. ඔබතුමන්ලා හැමදාමත් කළේ බඩගින්නට ඒගොල්ලන්ට මාළුවෙක් දුන්නු එක. හැබැයි, ඒ මිනිස්සුගේ ආර්ථිකය ශක්තිමත් වෙන වෙලාවට හැම වෙලාවේම ඔබතුමන්ලා ඒගොල්ලන්ගේ කකුලෙන් ඇද්දා. මොකද, මැතිවරණයකදී ඔබතුමන්ලා ඒගොල්ලන් පාවිච්චි කළේ බලය ලබා ගැනීම සඳහා විතරයි. නමුත්, අපේ ආණ්ඩුව මේ රටේ ඉන්න සියලු ප්‍රජාව ආවරණය වන පරිදි තමයි, මේ අය වැය සකස් කරලා තිබෙන්නේ. මේ අය වැය ගැන කනගාටු වෙන එක ම පිරිසක් ඉන්නවා නම්, ඒ මම මුලින් සඳහන් කරපු විපක්ෂයේ ඒ සුළු පිරිස පමණයි. ඔවුන් කනගාටු වෙන්නේ ඇයි? මේ ගෙවුණු අවුරුද්දේ ප්‍රගතිය දැක්කාම, මේ රටේ සාමාන්‍ය පුරවැසියන් තුළ ගොඩනැඟී තිබෙන යහපත් ආකල්ප, ධනාත්මක ප්‍රතිචාර දැක්කාම, විපක්ෂය දන්නවා නැවත කිසිම දවසක ආණ්ඩු පක්ෂයේ ඉඳලා අය වැයක් ඉදිරිපත් කරන්න අවස්ථාවක් හිමි වෙන්නේ නැහැ කියලා.

අපි මේ වෙනස ඇති කළේ කොහොමද කියලා අපි කියන්නම්. අපි මේ ජයග්‍රහණ ලබා ගත්තේ, value system එකක් හරහා.

[ගරු ඔෂානි උමංගා මහත්මිය]

එහෙමත් නැත්නම් වටිනාකම් පද්ධතියක් හරහා. හොරකම් නොකරන, වංචා නොකරන, අවංකව මේ රට ගොඩ ගැනීමේ සැබෑ වුවමනාවක් තිබෙන, ඒ වාගේම අත්දැකීම් තුළින් නිරන්තරයෙන් වඩාත් නිවැරැදි වෙන, දැඩි මූල්‍ය විනයක් සහ වටිනාකම් පද්ධතියක් යටතේ හැදිලා වැඩිලා, පෝෂණය වෙච්ච මාලිමාව නියෝජනය කරන අපි, මේ ඉදිරිපත් කළ අය වැය තුළින් ගමත්, නගරයත් එකට අත්වැල් බැඳගෙන සංවර්ධන ඉලක්ක කරා ජයග්‍රාහීව මේ රට ගෙන යන බවට කිසිදු සැකයක් නැහැ. මේ ගමන යන්නට අපේ රටේ ජනතාව විතරක් නොවෙයි, ලෝකය පුරාම විහිදී සිටින අපේ ජනතාව අපට ආශිර්වාද කරනවා. ඒ නිසා ඔබට ඒ පිළිබඳව දුකක් ඇති. නමුත්, අපි බලාපොරොත්තු වෙනවා, මේක ඉතාම සාධාරණ, හොඳ අය වැයක් නිසා මෙවර අය වැයට ඔබේ සහයෝගය ලබා දෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් අහනවා, one million rupeesවලින් ගෙයක් හදන්නේ කොහොමද කියලා. ඔබට one million rupees කියන්නේ මුදලේ වටිනාකම විතරක් වෙන්න ඇති. හැබැයි, ඒ ගෙය ලබා ගන්නා පුද්ගලයාට one million rupees කියන්නේ විශාල දෙයක්. ඒ ගෙය හදන්න ඒ ගමේ මුළු ප්‍රජාවම එකතු වෙනවා. ගමක් සාමූහිකව එකතු වෙලා ඉතාම ආදරයෙන්, ගෞරවයෙන්, සාමූහික හැඟීමෙන් ඒ කටයුත්ත කරන්නේ. අපි අත්දැකීමෙන් ඒක දැක්කා. කළුතර දිස්ත්‍රික්කයේ අපි මේ වෙනකොට ගෙවල් 230ක් විතර හදලා ඉවරයි. ඔබතුමන්ලාගේ පාලන කාලයේ මිනිස්සුන්ට දී ගන්න බැරි වුණු දේවල් තමයි, අපි මේ කරමින් යන්නේ. කුඩාරම්වල ඉඳපු අම්මලා තාත්තලාට, ගැහැනු දරුවන් එක්ක කුඩාරම් ඇතුළේ තනි වෙලා, ජීවත් වෙන්න විධියක් නැතුව හිටපු මිනිස්සුන්ට අපි මේ නිවාස ලබා දුන්නා. තවත් මන්ත්‍රීවරුන් අහනවා, ගැහැනු එක මිටට එකතු කළා, කෝ, එයාලා සවිබලගැන්වූවාද කියලා. අපි කියන්න කැමැතියි, ගැහැනු එක මිටට එකතු කරලා, මේ රටේ දැවැන්ත දේශපාලන පරිවර්තනයක් කරන්න, මාලිමා ආණ්ඩුව විධියට අපි සමත් වෙලා තිබෙන බව. ඒ පරිවර්තනය වාගේම, අපි ඔවුන් සවිබලගන්වන්න මේ වෙනකොට රුපියල් මිලියන 440ක් වෙන් කරලා තිබෙනවා. ඊට අමතරව, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය හරහා, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය හරහා, ප්‍රජාශක්ති ජාතික වැඩසටහන හරහා ගම දියුණු කරන්න, කාන්තාවන් සවිබලගන්වන්න අපි ජාතික වැඩ පිළිවෙළක් සකස් කර අවසන්.

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලාට විරුද්ධ වෙන්න තරම් කිසිදු හානිදායක අය වැයක් නොවෙයි මේ අය වැය. මේක මේ රටේ සිටින ආන්තික කොටස් දිහාත් බලලා, මේ රටේ සියලු ජන කණ්ඩායම් නියෝජනය වන පරිදි හදපු අය වැයක්. මේක මේ රටේ ජනතාවට ඉතා සුව පහසු ජීවිත ළඟා කර දීලා, අපේ රට පොහොසත් රටක් කරා ගෙන යෑම වෙනුවෙන් හදපු අය වැයක්. අපි බලාපොරොත්තු වෙනවා, විපක්ෂයේ ඉන්න මේ පුංචි කණ්ඩායම වුණත්, ඔබ මේ අය වැයට සහයෝගය ලබා දෙයි කියලා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[පි.ව. 3.36]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வரவு செலவுத்திட்டம் என்பது ஒரு நாட்டின் பொருளாதாரக் கொள்கையை வெளிப்படுத்துகின்ற ஓர் ஆவணமாகும். அதாவது, policy document. இதன்மூலம் ஒரு நாட்டிலுள்ள மக்கள் சமூகம், தங்களுக்கு எந்தெந்த வகையில் நன்மை மற்றும் தீமை கிடைக்கப் போகின்றது என்பதைத் தெரிந்து கொள்வதற்குச் சந்தர்ப்பம் கிடைக்கின்றது. விசேஷமாக, எல்லா சமூகங்களிலும் உள்ளவர்கள் எதிர்பார்க்கின்ற ஒரு விஷயம்தான், வரவு செலவுத்திட்டத்தில் தங்கள் சமூகத்துக்கு அல்லது தாங்கள் சார்ந்த வியாபாரத்துக்கு அல்லது பொருளாதாரத்தை அபிவிருத்தி செய்வதற்கு என்னென்ன வகையில் நன்மைகளைப் பெற்றுக்கொள்ளப் போகின்றோம் என்பது. அந்த வகையில், பெருந்தோட்ட மக்களும் இந்த வரவு செலவுத்திட்டத்தை மிகவும் ஆவலுடன் உன்னிப்பாகக் கவனித்துக்கொண்டு இருக்கின்ற வேளையில், மாண்புமிகு சனாதிபதி அவர்களுடைய சம்பள அதிகரிப்புத் தொடர்பான அறிவிப்பானது அவர்களுக்கு சந்தோசத்தைக் கொடுத்திருக்கிறது.

பெருந்தோட்ட மக்களுக்கு Budgetஇல் 200 ரூபாய் சம்பளம் அதிகரிக்கப்பட்டு இருப்பது இதுதான் வரலாற்றில் முதலாவது சந்தர்ப்பமென நான் நினைக்கின்றேன். அதற்காக மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு இந்த நேரத்தில் எங்களுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம். இந்த நாட்டில் மிகவும் பின்தங்கிய சமூகமாக இருக்கின்ற பெருந்தோட்ட சமூகத்தைப் பற்றி இன்று NPPஐச் சேர்ந்த அதிக உறுப்பினர்கள் பேசினார்கள். அவர்களுக்கு அச்சமூகத் தினர்மீது மிகுந்த அக்கறையும் அனுதாபமும் இருப்பதை அவதானிக்கக்கூடியதாக இருந்தது. தற்பொழுது, இச்சபையில் கௌரவ அமைச்சர் (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் அவர்கள் இருக்கிறார். அவருக்கு இது நன்றாக விளங்குமென நான் நினைக்கின்றேன்.

සියලුදෙනාටම අනුකම්පාවක් දක්වලා තිබෙනවා. හැබැයි, මේ අනුකම්පාව සාර්ථක එකක් කරන්න ඕනෑ. ඒක ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමාට කියන්න. මේක අනිවාර්යයෙන්ම කරන්න කියලා එතුමාට කියන්න. එතුමා පොරොන්දු වෙලා තිබෙනවා, වතු සේවකයන්ගේ දෛනික වැටුපට කොම්පැනිවලින් අමතරව රුපියල් 200ක් දෙන්නත්, අනෙක් රුපියල් 200 ආණ්ඩුවෙන් ලබා දෙන්නත්. ආණ්ඩුව දෙන්න හදන රුපියල් 200ට සමහර උදවිය විරුද්ධ වෙනවා. *[බාධා කිරීමක්]* ඒක තමයි, ඒකට අපි එකඟ නැහැ. අපේ ජනතාවට හම්බ වෙන යම්කිසි දෙයක් වෙනුවෙන් කවුරු හරි විරුද්ධ වෙනවා නම්, ඒකට විරුද්ධව කවුරු හරි කථා කරනවා නම් අපි ඒකට කැමැති නැහැ. අපි ඒක කියන්න ඕනෑ නේ. ඒ ජනතාව වෙනුවෙන් තමයි අපි මෙතැනට ආවේ. ඒ ජනතාවගේ ඡන්දයෙන් තමයි අපි මෙතැනට එවලා තිබෙන්නේ. ඒ ජනතාවට යම්කිසි හානියක් වෙනවා නම් අපි ඒකට විරුද්ධයි. *[බාධා කිරීමක්]* සමහර විට ඔයගොල්ලන් ඡන්දය දෙන්නත් පුළුවන්. ඒක හෙට තීරණය කරන්න ඕනෑ. නමුත්, මාසයකට දවස් 25ක් වැඩට ගියාම තමයි ඒ පඩිය දෙන්නේ කිව්වා නම් ඒක වැරදියි. ඒකට අපේ අනුමැතිය නැහැ. *[බාධා කිරීමක්]* දැන් කොන්දේසියක් තිබෙනවා, වතු කම්කරුවන් මාසයකට දවස් 25ක් වැඩට එන්න ඕනෑ කියලා; නැත්නම් වැඩ දෙන්න ඕනෑ කියලා. නමුත්, සමහර කොම්පැනිවලින් දවස් 20ක් දෙනවා. ඊට පස්සේ දවස් 25ක් වැඩ කළේ නැහැ, දවස් 20යි වැඩ කළේ කියලා ඒගොල්ලන්ගේ පඩි කපන්න හොඳ නැහැ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, මෙහෙමයි,-

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කාලයෙන් එතුමාට අවස්ථාව දෙන්න එපා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, නැහැ. ඔබතුමාගේ වෙලාව මම ගන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් දක්වපු අදහස නිසායි මම කියන්නේ. මේක හරි පැහැදිලියි. මේ වතු කම්කරුවන්ගේ වැටුප සම්බන්ධයෙන් විවිධ විධියට පටලවන්න හදනවා නේ, ගරු මන්ත්‍රීතුමා. මේක පටලවන්න හැදුවාට මෙකේ ඇත්ත කථාව මේකයි. වතු හාම්පුතුන් එකඟ වුණා, රුපියල් 200ක් basic salary එකට එකතු කරන්න. රජය තවත් රුපියල් 200ක් පැමිණීමේ දිරි දීමනාවක් ලෙස දෙන්න එකඟ වුණා. එතකොට ඒ රුපියල් 200 පැමිණීමේ දිරි දීමනාවක් ලෙස දෙනවා. එතකොට ඒ පැමිණීම දිරිගන්වන්න අන්න, ඒකට අපි යෝජනා කර තිබෙනවා, අවම *[බාධා කිරීමක්]* ඒක තමයි මම මේ කියන්නේ. දවස් 15ක්වත් වැඩට එනවා නම් දෙන්න කියන එක තමයි හාම්පුතුන් කියන්නේ. අපි කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, අහගන්න. ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියන එක ඔබතුමා අහගන්නේ නැහැ නේ. කට්ටිය පටලවන්න හැදුවාට ඔබතුමා පැටලෙන්න එපා. කට්ටිය පටලවන්න හදනවා. ඒක නේ මේ Bribery Commission එකටත් යන්නේ. අපි කියලා තිබෙන්නේ දවසක් වැඩට ආවොත්, රුපියල් 200ක් දෙනවා කියලා. හැබැයි, රස්සාවට ආවාම දින 14න්, 14ට පඩි ගෙවනවා. දින 14න්, 14ට පඩි ගෙවද්දී අඩුම තරමින් ඒ කම්කරුවන්ට දින 8ක්වත් වැඩ දෙන්න ඕනෑ. මාසයකට දින 8ක්වත් වැඩ දුන්නේ නැත්නම් එතැන රස්සාවෙන් වැඩක් නැහැ නේ. ඒ නිසා අපි කියලා තිබෙන්නේ දින 25ම වැඩ දෙන්න කියලා. හැබැයි, ඒගොල්ලන් දවසක් වැඩට ආවත්, දවසේ පඩියට ඒ රුපියල් 200 එකතු කරලා දෙන්න ඕනෑ. ඒක තමයි අපේ කොන්දේසිය.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
කුඩා තේ වතු හිමියන්ටත් ඒක හිමි වෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ඒක එතුමා පැහැදිලි කරාවි. මගේ වෙලාව අඩු කරන්න එපා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මේක විවාදයක් බවට පත් කර ගන්නේ නැතිව කථාව කරගෙන යන්න.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
හොඳයි.

தோட்டத்தொழிலாளர்கள் ஒரு நாள் வேலைக்குச் சென்றாலும், அவர்களுக்கு 200 ரூபாய் ஊக்குவிப்புக் கொடுப்பனவு கட்டாயம் வழங்கப்பட வேண்டுமெனவும் அதற்கு அரசாங்கம் உத்தரவாதம் அளிக்க வேண்டுமெனவும் நான் இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கடந்த கால ஆட்சியில் - அதாவது, கொவிட் தொற்று மற்றும் கோட்டாபயவின் ஆட்சிக்குப் பிறகு - இந்த நாட்டின் பொருளாதார வளர்ச்சி -7ஆகக் குறைவடைந்து இருந்தது. தற்போதைய அரசாங்கம் அதனை +4ஆக அதிகரித்திருக்கிறது. இது நல்ல விஷயம்! ஆகவே, நாங்கள் இதனைப் பாராட்டுகின்றோம்.

அடுத்து, ஹட்டன் நகரில் நிலவும் போக்குவரத்து நெரிசலைக் குறைப்பதற்காக இந்த வரவு செலவுத்திட்டத்தில் 500 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருக்கிறது. இதேபோல், நாங்களும் எங்களுடைய ஆட்சிக் காலத்தில் கொடுத்திருந்தோம். இல்லையென்று சொல்ல முடியாது. "நாங்கள்தான் road போட்டோம்" என்று நீங்கள் சொல்ல முடியாது. ராஜபக்ஷவும் road போட்டார்; கோட்டாபயவும் road போட்டார்; சந்திரிக்காவும் road போட்டார்; எல்லோரும் road போட்டார்கள். நீங்களும் road போடுகின்றீர்கள். மிகவும் நல்லது! ඔබතුමන්ලා දැන් හැමතැනම පාරවල් හදනවා. අපි ඒකට කැමැතියි. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ අමාත්‍යාංශයට අදාළ කාරක සභා අවස්ථාව එනකොට මම මගේ ප්‍රශ්නය ගැන කථා කරන්නම්. ඔබතුමාගේ වැය ශීර්ෂයට ඡන්දය දෙනවාද, නැද්ද කියලා මම එතකොට තීරණය කරනවා. *[බාධා කිරීමක්]* හරි, හරි. මම ඒකට එකඟයි.

Social justice, social welfare என இரண்டு விடயங்கள் இருக்கின்றன. Social justice என்பது சமூக நீதி! இந்த நாட்டில் சமூக நீதி இருக்க வேண்டும். அது எல்லோருக்கும் ஒரே மாதிரியாக இருக்க வேண்டும். அது ஏழைக்கு ஒரு விதமாகவும் பணக்காரனுக்கு இன்னொரு விதமாகவும் ஒரு சாதியினருக்கு ஒரு விதமாகவும் இன்னொரு சாதியினருக்கு இன்னொரு விதமாகவும் இருக்கக் கூடாது. சிங்களவர்களாக இருந்தாலும் சரி, தமிழர்களாக இருந்தாலும் சரி, முஸ்லிம்களாக இருந்தாலும் சரி, கிறிஸ்தவர்களாக இருந்தாலும் சரி, எல்லோருக்கும் ஒரே விதமாக சமூக நீதி இருக்க வேண்டும் என்றுதான் நாம் எதிர்பார்க்கின்றோம். அடுத்தது, social welfare எனப்படும் சமூக நலன்! ஏழை, பணக்காரன் என்ற வித்தியாசம் இல்லாமல், தாழ்த்தப்பட்ட மக்களுக்கும் எல்லாச் சலுகைகளும் சென்றடையக்கூடிய வகையில் வசதி வாய்ப்புகள் செய்து கொடுக்கப்படல் வேண்டும். அதாவது, இந்த நாட்டில் வறுமையைக் குறைக்க வேண்டும். பொருளாதாரத்தை அபிவிருத்தி செய்வதற்கு உற்பத்தியை அதிகரிக்க வேண்டும். நாங்கள் எந்த நாளும் இந்த நாட்டில் எதிர்பார்ப்பது, வெளிநாட்டிலிருந்து பொருட்களை இறக்குமதி செய்து மக்களைச் சந்தோசப்படுத்த வேண்டும் என்றுதான். அதற்கு மாறாக, உள்ளூரில் உற்பத்திகளை மேற்கொண்டு, வருமானத்தைப் பெருக்கி, செலவுகளைக் குறைத்து, அதன்மூலம் நல்ல விஷயங்களைச் செய்வதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டும் என்பதுதான் என்னுடைய கருத்தாக இருக்கின்றது.

நீங்கள் இப்பொழுது சொல்கிறீர்கள், "வளமான நாடு - அழகான வாழ்க்கை" என்று. சந்தோஷம்! இவற்றை எல்லாம் செய்வதற்கு இந்த நாட்டின் வருமானம் அதிகரிக்கப்படல் வேண்டும். இலங்கையானது உலகில் மிக முக்கியமானதொரு நாடு! இது ஒரு தீவாக இருக்கின்றபொழுதிலும், எல்லா வளங்களும் இருக்கின்றன. "என்ன வளம் இல்லை இந்தத் திரு நாட்டில், ஏன் கையை ஏந்துகிறாய் வெளிநாட்டில் ..." என்பதற்கு இணங்க, எங்களுடைய நாட்டிலுள்ள வளங்களை வைத்து நாம் நிறைய அபிவிருத்திகளைச் செய்யலாம். Tourismக்கு மிகச் சிறந்த நாடு எமது இலங்கை! இந்த நாட்டில் tourismஐ அபிவிருத்தி செய்வதற்கான நடவடிக்கைகளை இந்த அரசாங்கம் முன்னெடுத்து வருகின்றது. இன்றைக்கு இந்த

[ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා]

நாடு tourism மூலமாகத்தான் அதிக வருமானத்தை ஈட்டி வருகின்றது.

அதற்குப் பக்கபலமாக இன்று இந்தியா இருக்கின்றது. இன்று இந்தியா உலகில் நான்காவது வல்லரசு நாடாக இருக்கின்றது; எங்களுடைய அயல் நாடாக இருக்கின்றது. எங்களுக்கு ஆபத்து ஏற்படும்போது உதவி செய்கின்ற நாடாகவும் இருக்கின்றது. அவ்வாறான ஒரு நாட்டுக்குப் பக்கத்தில் இருக்கின்ற இலங்கையானது, வெகு சீக்கிரமாக முன்னேற வேண்டும் என்பது எங்களுடைய எதிர்பார்ப்பாக இருக்கின்றது. தற்போது ஆட்சிக்கு வந்திருக்கின்ற அரசாங்கம் ஊழல், மோசடி போன்றவற்றை ஒழிப்பதற்கான நடவடிக்கைகளை எடுத்து வருகின்றது. நல்ல விஷயம்! பாராட்ட வேண்டும். அண்மையில் நான் இந்தியாவுக்குச் சென்றிருந்தேன். அப்போது என்னிடம் ஒருவர் சொன்னார், "இப்பொழுது உங்களுடைய நாட்டில் சனாதிபதி ஊழலை ஒழிக்கிறார். அதேபோல், எங்களுக்கும் ஓர் ஆள் இருந்தால் நல்லது" என்று. அப்பொழுது நான் சென்னேன், ஊழலை ஒழிப்பது நல்லதுதான் என்று. ஊழலை ஒழிப்பதற்கு இந்த நாட்டிலுள்ள அதிகாரிகளிடமிருந்து ஒத்துழைப்புக் கிடைக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

எமது நாட்டில் இன்னுமொரு முக்கியமான பிரச்சினை இருக்கின்றது. இந்த நாட்டில் 2009ஆம் ஆண்டு யுத்தம் முடிவடைந்தது உங்கள் எல்லோருக்கும் தெரியும்! யுத்தம் முடிவடைந்தவுடன், அப்பொழுது சனாதிபதியாக இருந்த மஹிந்த ராஜபக்ஷ அவர்கள் இந்த நாட்டின் அரசராக அல்லது தெய்வமாகக் கருதப்பட்டார். அந்த நேரத்தில் அவர், இதைத்தான் தமிழ் மக்களுக்குத் தீர்வாகக் கொடுக்க வேண்டுமென ஏதாவது ஒரு தீர்வைக் கொண்டுவந்து இருந்தால், நிச்சயமாக அந்தத் தீர்வை சிங்கள மக்கள் ஏற்றிருப்பார்கள். ஆனால், இன்றைக்கு அதனை ஏற்றுக் கொள்வார்களா என்று தெரியவில்லை. எனினும், அவர் அந்த நேரத்தில் அதைச் செய்யவில்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
නැහැ, මට විනාඩි 4ක කාලයක් තිබෙනවා. ඇමතිතුමා මගේ විනාඩි දෙකක් ගත්තා. *[බාධා කිරීමක්]* එතුමාගේ පැත්තෙන් මට තව විනාඩි දෙකක් දෙන්න.

அவர் அடுத்த Electionஐப் பற்றித்தான் யோசித்தாரே தவிர, இந்த நாட்டின் பிரச்சினைக்கான தீர்வைப் பற்றி யோசிக்கவில்லை. இப்பொழுதுகூட, அதற்கான ஒரு சந்தர்ப்பம் கிடைத்திருக்கிறது. அதாவது, 159 பாராளுமன்ற உறுப்பினர்களைக் கொண்டுள்ள - பாராளுமன்றத்தில் மூன்றில் இரண்டு பெரும்பான்மையைக் கொண்டுள்ள - மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களுக்கு அதற்கான சந்தர்ப்பம் கிடைத்திருக்கிறது. நீங்கள் எல்லோரும் எப்படி தோட்டத் தொழிலாளர்கள் தொடர்பில் அனுதாபத்துடன் பேசுகின்றீர்களோ, அதேபோல வட, கிழக்கில் இருக்கின்ற மக்களுடைய பிரச்சினைக்கான தீர்வு பற்றியும் பேசுங்கள்! அவர்களுடைய பிரச்சினைக்கு ஒரு தீர்வைப் பெற்றுக் கொடுங்கள்!

அதற்கான ஓர் ஆரம்பக்கட்ட நடவடிக்கையாக மாகாண சபைத் தேர்தலை நடாத்துவதற்கான ஏற்பாட்டைச் செய்யுங்கள்! மாகாண சபை முறைமை இந்த நாட்டிலுள்ள தமிழ் மக்களின் பிரச்சினைக்கு முழுமையான தீர்வாக இல்லாவிட்டாலும், அதனை ஓரளவுக்கேனும் தீர்ப்பதற்காகக் கொண்டுவரப்பட்டது. எனவே, மாகாண சபைகளை இயக்குவதற்கு நடவடிக்கை எடுங்கள்! மாண்புமிகு சனாதிபதி அவர்கள் சொல்லியிருந்தார், "மாகாண சபைத் தேர்தலுக்கு நிதி ஒதுக்கப்பட்டு இருக்கின்றது. ஆனால், அதை நடத்துவதில் சட்டச் சிக்கல் இருக்கின்றது" என்று. சட்டச் சிக்கலை இந்தப் பாராளுமன்றத்தால் தீர்க்க முடியும். சட்டம் உருவாக் குவதற்குத்தான் இந்தப் பாராளுமன்றம் இருக்கின்றது. நீங்கள் 159 பேரும் வாக்களித்தாலே அந்தச் சட்டம் pass ஆகும். நாங்கள் வாக்களித்தாலும், வாக்களிக்காவிட்டாலும் உங்களுடைய Budgetஆனது pass ஆகும். எனவே, உங்களுடைய முழு ஆதரவையும் வழங்கி, மாகாண சபைத் தேர்தலை நடத்தி, தமிழ் மக்களுக்கு அதிகாரப் பரவலாக்கத்தைக் கொடுத்து, அந்த மக்களுடைய கருத்துகளுக்கு முன்னுரிமை கொடுங்கள்! மாகாண சபை என்பது தமிழ் மக்களுக்கு மட்டுமல்ல, சிங்கள மக்களுக்கும்தான்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
හොඳයි.

நான் மத்திய மாகாண கல்வி அமைச்சராக மூன்று முறை இருந்திருக்கிறேன். அங்கு செய்த வேலைகளைக்கூட, எங்களால் பாராளுமன்றத்தில் செய்ய முடியவில்லை. மாகாண சபை முறைமை என்பது, மக்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்கும் அதிகாரத்தைப் பரவலாக்குவதற்கும் முக்கியமான ஒரு கருதுகோளாக இருக்கின்றது. எனவே, மாகாண சபைத் தேர்தலை விரைவாக நடத்த வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් අමාත්‍යතුමිය, ඔබතුමියට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.49]

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද නොවැම්බර් මාසයේ 13වැනි දා. අද විශේෂ දවසක්. එකක්, ලංකාවේ වැඩ කරන ජනතාවගේ අරගළයක් සිහි කැඳවන ඉල්මහ විරු සමරු දිනය අද. වැඩ කරන පන්තියේ ජනතාව නියෝජනය කරමින් මේ

පාර්ලිමේන්තුවට ආ කෙනෙකු හැටියට අද දවසේ මට කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳවත් සතුටු වෙනවා.

අය වැය පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ, 2025 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරපු අපේ පසුගිය අය වැය ගැනත් කථා කරමින් ඉදිරියට යන්න පුළුවන් කියලා මා හිතනවා. විශේෂයෙන්ම අපේ දෙවැනි අය වැය කියවීමේදී අපේ ප්‍රතිපත්තිමය රාමුව තුළ ඉඳගෙන අපේ රජයේ ආර්ථික උපායමාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට මා අදහස් කරනවා. එහිදී කියන්න ඕනෑ, රටක අය වැය කියන්නේ ආදායම් සහ වියදම් පදනම් කරගෙන සකස් කෙරෙන ලියවිල්ලක් විතරක්ම නොවෙයි කියන එක. ඒ කියන්නේ, මූලික ආදායම් සහ වියදම් සංරචක පදනම් කරගෙන විතරක් සකස් කෙරෙන ලියවිල්ලක් නොවෙයි කියන එක. එම ලේඛනය, රටේ ජනතාවගේ ජීවන තත්ත්ව දර්ශකවල දියුණුව, ඒ වාගේම රටේ ආර්ථික සංවර්ධන ඉලක්ක, සමාජ හා සංස්කෘතික දර්ශකවල වර්ධනය, රටේ ජනතාවගේ මූලික මිනිස් අවශ්‍යතා වාගේම අයිතිවාසිකම් ගැනත් කරුණු දැක්වෙන මිනුම් දණ්ඩක් බවට පත් වනවා. ඒ වාගේම ඒ සියලු කාරණා පිළිබඳව ඉදිරි වර්ෂයට කරන ලද පුරෝකථනයකුත් ඒ තුළ තිබෙනවා. ගතවෙමින් තිබෙන 2025 වර්ෂය වෙනුවෙන් අපි ඉදිරිපත් කළ අය වැය ජනතා සුබසාධනය ඉලක්ක කර ගත් අය වැයක් හැටියට තමයි ක්‍රියාත්මක වුණේ. එය භෞතික සංවර්ධනය පදනම් කර ගත් අය වැයක් බවට පත්වෙලා තිබුණා. හැබැයි, 2026 අය වැය දේශීය නිෂ්පාදන බලගැන්වීම පදනම් කර ගත්, ආර්ථික සංවර්ධනය හරහා ජීවන තත්ත්වය නඟාසිටුවීම පදනම් කර ගත්, ආර්ථික සංවර්ධන ඉලක්ක කරා යන අය වැයක්.

ගරු ජනාධිපතිතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා, මේ රට භාර ගත්තේම ආර්ථික පදනම දෙදරා ගිහින් තිබුණු මොහොතක කියලා. "ආර්ථිකය කඩා වැටුණු මොහොතක" කියන එකට වඩා, අන්න ඒ "ආර්ථික පදනම දෙදරා ගිහින් තිබුණු මොහොතක" කියන එක වඩාත් ගැළපෙනවා කියා මා හිතනවා. ඒ වාගේම ඒක සරල වචනයක් නොවෙයි. ආර්ථික පදනම දෙදරා ගියා කියන්නේම, රටක සංවර්ධනයට තදබල පහරක්. වසර ගණනාවක් පුරා සියලු ක්ෂේත්‍රවල ආර්ථික අස්ථාවර බවක් තිබුණා. ඒ කාලයේ රාජ්‍ය මූල්‍ය අසමතුලිත බව වාගේම, ව්‍යුහාත්මක අකාර්යක්ෂමතාවත් තිබුණා. ඒ සියල්ලටම ඒ කාලයේ පැවති පාලනවල දුර්වලතා හේතු වුණා කියලා අපි දන්නවා. නමුත් මෙම නව දේශපාලන පරිවර්තනය සිද්ධ වෙලා අවුරුද්දක කාලය තුළ අපට විශාල ජයග්‍රහණ ප්‍රමාණයක් අත් පත් කර ගන්න ලැබුණා. අපේ අවුරුද්දක පාලන කාලය තුළ කරපු සංවර්ධන ක්‍රියාවලිය සරල නැහැ.

2025 වර්ෂයේ පළමු භාගය තුළ ආර්ථිකය සියයට 4.8කින් වර්ධනය වෙලා තිබෙනවා, උද්ධමනය නැවත ධන අගයකට ඇවිල්ලා තිබෙනවා, භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතය අඩු වෙලා මූල්‍ය ස්ථාවරත්වය ඇතිවෙලා තිබෙනවා, විනිමය අනුපාතය ස්ථාවර වෙලා තිබෙනවා, විදේශ ප්‍රේෂණ ගලා ඒම වැඩිවෙලා තිබෙනවා, නිල විදේශ සංචිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 6ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම ආර්ථික ස්ථාවරත්වය මත විදෙස් ආයෝජන ගලා ඒම තවත් වර්ධනය වනු ඇතැයි අප විශ්වාස කරනවා. ආර්ථික අර්බුදය හමුවේ රට ගලවා ගැනීමේ අපේ පළමු උපායමාර්ගික සැලැස්ම වුණේම රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීමයි. දෙවැන්න, විනිවිදභාවයෙන් සහ වගකීමෙන් යුතු රාජ්‍ය මූල්‍ය කළමනාකරණයයි. ඒ වෙනුවෙන් අපි දේශීයව ආදායම් රැස් කිරීම ශක්තිමත් කළා, ආදායම් පරිපාලනය ඩිජිටල් කිරීම ආරම්භ කළා. ඒ හරහා ගතවෙමින් තිබෙන 2025 වර්ෂය ජනතා සුබසාධනවලට මුල් තැන දුන් වර්ෂයක් විධියට සඳහන් කළ හැකි විධියට අපි කටයුතු කර තිබෙනවා.

ඉදිරි 2026 වර්ෂය තුළ දේශීය කර්මාන්ත දිරි ගැන්වීම, දේශීය නිෂ්පාදන දිරි ගැන්වීම, අපනයන ඉලක්ක හා ආයෝජන ඉලක්ක සපුරා ගැනීම අප සිදු කරනු ලබනවා. ඒ සපුරා ගන්නා ආර්ථික ඉලක්කවල ප්‍රතිලාභ ග්‍රාමීය ජනතාව දක්වාම ගලා යෑමේ ක්‍රමය ශක්තිමත් කිරීමට එම වර්ෂයේදී ගත් ප්‍රතිපත්තිමය තීන්දු අනුව කටයුතු කිරීමටත් අප තීරණය කර තිබෙනවා.

2026 අය වැයේ උපායමාර්ගික අරමුණු හැටියට, තිරසර සහ සැමට ප්‍රතිලාභ ලැබෙන ආර්ථික වර්ධනයක් ඇති වන, අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක් බලාපොරොත්තු වන, ණය තිරසරභාවය සහතික කරන, නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරන, ග්‍රාමීය දිළිඳුබව තුරන් කරන, ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කරන කරුණු තිබෙන බව අපි කියනවා.

අපි 2026 වර්ෂයේදී වතු කම්කරුවන් සඳහා වැටුප් වැඩිවීමක් යෝජනා කළා. නමුත් කනගාටුවෙන් වුණත් කිව යුතු කාරණයකුත් තිබෙනවා. එසේ වැටුප් වැඩි කරන්න යෝජනා කළේ, වරප්‍රසාදලාභී ජනතාවකට ලැබෙන තවත් වරප්‍රසාදයක් විධියට නොවෙයි. මේ සමාජය තුළ අවම වරප්‍රසාදිත ජනතාවකට කරන දිරි ගැන්වීමක් ලෙස තමයි රුපියල් 200ක් රාජ්‍ය පාර්ශ්වයෙන් ලබා දීමට යෝජනා කළේ. නමුත් ඒ පිළිබඳව ඒ නැඟෙන චෝදනාව සහ විරෝධය ඇත්තටම ජනතා විරෝධී බව අපි මේ වෙලාවේ කියනවා. ජනතාවට ආදරය කරන විපක්ෂයකට එවැන්නකට විරුද්ධවීමට හැකියාවක් නැහැ. අපි ජනතාවට ගංවතුර ආධාර ලබා දෙනවා, ආපදාවලදී සහන ලබා දෙනවා, සහනාධාර බෙදනවා, ගොවි ජනතාවට සහනාධාර දෙනවා, ධීවර ජනතාවට සහනාධාර දෙනවා. ඒ වාගේම මේ වතු කම්කරු ජනතාවගේ ජීවන මට්ටම යම් තරමකට හෝ ඉහළ නංවන්නත්, වතු හාම්පුතුන් සහ මේ ජනතාව අතර වැටුප් සම්බන්ධව ඇති වන අරගළ අවම කිරීම සඳහාත් තමයි ඒ වැටුප වැඩි කර දීමට යෝජනා කර තිබෙන්නේ. එහිදී සේවයට පැමිණීම දිරි ගැන්වීමක් ලෙසත්, ඊටත් එහා ගිහිල්ලා ජීවන තත්ත්වය උසස් කිරීමක් ලෙසත් තමයි රාජ්‍ය පාර්ශ්වයෙන් දිනකට රුපියල් 200ක් ලබා දෙන්න යෝජනා කළේ. ඒ අනුව සේවයට පැමිණෙන එක දිනකට රුපියල් 200ක් රජයෙන් ගෙවනු ලබනවා. එතකොට දින 25ක් ආවොත්, දිනකට රුපියල් 200 ගණනේ රුපියල් 5,000ක් ලැබෙනවා. ඒ කියන්නේ, දින 25ක් සේවයට ආවොත් සම්පූර්ණ දිරි දීමනාව විධියට -වතු සමාගමෙන් දිනකට ලබා දෙන රුපියල් 200ද ඇතුළුව- රුපියල් 10,000ක් ඔවුන්ට ලබාගන්න පුළුවන්කම තිබෙනවා. එම නිසා මේක රාජ්‍ය පාර්ශ්වයෙන් වතු කම්කරු ජනතාවට ලබා දෙන විශේෂ අවස්ථාවක්. අපි හිතනවා, ඒක රජය විසින් ගෙන තිබෙන අගය කළ යුතු තීරණයක් බව. නමුත් මේ වෙනකොට ඊට එරෙහිව අධිකරණමය ක්‍රියාමාර්ගවලට යන්න හදනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගිහින් පැමිණිලි කරන්න හදනවා. අපි කියන්නේ එහෙම කරන එක ජනතා විරෝධී බවයි.

ඊළඟට, රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීම, විශ්‍රාම වැටුප් වැඩි කිරීම, කාන්තාවන් සවිබලගැන්වීම සඳහා රුපියල් මිලියන 240ක් සහ අමතර රුපියල් මිලියන 200ක් වෙන් කිරීම, විදේශගත ශ්‍රී ලාංකිකයන් සඳහා සහන පොලී ණය පහසුකම් ලබා දීම, වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීමට යෝජනා කිරීම, සෞඛ්‍ය නඟාසිටුවීම, සෞඛ්‍ය අධ්‍යාපනය නඟාසිටුවීම, විශ්වවිද්‍යාල සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යාධාරය විධියට රුපියල් 10,000ක මුදලක් ලබා දීම වැනි කටයුතු හරහා අපි 2026 වර්ෂයට ඉදිරිපත් කළ අය වැය යෝජනා තුළ සංවර්ධන ඉලක්කවලටට එහා ගිහින් සුබසාධන ඉලක්කවලටත් ළඟා වී තිබෙනවා.

විශේෂයෙන්ම මලෙයහම් ජනතාව වෙනුවෙන් නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඉන්දීය ආධාර යටතේ අප සිදු කරනු

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

ලබනවා. ඒ වාගේම අපගේ රාජ්‍ය පාර්ශ්වයෙනුත් විශේෂයෙන්ම නිවාස 2,000කට රුපියල් මිලියන 4,290ක මුදල් වෙන් කිරීමක් මේ වෙනකොට කර තිබෙනවා.

இந்த வேளையில் நான் குறிப்பிட விரும்புகின்ற முக்கிய விடயம் என்னவென்றால், மக்கள் ஆணையைப் பெற்றுக் கொண்ட எமது அரசாங்கம் எடுத்த மாற்றமிகு நடவடிக்கைகளையிட்டு நாம் பெருமைப்பட முடியும் என்று முழுமையாக நம்புகின்றேன் என்பதாகும். அரசியல் கட்டமைப்பை நவீன மயப்படுத்துவதற்கும், மக்களை மையமாகக் கொண்ட ஆட்சி ஒன்றைத் தோற்றுவிப்பதற்கும், சட்ட, ஒழுங்கை மீள நிலைநாட்டுவதற்கும், ஆட்சியைப் பலப்படுத்துவதற்கும், எமது பொருளாதாரத்தில் நாம் அடையும் வெற்றிகளை நாட்டில் அடிமட்டத்தில் வாழும் மக்கள்வரை கொண்டுசெல்வதற்கும் நாங்கள் தொடர்ச்சியான நடவடிக்கைகளை மேற்கொள்கின்றோம் என்பதை நான் உறுதியாகக் கூற விரும்புகின்றேன். இந்த அரசியல் மறுசீரமைப்பின் காரணமாக ஒரு வருடம் என்ற குறுகிய காலப்பகுதிக்குள் அரச நிதி முகாமைத்துவம், பேரண்டப் பொருளாதார மாற்றம், சமூக உறுதிப்பாடு ஆகியவற்றை முழுமையாக ஏற்படுத்த முடியுமென்பதில் பூரண நம்பிக்கைகொண்டு நாங்கள் அதனை ஏற்படுத்தி இருக்கின்றோம். பொருளாதாரத்தில் எல்லாத் துறைகளிலும் ஏற்பட்ட பலமான வளர்ச்சியின் காரணமாக, 2025ஆம் ஆண்டின் முதல் அரையாண்டு காலப்பகுதியில் எமது பொருளாதாரமானது 4.8 சதவீதமான வளர்ச்சியை அடைந்துள்ளது. இது பல்வேறு நிறுவனங்களின் எதிர்வுகூறலையும் தாண்டிய பொருளாதார வளர்ச்சி என்பதை நான் குறிப்பிடுகின்றேன்.

2022 ஏப்பிரல் மாதத்தில் ஏற்பட்ட பொருளாதார வங்குரோத்து நிலை எமது நாட்டுக்கு ஒரு தசாப்த காலத்தை இழக்கச் செய்துள்ளதை நாங்கள் பார்த்தோம். அதாவது, சமூக நீதி இழக்கப்பட்ட, சமூக நலன்புரித் திட்டங்கள் வீழ்ச்சியடைந்த, மக்களுடைய பொருளாதாரத்தில் தாக்கம் ஏற்பட்ட காலமாக அந்தக் காலத்தை நாங்கள் குறிப்பிடுகின்றோம். அந்த வங்குரோத்து நிலைக்கு முன்னர் இருந்த நிலைமைக்கு மீள இந்த நாட்டைக் கட்டியெழுப்புவதற்கு 10 வருடங்களாகும் என எதிர்வு கூறப்பட்டிருந்தது. ஆனாலும், இவ்வருட இறுதியாகும்போது, அந்த வங்குரோத்தடைந்த பொருளாதார நெருக்கடிக்கு முன்பு இருந்த நிலைமையை அடைய முடியும் என்பதில் நாங்கள் நம்பிக்கை கொண்டிருக்கின்றோம் என மிகவும் பெருமையுடன் கூறுகின்றோம்.

சமூகப் பாதுகாப்பும் மனித வள அபிவிருத்தியும் எமது கொள்கை அணுகுமுறைகளின் அடிப்படை நோக்கம் என்பதை நான் உறுதியாகக் கூறுகின்றேன். அதற்காக நாங்கள் 'அஸ்வெசும' நிகழ்ச்சித்திட்டத்தை இற்றைப்படுத்தி விரிவாக் குவதற்கு நடவடிக்கைகள் எடுத்திருக்கின்றோம். அதேபோல, அந்தப் பயனாளிகளின் பட்டியல் மீளாய்வுக்கு உட்படுத்தப் பட்டு, முதியோர்கள் மற்றும் சிறுநீரக நோயாளிகளின் கொடுப்பனவுகளை அதிகரிப்பதற்கும், பல்கலைக்கழக மாணவர்களுக்கு உதவும் வகையில் 'மஹாபொல' புலமைப்பரிசில் பெறுகின்ற மாணவர்களின் கொடுப்பனவை அதிகரிப்பதற்கும் நடவடிக்கை எடுத்திருக்கின்றோம். 'அஸ்வெசும' உதவித்தொகை பெறும் பயனாளர் குடும் பங்களின் பாடசாலை மாணவர்களுக்குப் புத்தகங்களையும் பாடசாலை உபகரணங்களையும் கொள்வனவு செய்வதற்காகக் கொடுப்பனவுகள் வழங்கப் படுகின்றன. இப்பணிகளின் நோக்கம் என்னவென்றால், பொருளாதார வளர்ச்சியின் பயன்களை உண்மையாகவே தேவையுள்ள மக்களுக்குப் பெற்றுக் கொடுப்பதாகும். இது அரசாங்கத்தின் முக்கியமான ஒரு கடமையென்று நாங்கள் நம்புகின்றோம்.

அது மட்டுமல்லாமல், அரச துறையை மறுசீரமைப்புச் செய்து நவீனமயப்படுத்துவதற்கான தேவையுள்ளது என்பதை நாங்கள் உணர்ந்திருக்கின்றோம். அதற்காக அரச ஊழியர்களின் சம்பளத்தை 3 கட்டங்களில் அதிகரிப்பதற்கு நடவடிக்கை எடுத்திருக்கின்றோம். ஏற்கனவே ஒரு கட்டம் வழங்கப்பட்டிருக்கின்றது; அடுத்த கட்டத்தை 2026ஆம் ஆண்டில் வழங்கவிருக்கின்றோம். அது மட்டுமல்லாமல், ஆளணிப் பற்றாக்குறையை நிவர்த்தி செய்யும் வகையில் அரச துறையில் நிலவுகின்ற அத்தியாவசியமான வெற்றிடங்களை நிரப்புவதற்கும் அரச துறையை 'டிஜிட்டல்' மயப்படுத்தும் உபாய வழிகளைத் தயாரிப்பதற்கும் அனைத்து நடவடிக்கைகளையும் எடுத்திருக்கின்றோம். அரச துறையை மீளமைக்க நாங்கள் நடவடிக்கையெடுக்கத் தயாராக இருப்பதை நீங்கள் அனைவரும் அறிவீர்கள். மக்களுக்கு உண்மையிலேயே சேவையாற்ற வினைத்திறன்மிக்க கவர்ச்சிகரமான ஓர் அரச துறையை நிறுவ வேண்டும் என்று நாங்கள் நம்புகின்றோம்.

நீண்டகாலமாகப் போதைப்பொருட்களுக்கும் திட்டமிடப் பட்ட குற்றச் செயல்களுக்கும் இரையான எமது பிள்ளைகளை அதிலிருந்து மீட்டெடுக்க வேண்டும் என்பதற்காக நச்சுப் போதைப்பொருள் வழங்கல் சங்கிலியை உடைத்தெறிந்து, விநியோக வலையமைப்பினைப் பலவீனப்படுத்தி, கல்வி மற்றும் புனர்வாழ்வு நிகழ்ச்சிகளை நடைமுறைப்படுத்தி, தொழில்வாய்ப்புகளைப் பெற்றுக் கொடுத்தல் உள்ளிட்ட பல்வேறு செயற்பாடுகள் அடங்கிய செயற்றிடமொன்றை நாங்கள் அறிமுகப்படுத்தி இருக்கின்றோம்.

" வளமான நாடு - அழகான வாழ்க்கை" என்பதை எமது தொனிப்பொருளாக நாங்கள் முன்வைத்தோம். அதனைக் கட்டாயமாக உறுதிப்படுத்துவதற்காக எங்கள் அரசாங்கம் சில மூலோபாய நோக்கங்களைக் கொண்டிருக்கின்றது. அதில் சில முக்கியமான காரணங்களை நான் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, அந்த இலக்கினை அடைவதற்கு 2025ஆம் வருடத்தில் நாங்கள் பலமான அடித்தளத்தை இட்டோம். அதன்மூலமாக நாங்கள் பெற்ற நன்மைகளாக எமது பொருளாதார வளர்ச்சி 2024ஆம் வருடத்தில் முதல் அரையாண்டில் காணப்பட்ட 4.6 சதவீதத்திலிருந்து இப்போது 4.8 சதவீதம் வரை அதிகரித்திருக்கின்றது. 2024ஆம் ஆண்டின் முதல் காலாண்டில் 4.5 சதவீதமாகக் காணப்பட்ட வேலையின்மை சதவீதம் தற்போது 3.8 வரை குறைந்திருக்கின்றது. அதேபோல, எமது பண்டங்களின் ஏற்றுமதி வருமானம் 8.5 பில்லியன் அமெரிக்க டொலரிலிருந்து 9.1 பில்லியன் வரை அதிகரித்திருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට ලැබී ඇති කාලය අවසන්, ගරු ඇමතිතුමියනි.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

நாங்கள் ஈட்டிக்கொள்கின்ற அந்நியச்செலாவணி - தொழிலாளர்களால் அனுப்பப்படும் பணம் - 4.8 பில்லியன் அமெரிக்க டொலரிலிருந்து தற்போது 5.8 பில்லியன் வரை அதிகரித்திருக்கின்றது. அதேபோல, சுற்றுலாத்துறை வருமானமும் அதிகரித்துள்ளது. மக்களுக்கு நாங்கள் வழங்குகின்ற நன்மைகளுக்கான எங்கள் அரச நிதி உபாய வழி என்னவென்றால், ஸ்திரமற்ற தன்மைக்குப் பதிலாக எதிர்வுகூறும் ஆற்றலையும், சலுகைகளுக்குப் பதிலாக நியாயத் தன்மையையும், குறுகிய கால நன்மைகளுக்குப் பதிலாக நீண்டகால சுபிட்சத்தையும் நோக்காகக் கொண்ட மறுசீரமைப்புத் திட்டங்களின்மூலம் மீள் நிறைவான, இறைமைமிக்க, சுபிட்சம் நிறைந்த நாடொன்றைக் கட்டியெழுப்பவதற்கான அனைத்து நடவடிக்கைகளையும் முன்னெடுப்பதாகும். அதற்காகவேண்டி, முதலீட்டுக்கு அனுகூலமான சூழலை உருவாக்குதல், இலங்கையில் சிறிய மற்றும் நடுத்தர தொழில்முயற்சிகளை வலுப்படுத்துதல், விவசாய பெறுமதிச் சங்கிலியை அபிவிருத்தி செய்தல், சுற்றுலாத் தொழிற்றுறையினை அபிவிருத்தி செய்தல், Clean Sri Lanka தொடர் நிகழ்ச்சித்திட்டம் போன்றவற்றை முன்னெடுப்போம்.

தோட்டத் தொழிலாளர்களின் வாழ்க்கைத்தர அபிவிருத்திக்குச் சம்பள உயர்வு உயர்வு மட்டும் போதாது என்பதை நான் முழுமையாக நம்புகின்றேன். அவர்களுக்கு வீட்டு வசதிகள் மட்டுமல்லாமல், அனைத்து வசதிகளும் கிடைக்க நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். அதேபோல, மகளிர் வலுவூட்டல், வெளிநாடுகளில் பணிபுரியும் இலங்கையர்களுக்குச் சலுகைகள் வழங்குதல் போன்ற சகல நடைமுறைகளின் ஊடாகவும் நாங்கள் இந்த நாட்டை உறுதியான, நிலையான - நிரந்தரமான ஓர் அபிவிருத்திப் பாதைக்குக் கொண்டுவருவோம்.

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. අපි බලාපොරොත්තු වෙනවා, මේ රටේ සමස්ත සංවර්ධනය එහෙම නැත්නම් ස්ථිරසාර සංවර්ධනය සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනාට ලබා දෙන්න.

சிங்கள, தமிழ், முஸ்லிம் அனைவருமே சுபிட்சமாக, நிம்மதியாக, அடிப்படை உரிமைகளைப் பேணக்கூடிய வகையில் வாழக்கூடிய ஒரு நாடு எங்களுக்குத் தேவைப்படுகின்றது. எவரும் எவருக்கும் அனுதாபம் காட்டத் தேவையில்லை; அனுதாபம் என்ற அடிப்படையில் வாழ நாங்கள் விரும்பவில்லை. சுயமரியாதையுடன் வாழக்கூடிய ஒரு சூழலை உருவாக்குவது அனைவருக்குமே முக்கியமானது. ஆகவேதான் ஓர் அரசாங்கமாக நாங்கள் அவ்வாறான ஒரு நாட்டை உருவாக்குவதற்கு முழுமையான அர்ப்பணிப்புடன் செயற்படுகின்றோம். எனவே, பொருளாதார சமத்துவமும் நீதியும் நியாயத்தன்மையும் சமமான உரிமைகளைப் பெறக்கூடிய சூழலும் கொண்ட ஒரு நாட்டை உருவாக் குவதற்காக அனைவரும் இணைந்து அர்ப்பணிப்புடன் செயற்படுவோம் என்று கூறி, விடைபெறுகின்றேன்.

මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (MRS.) SAGARIKA ATHAUDA left the Chair, and THE HON. IMRAN MAHAROOF took the Chair.*

[අ.භා. 4.05]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න අවස්ථාවේදී මට කථා කිරීමට අවස්ථාව ලැබීම මා අගය කරනවා. මට මේ අය වැය ගැන වචන ස්වල්පයක් කථා කරන්න අවශ්‍යයි. මේ අය වැය JVP එක ප්‍රමුඛ ජාතික ජන බලවේගයේ පළමුවැනි අය වැය කිව්වොත් මා හිතන්නේ මා නිවැරැදි නැහැ. මොකද, මීට පෙර යම් මාස ගණනාවක් තවත් අය වැයක් තිබුණා. ඔබතුමන්ලා ලෝකයේ සවාරි ගහලා, වෙන රටවල් එක්ක කථා කරලා, IMF එකත් එක්ක කථා කරලා දැන් දන්නවා, මොකක්ද කරන්න ඕනෑ කියලා. දැන් තිබෙන්නේ ජනතාවට කියපු දේ කරනවාද, නැත්නම් මීට පෙර ආණ්ඩු කරපු දේවල් අවසන් කරනවාද කියන විවාදයයි. මා බොහොම සතුටු වෙනවා, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති ජනාධිපති අනුර දිසානායක මැතිතුමා ඒ ආකාරයෙන්ම ප්‍රතිපත්තිමය වශයෙන් ඉදිරියට ගෙන යන එක ගැන. මම 2015දී මුදල් ඇමති වශයෙන් පටන් ගත් යම් දේවල් සහ 2022දී රට බංකොලොත් වුණාට පසුව රනිල් වික්‍රමසිංහ ආරම්භ කරපු දේවල් ඒ ආකාරයෙන්ම මූල්‍ය විනයක් එක්ක ඉදිරියට කරගෙන යෑම සතුටුදායක තත්ත්වයක් ලෙස අපි සලකනවා. වසන්ත සමරසිංහ ඇමතිතුමා මේ සභාවේ ඉන්න නිසා මම මේ කාරණය කියන්නම්.

ජේ.ආර්. ජයවර්ධන මහත්මයා මේ රටට විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නා. ඒක එදා ඉඳන් හංවඩු ගැහුවා. අද ඒකට වඩා වෙනස් ගමනක් නැහැ. පෞද්ගලික අංශයට බැණ බැණ, වෛරක්කාර විධියට රට ගෙන යනවාට වඩා ජේ.ආර්. ජයවර්ධන ඉදිරිපත් කරපු විවෘත ආර්ථිකය ලෝකයම පිළිගෙන තිබෙන නිසා මම හිතන විධියට ඒකේ වැරැදි තිබෙනවා නම් ඒවා හදාගෙන මිත්‍රශීලීව ඉදිරියට යාම තමයි අවශ්‍ය වෙන්නේ.

ඇමෙරිකාව ගැන බලන්න. ඔබතුමන්ලා එක්කත් හීලෑව සිටිනවා. ඇමෙරිකා එක්සත් ජනපදය කියන්නේ, මේ රටේ ආණ්ඩුවේ anti-western concept එකක් තිබෙනවා කියලා; anti-private sector concept එකක් තිබෙනවා කියලා. එතුමන්ලාගේ ලිපියක සඳහන් වෙනවා, "There is institutional corruption still in the country" කියලා. ආයෝජන සඳහා අවසර ගන්න කල් යනවා කියලා තිබෙනවා. මම හිතන විධියට, ඔබතුමන්ලා මේ විවෘත ආර්ථික ක්‍රමය අනුගමනය කරන්න අවශ්‍යයි. විවෘත

[ගරු රවී කරුණානායක මහතා]

ආර්ථිකයේ තිබෙන අඩුපාඩු නිවැරැදි කරගෙන ඒ ගමන ගියා නම් මීට වැඩිය ආයෝජන එන්න තිබුණා. මොනවා කිව්වත් තවම මේ රටට ආයෝජන ඇවිල්ලා නැහැ, ඇමතිතුමා. ආයෝජනය සම්බන්ධව යම් විධියේ වැඩ පිළිවෙළක් තිබෙනවාය කිව්වාට, අපට ඒක අංක ගණිතය අනුව පෙනෙන්න නැහැ. යූඑස් ඩොලර් මිලියන 700ක්, 800ක් ඇවිල්ලා තිබෙනවා කිව්වාට ඒ තිබුණු ආයෝජන තුළින් තමයි ඉදිරියට ඇවිල්ලා තිබෙන්නේ. ආර්ථිකයක් පාලනය කරනවා කියන්නේ එසේ මෙසේ ගමනක් නොවෙයි. ඒක කොටස් හතරකට බෙදලා තිබෙනවා. එකක් තමයි, real economy එක. ඒක තමයි, පෞද්ගලික අංශය සහ රජයේ අංශය. දෙවැනි එක තමයි, Fiscal Policy එක. ඒක තමයි ඔබතුමන්ලාට පාලනය කරන්න තිබෙන්නේ. අනෙක් එක, ගෙවුම් ශේෂය - balance of payment. අනෙක, මූල්‍ය අංශය. ඒවා සම්පූර්ණයෙන් හුදෙකලා කරලා, ඒකේ ස්වාධීනත්වය මහ බැංකුවට දීලා තිබෙනවා. වැඩි කල් යන්න ඉස්සෙල්ලා ඔබතුමන්ලාට ඒකේ ප්‍රතිවිපාක පෙනෙන්න තිබේවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර ඉදිරිපත් කරලා තිබෙන අය වැයේ පළමුවැනි Schedule එකේ රුපියල් බිලියන 4,485කුත්, මීට පෙර ගත් ණය සහ capital repayment සඳහා රුපියල් බිලියන 4,495කුත් ගෙවන්න වුණාම ට්‍රිලියන 9කට ආසන්න ප්‍රමාණයක් ගෙවන්න තිබෙනවා. අපි ආදායම විධියට රුපියල් බිලියන 5,355ක් උපයනකොට අපට රුපියල් ට්‍රිලියන 3.74ක -රුපියල් බිලියන 3,740ක- හිඟයක් ඇති වෙලා තිබෙනවා.

දැන් මේ අවස්ථාවේදී ඉදිරිපත් කරලා පෙන්වූවා, ට්‍රිලියන එකක අතිරික්තයක් තිබෙනවාය කියලා. අපි ඒ ගැන කථා කරනවා නම්, අතිරික්තයක් තිබෙනවා නම්, එහෙම නම් මේ ට්‍රිලියනයක් තිබෙන අවස්ථාවක මොකටද 2026ට බිලියන 1,757ක තවත් ණයක් ගන්න අවශ්‍ය වන්නේ? දැන් ණය එකතු කිරීමක් තිබෙනවා. මෙතැන බිලියන 1,757ක්. ඉතින් මේ ට්‍රිලියනයක් කියලා ඇති වන්නේ buffer එකක්. දැන් මහ බැංකුවේ මුදල් අච්චු ගැසීමේ ක්‍රමවේදය නවත්වලා තිබෙන නිසා යම් විධියකින් උපයෝගී කර ගන්න මේ සල්ලි අපි හදලා තිබ්බා. මේක රනිල් වික්‍රමසිංහ පටන් ගත්ත ඒ වෙනස්කම තුළින්ම ඇති වෙලා තිබෙන එකක්. 2024ට බිලියන 600ක් ඒ වාගේ තිබ්බා. ඊට පස්සේ 2025 දී අපට පෙනෙනවා, ඒක ඉදිරියට ගිහිල්ලා තිබෙන බව. දැන් මේකේ opportunity cost එකක් තිබෙනවා. ඒ කියන්නේ, ආවස්ථික පිරිවැයක්. මේ බිලියන එකට සාමාන්‍යයෙන් ආණ්ඩුවක cost of capital එක සියයට 10ක් වෙනකොට බිලියන 30ක් මේකට යම් විධියක ආවස්ථික පිරිවැයක් ලෙස යනවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ මේකයි. කරුණාකරලා මුදල් අතිරික්තයක් නොවෙයි අවශ්‍ය වන්නේ ආණ්ඩුවට. පොලී අනුපාතය පුළුවන් තරම් අඩුවට අරගෙන ආයෝජන කරන්න අවශ්‍යයි, මීට වඩා ආදායමක් උපයන්න පුළුවන් දේවල්වලට. සියයට 6කට, 7කට, 8කට ණයක් අරගෙන සියයට 15ක, 20ක ආදායමක් උපයන්න පුළුවන් නම්, ඒක තමයි රටේ සංවර්ධනය කියන්නේ. ඒක බැංකුවේ තිබ්බාය කියලා රට සංවර්ධනය වෙන්නේ නැහැ. ඒකෙන් කිසි දියුණුවක් ඇති වෙන්නේ නැහැ.

දැන් බලන්න, ජනාධිපති අනුර දිසානායක මහතා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කළ දවසේදී ඩොලරය රුපියල් 301යි. අද 306.75යි. ඉතින් මේ දවස් 8 තුළ මේ රුපියල් 5ක අවප්‍රමාණය, මේකේ debt stock එකට එකතු වෙනවා. ඒ කියන්නේ අද තිබෙන US Dollars 38 billion වැඩි කරනවා, රුපියල් 5න්. ඒක බැලුවාම බිලියන 200ක් එකතු වෙනවා, අපේ debt stock එකට. ඉතින් debt stock එකට එහෙම එකතු වුණාම තමන්ගේ පොලී අනුපාතය අද සියයට 10 ගත්තොත්, බිලියන 20ක් එකතු වෙනවා, මේ දවස් 8 තුළ. ඉතින් මේ ආර්ථිකයක් ගෙන යනවා කියන්නේ එසේ මෙසේ කාර්යභාරයක් නොවෙයි. ඒ නිසා අපි පුළුවන් තරම් ආයෝජන ඇති කරන්න අවශ්‍යයි.

දැන් බලන්න, මේ තුළ මූර්ත ආදායම අඩු වෙලා තිබෙනවා. අපේ අමාත්‍යාංශවල, උදාහරණයක් විධියට කෘෂිකර්ම අමාත්‍යාංශය ගත්තොත්, සියයට 8ක, 9ක විතර ගිය ගමන තිබ්බ මුදල් අවප්‍රමාණය වීම, ඒ කියන්නේ inflation decode කළාම මෙන්න මෙච්චර ප්‍රමාණයක් අඩු වෙනවාය කියලා, 2025දී බිලියන 217ක් තිබෙන එක 221 දක්වායි වැඩි වෙලා තිබෙන්නේ. ඉතින් සියයට 1යි වැඩි වෙලා තිබෙන්නේ, මූර්ත ආදායමක් වශයෙන්. ඉතින් ගිය අවුරුද්දට වඩා අඩුවෙන් වෙන් වෙලා තිබෙනවා, මේ අවුරුද්දේ. ඒකම තමයි වෙලා තිබෙන්නේ, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය තුළ. ඒ වාගේම තමයි ගෙවල් ඉදිකිරීම. ගිය අවුරුද්දේ, ඒ කියන්නේ 2025දී බිලියන 104ක් තිබෙනකොට මේ අවුරුද්දට වෙන් කරලා තිබෙන්නේ බිලියන 103යි. ඉතින් ගිය අවුරුද්දට වඩා අඩුවෙන් තිබෙන්නේ. ඒකම තමයි තිබෙන්නේ අධ්‍යාපනයට. ඒකම තමයි තිබෙන්නේ සෞඛ්‍යයට. ඉතින් මේ වාගේ, මූර්ත ආදායම අඩු වෙලා තිබෙන බවක් තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. හැබැයි මේකෙදි IMF එකත් එක්ක තිබෙන සම්බන්ධය අනුව සියයට 13ක් තමයි වියදම් කරන්න පුළුවන් වන්නේ. ඒ නිසා තමයි ආදායම වැඩි කරන්න අවශ්‍ය වන්නේ. ආදායම වැඩි කරන අවස්ථාවේදී අපට අවශ්‍ය වන්නේ, පුළුවන් තරම් ප්‍රාග්ධන වියදම් අද ආයෝජනය කරන එක. හෙටට ආදායමක් උපයන්න පුළුවන් මාර්ගයක් තමයි ඒ තුළින් ඇති වන්නේ. ඉතින්, බැංකුවේ සල්ලි තිබෙනවා කියලා ඒකෙන් රටේ සංවර්ධනයක් ඇති වන්නේ නැහැ. ඒකෙන් මූල්‍ය විනයක් ඇති වන්නේ නැහැ. ඒකේ opportunity cost එකක් තිබෙනවා. මොකුත් කරන්නේ නැතුව ඒක බැංකුවේ තිබ්බාම ඔබතුමන්ලා ණයට ගන්න විට සියයට 10ට ඒක ගත්තාම, අනිවාර්යයෙන්ම ආවස්ථික පිරිවැයක් තිබෙනවා.

ඒ වාගේම මම ඔබතුමන්ලාට මේ කාරණයත් මතක් කරනවා. මේ අවුරුදු 76ක් ගැන කියලා බැණ බැණ ඉන්නවාට වඩා ඔබතුමන්ලාගේ 2024 මහ බැංකුවේ වාර්තාවේ පිටු අංක 3ට හැරුණා නම් පෙනෙනවා, මේ ආර්ථික කඩා වැටීම නිවැරදි වෙන්න පටන් ගත්තේ කොයි කාලයේද කියලා. උද්ධමනය සියයට ගණනක් තිබ්බ එක, අඩු වෙලා තිබෙන්නේ. මේ deflation එක 1.2 වෙලා තිබෙනවා. පොලී අනුපාතය 8ට අඩු වෙලා තිබෙනවා. Exchange rate එක 293ට තිබුණේ. දැන් අද 304යි, 305යි. නමුත් එදා තිබ්බේ, 293ට. ඒ කියන්නේ 2024දී. මේ ආණ්ඩුව භාර ගන්න ඉස්සර වෙලා. ඉතින් මේක නිහතමානීව පිළිගන්න එක කළ යුතු දෙයක් ලෙසයි මම සලකන්නේ.

ඒ වාගේම, ආර්ථිකය ඉදිරියට ගෙන යාමක් තුළ අපට පෙනෙනවා, මූල්‍ය විනය. ඒක අපි අගය කරන්න අවශ්‍යයි. එදා ඉඳන්ම ඒ කරපු එක, රනිල් වික්‍රමසිංහ මහතා ඡන්දයේදී පරාජයට ලක් වුණාට රටේ ආර්ථිකය හරි මට්ටමට ගෙනාපු එක මෙතැනදී මතක් කරන්න අවශ්‍යයි. ඒකම අනුර දිසානායක මහතා ජනාධිපති විධියට ගෙන යන එක වටිනා දෙයක් ලෙසත් අපි මතක් කරන්න අවශ්‍යයි.

නමුත්, ඒ මූල්‍ය විනය කියන්නේ, අපි ඒක පාවිච්චි කරන්න අවශ්‍යයි, රටේ සංවර්ධනයට. මොහොතකට අපි බැලුවොත් රජයේ ආයතන දෙස, රජයේ ආයතන 422ක් තිබෙනවා. ඒ ආයතන 422න් ආයතන 52ක් තමයි මුදල් උපයන්න පුළුවන් විධියට කටයුතු කරන්නේ. අපි 2022 වර්ෂය බැලුවොත්, මේ ආයතනවල සම්පූර්ණ අලාභය රුපියල් බිලියන 774ක්. 2023 වර්ෂයේ -ඒ කියන්නේ රට බංකොලොත් වුණාට පසුව පළමු

අවුරුද්දේ- නැවත කටයුතු කරන්න පටන් අරගෙන මේ ආයතන 422 රුපියල් බිලියන 428ක ලාභයක් ඉපැයුවා. 2024 වර්ෂයේ ලාභය රුපියල් බිලියන 485ක් වුණා. 2025 වර්ෂයේ මුල් මාස 9ට ලාභය රුපියල් බිලියන 227යි. ඒ කියන්නේ, දැන් තිබෙන වෙනස තමයි, එදාට වඩා ලාභය අඩු වෙලා තිබෙනවා මේ පාලන කාලය තුළ. ඉතින්, මම ඔබතුමන්ලාගෙන් අහන්නේ, මීට පෙර ආණ්ඩු හොරකම් කරලාත් ලාභ ලැබුවා නම්, මේ ආණ්ඩුව හොරකම් නොකර අලාභ ලබන්නේ කොහොමද කියලායි.

ලංකා විදුලිබල මණ්ඩලයේ 2024 profit එක තිබුණා, රුපියල් බිලියන 88ක්. මේ අවුරුද්දේ දෙවැනි කාර්තුව වෙනකොට රුපියල් බිලියන 13ක ලාභයක් තිබෙන්නේ. අපි කියනවාද ඔබතුමන්ලා හොරු කියලා? එහෙම නම්, අනික් ආණ්ඩුවලදීත් එහෙම වුණේ නැහැයි කියන එක පෙන්වන්න තමයි මට අවශ්‍ය වුණේ. විපක්ෂයේ සිටියාය කියලා අපි නිකරුණේ එහෙම කියන්නේ නැහැ. මොකද, අපි ඒකෙන් කුහක සතුටක් ලබන්නේ නැහැ. අපට අවශ්‍ය වන්නේ රට හදන්න. අපට අවශ්‍ය වන්නේ ආර්ථිකය හදන්න. හැබැයි, පසුගිය අවුරුදු 76ට බැණ බැණ ඉන්න එපා. මේ රටේ වැඩියෙන් සංවර්ධනයක් සිදුවෙලා තිබෙනවා නම් වෙලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ආණ්ඩු කාල පරිච්ඡේදය තුළයි. මෙතැන ඉන්න එක්සත් ජාතික පක්ෂය -අලියා- නියෝජනය කරන එකම කෙනා වශයෙන් මම ඒ ගැන කථා කරන්නේ බොහොම සතුටින්. ඔබතුමන්ලා -ලාල් කාන්තලා, වසන්ත සමරසිංහලා, බිමල්ලා, විජිත හේරත්ලා- මේකට එකතු වීම සම්බන්ධයෙන් මට තිබෙන තෘප්තිය තමයි, ඔබතුමන්ලා දැන් නිවැරදි මාර්ගයට එන්න පටන් අරගෙන තිබීම. අපට බැන්නා නම්, අපි එදා වැරදි මාර්ගයේ ගියා නම්, ඔබතුමන්ලා දැන් වැරදි මාර්ගයේ නොවෙයි යන්නේ. ඔබතුමන්ලා නිවැරදි මාර්ගයේ යනවා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා එතැන ඉඳන් කිව්වේ, අපි මේ මාර්ගයට ගෙනයන්න අවශ්‍යයි කියන එක. මීට පෙර ආණ්ඩුවල තිබුණු ගෙවල් ප්‍රමාණය අඩුවෙලා, කාර් අඩු කරලා, ජනාධිපති පඩි-නඩි නැති කරලා, පිට රට ගමන් නැති කරලා තිබෙනවා. දැන් backup vehicles නැහැ, advisersලා නැහැ. ඒ ඔක්කොම අත උඩ තබාගෙන මීට පෙර පැවැති ආණ්ඩු මීට වඩා ලාභයක් ඉපැයුවා නම්, ඇයි දැන් ඔබතුමන්ලාට ලැබෙන ලාභය අඩුවෙලා තිබෙන්නේ? ඒ සම්බන්ධයෙන් ගත්තාම, 2025 වර්ෂයේ පුනරාවර්තන වියදම සියයට 7කින් වැඩිවෙලා තිබෙනවා. එහෙනම් මොකක්ද මේ කියන සූත්‍රය? මේ අවස්ථාවේදී අපි කියන්න ඕනෑ, ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුව දේශපාලන වේදිකාවක් කරගන්න එපා කියලා.

ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය සම්බන්ධයෙන් අපි එදා කිව්වා, බිලියන 20කින් මේ ප්‍රශ්නය විසඳන්න බැහැයි කියලා. අපි එදා එහෙම කිව්වේ කුහකකමකින් නොවෙයි. ප්‍රායෝගිකව අපි දැකලා තිබෙනවා ඒක කරන්න බැරි බව. අපට අවශ්‍ය වන්නේ මේක වාණිජකරණය කරන එක. හොඳ අහස් යානා company එකක් එක්ක එකතු කිරීම තමයි අවශ්‍ය වන්නේ. Petty cash එක්ක මේ වාගේ අහස් යානා දුවන්න බැහැ. සමහර වෙලාවට opportunity cost එකක් තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. නමුත්, ඒකෙන් රටට උපයන ආදායම ගත්තාම, අපි බලන්න අවශ්‍ය වෙනවා මේකෙන් රටට කොතරම් වාසිදායක තත්ත්වයක් ඇති වෙනවාද කියලා. මේ ආයතනය 2023-2024 වර්ෂයේ රුපියල් මිලියන 2,970ක ලාභයක් ලබා තිබුණා. නමුත්, 2024-2025 වර්ෂයේ මිලියන 7,950ක අලාභයක් ලබා තිබෙනවා. එහෙනම් ඔබතුමන්ලාගේ මේ හොරු නැති ආණ්ඩුව පත් කළාට පසුව මේ ආයතනය අලාභ ලබන්නේ කොහොමද? එතකොට පසුගිය අවුරුදු 76ට බැණලා, බොරුවට ඒ බැණපු එක තුළ අන්තිමට සාක්ෂාත් වන්නේ, ඔබතුමන්ලා මේක දේශපාලනීකරණය කළ එක විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ ණයකරණය ගත්තාම, 2024 සැප්තැම්බර් මාසයේ සම්පූර්ණ ණය ප්‍රමාණය ට්‍රිලියන 28යි. ඒ ට්‍රිලියන 28 දැන් ට්‍රිලියන 33ක් වෙලා තිබෙනවා. මේ තුළ විදේශ ණය US Dollars 32.5 billion තිබෙනවා. දැන් මේක 37කට වැඩි වෙලා තිබෙනවා. අපි දන්නවා, මේ වැඩිවීම පාවිච්චි කරලා තිබෙන්නේ නිවැරදි මාර්ගයකට බව. හැබැයි, අපි ගන්නකොට ඒක ප්‍රශ්නයක් වෙලා, ඔබතුමන්ලා වැඩි කරනකොට ඒක සංවර්ධනයට යොමු වෙනවා කියලා කියන එක හරිද? මට අවශ්‍ය වන්නේ මේකේ යථා තත්ත්වය පෙන්වා දෙන්නයි. මේක තමයි අවශ්‍ය වන්නේ. මේ රට හදනවා කියන එක ලෙහෙසි දෙයක් නොවෙයි. අපි මේ පුටුවල ඉඳගෙන ඉන්න නිසා දන්නවා. වසන්ත සමරසිංහ මැතිතුමා වෙළඳ අමාත්‍යාංශය භාරගත් පළමු මාසයේම අපි කිව්වේ මොකක්ද? උපරිම මිල දමන්න එපා, තරගකාරී තත්ත්වයක් ඇති වෙන්න දෙන්න, නැත්නම් ඔබේ අද තිබෙන සිනාසෙන මුහුණ හෙට වෙනකොට ඇඬෙන තත්ත්වයකට පත් වෙනවා කියලා කිව්වා. මොකද, කෙළෙහි ගුණයක් නැති දේවල් තමයි වන්නේ. අපි එදා එහෙම කිව්වා නේද? අන්න ඒ වාගේ ගෙනයනවා නම් ඔය ප්‍රශ්න ඇති වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී reserves අඩු වෙලා තිබෙනවා. මේ රටේ සල්ලි අතිරික්තයක් තිබෙනවා ලු. මේ රටේ ඩොලර් 4,500 යනකල් වැඩි වෙලා තිබෙනවා ලු. මම quote කරනවා, 2025 නොවැම්බර් මස 11වැනි දා "The Morning" newspaper එක. එහි කියනවා,

> "SL's reserves dip in Oct."

Now, if you have a surplus in foreign exchange, you cannot have your reserves dropping. When the Hon. Ranil Wickremesinghe left office, there was US Dollars 6,485 million by 25th September last year in reserves. After 13 months, now it has come down to US Dollars 6,220 million. So, there cannot be a drop. That is why, Hon. Minister, with all respect, I want your Government to realize that the independent Central Bank is not the problem, but the cause of your problem.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

So, they are spending dollars and earning rupees.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

That is right, absolutely. The Hon. Mano Ganesan knows that because his community helps and contribute to earn dollars through the tea industry. Owing to having discussions with the IMF and going ahead with the IMF Programme, the Hon. Ranil Wickremesinghe sacrificed his political career for the development of the country and we thank him for that. On the other side, you are only looking at the rupee increase. But, what about the dollar increase? In April, 2028, we have got to pay roughly an US Dollars 3,259 million. For that, we must have foreign exchange coming in. The IMF is not bothered about foreign exchange. They only want to perpetuate poverty in this country. I am a person who has been dead against that. You would require them, but you only require their prescription and we must do our own diagnosis and what is good for the country.

[ගරු රවි කරුණානායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැයෙන් ඉලක්ක කළ යුතු වන්නේ මේ රටේ ආර්ථික ස්ථාවරභාවය ඇති කරන්නේ කොහොමද කියලායි. මේ කියන ස්ථාවරභාවය - stability එක - අවශ්‍යයි. IMF එක ඉලක්ක කරනවා, එය සපුරන්න පුළුවන් විධියකට අපේ fiscal - *[Interruption.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ. You have only two more minutes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ, මට මිනිත්තු 25ක් තිබෙනවා. අපි ඔබතුමා ඔතැනට එව්වේ අඩු ගණනේ ඒකෙන් අපට වාසියක් ලබා ගන්න පුළුවන් කියලායි. ඒ පැත්තෙන්ම දැම්මා නම් විපක්ෂයේ අපට වැඩි වාසි එනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Out of the 17 minutes alloted to you, you now have only two minutes left. - *[Interruption.]*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අන්න, වසන්ත සමරසිංහ ඇමතිතුමා කියනවා, එතුමාගෙන් මිනිත්තු 10ක් දෙනවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඇමතිතුමා දෙනවා නම්, වෙලාව දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආණ්ඩුවට බැරි ඒවා අපි කියලා දෙන්න හදනවා. මොකද, අපට කුහකකමක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇමතිතුමා, අහගන්න මේ කියලා දෙන ඒවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
කියලා දෙන ඒවා මම පස්සේ අහගන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපනයන වර්ධනය - export growth, ආයෝජනය වැඩි කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම, සාධාරණත්වය - equity, අධ්‍යාපනය දියුණු කිරීම, සෞඛ්‍ය ප්‍රවර්ධනය, දුප්පත්කම නැති කිරීම ආදිය කළ යුතුයි. ඒ වාගේම vulnerability - ඒ කියන්නේ, පීඩනය එල්ල වන විශේෂ අය ගැන බලන්නත් ඕනෑ. *[බාධා කිරීමක්]* ඒවා කිරීම තමයි ආර්ථිකයක් හදනවා කියන්නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ආවේ නිර්ධන පන්තිය නියෝජනය කරන පක්ෂයක් ලෙසයි. එහෙම තමයි පෙන්නුවේ. නමුත් අද සිද්ධ වෙන්නේ ඒකට සම්පූර්ණයෙන්ම වෙනත් පැත්තකට යෑමකුයි. අද සියයට 30ක ජනතාවට කුඩා වෙළෙඳ සැලකට හරි සුපර්මාර්කට් එකකට හරි යන්න පුළුවන් ආර්ථිකයක් හදලා දෙන්න. කොළඹ කොටස් වෙළෙඳ පොළේ සියලු කොටස් මිල දර්ශකය අද ඒකක 23,500 සීමාව පසු කළා කියනවා. ඒක නොවෙයි, රටේ ආර්ථික සංවර්ධනය. ඒ සියයට එක කියන්නේ, මේ රටේ ලාභ උපයන, නමුත් ඒකෙන් tax ගෙවන්නේ නැති කොටසක්. නමුත් අර කියපු සියයට 30 කියන්නේ ඔබතුමන්ලාට ඡන්ද දුන් පිරිසයි; ඔබතුමන්ලා අපෙන් ගත්තු ඡන්ද ප්‍රමාණයයි. ඒ අය දියුණු කිරීමෙන් තමයි වෙනස ඇති වන්නේ. ඒ වාගේම, ජීවන වියදම ගැන වචනයක්වත් කථා කරපු නැති අය වැයක්, මේක. ජීවන වියදම අඩු වන මාර්ග මොනවාද? අපි 2015 අය වැය ගෙනෙන කොට භාණ්ඩ 15ක මිල අවුරුදු 4කට, 5කට අඩු කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් පෙන්නුවා.

මේ අය වැයෙන් තරුණ අයට රක්ෂා ඇති කරන මාර්ගයක් කිසිසේත් පෙන්නලා නැහැ. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට තමාගේ ආයෝජනයට සියයට 15ක, 16ක විතර පොලී අනුපාතයක් ගෙවන්න එදා පුළුවන් වුණා. 2018දී සියයට 10ක්ව තිබුණු දුප්පත්කම දැන් සියයට 25කට වැඩි වෙලා තිබෙනවා. ඔබතුමන්ලා සඳහන් කර තිබෙනවා, රජයේ සේවකයන්ට නිවාස හා දේපළ ණය ලබා දෙන්න රුපියල් මිලියන 500ක් වෙන් කරනවා කියලා. රාජ්‍ය සේවයේ ලක්ෂ 16ක පමණ පිරිසක් ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තව මිනිත්තු 2ක් ගන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 17 ඉවර වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
රාජ්‍ය සේවයේ ලක්ෂ 16ක පිරිසක් ඉන්නවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පැහැදිලි කළා, පත්තරයක තිබුණා කියලා,- *[බාධා කිරීමක්]* මොකක්ද ඒ පත්තරය?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්. මේ තිබෙන්නේ ඒක. ඕනෑ නම් ඔබතුමාට මේක බලන්න පුළුවන්. "The Morning" newspaper of 11th November, 2025. එකේ මෙසේ සඳහන් වනවා:

> "SL's reserves dip in Oct."

ඔබතුමාට මම මේක දෙන්නම්.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
"The Morning"?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේක නිවැරැදි එකක්. බොරු නොවෙයි.

රජයේ සේවකයින්ට නිවාස හා දේපළ ණය ලබා දෙන්න වෙන් කරපු ඒ රුපියල් මිලියන 500ක මුදල 750,000න් බෙදුවොත් 665දෙනෙකුට විතරයි ණය දෙන්න පුළුවන් වෙන්නේ; ලක්ෂ 16න් බෙදුවොත් 312දෙනාටයි ණය දෙන්න පුළුවන් වෙන්නේ. රුපියල් 250,000ක් බැගින් දුන්නොත් 2,000ක පිරිසකට තමයි දෙන්න පුළුවන් වෙන්නේ. ණය ලබා දෙනවා කිව්වාට එහෙම දෙන්න අමාරුයි.

ඒ වාගේම, ලක්ෂ 10කට ගෙයක් හදන බවක් කියනවා. නමුත්, වර්ග අඩි 500ක් තිබුණොත්, අඩු ගණනේ වර්ග අඩියකට 4,000ක්වත් යනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා,-

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා එතුමාට ආණ්ඩු පක්ෂයෙන් වෙලාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, වෙලාව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාට නියමිත වෙලාවත් ඉවරයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, මට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා ඕනෑ වෙලාවක් එතුමාට දෙන්න. මම ඒකට උත්තර දෙන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන්නේ- *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි මම එතැනට එන්නම්. මට අවශ්‍ය වන්නේ monopoly එක කඩන්න. සිමෙන්ති, යකඩ, ටයිල්, ඇලුමිනියම්, bathware ආදියට තිබෙන monopoly එක කැඩුවොත්, මිල සියයට 65ක් අඩු වෙනවා. *[බාධා කිරීමක්]* යකඩවල,- *[බාධා කිරීමක්]* අද ඉන්දියාවේ, තායිලන්තයේ, මැලේසියාවේ නිෂ්පාදනය කරන ඒවාට වඩා- *[බාධා කිරීමක්]* මේ රටේ ඒකාධිකාරයක් තිබෙන නිසා, monopolistic trade එකක් තිබෙන නිසා මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. කාලය අවසානයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, just give me one more minute, please.

දැන් බලන්න, ප්‍රසන්න රණතුංග මහත්මයා සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා කියලා එයාව අත්අඩංගුවට අරගෙන තිබුණා. නමුත්, SriLankan Airlines එක embarkation levies විධියට රුපියල් බිලියන 27.5ක් ගෙවන්න තිබෙනවා.

ඒ සල්ලි තමයි සොයාගන්න තිබෙන්නේ. රජය සංචාරකයන් ගෙනැල්ලා තිබෙනවා. හැබැයි SriLankan Airlines, FitsAir, AirAsia, Aeroflot සහ Air India embarkation levies ගෙවලා නැහැ Civil Aviation Authority එකට. මේවා තමයි සල්ලි එකතු කරන්න තිබෙන මාර්ග.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඊළඟට, University Grants Commission එක කියන කාරණය බලන්න. ඔබතුමන්ලා අධ්‍යාපනය දියුණු කිරීම ගැන කියනවා. ජනාධිපතිතුමා, අගමැතිතුමිය ඇතුළු ආණ්ඩුව කියනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න හදන බව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි. කථාව අවසන් කරන්න. දැනටමත් ඔබතුමාට විනාඩි 20ක් ගිහින් තිබෙනවා. ඔබතුමාට විනාඩි 3ක් වැඩිපුරත් දීලා තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I know there is a problem with time.

මට ලැබුණා University Grants Commission එකෙන් විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්ට 2024 දෙසැම්බර් 03වැනි දා යවපු ලියුමක්. ඒකේ තිබෙන්නේ මොකක්ද? අවුරුදු 5කට විශ්වවිද්‍යාලවලට අමතර මුදල් ශත පහක්වත් වැඩි කරන්න එපා, ප්‍රතිපත්තිය අවුරුදු 5කට වෙනස් කරන්න එපා කියලා කියා තිබෙනවා. ඒ ලියුම මෙතැන තිබෙනවා. මම කියන්නේ මේකයි. අපි කැමැතියි අධ්‍යාපනය දියුණු කරනවාට. එය අත්‍යවශ්‍ය දෙයක්. ඒ වාගේම තමයි, ධවල පත්‍රිකාව ගෙනෙන කොට විරුද්ධ වුණු ඔබතුමන්ලා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙන එන එක ගැන අපට සතුටුයි. රජයේ සේවයේ රක්ෂා ලබා දීම කරන්න අවශ්‍ය වන්නේ විභාගයකින් බවත් කිව්වා. අපි ඒක අගය කරනවා.

එදා අධිවේගී මාර්ගය හදන්න යද්දී ගහක් බදාගෙන නටපු දේවානි ගැන මතකද? ඒකෙන් මොකක්ද වුණේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. කාලය අවසානයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එදා ඒක හැදුවා නම් යන වියදම රුපියල් බිලියන 158ක් පමණ වනවා; අද එය හදන්න රුපියල් බිලියන 357ක් පමණ වැය වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඊ.එම්. බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට පිළිතුරු දෙන්න ආණ්ඩු පක්ෂයේ වෙලාවෙන් මම විනාඩියක් ගන්නවා.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මතු කරපු කරුණු දෙකක් පිළිබඳව නිවැරැදි කිරීමක් කරන්න ඕනෑ. එතුමා කරුණු ඉදිරිපත් කරද්දී කිව්වා, Foreign Exchange Reserves US Dollars 4.2 billion දක්වා අඩු වෙලා කියලා. ඒක නිවැරැදි නැහැ. Foreign Exchange Reserves තිබෙනවා, US Dollars 6.3 billion. "The Morning" පත්තරේ තිබුණු එකක් පිළිබඳව අපට වග කියන්න බැහැ. ඒක කියන්න ඕනෑ,-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකේ තිබුණේ, "SL's reserves dip in Oct " කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඊ.එම්. බස්නායක මන්ත්‍රීතුමා, ඔබතුමා කථාව ආරම්භ කරන්න.

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා,

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එය මා කියවන්නම්. Central Bank එකෙන් කියන්නේ. මම ඒක quote කරන්නම්. "The Morning" newspaper of 11th November, 2025 states, I quote:

> "Sri Lanka's official reserve assets recorded a marginal dip in October, compared to the previous month's recorded reserves, data from the Central Bank of Sri Lanka (CBSL) shows.
>
> The gross official reserves were provisionally estimated at $ 6,216 million as at end October."

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔය කාරණය විවාදයක් කර ගන්න එපා. විපක්ෂය පැත්තෙන් කථා කරන්න තවත් කථිකයෝ තුන්දෙනෙක් ඉන්නවා.

ගරු ඊ.එම්. බස්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.27]

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය අපූරු අය වැයක්; ඒ වාගේම, මහා ශක්තිමත් සහ පූර්ණ අය වැයක්. අප මේ අය වැය දිහා බැලුවොත් පෙනෙනවා, අපේ රටේ ඉන්න සියලු ජන වර්ග මේකට හවුල් කරගෙන තිබෙන බව. ඒ වාගේම සියලු ජන වර්ගවලට මේකේ ප්‍රතිලාභ යනවා. මෙය සෑම ජන කණ්ඩායමක්ම, සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය කළ, ආරක්ෂා කළ අය වැයක්; සතා සිවුපාවා, පරිසරය ආදි සියල්ල ආවරණය කළ අය වැයක්. නමුත්, මේ අය වැය ගැන අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් කථා කරන කොට, මෙහි පිටු ගණන ගැන කථා කරනවා; මේකේ මුකුත් නැහැ කියලා කියනවා. ඔව්. මේ පිටු 57 ඇතුළේ සඳහන් කරලා තිබෙන ඉස්පිල්ලක්, පාපිල්ලක්, හැම අකුරක්, හැම වචනයක් වාගේම, සඳහන් කරලා තිබෙන හැම ඉලක්කමක් පිළිබඳවම හොඳ අධ්‍යයනයකින්, හොඳ පරිචයකින් තමයි අපේ ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා ඉදිරිපත් කරලා තිබෙන්නේ. මෙම අය වැයේ සඳහන් වෙලා තිබෙන සියලු කරුණු කාරණා සහ දත්තවලට අපි ආණ්ඩුවක් හැටියට වග කියනවා.

මේ අය වැය ඉදිරිපත් කළාට පසුව අපි දැක්කා, විපක්ෂයේ ඉන්න යම්කිසි ප්‍රමාණයක් තුෂ්ණීම්භූත වෙලා හිටපු හැටි. ඒ අය කලබල වුණා, භය වුණා. අය වැය ගැන නොතේරුණු කණ්ඩායමක් මෙහිදී නිදාගත්තා. හැබැයි, නිදා ගත්තු අයයි, නොතේරුණු අයයි දැන් අය වැය විවාදයට ඇවිල්ලා නන් දොඩවනවා; විකාර කියවනවා. එම නිසා අපි කියනවා, මෙම අය වැය වාර්තාව විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියලාට නැවත නැවතත් කියවන්න සහ තේරුම් ගන්න කියලා. අපි ඔබතුමන්ලාගෙන් කරන ඉල්ලීම ඒකයි.

මෙම අය වැය මේ මාසයේ 07වැනි දා ඉදිරිපත් කරන කොට රටේ කොහොම තත්ත්වයක්ද තිබුණේ? එහෙම නැත්නම්, 2024 සැප්තැම්බර් 21වන දා අපි මේ රටේ බලය ගන්න කොට, අපට මේ රටේ ජනතාව බලය දෙන කොට මේ රටේ තිබුණු තත්ත්වය මොකක්ද? අද තත්ත්වය මොකක්ද? 2024 සැප්තැම්බර් 21වන දා වනකොට අපේ රට දේශපාලන වශයෙන් අස්ථාවර වෙලායි තිබුණේ; ආර්ථිකය විනාශ කරලායි තිබුණේ, සමාජය කඩා වට්ටලායි තිබුණේ.

හැබැයි, අපි පසුගිය 7වෙනි දා අපේ පූර්ණ අය වැය ඉදිරිපත් කරනකොට රටේ දේශපාලනය ශක්තිමත් වෙලා, ජනතාවගේ ආශිර්වාදය ඇවිල්ලා ජනතාව ඒක පිළිගනිමින් ඉන්නවා. ජනතාවාදී පාලකයෝ 159දෙනෙක් මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්නවා. අන්න ඒකත් එක්ක දේශපාලනය ශක්තිමත් වෙලා තිබෙන්නේ. ඒක තේරුම් අරගන්න.

ආර්ථිකය කොහොමද තිබුණේ? අපේ රටේ ආර්ථිකය කඩා වට්ටලා තිබුණේ, බිඳ වට්ටලා තිබුණේ, විනාශ කරලා තිබුණේ. හැබැයි අද මොකක්ද කියන්නේ? අද ලෝක බැංකුව කියනවා, ලෝකයේ ණය දෙන ආයතන කියනවා, අපේ රටේ මහ බැංකුවේ අධිපතිතුමා කියනවා, ආර්ථික විශේෂඥයෝ කියනවා ලංකාවේ ආර්ථිකය ශක්තිමත් වෙමින් තිබෙන්නේ කියලා. ඒක පැහැදිලි වෙනවා දැන් අපේ රටේ රුපියල් ට්‍රිලියනයකට වැඩි මුදලක් වියදම් කරන්න ඉතිරි වෙලා තිබෙන එකෙන්ම. අපි ඒක තියාගෙන, බැංකුවේ දාගෙන ඉන්නේ නැහැ. අපි ඒක ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් වියදම් කරනවා. වියදම් කරන්න තමයි සල්ලි ඉතුරු කළේ, එකතු කළේ. ඔබතුමන්ලා මේක කඩාවට්ටලා විනාශ කරලා තිබුණේ. ඒ වාගේම ඩොලරයට සාපේක්ෂව රුපියල ශක්තිමත් වෙනවා. ඒක කවුරුත් පිළිගන්නවා.

ඒ වාගේම සමාජය ශක්තිමත් වෙමින් තිබෙන්නේ, සමාජයේ වටිනාකම් හැදෙමින් තිබෙන්නේ. ඒක කොහොමද වුණේ? මේ රටේ නීතියේ ආධිපත්‍යය කාටත් සමාන ලෙස ක්‍රියාත්මක වෙනවා. ඒක සමාජය පිළිගන්නවා. ඒ හින්දා සමාජයේ, මේ රටේ පුරවැසියෝ අපේ ආණ්ඩුවට, එහෙම නැත්නම් මේ ආණ්ඩුවට ආශිර්වාද කරනවා.

විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට අපි කියනවා මොනවා කරන්නද කියලා. අවුරුදු ගාණක්, කාලයක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ විධියට දෙපැත්තට බෙදිලා, එකම සංවාදය කර කර ඉඳලා එතුමන්ලාට මොකක්දෝ වෙලා තිබෙනවා. ඒකට මම පොඩි කථාවක් මෙහෙම කියන්නම්. අපි හාල් ටිකක් බත් එකක් කර ගන්න නම්, හරියට වතුර ටික දාලා, ළිපේ තියලා, හරියට සමානව මුට්ටියට ගින්දර ටික වදින්න දැම්මේ නැත්නම් ඒ බත් ටික ඇටකුණා වෙනවා. ඇටකුණා වුණාම ආයේ ඒක හදන්න බැහැ, ඒක බත් බවට පත් කරන්නත් බැහැ, හාල් බවට පත් කරන්නත් බැහැ. ඉතින් මේ පොදු විපක්ෂය, සජබය, පොහොට්ටුව, එක්සත් ජාතික පක්ෂය ඇතුළු විපක්ෂයේ සියලු මන්ත්‍රීවරු ඇටකුණා වෙලා ඉන්නේ. දැන් ඒගොල්ලන්ට තේරෙන්නේ නැහැ, තේරුම් ගන්නත් බැහැ. ඒක නිසා කරන්න දෙයක් නැහැ. ඒ අයගෙන් ඊට වැඩිය දෙයක් බලාපොරොත්තු වෙන්න බැහැ. ඒගොල්ලන් ලෝකයේ ජීවත් වන අමුතුම සත්ව කොට්ඨාසයක් බවට පත් වෙලා, තව ටික කාලයකින් විනාශ වෙලා පොසිල බවට පත් වෙනවා. වෙන මොකක්වත් වෙන්නේ නැහැ, පොසිල බවට පත් වෙනවා. අපට ඒකට කරන්න දෙයක් නැහැ, අනුකම්පා කරනවා හැර වෙන කරන්න දෙයක් අපට නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
ඉතින්, මොකක්වත් කියන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා මම කියන්න ආව දේවල් ගොඩක් නතර කරලා කාරණා දෙකක් කියන්නම්. මේ පාර්ලිමේන්තුවේ අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා එළියේ බොරු කිව්වා ඡන්දයට කලින්. දැන් මෙතැන ඇවිල්ලා බොරු කියනවා. හැබැයි මේ වාගේම තව team එකක් එළියේ බොරු කියනවා. මට කියපු බොරුවක් ගැන මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, නිවැරදි කරන්න. එළියේ කථාවක් යනවා, මේ දවස්වල තෙල්දෙණිය ආසනයේ නකල්ස් ලෝක උරුම වනාන්තරය ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමාත්, මමත් දෙන්නා එකතුවෙලා විනාශ කරනවා කියලා. පරිසරවේදී මහත්තයෙක් ඒක කියන්නේ. අපි ඒ පරිසරවේදී මහත්තයාට කියනවා පොදු විපක්ෂය වාගේ පට්ටපල් බොරු කියන්න එපා කියලා. අට්ටාලවෙට්ටුව - Corbett's Gap - දක්වා යන පාර කාපට් කරනවා කියලා පසුගිය සති දෙක තුන තුළ social mediaවල ලොකුවට ගියා. පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉන්න කිහිපදෙනෙකුත් ඒක share කරලා තිබුණා. ඒකයි මම මේක පාර්ලිමේන්තුවේ කියන්න තීන්දු කළේ. අර පරිසරවේදී මහත්මයාටත්, මේ සම්බන්ධව තොරතුරු සපයපු අයටත් මම කියනවා, -තෙල්දෙණිය කියන්නේ මම බලන ආසනය- මාත් එක්ක තෙල්දෙණියට එන්න කියලා මේක බලන්න.

මම තව එක කථාවක් කියන්න ඕනෑ, වතු සම්බන්ධව. මම අහනවා විපක්ෂයේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලාගෙන්, මලෙයහම් ජනතාවට ඡන්ද අයිතිය දීපු දවසේ ඉඳලා කාටද ඡන්දය දුන්නේ කියලා? ඔබතුමන්ලාටයි ඡන්දය දුන්නේ. අවුරුදු 200කට පෙර ලයින්වල එක කාමරයකට එක පවුලක් ලෙස ආව අය, අද පවුල් 3ක් 4ක් එක කාමරයක මාර දුකක් විඳිනවා. ඒ අයට බඩට කන්න නැහැ, අඳින්න ඇඳුමක් නැහැ, හිසට සෙවණක් නැහැ, ජීවිතයක් නැහැ. එදා හදලා දීපු එක පොදු වැසිකිළිය අදත් තිබෙන්නේ. එක ටැප් එකයි තිබෙන්නේ. ලජ්ජා හිතෙන්නේ නැද්ද ඒ අයට රුපියල් 200ක් දෙනකොට විරුද්ධ වෙන්න? ඒකට විරුද්ධව නඩු දාන්න යන්නේ? නඩු දාන්න යන්න ලජ්ජා හිතෙන්න ඕනෑ.

ඒ මිනිස්සුන්ගේ ජීවිත, ජීවිත නොවේද? ඒ මිනිස්සුන්ගේ ඡන්ද විතරද ඔබතුමන්ලාට වටින්නේ? ඒ නිසා අපි ආණ්ඩුවක් හැටියට වගකීමෙන් කියනවා, ඔය රුපියල් 200 විතරක් දීලා, එහෙම නැත්නම් රුපියල් 1,750ක් දක්වා පඩිය වැඩි කරලා විතරක් අපි නතර කරන්නේ නැහැ කියලා. අපි ඔවුන් ලයිම් කාමරවලින් එළියට ගන්නවා. පර්චස් 10ක් දෙනවා. ගෙවල් ටිකත් හදලා දෙනවා. ඒ වාගේම ඔබතුමන්ලාගේ ග්‍රහණයෙනුත් මුදා ගන්නවා. ඔබතුමන්ලාගේ අත්අඩංගුවෙනුත් මුදා ගන්නවා, ඔබතුමන්ලාගේ සිරභාරයෙනුත් මුදා ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
මට තව පොඩි අවස්ථාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම මේ කවිය කියලා කථාව අවසන් කරනවා. මේ, පසුගිය දවස්වල මම දැක්ක කවියක්.

"වදයක් වෙයන් මගෙ රට කන පරයන්ට
හෙණයක් වෙයන් මව්බිම කෙළෙසන උන්ට
සවියක් වෙයන් දුක් විඳිනා මිනිසුන්ට
එළියක් වෙයන් හෙට උපදින දරුවන්ට"

[ගරු ඊ.එම්. බස්නායක මහතා]

අපි ඉදිරිපත් කරපු, ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැය කථාව මේ සරල කවිය ඇතුළේ තිබෙනවා. මේක තේරුම් ගන්න, ගරු මන්ත්‍රීවරුනි. මේ කවියෙන් කියන්නේ මොකක්ද? අවුරුදු 76ක ඔබතුමන්ලාගේ පාලන කාලය මේ කවිය ඇතුළේ තිබෙනවා. අපේ එක අවුරුද්ද ඇතුළේ අපි අරගෙන ආපු රටේ ආර්ථිකය, රටේ ජන ජීවිතය, අනාගත බලාපොරොත්තුව මේ කවිය ඇතුළේ තිබෙනවා. මේක තේරුම් ගන්න බැහැ, ඇටකුණා වෙලා තිබෙන්නේ. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[4.37 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Presiding Member, I wish to commence by making some comments with regard to certain remarks made yesterday. Sir, the Hon. Ramalingam Chandrasekar, Minister of Fisheries, Aquatic and Ocean Resources, yesterday spoke very eloquently about the Government's policy on dealing with drugs. The war against drugs is something that we, as a party, will fully support because the Northern and the Eastern Provinces are the worst affected by that menace. In the course of his comments, I interjected with his permission and mentioned that unless the Government deals with the involvement of the military in the spreading of drugs, this matter cannot be dealt with in the North and the East. It is an unfortunate hangover from the war years. As we know, Sir, during the war, the military establishment had a counter-insurgency strategy, and that strategy, unfortunately, involved the spread of drugs in the North and the East so that the youth did not go and join the LTTE. Similarly, there were other vices that were systematically spread. But, now, the war is over and it has been 17 years since then and we have consistently been asking the consecutive governments which had governed since the end of the war to deal with that counter-insurgency strategy because for as long as the military remains in the North and the East in the way that they do and still have that same mindset, then dealing with issues such as drugs - the war against drugs - would be an utter failure.

Now, when I made those comments, the Hon. Minister of Fisheries, Aquatic and Ocean Resources stood up and agreed with me. He would agree with that because he has been living in Jaffna for the last 15 or16 years, representing the JVP. He cannot say that what I said is a lie because then, he cannot go to Jaffna. You understand? So, naturally, the Hon. Minister, in a responsible way, agreed. But, to my surprise, the Hon. Deputy Minister of Defence, who is here - I started my comments today with this issue because he is here - stood up and denied it; when his speech came up soon after, he denied it saying that the military is very pure and that Gajendrakumar Ponnambalam must produce the evidence. Sir, I can tell you with utmost responsibility that when the people affected go to the police station to make complaints against the military, the police refuse to accept those statements. When these matters have been brought up every month in the District Coordinating Committee - not only during this Government's time, but even during the previous governments' time; not only during the times of Ranil Wickremesinghe or Gotabaya Rajapaksa, but even before that during Mahinda Rajapaksa's time - even the Chairmen of the DCC , who have always been from the government, agreed that the military is involved. But, here, the Deputy Minister of Defence a Government which calls for a system change standing up and completely denying it is completely unacceptable! I can tell you with utmost responsibility that the military has a presence in that. Sir, in the Vanni, the ratio of the presence of the military is 1:2, for every two citizens, you have one military personnel. Do you mean to tell me that without the military's knowledge the drug menace could happen? Do you mean to say that? Whom are you trying to fool? In Jaffna, that ratio is 1:14 - that is the official figure and with the military intelligence, we know that it is much higher - and do you mean to say that without your knowledge this could happen? So, please do not fool us! Sir, I do not want to make personal comments against the Deputy Minister of Defence.

We know that when he was in charge of the Eastern Province and when two police officers were killed at the Vavunativu checkpoint, the LTTE was accused. They tried to make out that it was former LTTE cadres who were trying to recreate the LTTE, which was an utter lie and he was the Commander of the Eastern Province at that time. Sir, I do not want to cast personal aspersions, but I am saying this with utmost responsibility.

This Government has our best wishes, this Government will have our entire support against the war on drugs and all other vices. But, I am telling you again, in the North and the East, without you dealing with the military's involvement in that, you will never get rid of that menace. And, I can tell you again, it is those retired military officers who are now involved in this strained drug menace in the South because you all did not deal with it in the last 17 years. It is now a menace even in the South. So, for God's sake, please make sure that Deputy Ministers of Defence do not whitewash what is essentially a cancer that started in the North and the East and is now spreading all over the country.

Sir, I read through the entire Budget Speech. I am not a fast reader. President Anura Kumara Dissanayake might have taken four-and-a half hours for that, but I took about six to seven hours reading his entire Speech. Then, I went through all the supporting documents also. This Budget unlike the previous one, which was the NPP's first Budget, does not say anything about the North and the East. At least in the first Budget, there was some tokenism about roads for the Northern Province. Rs. 5 billion was allocated in the first Budget for new roads and that was made out to be a huge amount of money that had been allocated for the Northern Province. Sir, the

Northern Province has five districts and that comes to about Rs.1 billion per district. So, I asked the Divisional Secretaries of all those five districts what this Rs. 1 billion for roads amount to in practical terms. They said 20 kilometres of roads per district. So, this is what we are told as being having emphasis for the Northern Province and the Eastern Province. For the Eastern Province, there was nothing! There was just one sentence in the previous Budget: India will take care of the Eastern Province. In the Northern Province, we have the roads. The funniest part is, Jaffna got Rs.1 billion from that Budget and in the previous year under Ranil Wickremesinghe when the economy was even worse, Jaffna had Rs. 1.2 billion! So, actually, we had a Rs. 0.2 billion reduction. So, that is what happened last time.

There was, at least, that tokenism last time. This time, there is not even that, nothing for the North and the East, which was a war zone for almost 35 years; that was a war zone Those people in that 35 years had to face an economic embargo and in 2001 when I first became a Member of Parliament, a litre of petrol in Jaffna was Rs. 2,000! Do you think that for those 35 years when we had an economic embargo, we could have grown our economy? We were systematically pauperized; we were systematically pauperized in the name of fighting the LTTE, but it was the average Tamil-speaking people who were systematically pauperized. Okay, there was a war. Today, there is no war. During the 17 years after the end of the war, has any government chose to identify the fact that the North and the East are different from the rest of the country?

No. But, you cannot expect that from the previous governments. If you go by this present Government's logic, you cannot expect that from the previous governments because the NPP Government says that the previous governments were racist. They governed for the last 76 or 77 years because they were racist, anti-minority, anti-Tamil, anti-Tamil-speaking and they discriminated against the Tamils. So, naturally, you cannot expect those governments, even after the war, to think in terms of, "Look, the North and the East must be looked at separately. We must protect the people's economy in the North and the East, allow it to grow and then, allow it to compete with the rest of the country". You cannot expect the previous governments to do that. But, this Government? Oh, no! This Government is different, is that not so? They came in on a system change; they came in as a leftist party, fundamentally. And, if I remember correctly, the last time I checked, leftism was pro-protectionism, was "pro-", wanting to protect the weakened people, build them up so that, then, they can stand up and compete with the rest. But, that has not happened; in one year, that has not happened.

Instead, what do we have in this Budget? Only two times, something about the North or the East has been mentioned in this Budget, Sir, and that is with regard to the Lower Malwathu Oya Multipurpose Development Project, for which Rs. 5,000 million has been allocated primarily for the development of irrigation, land cultivation and agriculture of the Northern Province, particularly for the Mannar District. Rs. 5,000 million!

Sir, I am saying this with utmost responsibility. That project was identified during the time of Gotabaya Rajapaksa as well. We objected to it, I will tell you very bluntly. Because of the implementation of this project, only 15 Muslim families were going to get affected as when that project is implemented, there are certain lands that would go under water. So, only 15 Muslim families would have got affected. But, the Gotabaya Rajapaksa Government identified 1,500 Sinhala families from the Anuradhapura District and said that they, too, would get affected. I am saying with utmost responsibility, Sir - by going through all the details from the Divisional Secretaries - that those 1,500 families have no effect at all with regard to this project. But, they were going to be relocated into Cheddikulam in Vavuniya South. So, we objected to that saying, "We are not opposed to the Sinhalese people who genuinely want to come to the North and the East, live with the Tamil people, look upon themselves as part and parcel of the Tamil people and integrate with us". We have no problem with that; we have never been against that. But, if it is a programme to systematically try and change the demographic patterns of the Northern and the Eastern Provinces, that is something we oppose to. That is something we will oppose to. Even in the last Budget, there were two projects that were mentioned: the Lower Malwathu Oya Multipurpose Development Project and another project in Batticaloa. The Batticaloa Project has not been mentioned this time, but the Mualwathu Oya Project has been mentioned. That is the one occasion in which it has been mentioned.

The other occasion where the North and the East are mentioned in this Budget is with regard to the development of four airports. Those airports are, Hingurakgoda, Sigiriya, Trincomalee and Jaffna. Sir, Rs. 1,000 million has been allocated for the development of those four airports. Jaffna is supposed to be an international airport and altogether, Rs. 1,000 million has been allocated. What does that mean? Rs. 250 million per airport. You will struggle even to build a luxury house in Colombo with the prices today. Here, we are talking about developing an airport and only Rs. 250 million has been allocated! Whom are you fooling? So, this has to change.

Sir, though, I welcome one thing. The Hon. President, as Minister of Finance, Planning and Economic Development, has pledged to increase the allocation for building 2,500 homes from Rs. 3,850 million to Rs. 5000 million or Rs.5 billion. So, that means it would amount to about Rs. 2 million per house. That is an improvement and something that we welcome. But, it is only 2,500 homes, Sir. India was willing to give 50,000 houses, of which our *Malaiyaha Thamilar* also got some houses. Fifty thousand houses! You should be thinking on those term, as it is a war-affected area, for God's sake! A foreign country is willing to give us 50,000 houses. Here, you are talking about 2,500 houses, as if it is some great help for the Northern Province! So, we must put things in perspective, Sir. It has been too long, 17 years after the war. So, as a Government that claims to change the entire system, the entire perspective, if you are not prepared to

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

see the immense gap between the North and the East and the rest of the country, what you are going to do in effect is, create a situation where those people in the North and the East cannot compete and as a result, are forced to flee the country to eke out an existence. Is that what you want?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Refusing to accept the North and the East as a special status means that you are deliberately perpetuating a situation where those people are forced to leave or flee the country because they just cannot eke out an existence and that, Sir, is certainly no system change. Quite the contrary, it is a perpetuation of the rotten system that the Rajapaksas pursued as a result of their racist policies. So, that has to change, and I am asking this Government to kindly intervene at the highest.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Your time is up, Hon. Member.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am concluding, Sir.

Sri Lanka must integrate with South India. If ever Sri Lanka is to reach its true potential, it has to integrate with South India's economy. But, what are you doing to achieve that? When India is offering to help, are you accepting that? No! You look at everything with suspicion. You are giving only Rs. 250 million to develop the Palali Airport, whereas India had said that they would develop the entire Palaly Airport with their own funds. You are putting blocks to it. The previous Government did that and you are doing the same thing. You had to change the Minister because he was a hurdle to cross. So, you are doing the same thing without one word about willing to accept India's offer to develop Phase II of the Palaly Airport, which is purely to resurface the remaining part of the Palaly Airport enabling aircraft from Singapore, Dubai and places like that to land directly at Palaly. Why can you not do that?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, there is a time constraint with eight other speakers listed to speak.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
So, if you are serious about wanting to change the economy of this country, you have to integrate with South India, and if you are to reintegrate with South India, you must completely change your perspective on how you see the region.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you, Hon. Member.

මීළඟට, ගරු එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
Hon. Presiding Member, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
I thank you, Hon. Presiding Member.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order. නම කියවුණේ නැහැ.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
Please sit down. I kindly request you to sit down. I want to raise a point of Order. - *[Interruption.]*

Sir, the Hon. Gajendrakumar Ponnambalam raised an issue yesterday and I did reject his claim. - *[Interruption.]* Yes, again I vehemently reject the claim you made today; no Tri Force personnel is involved in the spread of drugs.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
You should be impeached! For as long as you -

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

Bring in whatever you want before this House. - [Interruption.] I vehemently reject that the Tri Forces are involved. - *[Interruption.]* You are talking about it in general terms. If you have specific information, please submit. Then, we can get involved. -*[Interruption.]* And also, Hon. Member, you were saying that retired Tri Forces personnel are involved in spreading drugs. -[*Interruption]* No, there is no such thing. I vehemently reject that.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, we do not have time because we have to finish by 6 o'clock. Also, there are eight speakers to speak. කථා කරන්න, නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේග ආණ්ඩුව පසුගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ බලයට පත් වෙනකොට මේ රටේ ආර්ථිකය, - *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ස්ථාවර නියෝග 92(2) යටතේ මේක අහන්නේ. මේ සභාව ඇතුළේ Deputy Minister කෙනෙකුට එරෙහිව අපට Motion එකක් ගේන්න බැරි නම් කොයි ආකාරයෙන්ද මෙතුමා ඇවිල්ලා උත්තර දුන්නේ? *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

*ගරු නියෝජ්‍ය ඇමතිතුමා, කථාව කරගෙන යන්න. [බාධා කිරීම්]*

[අ.භා. 4.57]

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 76 වසරක් පුරා මේ රටේ තිබිච්ච රාජ්‍ය පාලන කාලය ඔස්සේ අඩිතාලම පුපුරා ගිය අයහපත් ආර්ථික තත්ත්වයක් පවතිද්දී තමයි අපේ රජය බලයට පත් වුණේ. *[බාධා කිරීම්]* ඒ වාගේම අපේ ජනතාවගේ ආර්ථික බලාපොරොත්තු, අනාගත බලාපොරොත්තු සුනු විසුනු වෙච්ච අවස්ථාවක තමයි මේ ආණ්ඩුව බලයට පත් වුණේ. එහෙම බලයට පත් වුණු ආණ්ඩුව පසුගිය අවුරුද්ද ඇතුළත මේ රටේ ආර්ථිකය විශාල වශයෙන් ශක්තිමත් කර තිබෙනවා. ඒ වාගේම අපි සංවර්ධන කටයුතු විශාල ප්‍රමාණයක් ආරම්භ කර තිබෙනවා. ඒ සමහර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා අවසන් කර තිබෙනවා වාගේම තවත් විශාල ප්‍රමාණයක් තිබෙනවා, ආරම්භ කරලා දැනට කරගෙන යන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආර්ථික වර්ධන වේගය දැන් අපි සියයට 4.8කට වැඩි කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ තිබුණු ප්‍රධාන ගැටලුවක් තමයි, මධ්‍යම රජයට ගෙවන්න තිබෙන ණය ප්‍රමාණය. දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපේ ණය ප්‍රමාණය 2022දී සියයට 114.2යි. අපි බලාපොරොත්තු වෙනවා, ඒ ණය ප්‍රමාණය 2026 වර්ෂය වනකොට සියයට 96.8ට අඩු කරන්නත්, 2030 වර්ෂය වනකොට සියයට 87කට අඩු කරන්නත්. ඇත්තටම ඒ හරහා රජයේ ආදායමෙන් විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගන්න අපට හැකියාව ලැබෙනවා. අපට පුළුවන් වෙනවා, ඒ ඉතිරි කර ගන්නා ආදායම අපේ සංවර්ධන කටයුතුවලට යොමු කරන්න.

අපි දන්නවා, 2020දී කොවිඩ් වසංගතයේ ආරම්භයත් එක්ක ඇති වුණු වාහන ආනයනය අඩාළ වීම අපේ ආර්ථික අවපාතයත් එක්ක නැවත විවෘත කරන්න බැරි වුණු බව. ඒ හරහා ජනතාවට අවුරුදු 5ක් බලාගෙන ඉන්න වුණා, තමන්ට කැමැති වාහනයක් ගෙන්වා ගන්න. ඔවුන්ට අලුත් වාහනයක යන්න හැකියාවක් නැති වෙලා තිබුණා. නමුත්, අපේ රජය බලයට පත් වෙලා මාස 6ක වාගේ කාලයක් ඇතුළත අපට පුළුවන් වුණා, වාහන ආනයනයට අවකාශය ලබා දෙන්න. අපෙන් ඩොලර් බිලියන 2කට ආසන්න ප්‍රමාණයක් වියදම් කරමින් වාහන ආනයනය කරන්න වුණත් අපේ රජයට පුළුවන් වුණා, ඩොලරයේ අගය විශාල වශයෙන් චලනය නොවී ස්ථාවරව තබා ගන්න. එයම පමණක් රජයේ ස්ථාවරත්වය, මූල්‍ය විනය හොඳට ප්‍රදර්ශනය කරන කාරණයක්.

අපේ විදේශ සංචිත ගැන බැලුවොත්, මහ බැංකුව තුළ ඩොලර් බිලියන 6ක විදේශ සංචිත ප්‍රමාණයක් ආරක්ෂා කර ගන්න අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ තුළින් අපට ණය දෙන විදේශීය සමාගම්වලට පවා සැහෙන බලාපොරොත්තුවක් ඇති කරන, ඒ වාගේම විශ්වාසයක් ඇති වන මට්ටමට අපේ රට ගොඩනහන්න මේ රජය සමත් වෙලා තිබෙනවා. මේ රජය බලයට පත් වනකොට මේ රට තිබුණේ නූල් බෝලයක් වාගේයි. රාජ්‍යකරණය ඉතාම පැටලිලි සහගතව තිබුණේ. හැම අමාත්‍යාංශයකම වාගේ තිබුණා, ආරම්භ කර අතරමඟ නැවතුණු ව්‍යාපෘති. එක්කෝ, ඒ ව්‍යාපෘති හරියට ආරම්භ කරලා නැහැ. එක්කෝ, ප්‍රසම්පාදන කටයුතු සිදු වෙලා නැහැ. ඒ වාගේම ආරම්භ කර තිබෙන සමහර ව්‍යාපෘති යාවත්කාලීන වෙලා තිබුණේ නැහැ, රටට ඔබින විදියට සකස් වෙලා තිබුණේ නැහැ. ඒ ආරම්භ කළ ව්‍යාපෘති තුළත් සැහෙන අකාර්යක්ෂමතා සහ අපැහැදිලිතා තිබුණා. අපේ රජය පත් වුණාට පසු අපට සිදු වුණා, මේ නූල් බෝලය ලිහන්න. අපට සිදු වුණා, රාජ්‍ය යන්ත්‍රණය හරියට ගොඩනහන්න. මොකද, පැවති යන්ත්‍රණය ඒ විදියටම තබාගෙන අපට කවදාවත් මේ රට දියුණු

[ගරු එරංග වීරරත්න මහතා]

කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ හරහා අපට සිද්ධ වුණා, සමහර ව්‍යාපෘති නවීකරණය කරලා රටට අවශ්‍ය විධියට ආපහු ක්‍රියාත්මක කරගෙන යන්න. එහෙම නැත්නම් ප්‍රසම්පාදනය වෙලා නැති දේවල් ප්‍රසම්පාදනය කරන්න සහ ප්‍රසම්පාදනය වෙලා ක්‍රියාත්මක වෙච්ච ව්‍යාපෘතිවල කිසිම ඵලදාවක් නැතිව යන ව්‍යාපෘති නැවතත් සලකා බලා ඒවා නවීකරණය කරලා, රටට වැඩදායක විධියට ආරම්භ කරන්න අපට සිද්ධ වුණා.

ඩිජිටල්කරණය පැත්තෙන් ගත්තොත් අපට පෙනෙනවා, මේ රජය බලයට පත්ව සැහෙන ව්‍යාපෘති ප්‍රමාණයක් සිද්ධ කර තිබෙන බව. උදාහරණයක් විධියට ගත්තොත්, GovPay කියන්නේ රජයේ ආයතනවලට ඩිජිටල් මාධ්‍ය හරහා ගෙවීම් කරන්න තිබෙන ව්‍යාපෘතියක්. මේ ව්‍යාපෘතිය නිසා අපේ ජනතාවට පුළුවන්, රජයේ කාර්යාලයකට යන්නේ නැතිව ඕනෑම තැනක ඉඳගෙන, සති අන්තයක වුණත්, නිවාඩු දවසක වුණත්, රාත්‍රී 12ට වුණත්, ඕනෑම වෙලාවක වුණත් රජයේ සේවාවක් සඳහා ගෙවීමක් කරන්න.

මේ වෙනකොට GovPay සේවාව හරහා රුපියල් බිලියන 1.2ක ප්‍රමාණයකට වඩා ගෙවීම් රජයට ලැබිලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය ආයතන 200කට වැඩි ප්‍රමාණයක් මේ GovPay සේවාවට සම්බන්ධ කරලා තිබෙනවා. එමෙන්ම රාජ්‍ය සේවා 3,130කට අධික ප්‍රමාණයකට ඩිජිටල් මාධ්‍ය හරහා ගෙවීම් කරන්න මේ සේවාව තුළින් අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම අපේ පොලීසියට කිසිම වියදමක් නැතුව මාර්ග නීති කඩ කිරීම්, ස්ථානීය දඩ ගෙවීම් ආදිය මේ GovPay සේවාව හරහා සිදු කරන්න සම්බන්ධතාව ඇති කරලා තිබෙනවා. අපේ ජනතාව අතින් මාර්ග නීති බණ්ඩනයක් වුණොත්, රස්තියාදු නොවී සහ පොලීසියේ මහත්වරුන්ට කරදරයක් නොවී මුදල් ගෙවීමේ හැකියාව ඒ සේවාව හරහා ඇති කරලා තිබෙනවා. රාජ්‍ය සේවය ඩිජිටල්කරණය හරහා කරන ගෙවීම් ඉතා විනිවිදභාවයකින් කරන්නත්, විශ්වාසය ලබා දෙන විධියට සහ නිලධාරිවාදය අවම වෙන විධියට වැඩකටයුතු කරන්නත් මේ සේවාව තුළින් අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
තවම කථාව පටන් ගත්තා විතරයි නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ රජයේ සේවාව සඳහා cyber attacks නැති කරන්න අවශ්‍ය සයිබර් ආරක්ෂණ මධ්‍යස්ථානයක් අපි පිහිටුවා තිබෙනවා. තවද, Lanka Government Cloud පද්ධතිය නවීකරණය කරලා, නවීන තාක්ෂණය ඔස්සේ අපේ රාජ්‍ය සේවාවලට කිසිම අගතියක් නොවන විධියට GovPay පද්ධතිය නවීකරණය කරලා තිබෙනවා. තවද, ජනාධිපති අරමුදලින් මුදල් ලබා ගැනීම, උප්පැන්න සහතික, විවාහ සහතික වාගේ දේවල් පිටරට ඉඳන් ලබා ගැනීමේ හැකියාව මේ තුළින් ඇති වෙනවා. GovTech සමාගම ස්ථාපිත කිරීම වාගේ නව ව්‍යාපෘති හරහා අපේ රට ඩිජිටල්කරණය ඔස්සේ දියුණු මාවතකට ගෙනෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. මේ ඔක්කෝම කළේ අර නූල් බෝලය ලිහන ගමන්. ඒ ක්‍රියාවලියෙන් අපි පසුගිය අවුරුද්ද ඇතුළත ඉතා හොඳ, ස්ථාවර අඩිතාලමක් මේ රටට දාලා තිබෙනවා. ඒ දාපු ස්ථාවර අඩිතාලමේ ඉඳගෙන තමයි අපි මෙවර 2026 අය වැය යෝජනාව මේ ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ යෝජනා බලන, අහන පහළ ස්තරයේ ඉඳන් ඉහළම ස්තරය දක්වා ඉන්න සියලු පුරවැසියන්ට ඔවුන්ගේ ආර්ථිකය දියුණු වෙනවා කියන හැඟීම ඇති වෙනවා.

ඒ වාගේම මේ අය වැය, රටේ ආර්ථිකය ස්ථාවර කරන්න වාගේම, මේ ආර්ථිකය සහ රට දියුණු කරන්න විශාල යෝජනා ප්‍රමාණයක් ගොනු වෙච්ච යෝජනාවක්. මේ හරහා අපි බලාපොරොත්තු වෙනවා, 2030දී අප බලාපොරොත්තු වන සංවර්ධනය කරා ළඟා වෙන්න. හැම ක්ෂේත්‍රයකටම අවශ්‍ය ව්‍යාපෘති විශාල ප්‍රමාණයකට රජයේ මූල්‍ය කළමනාකරණයක් සහ මූල්‍ය විනයක් ඇතිව අවශ්‍ය ප්‍රතිලාභ ලබා දීලා, ඒ ක්‍රියාවලිය ඉතා සාර්ථක කර ගන්නත් අපි බලාපොරොත්තු වනවා.

උදාහරණයක් විධියට එක project එකක් ගැන කිව්වොත්, අපි Starlink සේවාව හඳුන්වා දීලා තිබෙනවා. ඒ වාගේම අපි 5G spectrum එක මේ දෙසැම්බර්වල auction කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ හරහා අපේ ජනතාවට ඩිජිටල්කරණයට ප්‍රවිෂ්ට වීමට අවශ්‍ය යටිතල පහසුකම් ගමට ගෙනිහිල්ලා, ගමේ ඉන්න ඉතා දුප්පත් මනුස්සයාට පවා ඒ සේවා ලබා ගන්න අවශ්‍ය පහසුකම ඇති කරනවා. ඒ වාගේම අධ්‍යාපනය හදාරන ළමයින්ට, දුෂ්කර පළාත්වල ඉන්න නැති බැරි ළමයින්ට ඒ සේවාව සඳහා ප්‍රවිෂ්ට වීමට අපි වවුචර් මාර්ගයෙන් අවස්ථාව ලබා දෙනවා. ඒ නිසා ජනතාවට විශාල වශයෙන් සෙත සලසන අය වැයක් තමයි අපි මේ ගෙනැත් තිබෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, මේ පාර්ලිමේන්තුව හරහා ඒ අය වැය සම්මත කරගෙන ක්‍රියාත්මක කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. M.K.M. Aslam to the Chair?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
Sir, I propose that the Hon. M.K.M. Aslam do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. IMRAN MAHAROOF left the Chair and THE HON. M.K.M. ASLAM took the Chair.*

[අ.භා. 5.07]

**ගරු නන්දන පත්මකුමාර මහතා**
(மாண்புமிகு நந்தன பத்மகுமார)
(The Hon. Nandana Pathmakumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" තේමා කරගත් අපේ ආණ්ඩුවේ දෙවැනි අය වැය පසුගිය දා ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. අපි විශ්වාස කරනවා, මේ අය වැය පාර්ලිමේන්තු ඉතිහාසයේ වෙනසක් ඇති කරපු, පාර්ලිමේන්තු ඉතිහාසයේ හොඳම අය වැය කියලා. ඇයි අපි එහෙම කියන්නේ? අපට එහෙම කියන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ අය වැය නිසා විපක්ෂයේ කලබල වීමත්, විපක්ෂයේ අඬ ඇඬියාවත්, මෙහි තිබෙන සාධනීය තත්ත්වයත් නිසා අපට කියන්න පුළුවන් මේ අය වැය පාර්ලිමේන්තු ඉතිහාසයේ ඉදිරිපත් කරපු විශිෂ්ටම අය වැයක් කියලා.

ඒ විතරක් නොවෙයි. අපි දැක්කා, Fitch Ratings ආයතනය සඳහන් කරලා තිබෙනවා, "අනුර ජනාධිපතිතුමාගේ අය වැය ශ්‍රී ලංකාව මූල්‍ය ඒකාග්‍රතාව කරා රැගෙන යන අය වැයක්" කියලා. එහෙම කියන්නේ කවුද? Fitch Ratings ආයතනය. ඒ විතරක් නොවෙයි. එළියට ගිහිල්ලා මොන දේ කිව්වත්, මාධ්‍යවල මොන තරම් දේවල් කථා කළත්, මේ අය වැය අහගෙන හිටපු අපේ ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේදී කළ කථාවේදී කිව්වා, "අපි දන්නා ඉතිහාසය තුළ පළමු වතාවට භාණ්ඩාගාරය පිරී ඉතිරී ගිය අය වැයක්" කියලා. ඒ තුළින් අපට පෙනී යනවා, මේ අය වැය තුළ තිබෙන සාධනීය ලක්ෂණ වාගේම, මේ අය වැය පාර්ලිමේන්තු ඉතිහාසයේ හොඳම අය වැය බව.

අද විපක්ෂය කලබල වෙලා ඉන්නවා, වතු කම්කරු ජනතාවගේ වැටුප් වැඩි වීම පිළිබඳව. ඒ සම්බන්ධයෙන් නොයෙක් කතන්දර කියන්න පටන්ගෙන තිබෙනවා. අපි කවුරුත් දන්නවා, අපේ රටේ වැඩියෙන්ම දුක් විඳින්නේ වතු ආශ්‍රිතව ජීවත් වන ජනතාව බව. ඔවුන්ගේ ජීවිතය ඉතාම ඛේදජනක තත්ත්වයක තිබෙන්නේ. එහෙම ජනතාවක් වෙනුවෙන් තමයි අපේ ආණ්ඩුව මේ අය වැය තුළින් වැටුප් වැඩි කරලා තිබෙන්නේ. අපි දැක්කා, වැටුප් වැඩි කිරීම නිසා ඔවුන් තුළ තිබෙන සතුට. ඔවුන් දෛනිකව දළු ටික කඩන්න වත්තට යන්න ඉස්සෙල්ලා, උදේ පාන්දර නැඟිටලා කෝවිලට ගිහිල්ලා, පහන් පත්තු කරලා දෙවියන් ඉදිරියේ අපේ ජනාධිපතිතුමාටත්, අපේ ආණ්ඩුවටත් ආශීර්වාද කළා. ඒ විධියට ඔවුන්ගේ ජීවිතය පවත්වාගෙන යෑම සඳහා මේ වැටුප් වැඩි කිරීම නිසා ඔවුන්ගේ සතුට පළ කරනවා අපි දැක්කා.

ඒ විතරක් නොවෙයි. අපේ රටේ සියලු ජනතාවගේ බලාපොරොත්තුව, සිහිනය බවට පත් වෙලා තිබෙන්නේ මේ ආණ්ඩුව කියලා අපි විශ්වාස කරනවා. අපි විතරක් නොවෙයි, ඒක මුළු රටේම ජනතාව විශ්වාස කරනවා. ඒ වාගේම අපි දන්නවා, මේ අය වැය සම්බන්ධයෙන් විවේචන විශාල ප්‍රමාණයක් විපක්ෂය විසින් ඉදිරිපත් කරනවා කියලා.

අපි දැක්කා, ඒ විවේචනය තුළ තිබෙන ඒ අයගේ නොහැකියාව. ඒ වාගේම ඒවා කියන්න දෙයක් නැතිකමට කියන දේවල්. ඒ අයට මේක හරියට අහගෙන ඉඳලා, මේක හරියට කියවා ගන්න බැරිවීම නිසා විවේචන ඉදිරිපත් කරනවා හැර, මේ තුළ තිබෙන යම් හොඳ දේවල් කිසි දෙයක් පෙනෙන්නේම නැතුව ගිහිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම අපි ඒ අයට කියනවා, ඒ අය මේ අය වැය හරියට අහගෙන හිටියේත් නැහැ, මේ අය වැය හරියට කියවා ගත්තේත් නැහැ කියන කාරණය. ඒ නිසා ගෙදර ගිහිල්ලා, විවේක තිබෙන මොහොතක පොඩ්ඩක් මේ අය වැය කියවා ගන්න. මොකද, මේ අය වැය විවාදය ලබන මාසය වෙනකම් තිබෙනවා. ඒ නිසා කාලය අරගෙන මේ අය වැය හොඳට කියවන්න, අපේ යම් යම් අඩුපාඩු තිබෙනවා නම් ඒවා අපට පෙන්වා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුඩා දරුවෝ අඳුරට බයයි. යම් යම් දේවල්වලට බයයි. ඉතින් වැඩිහිටියෝ කුඩා දරුවන්ට කියනවා, "ඔයා බය වුණොත්, ඉතිපිසෝ ගාථාව කියන්න" කියලා. ඒ විතරක් නොවෙයි, සමහරු චණ්ඩි වාගේ හිටියාට, මහා දර්ශන ඉදිරිපත් කළාට, තමන්ගේ බය එළියට දාන අවස්ථා තිබෙනවා. සමහරු සොහොන් ළඟින් යනකොට හයියෙන් කෑ ගහන්නේ, විසිල් ගහන්නේ, කුණුහරුප කියන්නේ හිතේ තියෙන බයට. ඒ විතරක් නොවෙයි, අපි දන්නවා, ගොවියෝ පැලට ගිහිල්ලා පැල් රකිද්දී, කවි කියන්නේ, ගීත කියන්නේ, හයියෙන් කෑ ගහන්නෙත් බොහෝ විට හිතේ තිබෙන බය නිසා බව. ඒ නිසා මේ හැමදේකම තිබෙන්නේ පරාජිතභාවයක්. අපි දකිනවා, ඒ තුළ තිබෙන පරාජිතභාවයක්. මේ විපක්ෂයේ හඬත්, ඔවුන් සැරින් සැරේ කියන දේවල් තුළත් අපට පෙනෙන්න තිබෙන්නේ, විපක්ෂයේ තිබෙන පරාජිතභාවය කියලා තමයි අපට කියන්න තිබෙන්නේ. ඒ නිසා මේ අය වැය තුළ තිබෙන හොඳ දේ කිසිම මොහොතක ඒ අය දකින්නේ නැහැ. ඒ අය ඒ දිහා සාධනීය ලෙස බලලා විවේචන ඉදිරිපත් කරන්නේත් නැහැ. ඒ නිසා අපි ඒ අයගෙන් ඉල්ලා සිටිනවා, හොඳට කියවන්න; හොඳට මේ දිහා බලන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය තුළ තිබෙන යම් යම් ක්ෂේත්‍ර ගත්තොත්, අපි දන්නවා, අපේ රටේ තිබෙන පශු සම්පත් ක්ෂේත්‍රය ඉතා වැදගත් බව. විශේෂයෙන්ම ග්‍රාමීය ආර්ථිකය නංවන්න, දිළිඳු ජනතාව දිළිඳුකමින් මුදා ගන්න මේ අය වැය තුළ වැඩසටහන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. අපේ රටේ වර්තමාන කිරි නිෂ්පාදනය ගත්තොත්, සියයට 40ක් තමයි අපි නිෂ්පාදනය කරන්නේ. අපි සියයට 40ක් නිෂ්පාදනය කරද්දී, සියයට 60ක ප්‍රමාණයක් අපි විදේශ රටවලින් කිරි ආශ්‍රිත නිෂ්පාදන ගෙන්වා ගන්නවා. ඒ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් අපේ රටින් බැහැරව යනවා. අන්න ඒ මුදල් ග්‍රාමීය ජනතාවට, ගමේ ජීවත් වෙන ගොවියාගේ අතට පත් වෙනවා නම් මොන තරම් හොඳද? අන්න ඒ වෙනුවෙන් අපි විශේෂ වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරමු.

**ගරු නන්දන පත්මකුමාර මහතා**
(மாண்புமிகு நந்தன பத்மகுமார)
(The Hon. Nandana Pathmakumara)

මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නන්දන පත්මකුමාර මහතා**
(மாண்புமிகு நந்தன பத்மகுமார)
(The Hon. Nandana Pathmakumara)

විශේෂයෙන්ම ඒ වැඩ පිළිවෙළ තුළ, අපේ රටේ වාර්ෂික කිරි නිෂ්පාදනය කිරි ලීටර් මිලියන 1,200 දක්වා වර්ධනය කර ගන්නට, 2030දී දේශීය කිරි අවශ්‍යතාවයෙන් සියයට 75 දක්වා වර්ධනය කර ගන්නට අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. අන්න ඒ වැඩ පිළිවෙළට අපි විශාල මුදල් කන්දරාවක් වෙන් කරලා තිබෙනවා. මෙන්න මේ ඉදිරිපත් කළ අය වැය තුළින් ග්‍රාමීය දුප්පත් බව තුරන් කිරීම සඳහා අපි විශාල මුදල් කන්දරාවක් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳ විශේෂ අවධානය

[ගරු නන්දන පත්මකුමාර මහතා]

යොමු කරලා මේ අය වැය තුළින් අපේ රටේ දිළිඳුකම නැති කරනවා වාගේම, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ගොඩනැඟීම සඳහා මේ 2026 අය වැය ඉවහල් වෙනවාය කියන එකත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.14]

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 අය වැය දෙවන වර කියවීමේ විවාදයේදී අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ජාතික ජන බලවේගය ඉදිරිපත් කළ දෙවන අය වැය ගැන පසුගිය දිනවල ආණ්ඩු පක්ෂය මෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරු රාශියක් අදහස් ඉදිරිපත් කළා. අතිගරු ජනාධිපතිතුමා ඇතුළු ජාතික ජන බලවේගය ආණ්ඩුව "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශය එළි දැක්වූවා. ඉතින් ඒ එළි දැක්වුණු ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබුණු බහුතර යෝජනා, 2025 මංගල අය වැය හරහා ඉටු කිරීමට අපොහොසත් වූ බවක් අපි දැක්කා.

අපි දන්නවා, වර්තමානයේ බටහිර රටවල ගත්තොත්, යම්කිසි අලුත් ආණ්ඩුවක් විසින් ඉදිරිපත් කරන්නා වූ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉටු වෙන්නේ නැත්නම් ගත හැකි නීතිමය ක්‍රියාමාර්ග මොනවාද කියලා බලන කතිකාවක් මේ දවස්වල ඇති වෙලා තිබෙනවා කියලා. නමුත් අපි දන්නවා, ලංකාවේ රජයක් ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කළාම නෛතික රාමුවක් නැහැ, ඒක ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්. නමුත් මැතිවරණ සමයේ ඉදිරිපත් කරන්නා වූ ප්‍රතිපත්ති ප්‍රකාශයේ අඩංගු කරුණු අනුව ජනතාව එක්ක ඒ පක්ෂය ඍජු සමාජ ගිවිසුමක් ඇති කරගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව ඒ පත් වෙන ආණ්ඩුවට මේ ඍජු සමාජ ගිවිසුමේ තිබෙන කරුණු ඉටු කිරීමට විශාල වගකීමක් තිබෙනවා කියලා මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු වශයෙන් අපට වගකීමක් තිබෙනවා, මේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කරපු අය වැයේ යෝජනා හරියාකාරව සමාලෝචනය කරලා අප ඡන්දයෙන් තෝරා පත්කරගත්ත අපේ ජනතාවට ඒ ප්‍රගතිය වාර්තා කිරීමට. විශේෂයෙන්ම මම මතක් කරන්න කැමැතියි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුයි කියන එක. මම කලින් කියපු ආකාරයට අපි විපක්ෂයක් වශයෙන් ඉතාම සද්භාවයෙන් සාධනීය විවේචන ඉදිරිපත් කරනකොට මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඒවා දරා ගැනීමේ යම්කිසි අපහසුතාවක් තිබෙනවා අපි දැක්කා. මොකද, ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු ඒ වාගේම මන්ත්‍රීවරු ඒ ගැන නොයෙකුත් ප්‍රකාශ කරනවා. විපක්ෂය අදහස් ඉදිරිපත් කරනකොට එක ඇමති කෙනෙක් කියනවා දැක්කා, අපි මනාප එකතු කරනවා කියලා. අපි දන්නවා, මැතිවරණයක් පැවැත්වීමට තව අවුරුදු 4ක් තිබෙනවා කියලා. ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන කරුණු ආණ්ඩු පක්ෂයට වැඩිය විපක්ෂය හොඳින් දන්නවා කියලාත් ප්‍රකාශ කළා. ඒ වාගේම, මා නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය අමාත්‍යවරයෙක් කියනවා විපක්ෂයේ මන්ත්‍රීවරු අදහස් දක්වනකොට ඒක ආකිමීඩීස්ගේ බිරිඳ අදහස් ප්‍රකාශ කරනවා හා සමානයි කියලා. මම එතුමාගේ වචනයෙන් කිව්වොත් එතුමා කියනවා, "ආකිමීඩීස්ගේ ගෑනි මේ විපක්ෂයට වඩා හොඳයි" කියලා. ඉතින් මේ ආකාරයට කාන්තාවක් පහළ දමලා, කාන්තාවට අපහාස කරලා, අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු ඉදිරිපත් කරන්නා වූ සාධනීය කරුණු සලකා බලන්නේ නැතුව එතුමන්ලා කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ දිනවල කළ කථා ගත්තොත්, බොහෝ විට කථා කළේ අවුරුදු 76 ශාපය ගැන, එහෙම නැත්නම් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු ගැන. මොකද, ඒ කථාවල සියයට 75ක්ම කථා කරන්නේ අපේ විපක්ෂය ගැන. ඒ නිසා විශේෂයෙන්ම මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම කියන්න කැමැතියි, දේශපාලනය කරනවා නම් විවේචනය දරා ගැනීමේ හැකියාවත් වැඩිදියුණු කළොත් හොඳයි කියලා. අපි දන්නවා, අපේ අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා පැය 4යි විනාඩි 20ක කථාවක් කළා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සිය පාරකටත් වැඩිය අත්පුඩි ගහනවාත් අපි දැක්කා. යෝජනා 62ක් ඒ අය වැය කථාවේ තිබුණා. හැබැයි කියන්න ඕනෑ, විපක්ෂයට සහ ජනතාවට මේ ආණ්ඩුව ගැන කිසිම විශ්වාසයක් නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම 2025 අය වැයේ ප්‍රගතිය ඉතාම අඩු මට්ටමක තිබෙනවා කිව්වොත් නිවැරදියි. විශේෂයෙන්ම ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම සඳහා රුපියල් මිලියන 500 ඒකෙන් යෙදෙව්වා. එහි ප්‍රගතිය සියයට බින්දුවයි. ඒ වාගේම, අමාත්‍යාංශ ගණනාවකට වෙන් කරපු මුදල්වලින් සියයට 50ක්වත් වැය කිරීමට අපොහොසත් වෙලා තිබෙනවා, මේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට. මම හිතනවා, සියයට 70ක් පමණ වැය කිරීමට හැකි වුයේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයටයි කියලා. ඒකත් මැතිවරණයක් පැවත් වූ නිසා. අපි දැක්කා, Fitch Ratings ආයතනයත් මේ අය වැය ගැන කියනවා. ඔවුන් ශ්‍රී ලංකාවේ මෙවර අය වැය පිළිබඳ අනතුරු ඇඟවීමක් කර තිබෙනවා, මූල්‍ය ඒකාබද්ධතාව සඳහා රජයේ කැපවීම ප්‍රකාශ කළද, නව අය වැය රටේ දිගුකාලීන ආර්ථික අපේක්ෂාවලට සැලකිය යුතු අවදානමක් ගෙන එන බවට.

අපි දන්නවා, අපේ රටේ වතුකරයේ ජනතාව අපට විදේශ විනිමය උපයා දීම සඳහා විශාල සේවාවක් කරන බව. ඒ බවත් මා සඳහන් කරන්න කැමැතියි. මා නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේත් වතු ප්‍රජාව ඉන්නවා. වතුකරයේ ජනතාවට 2015දී අපි ප්‍රථමයෙන්ම ඉඩම් අයිතිය ලබා දෙමින් පර්චස් 20ක ඉඩමක් ලබා දුන්නා. ඒ වාගේම, අවුරුදු ගණනාවක් තිස්සේ ගෙවපු නැති පාරිතෝෂික, අර්ථසාධක අරමුදල් වතුකරයේ ජනතාවට ලබා දුන්නා; ඉන්දියන් ආධාර අරගෙන නිවාස හදලා දුන්නා. 2018දී ඔවුන්ගේ දෛනික වැටුප රුපියල් 1,000 දක්වා වැඩි කරලා ඉන්පසුව අපේ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේදී එය රුපියල් 1,350 දක්වා වැඩි කළා. මෙවර අය වැය යෝජනාවකින්, වතු ජනතාවගේ දෛනික වැටුප රුපියල් 200කින් වැඩි කර තිබෙනවා අපි දැක්කා. ඉතින් අපි ඒ ගැන සන්තෝෂ වෙනවා. පසුගිය රජයන් විසින් ක්‍රමක්‍රමයෙන් වැඩි කරපු වතුකරයේ ජනතාවගේ දෛනික වැටුප මෙවර අය වැයෙනුත් රුපියල් 200කින් වැඩි කිරීම ගැන අපි සන්තෝෂ වෙනවා.

ඒ වාගේම මතක් කරන්න කැමැතියි, කාන්තාවන් ශක්තිමත් කිරීම සඳහා ගෙන ඇති පියවර ගැනත්. අපේ රටේ බහුතරයක් ඉන්නේ කාන්තාවන්. අපේ රටේ කාන්තා මූලික පවුල් සියයට 25ක් තිබෙනවා. කාන්තාවන් ශක්තිමත් කිරීම සඳහා 2026 අය වැයෙන් රුපියල් මිලියන 440ක් වෙන් කර තිබෙනවා. ඇත්තටම, මේ මුදල ප්‍රමාණවත් නැහැ. මොකද, මෙය රටේ ඉන්න මුළු කාන්තාවන් සංඛ්‍යාවත් එක්ක බලන කොට එක් කාන්තාවකට ලැබෙන්නේ, රුපියල් 40යි. රුපියල් 40කින් අඩුම ගාණේ plain tea එකක්වත්, කහට එකක්වත් බොන්න බැහැ. විශේෂයෙන්ම අපට කාන්තා අගමැතිතුමියක් ඉන්නවා. ඒ රුපියල් 40 ප්‍රමාණවත් නැහැ කියලා අපි එතුමියට කියනවා. ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න කියමින්, මේ කාලය ලබා දුන්නාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.22]

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ දෙවන අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන වෙලාවේ, මේ රට කේතුමතී පුරවරයක් බවට පත් නොවුණත්, මේ රටේ ජනතාව පැවැති ආණ්ඩු සමඟ මේ ආණ්ඩුව සසඳනවා; විපක්ෂය කරන විවේචනත් එක්ක මේ ආණ්ඩුවේ කටයුතු සසඳනවා. එහෙම සසඳලා යම්කිසි ස්ථානයක අපේ ආණ්ඩුව තියලා තිබෙනවා කියා මම හිතනවා.

මේ ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන මෙවර අය වැය පිළිබඳව කෙටියෙන් වචන කිහිපයක් නිසඳැසක් වාගේ මා කියන්නම්.

"රටක් සැනසෙන
හිරගෙවල් පෙනි පෙනී ටිකක් වැලපෙන
ජනතාවාදී ලේඛනය
2026 අය වැය ලේඛනයයි"

මෙවර අය වැය ලේඛනය ගැන අපට එහෙම කියන්න පුළුවන්. මේ අය වැය ලේඛනය සම්බන්ධයෙන් වැලපෙන්නේ කවුද? අද අන්දුන් කුන්දුන් වෙච්ච, කිසිදෙයක් කර ගන්න බැරි විපක්ෂය විතරක් ඒ අයගේ කාල වෙලාව තුළ මේ පාර්ලිමේන්තුවේදී සහ මාධ්‍ය ආයතන ඇතුළේ අඬනවා; වැලපෙනවා; පොළොවේ පස් කනවා. නමුත්, රටේ ජනතාව දන්නවා, මේ රට තිබ්බෙ තැන පිළිබඳව. රටේ ජනතාවට අවබෝධයක් තිබෙනවා, මේ දේශපාලන ව්‍යාපාරය මේ රට යම් තැනකට ගේනවා කියලා. පසුගිය අවුරුද්දේ කෙරිච්ච වැඩ සම්බන්ධයෙන් ද ජනතාවට අවබෝධයක් තිබෙනවා.

දැන් මේ කථා කරන මහත්වරුන්ගේ ආණ්ඩු කාලවල වුණේ කොහොමද? මීට කලින් රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කරනවා මම දැක්කා. 2015දී එතුමා තමයි මුදල් ඇමති. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලා තමයි ආර්ථික ඔස්තාර්ලා. සජිත් ප්‍රේමදාස මහත්මයාත් ප්‍රධාන පෙළේ ඇමතිවරයකු විධියට හිටියා. එදා සියයට 5ක පැවැති ආර්ථික වර්ධන වේගය සියයට 2ට ඇද දැම්මා. අද අපි ගෙවන්නේ ඒ පව. අපට මතකයි ආණ්ඩුව එදා 2015දී ඩොලර් බිලියන 12.5ක ස්වෛරීත්ව බැඳුම්කර ලබා ගත්තා. එතුමන්ලා කියනවා, එදා මහා ලොකු සංවර්ධනයක් කළා කියලා. එදා ගොඩ ගහපු ණය කන්ද කොතරම්ද? මහා ණය කන්දක් ගොඩ ගහලා චූටි සංවර්ධනයක් කරලා තිබෙනවා. ඒකේ පව තමයි මේ ගෙවන්නේ. නමුත් ඒක නොවෙයි මාවත.

ලෝකයේ රටවල ඇති ආර්ථික ක්‍රම අතර තිබෙනවා, ප්‍රධාන ධාරා දෙකක්. එක ධාරාවක් තමයි රජයට යම් කාර්යභාරයක් තිබෙනවා කියලා විශ්වාස කරන ආර්ථික ධාරාව. තවත් ආර්ථික ධාරාවක් තිබෙනවා, රජයට එහෙම කාර්යභාරයක් ඕනෑ නැහැ, වෙළෙඳ පොළ ක්‍රමයට සියල්ල මෙහෙයවන්න දෙන්න ඕනෑය කියන. මේ දෙකෙන් අප නියෝජනය කරන්නේ මොකක්ද? අපි හරි තැනක හිටගෙන ඉන්නවා. රජයට ආර්ථිකය සම්බන්ධයෙන් යම් කාර්යභාරයක් තිබෙනවා, රජය ඒකට පණ පොවන්න ඕනෑය කියන තැන අපි ඉන්නවා.

දැන් විපක්ෂය පැත්තෙන් චෝදනාවක් එනවා, "පසුගිය අවුරුද්දේ අපි නම් ගොඩක් වියදම් කළා, මේ ආණ්ඩුවෙන් ඒ විධියට කෙරිලා නැහැ" කියලා. ඔය ගත්තේ කවදාට අදාළ දත්තද? ඔය අරගෙන තිබෙන්නේ, සැප්තැම්බර් මාසයේ 30වෙනිදාට අදාළ දත්ත. තවත් මාස 3ක් අපට තිබෙනවා. මම 11වැනි දා ගාල්ලේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව කැඳෙව්වා. ඒ කැඳවන කොට, එම දිස්ත්‍රික්කයට යොදවපු මුදල්වලින් සියයට 85ක්ම පාවිච්චි කරලා ඉවරයි. සියයට 85ක්! ඒ නිසා මේ මාස දෙකතුනත් බලාගෙන ඉන්න.

අනෙක් කාරණය මේකයි. පසුගිය අවුරුද්දේ Capital Expenditure ලෙස රුපියල් බිලියන 667යි වෙන් කරලා තිබුණේ. මේ අවුරුද්දේ Capital Expenditure ලෙස රුපියල් බිලියන 1,400ක් වෙන් කරලා තිබෙනවා. Capital Expenditure වෙනුවෙන් ලංකා ඉතිහාසයේ යොදවපු වැඩිම මුදල මේකයි. මේකෙන් සියයට 50ක්වත් වියදම් කරලා නැහැ කියලා තමයි එතුමන්ලා කියන්නේ. ගරු ජනාධිපතිතුමාටත්, අපටත් වුවමනා වුණේ මේ මුදල් ටික වියදම් කරන්නයි. මේ මුදල් ටික වියදම් කළා නම්, ඒවා ආණ්ඩුවේ වියදම් වුණාට ජනතාවගේ ආදායම්. එතකොට ආර්ථික ක්‍රියාවලිය සක්‍රිය වෙනවා. සියයට 5කට එහා ගිය growth එකක් එනවා. දේශපාලන නායකයා හැටියට ජනාධිපති සහෝදරයාට, ඇමති සහෝදරවරුන්ට, අපට වුවමනාව තිබුණාට අපට තිබුණු රාජ්‍ය යාන්ත්‍රණය ගත්තොත්, ඒක හොඳ එකක් නොවෙයි. මොකද, ඔබතුමන්ලා රාජ්‍ය යන්ත්‍රණය බිඳ වට්ටලා තිබුණේ.

දැන් කැබ් එකක් දෙන්න යනකොට අහනවා, කොහොමද එහෙම ගේන්නේ, ඇයි එහෙම දෙන්නේ කියලා. ඇයි කැබ් දෙන්නේ? මේ බිඳ වැටුණු රාජ්‍ය යන්ත්‍රණය හදන්න ඕනෑ. ඒ නිසා තමයි රාජ්‍ය සේවකයාගේ පඩි වැඩි කළේ. ඒ නිසා තමයි විශ්‍රාමිකයාගේ දීමනාව වැඩි කළේ. ඒ නිසා තමයි රාජ්‍ය සේවයට 65,000ක්, 75,000ක් විතර බඳවා ගන්නේ. මේ රාජ්‍ය සේවය යළි හදන්න ඕනෑ. ඒ අයට අවශ්‍ය පහසුකම් ටික දෙන්න ඕනෑ; පඩි වැඩි කරලා දෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, මේ රාජ්‍ය සේවකයාට මේ තිබෙන ලට්ට ලොට්ට වාහන එක්ක දුවන්න බැහැ. ඔවුන්ට වේගයෙන් වැඩ කරන්න හොඳ වාහන ටිකක් දෙන්න ඕනෑ. එදා හොඳ වාහනය ඇමතියා ගත්තා; රාජ්‍ය සේවයට කබල් වාහන දුන්නා. එහෙම නොවෙයි විය යුත්තේ. මේ රාජ්‍ය සේවය යළි ප්‍රකෘතිමත්භාවයට පත් කරන්න නම් පඩි වැඩි කරලා, දීමනා ටික වැඩි කරලා, රාජ්‍ය සේවකයන් තෘප්තිමත් කරලා, ඔවුන්ට යන්න එන්න වාහන ටික දීලා අවශ්‍ය පහසුකම් ටික

[ගරු නලින් හේවගේ මහතා]

දෙන්න ඕනෑ. එහෙම දුන්නාට පසුව තමයි පූර්ණ ධාරිතාවෙන් යුතුව ඒ අයගෙන් වැඩ ටික කරවා ගන්න අපට පුළුවන්කම ලැබෙන්නේ. අපි හිතනවා, ලබන අවුරුද්ද මේ අවුරුද්දට වඩා හොඳ වෙයි කියලා.

මේ Budget එක සම්බන්ධයෙන් රටේ ජනතාවට ලොකු ප්‍රශ්නයක් නැහැ. ගොවියා ගත්තත්, ධීවරයා ගත්තත්, රාජ්‍ය සේවකයා ගත්තත්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයා ගත්තත් එහෙමයි.

1980 ගණන්වලයි මහපොළ දීමනාව දෙන්න පටන් ගත්තේ. අවුරුදු 45ටම මහපොළ දීමනාව රුපියල් 5,000යි. අපි ඇවිත් එක අවුරුද්දකින් එය රුපියල් 10,000ක් කළා. ඉතින්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලා ආණ්ඩු දෙකක් කරලාත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබා දුන්නේ රුපියල් 5,000යි. අපි ඇවිත් අවුරුද්දකින් එය තවත් රුපියල් 5,000කින් වැඩි කළා. ඒක නිසා ඒ ශිෂ්‍යයන්ට ප්‍රශ්නයක් නැහැ. හැබැයි දැන් විපක්ෂය දන්නවා, මේ වැඩ ටික කරන කොට විපක්ෂය හෝදලාම යනවා කියලා. ආයේ මොකක්වත් ඉතිරි වෙන්නේ නැහැ. අද ගමක බිමක විපක්ෂයක් නැහැ. ගමක බිමක ඔබතුමන්ලා පේන්න නැහැ. ගමට බිමට ගිහින් ඔබතුමන්ලාට කියන්න දෙයක් නැහැ. මොකද, මේ ආණ්ඩුවේ වංචාව නැහැ; දූෂණය නැහැ; හොරකම නැහැ. අද මත්ද්‍රව්‍ය අල්ලනවා; පාතාලය නැති කරනවා. ඒ වාගේම, අද හොඳ අය වැයකුත් ගෙනැවිත් තිබෙනවා. වෙනදා එහෙම නොවෙයි. ආණ්ඩුව හදලා දින 27ක් යනකොට මහ බැංකුව කඩලා. එහෙමයි වුණේ. අද එහෙම නැහැ. එම නිසා අද විපක්ෂයට කරන්න කිසිදු කාර්යභාරයක් ඉතිරි වෙලා නැහැ. අපි මේ අවුරුදු 5ම ආණ්ඩුව කරන කොට විපක්ෂයට මොකක් වේවිද? ඔබතුමන්ලා ඒක තීරණය කරන්න. අවුරුද්දකට මෙහෙම නම් මේ අවුරුදු 5 ගෙවෙන කොට ආයේ දෙකක් නැහැ, විපක්ෂය රටෙන් හෝදලාම යනවා. මොකද, ඔහොම විපක්ෂ තිබෙන්නේ නැහැ.

හැම දාම විපක්ෂයට කාර්යභාරයක් තිබුණේ, ආණ්ඩුව නොමඟ යනවා නම් තමයි; ආණ්ඩුව ජනතා ද්‍රෝහී නම් තමයි. හැබැයි, දැන් ආණ්ඩුව ජනතා හිතෛෂීයි. එහෙම නම් විපක්ෂයේ ඔබතුමන්ලාට කාර්යභාරයක් ඉතිරි වෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා තවදුරටත් ඔය වැඩ ටික කරන්න ඕනෑ නැහැ. ඒ නිසා මම අර්චුනා මන්ත්‍රීතුමාට කියනවා, ඔබතුමා මෙහේ නිදාගත්තත් එකයි, ගෙදර ගිහින් නිදාගත්තත් එකයි කියලා. මෙතැන නිදාගත්තත් එකයි, ගෙදර ගිහින් නිදාගත්තත් එකයි. ගෙදරම ගිහින් නිදාගන්න.

අද අපි හොඳ ගමනක් යමින් ඉන්නේ. රටේ ජනතාව ඒ ගමනත් එක්ක එකතු වෙලා ඉන්නේ; ඒ ගැන අවබෝධයෙන් ඉන්නේ. ඒ නිසා අපි විපක්ෂයේ ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, දෙකයි පනහේ විවේචන කරන්න එපා කියලා. අපට විපක්ෂයක් අවශ්‍යයි. අපට තිබෙන කනගාටුව තමයි මේ විපක්ෂයට දැක්මක් නොමැතිකම. මේ විපක්ෂයට දැක්මක් නැහැ. අද මේ වෙලා තිබෙන්නේ මොකක්ද? හෙට අනිද්දා නඩු ටිකක් එනවා. ඒ නඩු අහන කොට සමහරුන්ට ඇතුළට යන්න වෙනවා. ඒ නිසා ඔබතුමන්ලා එකතු වෙලා මොකක් හරි ගේමක් ගහන්න හදනවා. නමුත්, එහෙම කරන්න බැහැ.

ජනතා හිතෛෂී අය වැයක් අපි මේ ගෙනැවිත් තිබෙන්නේ. පසුගිය අය වැයේ ප්‍රතිඵල වේගයෙන් ගමට යනවා. අපි හිතනවා, මේ අය වැයේ ප්‍රතිඵල ටිකත් ගමට යනකොට සෙත්තපෝච්චි වෙච්ච විපක්ෂයක් ඉතිරි වෙයි කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ධනුෂ්ක රංගනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.29]

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ දෙවැනි අය වැය ඉදිරිපත් කර තිබෙන මොහොතේ අදහස් දැක්වීම සඳහා මටත් අවස්ථාවක් වෙන් කර දීම වෙනුවෙන් ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගය විධියට අප මේ රටේ බලය අත්පත් කරගත් මොහොතේ මේ රට ආර්ථික, දේශපාලන, සමාජයීය ආදි වශයෙන් සෑම අතකින්ම වට්ටලායි තිබුණේ. ඒ නිසා අපේ ප්‍රධාන අරමුණ වුණේ මේ රටේ ආර්ථිකය ස්ථාවර කර ගැනීමයි. ඒකට අදාළව ජාතික ජන බලවේගය විධියට අපි මුලින්ම මේ වසරට අදාළව අය වැය ඉදිරිපත් කරලා ඒ අය වැය තුළින් මේ රටේ ආර්ථිකය ස්ථාවර කර ගත්තා.

මේ රටේ ආර්ථිකය ස්ථාවර කරගෙන, ඒකේ ප්‍රතිලාභ ජනතාවට යොමු කරන්න අපට අවශ්‍යතාවක් තිබුණා. ඒකට අදාළව අපි ගොඩනඟා ගත්ත අය වැය තුළින් අපි සාර්ථකත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ රටේ ආර්ථිකය ස්ථාවර කරගෙන, ඒ ස්ථාවර කර ගත්ත ආර්ථිකයේ ප්‍රතිලාභ, ජනතාවට විතරක් නොවෙයි, සමස්ත සමාජ දේහයටම යොමු කරන අවස්ථාවක තමයි මේ නිරත වෙමින් සිටින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ මම අය වැය කථාව ගැන කථා කරන්න කලින්, පුංචි පැහැදිලි කිරීම් දෙකක් කරන්න ඕනෑ. මේ අය වැය විවාදය පටන් ගන්නා දවසේ විපක්ෂයේ ප්‍රධාන කථාව ඉදිරිපත් කරපු, මුදල් ඇමතිවරයෙක් වෙන්න බලාගෙන හිටපු, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත්, ඒ වාගේම මුදල් ඇමතිවරයෙක් වෙලා හිටපු, මීට මොහොතකට කලින් අදහස් දක්වපු ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාත් මෙහෙම කථාවක් කිව්වා. අපේ ආණ්ඩුව ගම්වල පීඩාවට පත් වෙලා ඉන්න දුප්පත් ජනතාව වෙනුවෙන් රුපියල් මිලියනයකින් - ලක්ෂ 10කින්- නිවසක් හදලා දෙන්න කටයුතු කරනවා. ඒකට අදාළව ලබන වසරේ නිවාස 10,000ක් හදලා අවසන් කරන්න අපි කටයුතු කරමින් ඉන්නවා. නමුත් එතුමන්ලා කිව්වා, රුපියල් මිලියනයකින් වර්ග අඩි 100කවත් ගෙයක් හදලා අවසන් කරන්න බැහැ කියලා. හැබැයි, මම ඒ මන්ත්‍රීවරුන් දෙදෙනාටම මේ කාරණය ප්‍රකාශ කරන්න කැමැතියි. ගරු මන්ත්‍රීවරුනි, අපි කළුතර දිස්ත්‍රික්කයේ ඒ නිවාස ව්‍යාපෘතිය සිදු කරමින් පවතිනවා. මේ වන විට අපි කළුතර දිස්ත්‍රික්කයේ නිවාස 198ක් හදන්න අනුමත කරගෙන තිබෙනවා. ඒ අතුරින් නිවාස 147ක් හදා නිම කරලා තිබෙනවා. ඒ වාගේම, වැඩ කටයුතු අවසන් නොවුණු, අතරමඟ ක්‍රියාවලියක තිබෙන තවත් නිවාස 49ක් හා වැඩ ආරම්භ කරන්න තිබෙන නිවාස දෙකක් තිබෙනවා. දැනට කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවට නිවාස 82ක් අපි භාර දීලා තිබෙනවා. එම නිවාසවල ඡායාරූප කිහිපයක් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම එතුමන්ලා දෙදෙනාටම ආරාධනා කරනවා, පුස්තකාලයට ගිහිල්ලා හොරෙන් හරි මේක බලන්න කියලා. මේක අපිට කර ගන්න පුළුවන් කියලා මම කියනවා. පුස්තකාලයට ගිහිල්ලා හොරෙන් හරි ගිහිල්ලා බලන්න, ඒක අපි කරලා තිබෙනවා. මේ ගම්මානවල ජනතාව ඒකට උදවු කරලා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්වරුන් විතරක් නොවෙයි, ඒ ග්‍රාම නිලධාරි වසම්වල ග්‍රාම නිලධාරින්, සංවර්ධන නිලධාරින් හා නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරින් යන සියලුදෙනා ජනතාවත් ඒකාබද්ධ කරගෙන, මේ වැඩසටහන ඉතා වේගයෙන් ගම් ඇතුළේ ඉතා කැමැත්තෙන් සිදු කරගෙන යනවා. ඒ නිසා මුදල්ම නොවෙයි වටිනාකම් කියන්නේ, කැපවීමිනුත් වටිනාකම් විධියට හඳුන්වා දෙන්න කැමැතියි.

දැන් මොහොතකට කලින් විපක්ෂයේ මන්ත්‍රීවරියක් අපේ නියෝජ්‍ය ඇමතිතුමාට පොඩි ෂොට් එකක් දීගෙන යන්න හැදුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පොඩි කවියක් මතක් කරන්න ඕනෑ. "ආකිමිඩීස් සිය දිවි නසා ගනී" කියලා පොතක් තිබෙනවා. අන්න ඒ පොතේ තිබෙන කවියක් තමයි, එදා අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඉදිරිපත් කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ මතක් කරන්න ඕනෑ, වසර ගණනාවකට පස්සේ මේ රටේ දුක් විඳින කණ්ඩායමක් වෙලා සිටි, මේ රටේ මෙතෙක් ඉතිහාසයේ දේශපාලකයන් ආන්තිකකරණයකට ලක් කරලා තිබුණු ජන කණ්ඩායමක් වෙනුවෙන් අපේ ආණ්ඩුව දිගින් දිගටම කටයුතු කරමින් ඉන්න බව. ඒ ජන කණ්ඩායම තමයි, මලෛයහම් ද්‍රවිඩ ජනතාව. අපි දන්නවා, මේ රට මේ මට්ටමින් හෝ පවත්වාගෙන යන්න, මේ රටේ ආර්ථිකය මේ ආකාරයෙන් හෝ පවත්වා ගෙන යන්න ඔවුන්ගේ සමස්ත ජීවිතයම කැප කරපු ජනතාවක් තමයි ඒ අය. ඒ නිසා ඒ ජනතාවගේ වැටුප් වැඩි කරන්න මේ ආණ්ඩුව කටයුතු කළා. දැන් මේ ඊළඟ වසරේ අය වැයෙන් වැටුප් වැඩි කරලා දෙන්න මේ ආණ්ඩුව කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම ඔවුන්ට තිබුණේ රුපියල් 1,350ක දෛනික අවම වැටුපක්. ගිය වසරේත් අපි මේකට උත්සාහ දැරුවා. නමුත්, ගැටලු ඇති වුණා. නමුත්, ඊළඟ වසරේ ඒකට අදාළ පිළියම අපි සිදු කරලා තිබෙනවා. ඒ නිසා ඒ රුපියල් 1,350ක දෛනික අවම වැටුපට වතු සමාගම් විසින් රුපියල් 200කුත්, පැමිණීමේ දෛනික දිරි දීමනාව විධියට ආණ්ඩුවෙන් රුපියල් 200කුත් දෙන්න කටයුතු කරමින් ඉන්නවා. දවස් 25ට ඔවුන්ට රුපියල් 400 ගණනේ, රුපියල් 10,000ක වැඩි කිරීමක් ලැබෙනවා. මේ ආණ්ඩුව කවදාවත් වෙනත් ආණ්ඩු නොදුන්නු පඩි වැඩි කිරීමක් මලෛයහම් ජනතාවට දෙන්න කටයුතු කරමින් ඉන්නවා.

කන්ද උඩරට විතරක් නොවෙයි, මම නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේත් 45,000කට ආසන්න මලෛයහම් ජනතාවක් ඉන්නවා. ඔවුන්ටත් ඒ සහනය ලැබෙනවා. හැබැයි, මේ විපක්ෂය මොන තරම් පටු විධියට ද හිතන්නේ කියලා ඒ ජනතාවත් තේරුම් අරගෙන ඉන්නවා, අපිත් තේරුම් අරගෙන ඉන්නවා. මේ පඩිය වැඩි කිරීම සම්බන්ධයෙන් ඔවුන් නිරන්තර අදහස් දැක්වීම් කරනවා. ඒ විතරක් නොවෙයි, එතැනින් එහාට ඔවුන් නීතිමය ක්‍රියාමාර්ගත් ගන්න කටයුතු කරමින් ඉන්නවා ලු. විපක්ෂයේ සියලුදෙනාට අපි මෙන්න මේ කාරණයත් කියන්න කැමැතියි. ඔබ මොන තරම් අපට විරුද්ධව කටයුතු කළත්, අපි ඒ ජනතාව කෙරෙහි යොදවා තිබෙන අවධානය අඩු කරන්නේ නැහැ. ඒ නිසා මේ රටේ සියලු ජනතාවට ජාතික ජන බලවේගයේ ආණ්ඩුව වග කියනවා. ඒ වගකීම අපි සපථ කරමින් මේ අය වැය මේ රටේ ඉදිරි දිශානතිය නිසි ආකාරයෙන් මෙහෙයවන වඩාත් සාර්ථක අය වැයක් විධියට හඳුන්වා දෙමින් මා නතර වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම සම්බන්ධයෙන් බෙහෙවින්ම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගීතා හේරත් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.36]

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලාංකික ජනතාව දුන් ඓතිහාසික ජනවරමින් පස්සේ මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කර තිබෙන දෙවැනි අය වැය සම්බන්ධයෙන් කෙරෙන විවාදයට එක්වන්නට අවස්ථාව ලැබීම මා භාග්‍යයක් කොට සලකනවා.

ගත වුණු වසරක පමණ කාලය තුළ ජනතා බලාපොරොත්තු ඉෂ්ට කිරීම සඳහා අප විසින් වැදගත් තීරණාත්මක පියවර රැසක් අරගෙන තිබෙනවා. අපි 2025 වර්ෂයට අදාළව අය වැය ඉදිරිපත් කිරීමේදීත් අභියෝගයක් තිබුණා, ආර්ථික ස්ථායීකරණයක් ඇති කිරීම පිළිබඳව. ඒ 2025 අය වැය මේ වෙනකොට සාර්ථක වෙලා තිබෙනවා. අපි ටිකක් මුලට ගිහිල්ලා මතක් කර බලමු. සාර්ව ආර්ථික අස්ථාවරභාවය, රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාව, අකාර්යක්ෂමතාව, පාලන දුර්වලතා හේතුවෙන් 2022 අප්‍රේල් වෙනකොට මේ රට බංකොලොත් රාජ්‍යයක් බවට ප්‍රකාශයට පත්වෙලා තිබුණේ. ඒ වාගේ අභියෝගයකුත් එක්ක ජනතාව අප කෙරෙහි විශ්වාසය තබලා අපට ආණ්ඩු බලය ලබා දුන්නා. ඒ ජනවරම ලබා ගත්ත මොහොතේ පටන් අපි ජනතා වගකීම් බලාපොරොත්තු ඉෂ්ට කිරීම සඳහා ආණ්ඩුවක් විධියට වගකීමෙන් යුතුව 2025 අය වැය ඉදිරිපත් කළා. ඇත්තටම අපට ඒ සම්බන්ධයෙන් සතුටු වෙන්න පුළුවන්. මොකද, ආර්ථිකයේ සියලු අංශවල ශක්තිමත් වර්ධනයක් ඇති කරමින් 2025 පළමු භාගය තුළදී ආර්ථිකය සියයට 4.8කින් වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම, උද්ධමනය ධන අගයකට පැමිණිලා තිබෙනවා. භාණ්ඩාගාර බිල්පත්වල පොලී අනුපාතිකය අඩුවීමෙන් මූල්‍ය අංශය ස්ථාවර වෙලා තිබෙනවා;

විනිමය අනුපාතිකය ස්ථාවර වෙලා තිබෙනවා. ඒ වාගේම, විදේශ ප්‍රේෂණ ඉහළ ගිහිල්ලා තිබෙනවා. දූෂණයට එරෙහිව ආණ්ඩුව අරගෙන යන ක්‍රියාමාර්ග හේතුවෙන් ජාත්‍යන්තරය තුළ මේ වෙනකොට ශ්‍රී ලංකාව ගැන ප්‍රසාදයක් ඇතිවෙලා තිබෙනවා. ඒත් එක්කම ආයෝජන ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙලා තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙන්න ඕනෑ. විපක්ෂයේ අය ආණ්ඩු බලය දරපු කාලයේ කරන්න බැරි වෙච්ච දේවල් දැන් අපි කරලා තිබෙනවා. ඒ ගැන විපක්ෂය ඇත්තටම සතුටු වෙන්න ඕනෑ.

ඇත්තටම ආර්ථිකය ස්ථාවර කිරීමට සමගාමීව සමාජ ආරක්ෂණය සහ මානව සම්පත් සංවර්ධනයත් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එක් අරමුණක්. ඒකට ගැළපෙන ආකාරයට 2025 අය වැයෙන් ලබාගත් ස්ථාවර පදනම තවත් ශක්තිමත් කරමින්, 2026 වර්ෂය වෙනුවෙන් අය වැය ඉදිරිපත් කර තිබෙනවා.

ඇත්තටම උපාය මාර්ගික අරමුණු කිහිපයක් එක්ක තමයි අපි 2026 අය වැය සකස් කර තිබෙන්නේ. විපක්ෂයෙන් කථා කරපු සමහර කථිකයන්ගෙන් මතු වෙච්ච දෙයක් තමයි, ඔවුන්ගේ පොදු අදහස තමයි, "කලින් ආණ්ඩු ඉදිරිපත් කළා වාගේම අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා. කිසිම කමකට නැහැ." කියන දේ. නැහැ, අපි එහෙම නැහැ. අපි මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ දූරදර්ශීව කටයුතු කරලා. උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගන්න පුළුවන් වන විධියට තමයි අපි මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ.

මේ අය වැය හරහා තිරසාර සහ සැමට ප්‍රතිලාභ ලැබෙන ආර්ථික වර්ධනයක් ඇති කර ගැනීම අපේ එක් අරමුණක්. ඒ වාගේම, අපනයන විවිධාංගීකරණය මඟින් ආදායම් ඉහළ නංවා ගැනීමත්, ණය තිරසාරභාවය සහතික කිරීමත්, නිෂ්පාදන

[ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය]

ආර්ථිකය ශක්තිමත් කිරීමත් අපේ උපාය මාර්ගික අරමුණු අතර වෙනවා. ඒ වාගේම, ග්‍රාමීය දිළිඳුභාවය තුරන් කිරීමත්, ඩිජිටල්කරණයත් අරමුණු කරගෙන අපි මේ අය වැය සකස් කර තිබෙනවා.

ඒ වාගේම අපි මේ 2026 වර්ෂය වෙනුවෙන් අය වැය ඉදිරිපත් කරද්දී, විශේෂයෙන්ම ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අවශ්‍යයි කියන කාරණය අවබෝධ කරගෙන තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, මාර්ග සංවර්ධනය වෙනුවෙන් මෙවර අය වැයෙන් රුපියල් මිලියන 342,000ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ග්‍රාමීය මාර්ග සංවර්ධනයට රුපියල් මිලියන 24,000ක ප්‍රතිපාදන වෙන් වෙනකොට, පැරණි පාලම් උපාංග යොදා ගනිමින් ග්‍රාමීය ප්‍රදේශවල පාලම් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 2,500ක ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. ඉතින්, ආර්ථික සංවර්ධනයක් කරා යන ගමනේදී මාර්ග සංවර්ධනය වෙනුවෙන් මෙපමණ විශාල මුදලක් වෙන් කර තිබීම ගැන අපට සතුටු වෙන්න පුළුවන්.

ඒ වාගේම පසුගිය කාලයේදී අපි දැකපු දෙයක් තිබෙනවා. වසර දෙකක්, තුනක්, හතරක් ආපස්සට ගිහිල්ලා බලද්දී, ඉදිකරමින් තිබූ අධිවේගී මාර්ග අතරමඟ නතර කරලා තිබුණා. අපි ඒ සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වලා, මේ වෙනකොට මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත සිට මීරිගම දක්වා වන කොටසේ වැඩ කටයුතු නැවත ආරම්භ කර තිබෙනවා. 2026 වර්ෂයේදී එහි ඉදිකිරීම් කටයුතු කරගෙන යෑම සඳහා රුපියල් මිලියන 66,150ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම කුරුණෑගල සිට දඹුල්ල දක්වා යෝජිත අධිවේගී මාර්ගය වෙනුවෙන් ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු මේ වෙනකොට සිද්ධ වෙනවා. එම ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා 2026 අය වැයෙන් රුපියල් මිලියන 1,000ක මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා.

අපි දකිනවා අද මාර්ග අනතුරු දිනෙන් වැඩි වන බව. මාර්ග අනතුරු අවම කිරීම සඳහා පුළුල් මාර්ග ආරක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන්, වෙන් කර ඇති මුදල්වලට අමතරව තවත් මිලියන 1,000ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම නාගරික සංවර්ධනය, ජල ගැලීම් පාලනය, පානීය ජල සැපයුම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. විශේෂයෙන්ම කියන්නට ඕනෑ, වාරි කර්මාන්තය නඟා සිටුවීම වෙනුවෙන් රුපියල් මිලියන 91,700ක මුදල් ප්‍රමාණයක් වෙන්වෙලා තිබෙනවා. කුඩා වැව්, ඇළ මාර්ග සහ එල්ලංගා පද්ධති වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය වෙනුවෙන් රුපියල් මිලියන 8,350ක මුදල් ප්‍රතිපාදන වෙන්වෙලා තිබෙනවා. ඒ යටතේ වැව් 650ක්, ඒ වාගේම ඇළ මාර්ග කිලෝමීටර 350කට ආසන්න ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අය වැයෙන් මුදල් වෙන්වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මම මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. අපේ ප්‍රධාන විදේශ විනිමය මූලාශ්‍රයක් වන්නේ විදේශ රටවල සිටින ශ්‍රී ලාංකිකයන් විසින් සිදු කරනු ලබන ප්‍රේෂණ. ඒ පිරිස රටේ ආර්ථිකයට දක්වන දායකත්වය ඇගැයීමට ලක් කරමින් මෙවර අය වැයෙන් විදේශගත ශ්‍රමිකයින් සඳහා සහන පොලියට නිවාස ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබෙනවා. ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්ති කාර්යාංශ අරමුදල භාවිත කරමින් තමයි ඒ කටයුත්ත කරන්න යෝජනා වෙලා තිබෙන්නේ.

ඊත් එක්කම මේ කාරණයත් මම අවසාන වශයෙන් කියන්න කැමැතියි. බදු ආදායම් වැඩි කරන්නේ නැතුව තමයි අපි මේ අය වැය සකස් කරලා තිබෙන්නේ. ඒ වාගේම ආර්ථික සංවර්ධන ඉලක්ක කරා යෑමේදී මූල්‍ය විනය පවත්වා ගනිමින්, ඒ වාගේම මූල්‍ය කළමනාකරණය නිසි පරිදි සිද්ධ කරමින් ජනතාව වෙනුවෙන් ප්‍රගතිශීලී අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඉතින්, 2026 අය වැය හරහා වෙන් කර තිබෙන මුදල් සියයට 100ක්ම භාවිතයට ගනිමින්, ආර්ථික ස්ථායීකරණයේදී අපි බලාපොරොත්තු වන ඉලක්ක කරා යමින් කටයුතු කරන්නට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்ததாக, கௌரவ உறுப்பினர் அபூபக்கர் ஆதம்பாவா அவர்கள், உங்களுக்கு 7 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

[பி.ப. 5.44]

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த அரசாங்கம் ஆட்சியேற்று முதலாவது வரவு செலவுத்திட்டத்தை இவ்வருட ஆரம்பத்தில் சமர்ப்பித்து, அதனைத் தொடர்ந்து இரண்டாவது வரவு செலவுத்திட்டத்தினைத் தற்போது சமர்ப்பித்திருக்கின்றது. இந்த வரவு செலவுத்திட்டம் வெறுமனே கடதாசியில் இலக்கங்களினால் எழுதப்பட்டது அல்ல! மாறாக, இந்த நாட்டிலே இருக்கின்ற மக்கள் மனங்களை வெல்லக்கூடியதாக, அவர்கள் எதிர்பார்த்தது போன்று இந்த நாட்டினுடைய பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்காக நாட்டினுடைய மாண்புமிகு சனாதிபதி அவர்களினால் முன்வைக்கப்பட்ட இந்த 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டம், மிகச் சிறந்த ஒன்றென இந்த நாட்டிலும் உலக நாடுகளிலும் பேசப்படுகின்றது. அந்த அடிப்படையிலே பல்வேறு விடயங்களை உள்ளடக்கியதாகக் காணப்படுகின்ற இந்த வரவு செலவுத்திட்டமானது நிலைபேறான, சகலருக்குமான பொருளாதாரத்தை விருத்தி செய்கின்ற, இந்த நாட்டின் பொருளாதாரத்தை ஒரு நிலையானதாக மாற்றக்கூடிய அடிப்படையிலே முன்வைக்கப்பட்டிருக்கின்றது. அதேபோன்று, ஏற்றுமதியைப் பல்வகைமைப்படுத்துதல்மூலம் உயர் வருமானத்தைப் பெற்றுக்கொள்வதற்காக எங்களுடைய உள்நாட்டு உற்பத்திகளை ஏற்றுமதி செய்வது தொடர்பாகவும், அதன்மூலமாக டொலர்களைச் சம்பாதிக்கக்கூடிய விதத்திலும் முன்மொழியப்பட்ட ஒன்றாக இதனை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கிறது.

கடன் நிலைபேற்றுத் தன்மையை உறுதிப்படுத்துதல், உற்பத்திப் பொருளாதாரத்தைப் பலப்படுத்துதல் மற்றும் கிராமிய வறுமையை ஒழித்தல் தொடர்பான விடயங்களும் இதில் கூறப்பட்டுள்ள அதேவேளை, digital மயப்படுத்துதலை உறுதிப்படுத்தல்மூலமாக நாட்டினுடைய பொருளாதாரத்தை மேம்படுத்த முடியும் என்றும் எதிர்பார்க்கப்படுகிறது. அதாவது, இந்த நாட்டிலே பொருளாதாரத்தை digital மயப்படுத்துவதன் மூலமாக 15 மில்லியன் US Dollars எதிர்காலத்தில் சம்பாதிக்க முடியும் என்று நாங்கள் எதிர்பார்க்கின்றோம்.

இந்த அடிப்படையிலே, 2025ஆம் ஆண்டுக்காகச் சமர்ப்பிக்கப்பட்ட கடந்த வரவு செலவுத்திட்டம் தொடர்பாகவும் இங்கு பேசவேண்டும் என்று

நினைக்கின்றேன். குறிப்பாக, எனக்கு முன்னர் பேசிய வடக்கைச் சேர்ந்த ஒரு பாராளுமன்ற உறுப்பினர் தவறான தகவல்களை வழங்கி, இந்தச் சபையைப் பிழையாக வழிநடத்துவதை என்னால் பார்க்கக்கூடியதாக இருந்தது. கடந்த வரவு செலவுத்திட்டத்தில் பல மில்லியன் ரூபாய் வடக்கு, கிழக்குப் பிரதேசங்களுக்குக் ஒதுக்கப்பட்டிருந்தது. குறிப்பாக, அம்பாறை மாவட்டம் 2025ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்திலே சுமார் 18,231.97 மில்லியன் ரூபாயைப் பெற்றிருந்தது. அதுமாத்திரமல்ல, மட்டக்களப்பு மாவட்டம் சுமார் 9,000 மில்லியனுக்கும் அதிகமான தொகையைப் பெற்றிருந்தது. அதன்படி கடந்த வரவு செலவுத்திட் டத்தினூடாகக் கிழக்கு மாகாணம் சிறந்த அபிவிருத்தியைக் கண்டுகொண்டிருப்பதை நாம் கண்ணால் காணக்கூடியதாக இருக்கின்றது. 'அபிவிருத்தி மழை' என்று சொல்லக்கூடிய அளவுக்கு அம்பாறை, மட்டக்களப்பு மாவட்டங்களில் கடந்த 2025ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்திலே ஒதுக்கப்பட்ட நிதி பயன்படுத்தப்பட்டு வருகின்றது. இதுவரை அதில் 90 சதவீதமான நிதி பயன்படுத்தப்பட்டிருப்பதை அவதானிக்கக் கூடியதாக இருக்கின்றது.

குறிப்பாக, இந்த நாட்டின் நெல் உற்பத்தியில் 20 சதவீத உற்பத்தியைச் செய்வது அம்பாறை மாவட்டமாகும். இம்மாவட்டத்திலுள்ள கல்லோயா திட்டத்தின் மீள் நிர்மாணப் பணிக்காகச் சுமார் 900 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு, அந்தப் பணி நடைபெற்றுக் கொண்டிருக்கின்றது. தற்போது அந்த மீள் நிர்மாணப் பணியின் 60 சதவீதமான வேலைகள் பூர்த்தியடைந்திருப்பதை நாங்கள் பார்க்கிறோம். அது முடிவடைகின்றபோது, அம்பாறை மாவட்டத்தின் நெல் உற்பத்தியை 25 சதவீதமாக அதிகரிக்க முடியுமென எதிர்பார்க்கின்றோம்.

சுமார் 90 வருடங்கள் பழைமைவாய்ந்த வரலாறு கூறும் காரைதீவு-மாவடிப்பள்ளிப் பாலம் இதுவரை புனர்நிர்மாணம் செய்யப்படாமலிருந்தது. அது வடக்கையும் தெற்கையும், கிழக்கையும் வடக்கையும் இணைக்கின்ற பாலமாகும். கடந்த 90 வருடங்களாக எதுவுமே செய்யப்படாமல் - 'கார்பெட்' வீதி போடப்பட்டு இருந்தாலும் - மிகவும் நெருங்கிய வீதியாகவே அது இருந்தது. என்னுடைய வாழ்க்கைக் காலத்தில் நூற்றுக்கணக்கானோர் அந்தப் பாலத்தில் உயிரிழந்திருப்பதை நான் அறிந்திருக்கின்றேன். அந்தப் பாலத்தைப் புனர்நிர்மானம் செய்வதற்காகக் கடந்த வரவு செலவுத்திட்டத்திலே இந்த அரசாங்கம் 242.7 மில்லியன் ரூபாயை ஒதுக்கியது என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். எனவே, பிழையான தகவல்கள் மக்களுக்கு வழங்கப்படுவது மிகவும் வேதனையாக உள்ளது.

அதுபோல், "வளமான நாடு - அழகான கடற்கரை" என்ற தொனிப்பொருளின் அடிப்படையிலே நாடு முழுவதும் கடற்கரைப் பூங்காக்களை உருவாக்கும் மாண்புமிகு ஜனாதிபதி அவர்களின் திட்டத்தின்கீழ் சுமார் 10 கடற்கரைப் பூங்காக்களை எங்களுடைய அம்பாறை மாவட்டத்தின் கரையோரப் பிரதேசங்களிலே நிர்மாணித்துக்கொண்டு இருக்கின்றோம். இதற்காக ஒவ்வொரு கடற்கரைப் பூங்காவுக்கும் 1.5 மில்லியன் ரூபாய் - 2 மில்லியன் ரூபாய் என்ற வகையில் ஒதுக்கப்பட்டிருப்பதுடன், இன்னும் பல அபிவிருத்தித் திட்டங்கள் அம்பாறை மாவட்டத்தில் நடைபெற்றுக் கொண்டிருக்கின்றன என்பதை நான் இந்தச் சபைக்குத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

இந்த 2026ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தினூடாக குறிப்பாக, கல்முனை சந்தாங்கேணி விளையாட்டு மைதானத்துக்கு 150 மில்லியன் ரூபாய் ஒதுக்கப் பட்டிருக்கின்றது. சென்ற வரவு செலவுத்திட்டத்திலும் 150 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருந்தது. ஆனால், வளப் பிரச்சினை காரணமாக அதன் அபிவிருத்தி வேலைகளை எங்களால் செய்ய முடியாமற்போனது. தொடர்ந்தும், இந்த வருடமும் மாண்புமிகு ஜனாதிபதி அவர்களுடனும் சம்பந்தப்பட்ட அமைச்சர் அவர்களுடனும் பேசி ஒதுக்கீடு செய்யப்பட்டுள்ள 150 மில்லியன் ரூபாயை அந்த மைதானத்தினுடைய அபிவிருத்திக்காகப் பயன்படுத்த இருக்கின்றோம்.

அத்தோடு, நிந்தவூரில் கட்டிட வேலைகள் ஆரம்பிக்கப் பட்ட கலாசார மண்டப வேலைகள் பூர்த்திசெய்யப்படாமல் 29 வருடங்களாகக் கேட்பார், பார்ப்பார் அற்றுக் கிடந்தது. கடந்த பொதுத் தேர்தலில் மாண்புமிகு ஜனாதிபதி அவர்களும் நாங்களும் நிந்தவூர் மக்களுக்கு வழங்கிய வாக்குறுதியின் பிரகாரம், அந்தக் கலாசார மண்டபத்தைப் புனர்நிர்மாணம் செய்வதற்காக இந்த வரவு செலவுத்திட்டத்தில் 300 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கிறோம். இது தொடர்பாக 28 ஜனவரி 2025 அன்று நிந்தவூர் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் நாங்கள் பேசியது எனக்கு நன்றாக ஞாபகம் இருக்கின்றது. தொடர்ந்து மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் இதுபற்றி பேசியபோது, இதற்கு 100 கோடி ரூபாய் தேவைப்படுவதாகவும் அதை வழங்க முடியாதென்றும் சொல்லியிருந்தார்கள். இருந்தாலும், நாங்கள் எடுத்த முயற்சியின் காரணமாக இப்போது அதற்கு 300 மில்லியன் ரூபாய் வழங்கப்பட்டிருக்கின்றது. எதிர்க்கட்சியில் இருக் கின்றவர்கள் இப்போது அதற்கு உரிமை கோருகின்றார்கள். உண்மையில் நாங்கள் சம்பந்தப்பட்ட அமைச்சரோடும் மாண்புமிகு ஜனாதிபதி அவர்களோடும் பேசித்தான் 300 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீட்டை நிந்தவூர் கலாசார மண்டபத்திற்குக் கொண்டுவந்தோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
நன்றி, கௌரவ உறுப்பினர் அவர்களே!

ගරු අබූබකර් අතම්බාවා මහතා
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)
Sir, please give me one more minute.

அடுத்து, மட்டக்களப்பு மாவட்ட மீனவர்களின் நன்மை கருதி, வாழைச்சேனை மீன்பிடித் துறைமுக மேம்பாட்டுக்காக 350 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. கடந்த வரவு செலவுத்திட்டத்தின் மூலமும் இந்த வரவு செலவுத்திட்டத்தின் மூலமும் வடக்கு, கிழக்கு மாகாணங்கள் பெருமளவு நிதியைப் பெற்று அபிவிருத்தி அடைந்துகொண்டிருப்பதை இந்தச் சந்தர்ப்பத்திலே நான் கூற விரும்புகின்றேன். எதிர்க்கட்சியில் இருப்பவர்கள் இதைப் பார்த்துப் பொறுத்துக்கொள்ள முடியாது, மறைமுகமாக இனவாதத்தைப் பேசி, இந்த நாட்டிலே தமிழர்கள் சிங்களவர்களோடு சேர்ந்து வாழாமலிருக்க பல நுட்பங்களைப் பயன்படுத்துகின்றார்கள். இனங்களுக்கிடையே முரண்பாடுகளை ஏற்படுத்தும் வகையில் இவர்கள் உரை நிகழ்த்துவது இந்த நாட்டினுடைய எதிர்கால அபிவிருத்திக்கும் வளர்ச்சிக்கும் பாதகமாக அமையும் என்ற செய்தியைக் கூறி, விடை பெறுகிறேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்ததாக, கௌரவ உறுப்பினர் சண்முகம் குகதாசன் அவர்கள். உங்களுக்கு 9 நிமிடம் ஒதுக்கப்பட்டுள்ளது.

[பி.ப. 5.52]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த வரவு செலவுத்திட்டத்திலே 26 அமைச்சுகளுக்கான நிதியொதுக்கீடுகள் மற்றும் அபிவிருத்தித் திட்டங்கள் பற்றி குறிப்பிட்டிருந்தாலும், எனக்கு வழங்கப்பட்ட 9 நிமிடத்திலே நான் கல்வி, விவசாயம், மீன்பிடி, வீட்டு வசதி, சுற்றுலா, ஊரக வளர்ச்சி, விளையாட்டு ஆகிய துறைகள் பற்றி கருத்துரைக்கலாம் என்று கருதுகின்றேன்.

ஐக்கிய நாடுகள் சபையின் கல்வி, அறிவியல் மற்றும் பண்பாட்டு நிறுவனத்தின் - UNESCOவின் - உலகளாவிய பரிந்துரையானது, அரசுகள் தமது மொத்த உள்நாட்டு உற்பத்தியில் 4-6 சதவீதம் வரை அல்லது மொத்தப் பொதுச் செலவினத்தில் 15-20 சதவீதம் வரை கல்விக்கு ஒதுக்க வேண்டும் எனக் குறிப்பிடுகின்றது. இந்த வரவு செலவுத்திட்டத்தில் இந்த இலக்கு எட்டப்படவில்லை. மேலும் கல்விக்கான ஒதுக்கீட்டில் 77 சதவீதமான தொகை மீண்டுவரும் செலவினங்களுக்கு ஒதுக்கப்பட்டுள்ளமை சாதகமான ஒரு விடயம் அல்ல. கல்விக்கான மூலதனச் செலவு அதிகரிக்கப்பட வேண்டும்.

இப்பாதீட்டில் கூறப்பட்டுள்ள பல்கலைக்கழக விடுதிகளை நிர்மாணிப்பதற்கான 1,500 மில்லியன் ரூபாய் ஒதுக்கீடானது யாழ்ப்பாணம்-கிளிநொச்சி, வவுனியா மற்றும் கிழக்குப் பல்கலைக்கழகங்களை வெளிப்படையாகப் பெயரிடுகிறது; இதன்மூலம் தொலைதூரப் பகுதிகளைச் சேர்ந்த மாணவர் முகங்கொடுக்கும் முதன்மையான ஒரு சிக்கலுக்குத் தீர்வு காண முனைகின்றது. இந்தச் செயற்பாடனது உட்கட்டமைப்புத் தேவைகளை நிறைவுசெய்ய முற்பட்டாலும், இந்தப் பல்கலைக்கழகங்களின் குறிப்பிட்ட கல்வித் தரத்தை மேம்படுத்துதல், ஆராய்ச்சி நிதி அல்லது தொழில் சார்ந்த பாடத் திட்டங்களை மேம்படுத்துவதற்கான நிதி ஒதுக்கப்படவில்லை. எடுத்துக்காட்டாக, திருகோணமலையில் கடல்சார் அறிவியல், கிளிநொச்சியில் விவசாயத் தொழில்நுட்பம் போன்றவற்றை உருவாக்குவதுபற்றி எதுவும் குறிப்பிடப்படவில்லை.

தொழிற் பயிற்சி மையங்களை மேம்படுத்துவதுபற்றி பாதீட்டில் குறிப்பிடப்பட்டுள்ளது. எனினும், மீன்பிடி, விவசாயம் மற்றும் சுற்றுலா முதலிய உள்ளூர் பொருளாதார வாய்ப்புகளோடு ஒத்துப்போகக்கூடிய தொழிற்பயிற்சி மையங்களை வடக்கு மற்றும் கிழக்கில் நிறுவுவது பற்றியோ அல்லது மேம்படுத்துவது பற்றியோ எதுவும் குறிப்பிடப்படவில்லை.

பாதீட்டின் ஒரு பகுதியாக, 2026ஆம் ஆண்டில் 100 நீர்ப்பாசனத் திட்டங்களை நவீன மயப்படுத்த 1,000 மில்லியன் ரூபாய் முன்மொழியப்பட்டுள்ளது. வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களின் பெரும் பகுதியை உள்ளடக்கிய வரண்ட வலயமும் இதற்கான இலக்குப் பகுதியாகக் குறிப்பிடப்பட்டுள்ளது. புதிய நீர்ப்பாசனத் திட்டங்கள் பற்றி பாதீட்டில் குறிப்பிடப்பட்டாலும், இந்த வரண்ட வலயப் பகுதிகளில் நீர் மேலாண்மையின் முதுகெலும்பாக விளங்கும், போரால் கைவிடப்பட்ட ஆயிரக்கணக்கான பண்டைய நீர்ப்பாசனக் குளங்களை முறையாக மறுசீரமைப்பது பற்றி குறிப்பிடப்படவில்லை; அதற்கான ஒதுக்கீடுகள் எதுவும் இல்லை. எடுத்துக்காட்டாக, திருகோணமலை மாவட்டத்தில் மட்டும் 1985ஆம் ஆண்டுக்கு முன்பு நெற்செய்கை பண்ணப்பட்டுக் கைவிடப்பட்டுள்ள 205 சிறு குளங்களும் 25 அணைக்கட்டுகளும் காணப்படுகின்றன. இவற்றை மீண்டும் பயன்பாட்டுக்குக் கொண்டுவருவதன்மூலம் ஆண்டுக்கு அண்ணளவாக 500,000 மெற்றிக்தொன் அரிசியை உற்பத்தி செய்ய முடியும். இந்த விடயத்தைக் கடந்த வரவு செலவுத்திட்ட விவாதத்தின்போது நான் கூறியிருந்தேன்; மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும் கூறியிருக்கின்றேன். எனினும் எதுவும் நடக்கவில்லை. இதுதொடர்பான நடவடிக்கைகளை மேற்கொண்டால் அரிசி இறக்குமதியைக் குறைக்கலாம்.

குறைந்த வருமானம் கொண்ட குடும்பங்களை இலக்காகக் கொண்ட 'தமக்கெனதோர் இல்லம்-அழகான வாழ்க்கை' என்ற வீடமைப்புத் திட்டத்திற்கு 2026ஆம் ஆண்டின் பாதீட்டில் 3,000 மில்லியன் ரூபாய் கூடுதலாக ஒதுக்கப்பட்டுள்ளது. இது ஒரு தேசிய திட்டம். இதற்கு நாடு முழுவதும் உள்ள பயனாளிகள் தகுதி பெறுவர். எனினும் இதற்குரிய நிதி போதுமானதல்ல. எனவே, இதற்கான நிதி ஒதுக்கம் பன்மடங்கு ஆக்கப்பட வேண்டும்.

அதிக நிலச்சரிவு அபாயத்தை எதிர்கொள்ளும் குடும்பங்களுக்குப் புதிய வீடுகளை வழங்க 2,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இதுவும் போதுமானது அல்ல. இதற்கும் நிதி ஒதுக்கம் பன்மடங்கு ஆக்கப்பட வேண்டும்.

வடக்கு மற்றும் கிழக்கில் போரின் விளைவாக இடம்பெயர்ந்து தரமற்ற தற்காலிகத் தங்குமிடங்களில் வசிக்கும் ஆயிரக்கணக்கான குடும்பங்களுக்கான வீட்டு வசதித் திட்டம்பற்றி எதுவும் குறிப்பிடப்படவில்லை. இவர்களுக்கான சிறப்பு வீடமைப்புத் திட்டங்கள் உருவாக்கப்பட நிதி ஒதுக்கப்பட வேண்டும்.

வடக்கு மாகாணத்தில் பலருக்கு, அரசு குறிப்பிடும் 'தமக்கெனதோர் இல்லம்-அழகான வாழ்க்கை' எனும் திட்டத்தைப் பெறுவதற்கான அடிப்படை முன்நிபந்தனையான 'காணி' என்பதில் சிக்கல் காணப்படுகின்றது. இராணுவம் கையகப்படுத்தி வைத்திருக்கும் இவர்களது நிலத்தை விடுவித்தல் குறித்து பாதீடு அமைதியாக உள்ளது. இந்தக் காணிகள் உரியவர்களிடம் கையளிக்கப்பட்டு, வீடமைத்துக் கொடுக்க ஆவன செய்யவேண்டும்.

சுற்றுலாவை மேம்படுத்துவதற்காக உள்நாட்டு விமான நிலையங்களை உருவாக்குவது குறித்து பாதீடு குறிப்பிடுகின்றது. சிகிரியா மற்றும் திருகோணமலை உள்நாட்டு விமான நிலையங்களின் வளர்ச்சிக்கும் யாழ்ப்பாண பன்னாட்டு விமான நிலையத்தின் செயற்பாடுகளை விரிவுபடுத்துவதற்கும் 1,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளதாகப் பாதீடு குறிப்பிடுகின்றது. இது வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களுக்கு ஒரு குறிப்பிடத்தக்க நேரடி முதலீடாகும். விமான நிலையங்களின் மேம்பாடு பற்றி பாதீட்டில் குறிப்பிடப்பட்டாலும், மாகாணங்களுக்குள் உள்ள சுற்றுலா வலயங்களின் இணைப்புச் சாலைகள், நீர் வழங்கல் மற்றும் கழிவு மேலாண்மையை மேம்படுத்துவதற்கு குறிப்பிட்ட ஒதுக்கீடு எதுவும் இல்லை. எனவே பாதீட்டில் இவற்றையும் கவனத்திற்கொள்ள வேண்டும்.

"இலங்கை ஒரு முன்னணி பன்னாட்டுப் போக்குவரத்து மையமாகத் தன்னை நிலைநிறுத்திக்கொள்ள ஒரு தனித்துவமான வாய்ப்பு உள்ளது" என்று பாதீடு கூறுகின்றது. இது திருகோணமலை இயற்கைத் துறைமுகத்தின் அமைவிட முதன்மையையும், யாழ்ப்பாணத்தின் பண்பாட்டு ஈர்ப்பையும் கருத்திற்கொண்டு, வடக்கு மற்றும் கிழக்கை மறைமுகமாக

உள்ளடக்குகின்றது. எனினும், வடக்கு மற்றும் கிழக்கின் தனித்துவமான சுற்றுலாத் தயாரிப்புகளை மேம்படுத்துவதற்குக் குறிப்பிட்ட திட்டம் அல்லது நிதி ஒதுக்கீடு இந்தப் பாதீட்டில் காணப்படவில்லை. யாழ்ப்பாணத்தின் பண்பாட்டு மரபுகள், யாழ்ப்பாணக் கோட்டை, நல்லூர் கோவில் மற்றும் ஏழு தீவுகளை உள்ளடக்கிய திட்டங்களோ, திருகோணமலையில் புறாத்தீவு தேசிய பூங்காவை உருவாக்குதல், திமிங்கிலத்தைப் பார்ப்பது, நிலாவெளி மற்றும் உப்புவெளியில் கடற்கரைச் சுற்றுலா வசதிகளை மேம்படுத்தும் திட்டங்களோ, மட்டக்களப்பின் தனித்துவமான வாவிகள் சார்ந்த சுற்றுலா அல்லது பண்பாட்டு நடுவங்களை மேம்படுத்துவது பற்றியோ எதுவும் குறிப்பிடப்படவில்லை. இவற்றை மேம்படுத்தும் திட்டங்களோ, நிதி ஒதுக்கமோ இல்லாமல் சுற்றுலாத் துறையை மேம்படுத்த முடியாது என்பதை அரசு கவனத்திற்கொண்டு, இவற்றுக்கு தீர்வு காண ஆவன செய்யவேண்டும்.

'பிரஜாசக்தி' என்று அழைக்கப்படும் ஒருங்கிணைந்த ஊரக மேம்பாட்டுத் திட்ட ஒதுக்கீட்டை இப்பாதீடு 25,000 மில்லியன் ரூபாயாக அதிகரிக்கிறது. இது நாடு முழுவதையும் உள்ளடக்கி, ஒவ்வொரு கிராம அலுவலர் பிரிவிலும் சமூக அபிவிருத்திச் சபைமூலம் செயற்படுத்தப்படும் ஒரு தேசிய திட்டமாகும். இது உள்ளூர்ச் சமூகத்தால் அடையாளம் காணப்பட்ட திட்டங்களுக்கு நிதியளிப்பதற்குச் சாத்தியமான ஒரு வழி என முன்மொழியப்பட்டுள்ளது. எனினும், கிராம மட்டத்தில் கிராம அபிவிருத்திச் சங்கங்கள், மகளிர் கிராம அபிவிருத்திச் சங்கங்கள், சனசமூக நிலையங்கள், கமக்காரர் அமைப்புகள், கடற்றொழிலாளர் அமைப்புகள் என பற்பல ஊரகமட்ட அமைப்புகள் இருக்கும்பொழுது, புதிதாக 'சமூக அபிவிருத்திச் சபை' என்னும் அமைப்பை நிறுவி அதன்மூலம் தேவைகளை அடையாளங் காண முற்படுவதானது, அபிவிருத்தி நோக்கம் கொண்டாதாக அல்லாமல், அரசியல் நோக்கம் கொண்டதாக இருப்பதாக ஆய்வாளர்கள் கருதுகின்றார்கள்.

கிராமப்புறச் சாலைகள் மற்றும் பாலங்களுக்குத் தேசிய ஒதுக்கீடு கிடைக்கிறதே தவிர, பிராந்திய பொருளாதாரத்தை மேம்படுத்துவதற்கான இன்றியமையாத உட்கட்டமைப்புத் திட்டங்கள் பற்றி எதுவும் பாதீட்டில் குறிப்பிடப்படவில்லை. எடுத்துக்காட்டாக, ஏ-9 நெடுஞ்சாலையை உயர் தரத்திற்கு மேம்படுத்துதல், வணிக விருத்திக்காகத் திருகோணமலைத் துறைமுகத்தை மேம்படுத்துதல், கிழக்குத் தொடர்வண்டிப் போக்குவரத்து இணைப்பை மேம்படுத்துதல் முதலியவற்றைக் கூறலாம். இவற்றுக்கு நிதி ஒதுக்க ஆவன செய்ய வேண்டும்.

வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் விளையாட்டு வளாகங்களை மேம்படுத்துவதற்காக 150 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. மேலும், கல்முனை விளையாட்டு மைதானப் பணிகளை நிறைவுசெய்வதற்காக 150 மில்லியன் ரூபாயும், மன்னார் மற்றும் வவுனியா மாவட்டங்களில் உள்ள விளையாட்டரங்குகளை மேம்படுத்த 225 மில்லியன் ரூபாயும் இந்தப் பாதீட்டில் ஒதுக்கப்பட்டுள்ளது. எனினும், வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் விளையாட்டு வளாகங்களை மேம்படுத்துவதற்காக ஒதுக்கப்பட்டுள்ள தொகை போதுமானதல்ல. யாழ்ப்பாணத்தில் உள்ள துரையப்பா விளையாட்டரங்கு, திருகோணமலையில் உள்ள 'மக்கேசர்' விளையாட்டரங்கு, மட்டக்களப்பில் உள்ள 'வெபர்' விளையாட்டரங்கு ஆகியவற்றை மேம்படுத் துவதற்கான நிதி ஒதுக்கீடுகள் எதுவும் பெயர் குறித்து மேற்கொள்ளப்படவில்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கான நேரம் முடிவடைந்துவிட்டது,

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
முடித்துக் கொள்கின்றேன். மேற்படி விளையாட்டரங் குகளை மேம்படுத்துவதன்மூலம் பன்னாட்டு விளையாட்டுப் போட்டிகளை இங்கே நடத்த முடியும். இதன் வழியாக சுற்றுலாப் பயணிகளை ஈர்க்கவும் வெளிநாட்டு நாணய மாற்றை ஈட்டவும் முடியும். நன்றி.

*එකල්හි වේලාව අ. භා. **6.00** වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.*

*එතැන් සිට විවාදය **2025** නොවැම්බර් **14** වන සිකුරාදා පවත්වනු ලැබේ.*

*அப்போது பி. ப. 6.00 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம், 2025 நவம்பர் 14, வெள்ளிக்கிழமை மீளத் தொடங்கும்.*

*It being 6.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Friday, 14th November, 2025.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව, கௌரவ (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்கள்! உங்களுக்கு 10 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

## අක්ෂි සෞඛ්‍යය සඳහා ජාතික ක්‍රමෝපායික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම
### கண் சுகாதாரத்துக்கென தேசிய மூலோபாயத் திட்டமொன்றைச் செயற்படுத்தல்
IMPLEMENTATION OF A NATIONAL STRATEGIC PLAN FOR EYE HEALTH

[6.01 p.m.]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I am grateful for the opportunity to move the following Adjournment Motion, which relates to the implementation of the National Strategic Plan for Eye Health in Sri Lanka.

> "The proposed National Plan envisions eliminating avoidable blindness and integrating primary eye care into a sustainable national programme aligned with WHO goals. Its objectives include achieving over 90 per cent cataract surgical coverage, expanding diabetic retinopathy and glaucoma screening, conducting annual school eye screenings, training primary health staff and upgrading hospitals with tele-ophthalmology and AI-assisted screening.
>
> Implementation through the Ministry of Health, the National Programme for the Control of Blindness, and provincial health authorities will ensure coordination, monitoring, and data-driven interventions. Partnerships with NGOs, private sector, and WHO/IAPB are essential for financing and sustainability.
>
> The Plan proposes a phased implementation over ten years, aiming for measurable outcomes including a 25 per cent reduction in avoidable blindness by 2030.
>
> Therefore, this House urges the Ministry of Health to immediately adopt and operationalize the National Strategic Plan for Eye Health to ensure equitable access, strengthen preventive services, and protect the vision and quality of life of all Sri Lankans."

Sir, Parliament must pay urgent attention to the implementation of the National Strategic Plan for Eye Health in Sri Lanka. Currently, blindness affects 1.7 per cent of adults over 40 years, mainly due to cataract, uncorrected refractive errors, glaucoma, diabetic retinopathy and childhood blindness. The country faces a backlog of 1.5 million cataract surgeries due to the rising elderly and diabetic population.

මම මේ අවස්ථාව පාවිච්චි කරනවා තවදුරටත් ඒ ගැන පොඩ්ඩක් කථා කරන්න. ඇත්තටම අපේ රටේ මිනිස්සුන්ගෙන් සියයට 1.7ක්, ඒ කියන්නේ මිනිස්සු 1,000ක් ගත්තොත් එයින් 17දෙනෙක් blind; ඇස් පෙනෙන්නේ නැහැ. අපේ රටේ 22.6 million වන total ජනගහනයෙන්, ඇස් පෙනෙන්නේ නැති ජනතාවක් ඉන්නවා 3.86 million. Surgeries සඳහා තිබෙන pending list එක ගත්තාම, ඇස් පෙනෙන්නේ නැතිවීමට ප්‍රධාන කාරණාව - cause එක - විධියට තිබෙන්නේ cataract. Annually, cataract surgeries 150,000ක් පමණ කරනවා. හැබැයි, සාමාන්‍යයෙන් one million පිරිසකගෙන් අපට surgeries කරන්න target එක තිබෙන්නේ 4,500කගේ පමණ. ඒ කියන්නේ, one million මිනිස්සු ගත්තාම, 4,500 surgeries කරන්න ඕනෑ. හැබැයි, අපේ රටේ දැනට කරන්නේ 3,000 surgeries. එතකොට එතැන 1,500ක gap එකක් තිබෙනවා.

මම මෙතැනදී මේ කාරණයත් කියන්න ඕනෑ. උතුරු පළාතේ ඉන්න Dr. Malaravan කියන්නේ, eye surgeon කෙනෙක්. ඔහු සේවය කරන hospital එක තමයි, දැනට ලංකාවේ cataract surgeries සඳහා backlog එකක් නැති එකම hospital එක. ඔබතුමන්ලා අද ආවොත්, හෙට වෙනකොට ඔබතුමන්ලාට cataract surgery එක කරලා දෙනවා. මම ඒ ගැන මෙතැනදී specially කියන්න ඕනෑ. හැබැයි, දකුණේ ඕනෑම hospital එකක් අරගෙන බලන්න, මාස 6ක පමණ backlog එකක් තිබෙනවා.

සමහරු කියනවා, අපි මෙතැනට ඇවිල්ලා පිස්සු දොඩවනවා කියලා. නමුත් අපට මේ වාගේ professional විධියට කථා කරන්නත් පුළුවන්. Januaryවල අපි අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට proposal එකක් ඉදිරිපත් කළා, national eye health plan එකක් ගෙනෙන්න කියලා. ඒ කියන්නේ, හැම hospital එකකටම එක plan එකක් ගෙනෙන්න කියලා Januaryවල අපි ලියුමක් දැම්මා. ඒ ලියුම Juneවල ජනාධිපති ලේකම් කාර්යාලයෙන් සෞඛ්‍ය ඇමතිට යවලා තිබුණා, වහාම ඒ සම්බන්ධ වැඩ කටයුතු කරන්න කියලා. හැබැයි, අද උදේ වෙනකම් කිසි දෙයක් කර තිබුණේ නැහැ. අද Sectoral Oversight Committee එකේදී මම Secretaryගෙන් ඇහුවා. -ඒ මගේ ලොක්කා; මගේ සර් කෙනෙක්- මේකට මොකක් හරි කරලා තිබෙනවාද කියලා. "නැහැ, පුතා මොකුත් කරලා නැහැ" කිව්වා. එතැන තමයි වැඩේ තිබෙන්නේ. ආණ්ඩුව ගත්තාම, අනුර කුමාර දිසානායකට මේ රට කොහොම හරි ගොඩගන්න ඕනෑ කියලා idea එකක් තිබෙනවා. ඒ නිසා තමයි මිනිස්සු බරපතළ විධියට හිතලා ඡන්දය දුන්නේ. ආණ්ඩුව යටතේ ඇමතිලා ඉන්නවා. ඒ ඇමතිලා තමයි ඒ වගකීම භාර ගන්න ඕනෑ. අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමාට හෝ Deputy Ministerට හෝ හැම එකටම ඔළුව දමලා අරක කළාද, මේක කළාද කියලා බලන්න බැහැ. මම මේ අත දිගු කරන්නේ ඒ අයට පහළ ඉන්නා නිලධාරීන්ට. ජනාධිපති ලේකම් Juneවල ලියුමක් දමා තිබෙනවා, මේ සම්බන්ධ වහාම action ගන්න කියලා. මෙතැන ලොකු මාෆියා එකක් තිබෙනවා. මම ඒ ගැනත් කියන්න ඕනෑ.

කොළඹ තිබෙන ලොකුම eye hospital එකකට - ඒ කියන්නේ, government hospital එකකට නොවෙයි, private hospital එකකට - ගියොත් cataract surgery එකක් කරගන්න නම් රුපියල් ලක්ෂ 1 ½ක් පමණ ඕනෑ. හැබැයි, සාමාන්‍ය cost එක වන්නේ US Dollars 400. ඒ කියන්නේ Rs. 120,000. Rs. 120,000 ඉඳලා Rs. 2 lakhs විතර වෙනකම් වියදම් වෙනවා. අපි ඉල්ලන්නේ national eye health policy එකක් අරගෙන strategic plan එකක් හදා ගනිමු කියලා. අපි අවුරුද්දකට කලින් ඒ ලියුම දැම්මේ. Deputy Minister, මට උත්තර දෙන්න, ඔයගොල්ලන් මේ ලියුමට reply එකක් දෙන්නේ කවදාද කියලා. මෙතැනදී තමයි අනුර කුමාර දිසානායක සහෝදරයාගේ ඔක්කෝම ටික කැඩෙන්නේ. ඔක්කෝම ටික කැඩෙනවා කියන්නේ එතුමාට වුවමනාව තිබුණාට කරලා නැහැ.

මේ ආණ්ඩුව බලය ගත්තේ එකම පුද්ගලයෙකුගේ නමට; අනුර කුමාර දිසානායක කියන නමට. මමත් රැවටුණා. මම ඔයගොල්ලන් වෙනුවෙන් උතුරේ වැඩ කළා. මතක තියා ගන්න, ඔයගොල්ලන් මට කොච්චර කෑ ගැහුවත්, මට පිස්සා කිව්වත්, ඔයගොල්ලන්ට ඡන්දය දෙන්න කියලා ඔයගොල්ලන් වෙනුවෙන් උතුරේදී කථා කරපු එකම පුද්ගලයා මම. හැබැයි, අන්තිමට මටත් කිව්වා, කුඩුකාරයා කියලා. අන්තිමට, විපක්ෂයේ ඉන්න හැමෝම කුඩුකාරයෝ කියලා කිව්වා. ඒ කියන්නේ, මමත් කුඩුකාරයෙක් කියලා නේ කිව්වේ. ඒවා මගේ හිතේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මාසයකට කලින් යුරෝපයට ගියා. One month මම හිටියේ Europeවල. බලන්න, එහේ එක doctor කෙනෙකුට EUR 20,000 පඩි ගෙවනවා.

එතකොට අපේ රටේ කොහොමද? අපේ රටේ eye surgeon කෙනෙකුට පිටරටදී Rs. 80 lakhs විතර හම්බ වෙනවා. ඒ නිසා eye surgeonsලා පිට රට යනවා. අනෙක් surgeonsලාත් පිට රට යනවා. හැබැයි, අපි මොකක්ද කරන්නේ? අපි කැබ් ගෙන්වනවා. කැබ් එක දෙන්න අපට. අපි තමයි කිව්වේ, කැබ් එකත් ඕනෑ, පාර්ලිමේන්තුවත් ඕනෑ කියලා. ඔබතුමන්ලා කිව්වේ "අපි බස් එකේ ගිහිල්ලා වැඩ කරනවා, යමු බස් එකේ" කියලා. ඒ නිසා අපට දෙන්න කැබ් එක, අපට දෙන්න V8 එක. දැන් ජනාධිපතිතුමා යන්නේ V8 එකේ. Prime Minister යන්නේ V8 එකේ. හැබැයි, හර්ෂණ නානායක්කාර ඇමතිතුමා කිව්වා, අපේ මලෛයහම් මිනිස්සු කක්කුස්සි බකට් එක බලාපොරොත්තු වෙන මිනිස්සු කියලා. ඒ මිනිස්සු ඒවාටද ඡන්දය දුන්නේ? මම පෞද්ගලිකව ගිහිල්ලා ඔයගොල්ලන් වෙනුවෙන් අපේ මිනිස්සු එක්ක රණ්ඩු වුණා. මට ඔවුන් කිව්වා, "සිංහල ජනාධිපතිට support කරනවා" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අපි ඔයගොල්ලන්ගේ පස්සේ ආවා. දැන් අපට විරුද්ධ වෙලා ඉන්නේ මොකටද? අපිත් කුඩුකාරයෝ කිව්වා. කවුරු හරි අත ඔසවලා කියන්න, මම කුඩුකාරයෙක්ද කියලා. මමත් හොරෙක් කිව්වා. අන්තිමට මාත් එළවලා දැම්මා. ඔයගොල්ලන්ට බරක් වෙලා තිබෙන්නේ, මම. Deputy Ministerගේ කාර්යාලයටත් ඇවිල්ලා කීප දවසක් මම කථා කළා. අන්තිමට කිව්වා, මමත් කුඩුකාරයා කියලා. ඔයගොල්ලන්ට උදවු කරන්න ආපු මිනිස්සු ඔයගොල්ලන්ම එළවනවා. එළවනකොට අපි විරුද්ධ වෙනවා. ඒකයි වෙලා තිබෙන්නේ.

අද බලන්න, doctorsලා 1,500ක්, 2,000ක්, ඒ වාගේම consultantsලා රට දාලා යනවා. ඔයගොල්ලන්ට යෝජනාව ගේන්න තිබුණා, 2028දී හරි car permit එක දෙනවා කියලා. ඒ ගැන හිතලා බලන්නකෝ. Doctor කෙනෙක් කියන්නේ, SL Grade IIවල ඉන්න කෙනෙක්. මමත් ඩොක්ටර් කෙනෙක්. Deputy Minister of Health මේ සභාවේ වාඩි වෙලා ඉන්නවා. SL Grade එකක් නැති GA කෙනෙක් කැබ් එකේ යනවා. අපි යන්නේ මොකකද? අපි රුපියල් ලක්ෂ 150ක loan එකක් අරගෙන, ඒකෙන් වාහනයක් අරගෙන, ඊට පස්සේ හොරු කියන නමත් අරගන්නවා. Doctorsලා ටික දැන් රට පනිනවා. ඒ රටවල ලක්ෂ 80ක් පඩි. අපේ රටේ රුපියල් ලක්ෂ දෙකයි පඩිය. කොහොමද ඩොක්ටර් කෙනෙක් අපේ රටේ ජීවත් වෙන්නේ? අද මම pass out වුණත් මට කාර් එකක් ගන්න පුළුවන්ද කියලා හිතලා බලන්නකෝ. අනේ, කරුණාකරලා මේ ගැන හිතන්න. අපි ඔයගොල්ලන්ට උපරිම support එක දෙනවා.

මම පළමුවැනි දවසේ ඇවිල්ලා මොකක්ද කිව්වේ? අනුර කුමාර දිසානායක වෙනුවෙන් මම මැරෙන්න වුණත් කැමැතියි කිව්වා. අන්තිමට මට කිව්වා කුඩුකාරයා කියලා. මගේ පස්සෙන් එළව, එළවා ඇවිල්ලා මට නඩු දැම්මා. හැබැයි, ඔයගොල්ලන් ගෙදර යවන්න ඕනෑ නම් මට උතුරේ ඒ දේ නිකම්ම කරන්න පුළුවන්; අදත් පුළුවන්. පළාත් පාලන ඡන්දයේදී මොකද වුණේ? දැන් ඔයගොල්ලන්ට පළාත් සභා ඡන්දය තියන්න පුළුවන්ද? ඔයගොල්ලන්ට උතුරේ කවුරු හරි ඉන්නවාද? හතර දෙනෙක් ඉන්නවා. අනේ, කියන්නකෝ, ඒ හතර දෙනාට කට වහගෙන ඉන්න කියලා. අපි ඔයාලා බේරලා දෙන්නම්, උතුරේ. මම බේරලා දෙන්නම්, උතුරේ. මට ඔය තනතුරු ඕනෑ නැහැ. Deputy Minister හරි Minister හරි තනතුරු ඕනෑ නැහැ. DCC meetingsවලදී මම කිව්වා, මම වැඩ කරනවා කියලා. අන්තිමට DCC meeting එකේදී මට පිස්සා කියලා බැන්නා. කරුණාකරලා මම කියන දේ අහන්න. මට ඕනෑ නැහැ, ඔය ආණ්ඩුව යවලා මේ අය ආණ්ඩුවට ගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තත්පරයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපට හැමෝම එකයි. විපක්ෂයේ මේ අය ආණ්ඩුවේ හිටියත් එකයි. ඔබතුමන්ලා ආණ්ඩුවේ හිටියත් එකයි. අපට වෙන්න ඕනෑ මොකක්ද? යම්කිසි ප්‍රමාණයකට වැඩ කරන්න ඕනෑ. උතුරේ hospitals තිබෙන හැටි බලන්න. දකුණේ ඉඳලා යන දොස්තරලා දවස් පහයි වැඩ කරන්නේ. ඉතුරු දවස් 25ම ඉන්නේ කොළඹ ලංකා හොස්පිට්ල් එකේයි, ආසිරි එකේයි. ඔයගොල්ලන් මොනවාද කරන්නේ? ඔයගොල්ලන් මොකුත්ම කරන්නේ නැහැ. මම වංචා, දූෂණ ගැන,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
තත්පරයක් දෙන්න. මේක මගේ Adjournment Motion එකක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් විනාඩි 10ක් අවසන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
වංචා, දූෂණ කියලා documents පහක් ගැහුවා. Deputy Minister කියන්න, අද වෙනකල් ඔයගොල්ලන් ඒ සම්බන්ධයෙන් inquiry කරන්න පටන් ගත්තාද කියලා. ඒක නේ වෙලා තිබෙන්නේ. එතකොට මිනිස්සුන්ට විශ්වාසය නැති වෙනවා. ඒකයි අපි ඔයගොල්ලන්ට කිව්වේ, මහන්සි වෙලා වැඩ කරන්න කියලා. අපි පිස්සොද? මම Master of Science Degree එකක් Medical Administrationවලින් අරගෙන, MBBS එකත් අරගෙන මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ දේවල් කිව්වාම, සමහර

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියනවා, අපට පිස්සු කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තත්පරයක් දෙන්න, මම අවසන් කරන්නම්; I will wind up.

එක්කෙනෙක් කිව්වා, මට පිස්සු කියලා. අන්තිමට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අපි නොවෙයි.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු (වෛද්‍ය) පී. සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[6.11 p.m.]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Hon. Presiding Member, I second the Adjournment Motion on the implementation of a National Strategic Plan for Eye Health in Sri Lanka moved by the Hon. (Dr.) Ramanathan Archchuna. In Sinhala, it is "අක්ෂි සෞඛ්‍යය සඳහා ජාතික උපාය මාර්ගික සැලසුම". Actually, Sri Lanka is struggling to prevent blindness among 1.7 per cent of adults who are less than 40 years of age. ඒකට ලොකු බලපෑමක් තිබෙනවා.

Hon. (Dr.) Ramanathan Archchuna சிங்களத்திலும் ஆங்கிலத்திலும் உரையாற்றியதால், நான் இந்த விடயத்தைத் தமிழில் கூறலாமென நினைக்கின்றேன். இலங்கையில் 40 yearsக்கு உட்பட்ட adultsக்கு மத்தியிலுள்ள blindnessஐ 1.5சதவீதமாகக் குறைப்பதில், அந்த achievementஐ அடைவதில் நிறையப் பிரச்சினைகள் இருக்கின்றன. முக்கியமாக, blindnessஐ prevent பண்ணுவதற்கு உரிய நடவடிக்கைகள் முறையாக எடுக்கப்படவில்லை என்பது பாரிய பிரச்சினையாக இருக்கின்றது. கண் பார்வை இல்லாமல் போவதற்கு மிக முக்கிய காரணமாகச் சொல்லப்படுவது cataract. அதுதவிர, refractive errorsஐ correct பண்ணாமல் விடுவது, glaucoma, diabetic retinopathy என நிறையக் காரணங்கள் இருக்கின்றன. இந்த proposalமூலம் சொல்ல வருகின்ற விடயம் என்னவென்றால், இவ்விடயம் தொடர்பில் இலங்கையில் ஒரு தேசிய திட்டத்தை உருவாக்கி, அதனூடாக இந்த பார்வைக் குறைபாட்டை நிரந்தரமாக இல்லாமல் செய்வதற்கான உபாய மார்க்கத்தையும் - அதற்குரிய வழிமுறைகளை - செய்ய வேண்டும் என்பதுதான். இந்த proposal மிகவும் முக்கியமானதொரு proposal. எனவே, இதைச் செய்ய வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இப்போது இலங்கையில் cataract surgery செய்ய வேண்டியவர்கள் 1.5 மில்லியன் இருப்பதாகச் சொல்லப் படுகின்றது. வடக்கு மாகாணத்திலுள்ள முக்கியமான இரண்டு வைத்தியசாலைகளில் குறிப்பாக, யாழ்ப்பாணம் Teaching Hospitalஇலும் Vavuniya General Hospitalஇலும் இப்போது cataract surgery செய்ய வேண்டியவர்களின் எண்ணிக்கை பெரிதாக இல்லை. யாழ்ப்பாணத்தில் Dr. Malaravan எப்படி சிறப்பாக சேவை செய்கிறாரோ, அதேபோல Vavuniya General Hospitalஇல் Dr. Kiritharan சேவை செய்கிறார். அங்கு ஒரு மாதத்துக்கு 400-450 cataract surgery ஒரு eye surgeonஆல் ஒரு Theatreஇல் செய்யக்கூடியதாக இருக்கின்றது. அதேபோல், இலங்கையிலுள்ள எல்லா இடங்களிலும் செய்தால் இவ்வளவு பெரிய backlog இருக்காது என்பது என்னுடைய கருத்தாகும்.

Northern Provinceஇல் Cataract Surgery Rate - CSR - கிட்டத்தட்ட 15. அதாவது, ஆயிரம் பேருக்கு 15 என்ற அடிப்படையில் இருக்கிறது. UKஇல் CSR 8. ஒட்டுமொத்த SriLankaஇல் CSR 03. எங்களுடைய வடக்கு மாகாணத்தில் இவ்வளவு பெரிய தொகையினருக்கு அந்தச் சிகிச்சையைச் செய்யக்கூடியதாக இருக்கிறது. இதற்கு தனியே அரசாங்கம்தான் செலவழிக்க வேண்டும் என்று இல்லை. அந்த வகையில், இலங்கை முழுவதும் இப்படியான முயற்சியை எடுத்தால் அதற்கு உதவி செய்வதற்கு நிறைய அரச சார்பற்ற நிறுவனங்களும் - NGOs - சர்வதேச நிறுவனங்களும் தயாராக இருக்கின்றன. அவற்றின் உதவிகளைப் பெற்றுத்தான் வடக்கு மாகாணத்தில் இப்படி ஒரு பெரிய achievementஐ அடைய முடிந்திருக்கிறது. Cataract Surgery Rateஆனது UKஇல் 8ஆக இருக்கும்போது, வடக்கு மாகாணத்தில் அதை 15க்குக் கொண்டுவந்து இருக்கிறார்கள். இது குறித்த unitஇன் வைத்தியர்களோடு சேர்ந்து இயங்குகின்ற பணிக் குழாமின் கூட்டு முயற்சியால்தான் செய்யப்பட்டு இருக்கிறது.

கௌரவ இராமநாதன் அர்ச்சுனா அவர்களால் முன்மொழியப்பட்டுள்ள கண் சுகாதாரத்துக்கான தேசிய மூலோபாயத் திட்டம் தொடர்பான பிரேரணை மிகவும் முக்கியமானது. அதை ஆமோதிப்பதில் நான் பெருமையடைகின்றேன். மேற்குறித்த முன்மொழிவு இலங்கையில் நடைமுறைக்கு வருமாக இருந்தால், இலங்கையில் கண்பார்வை அற்றவர்களை நிரந்தரமான இல்லாமல் செய்யக்கூடிய காலம் வெகுவிரைவில் எங்களுக்குக் கிடைக்குமெனக் கூறி, விடை பெறுகிறேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ எஸ். ஸ்ரீ பவானந்தராஜா அவர்கள்! உங்களுக்கு ஏழு நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

[6.15 p.m.]

**ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)
Hon. Presiding Member, I very much appreciate the Adjournment Motion moved by the Hon. (Dr.) Ramanathan Archchuna, Member of the Opposition, in this House. As we all know, our health indexes are very much equal to those of the countries in this region and the global level as well. All those have been materialized due to implementation of national programmes in this country, but our indicators relating to blindness and other

visual impairments are below the required level, when compared with other countries in this region. That is because there has been  no national plan for eye health care. So, this is the right time to implement a National Strategic Plan especially to improve eye health in this country.

Blindness and other visual impairments, particularly among adults, reduce the quality of life and lower productivity. That also increases dependency and causes a significant economic loss to the country. So, to address those growing health concerns, the implementation of a national plan for eye health care is very much important.

It is essential to implement a National Strategic Plan to prevent blindness. That national plan should include integration of eye care into our primary health care system and a national screening programme for cataract, refractive errors and diabetic retinopathy. Also, it should have legal support to establish a public-private partnership, which is very much important to bear the cost.

This national plan should have the following targets: fulfilling the WHO SPECS 2030 goals, effective coverage of cataract surgeries, issuing spectacles to patients following cataract surgeries for rehabilitation of the eye vision,  regular screening for 80 per cent of the diabetic patients, increase the coverage of refractive error correction, one hundred percent coverage for premature babies with retinopathy and ensuring screening of pre-school children and managing them effectively. All these will help improve the vision of the people of our nation. Also, we have to improve the number of corneal transplantations, which is very much less compared to other countries.

Further, I wish to inform Parliament that in the Jaffna Teaching Hospital, from January to October, more than 10,341 cataract surgeries had been done, which is a very good number and we have to appreciate that team led by Dr. Malaravan and consisting of other staff of the hospital. He told us that, now, he gets patients from Kalutara and Padaviya in Anuradhapura as well for cataract surgeries.

Therefore, it is time to implement this National Strategic Plan to improve the eye vision and prevent blindness of our people so that it will help improve our economy and reduce their dependency on others.

Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුරු කථාව, ගරු (වෛද්‍ය) හංසක විජේමුණි නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 6.20]

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, අද සභාව කල් තබන අවස්ථාවේ අක්ෂි රෝග සම්බන්ධ ජාතික උපාය මාර්ගික සැලැස්මක් ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජනාවක් ගෙන ඒම ගැන. අපට උපාය මාර්ගික සැලැස්මක් අවශ්‍ය වෙනවා. උපාය මාර්ගික සැලැස්මක් අපේ අමාත්‍යාංශය සකස් කරලා තිබෙනවා. ඒ උපාය මාර්ගික සැලැස්ම WHO - Vision 2030 ඉලක්කවලට අනුකූලව හදපු උපාය මාර්ගික සැලැස්මක්.  2030 වන විට ලෝකයේ අක්ෂි රෝග සම්බන්ධ නිර්ණායකවලට අනුකූලව තමයි ඒක සකස් කරලා තිබෙන්නේ.

එහිදී අපි බලාපොරොත්තු වෙනවා, ඇසේ සුද ඉවත් කිරීමේ සැත්කම් සඳහා ඵලදායී ආවරණය සියයට 30කින් වැඩි කිරීමට. ඇත්තටම ලංකාවේ මේ service එකේ gap එකක් තිබෙනවා. එම නිසා පසුගිය කාලයේ අපි College of Ophthalmologistsහි eye surgeonලාත් එක්ක එකතු වෙලා විශේෂ වැඩසටහන් පැවැත්වූවා. විශේෂයෙන්ම පෝලිම් වැඩිපුර තිබෙන තැන්වල විශේෂ වැඩසටහන් හරහා පෝලිම්වල සිටින ප්‍රමාණය ඉක්මනින් අඩු  කළා. එහිදී අපට බොහෝ තැන්වල තිබෙන පොරොත්තු ලේඛන කෙටි කර ගන්න පුළුවන් වුණා.

ඒ වාගේම ජනාධිපති අරමුදලින් අපි විශේෂ මුදලක් වෙන් කරලා තිබෙනවා, පෞද්ගලික අංශයට හෝ යොමු කරලා පෝලිම්වල සිටින රෝගීන්ගේ cataract surgeries පුළුවන් තරම් ඉක්මනට  කරන්න.

මොකද, ඒක, preventable blindness; ඒ කියන්නේ, එය වළක්වාගත හැකි අන්ධභාවයක්. ඇසේ සුද ගොඩක් ඇවිල්ලා ගොඩක් කාලයක් තිබුණොත්, ඒක යථා තත්ත්වයට පත් කළ නොහැකි වෙනවා. ඒක තමයි එහි තිබෙන අවාසනාවන්ත තත්ත්වය. ඇසේ සුද ඉවත් කළාටම බැහැ. ඊට පස්සේ ඔවුන්ට ඇස් කණ්ණාඩි දෙන්න ඕනෑ. ඊළඟ ප්‍රශ්නය එයයි. එහෙම වැඩසටහනක් ලංකාවේ හරියාකාරව ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා operation එක කළාට පස්සේ ඔවුන්ට ඇස් කණ්ණාඩි ලබා දීමේ වැඩසටහනක් අපි ක්‍රියාත්මක කරනවා.

ඒ වාගේම, diabetic retinopathy ගැන කියනවා නම්, දියවැඩියාව හැදුණාට පසුව ඇසේ වෙනස්වීම් සිදු වෙනවා; retinopathy තත්වයක් ඇති වෙනවා. ඒකත් ලංකාවේ මිනිසුන්ගේ ඇස් නොපෙනීමට ප්‍රධාන හේතුවක්. ඒක ඇත්තටම වළක්වා ගත හැකි එකක්. ඒ නිසා ඒ සම්බන්ධයෙන් කරන්න ඕනෑ දෙය තමයි, දියවැඩියාව තිබෙනවා නම් අවුරුද්දකට සැරයක්වත් ඇස් check කරලා බලන එක. ඒ සඳහා වන රෝහල්වල පහසුකම් අපි වැඩි දියුණු කරලා තිබෙනවා. ඒ වාගේම ඒ සඳහා පහසුකම් නැති රෝහල්වල රෝගීන් පහසුකම් තිබෙන රෝහල්වලට යොමු කිරීමේ ක්‍රියාවලියක් අපි සකසා තිබෙනවා. ඒ වාගේම, ප්‍රතිලෝම දෘෂ්ටි දෝෂ - refractive errors - නිවැරැදි කිරීම ගැන කියනවා නම්, ඒක කණ්ණාඩියක් දමලා තමයි හදන්න ඕනෑ. ඒ දෝෂ සොයා ගැනීමට සහ එයට සහාය දීමට අපි වැඩ පිළිවෙළක් සකසලා  තිබෙන්නේ. ඒ වාගේමයි, retinopathy of prematurity.

[ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා]

ඒ කියන්නේ, අඩු වයසින් - නියමිත දිනයට ප්‍රථම - උපදින ළමයින්ගේ ඇස් නියමිත පරිදි වර්ධනය වෙලා නැහැ. ඒ නිසා අපි ඒ ගොල්ලන් සියයට 100ක් පරීක්ෂාවට ලක් කළ යුතුයි. ඒ සඳහා වූ සහතික කිරීමේ ක්‍රමයක්, සහතික කළ දත්ත ලබා ගැනීමේ ක්‍රමයක් අපි සකසා තිබෙනවා.

ඒ වාගේම, පාසල්වල සහ පෙර පාසල්වල ළමයින්ගේ දෘෂ්ටිය check කිරීමේ වැඩසටහන් අපි ක්‍රියාත්මක කරනවා. ළමයින් 200ට අඩු පාසල් නම්, අපි අවුරුද්දෙන් අවුරුද්දට පරීක්ෂා කර බලනවා. ඒ වාගේම ළමයින් 200ට වැඩි පාසල්වල 1, 4, 7 කියන ශ්‍රේණිවල ළමයින්ගේ ඇස් check කරනවා. ඒක ලංකාවේම කරනවා. ඒකට අපට අවශ්‍ය දේවල් ගෙන්වා ගන්නවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, errors තිබෙන ළමයින් රෝහල් වෙත යොමු කළාට පස්සේ ඒ රෝහල්වලින් නිසි පරිදි ඒ ප්‍රතිකාරය ලැබෙනවාද කියන එකයි. විශේෂයෙන්ම ඒ ළමයින්ට අවශ්‍ය කණ්ණාඩි ලබා දීමේ ක්‍රමයක් සහිත වැඩසටහන් ලංකාවේ නැහැ. ලංකාවේ දැනට තිබෙන ක්‍රමය තමයි, ඇස් කණ්ණාඩිය අරගෙන ආවාට පසුව ඒ බිලෙන් යම්කිසි මුදලක් රජය විසින් ගෙවීම. නමුත් අප කළ යුත්තේ, අපම මැදිහත් වෙලා ඒ කණ්ණාඩිය අරගෙන දෙන එකයි. එහිදී අපට අඩු මිලකට කණ්ණාඩි ලබා දෙන්නත් පුළුවන්. ඒ වාගේම රජයට යන වියදම අඩු කර ගන්නත් පුළුවන්. මා දන්නා විධියට කොළඹ, නුවර රෝහල්වල ඒ කණ්ණාඩි සෑදීමට අවශ්‍ය techniciansලා ඉන්නවා; උපකරණ ඔක්කෝම තිබෙනවා. මා හිතන්නේ තවත් රෝහල්වල ඒ දේවල් තිබෙනවා ඇති. නමුත් ඒක කාලයක් තිස්සේ මේ රෝහල් පද්ධතියෙන් අයින් වෙලා තිබෙන ප්‍රශ්නයක් තමයි තිබෙන්නේ.

ඒ වාගේමයි, corneal opacity කියන එක. ඒ කියන්නේ, කුනීත අන්ධභාවය. ඒකත් ප්‍රශ්නයක්. ඇත්තටම ලංකාව තමයි ගොඩක් quality කුනීත ලබා දෙන්නේ. ඒ කියන්නේ අපේ සමහරු මිය ගියාට පස්සේ ඇස් දන් දෙනවා නේ. එතකොට තමයි කුනීත ගන්නේ. අපි ඒවා පිට රටවලටත් යවනවා. ගොඩක් පිට රට යවනවා වාගේම 2011 වසරේ ඉඳලා 2025 සැප්තැම්බර් 30 වන විට ශ්‍රී ලංකා ජාතික අක්ෂි රෝහල මඟින් කුනීත පටක බද්ධ කිරීමේ ශල්‍යකර්ම 15,549ක් සාර්ථකව කරලා තිබෙනවා. ඒ පිළිබඳව වූ සියලු තොරතුරු සඳහන් වගුව ඕනෑම කෙනෙකුට බලා ගැනීම සඳහා මම **සභාගත*** කරනවා.

අපේ රටේ අක්ෂි රෝග විශේෂඥයන්ගේ යම් හිඟයක් තිබෙනවා. ඒ වාගේම deliver කරන service එකේ quality එක පිළිබඳවත් ප්‍රශ්න තිබෙනවා. ඇත්තටම ඒ බොහෝ ප්‍රශ්න පරිපාලන ප්‍රශ්න, ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමාත් කියපු විධියටම. ඒ පරිපාලන ප්‍රශ්න විසඳීම සඳහා වූ උපරිම ක්‍රියාමාර්ග අපි ගනිමින් ඉන්නවා.

ඒ වාගේම යම්කිසි ආකාරයකට සංවිධානාත්මකව රෝගීන් පිටතට යොමු කිරීම සහ ලොකු මුදලක් අය කිරීමක් සිදු වෙනවා නම්, අපි ඒ ගැන ඇත්තටම සොයා බැලිය යුතුව තිබෙනවා.

ඒ වාගේම, ගරු මන්ත්‍රීතුමාගේ ලිපිවලට පිළිතුරු නොලැබීමේ කථාවකුත් කිව්වා.

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

අමාත්‍යාංශයට ලැබෙන ලිපිවලට පිළිතුරු යා යුතුයි. අපේ අමාත්‍ය කාර්යාලවලට ලැබෙන ලිපි පිළිබඳව අපි අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල මඟින් කටයුතු කරනවා. මම විමසා බලන්නම් අමාත්‍යාංශයෙන්, එහෙම ප්‍රශ්නයක් තිබෙනවාද කියලා.

අවසාන වශයෙන් මා කිව යුතුයි, එතුමා මතු කළ වෛද්‍යවරුන් සම්බන්ධ ප්‍රශ්නය ගැන. ඇත්තටම වෛද්‍යවරුන්ට විතරක් නොවෙයි, අපි මේ රටේ සෑම වෘත්තිකයෙකුටම හිමි විය යුතු අයිතිවාසිකම් සහ වරප්‍රසාද වෙනුවෙන් පෙනී ඉන්නවා. නමුත්, මේ වෙලාවේ රටේ තිබෙන ආර්ථික තත්ත්වය මත තමයි අපි දෙන්න පුළුවන් දේවල් දෙන්නේ. එහෙම නැතුව රජයක් විධියට කිසිම වෘත්තිකයෙකුගේ කිසිම අයිතියක් හෝ කිසිම වරප්‍රසාදයක් ඉවත් කිරීමට අපි කිසිම තීරණයක් අරගෙන නැහැ. පොඩි propaganda එකක් මේ යන්නේ. අපි ඒකට නතු වෙන්න ඕනෑ නැහැ. අපි මේ ආර්ථිකය යන්තම් ස්ථාවර කරමින් ඉන්නවා. එසේ ස්ථාවර වෙමින් තිබෙන ආර්ථිකයේ ප්‍රතිලාභ අපි නැවත මේ ආර්ථිකය තුළම ආයෝජනය කළ යුතුයි. එසේ ආයෝජනය කිරීමෙන් ලැබෙන වඩාත් හොඳ ආර්ථික තත්ත්වයක් යටතේ තමයි අප එම ප්‍රතිලාභ භුක්ති විඳිය යුත්තේ. මා හිතන විධියට, අපේ රටේ වෘත්තිකයන් ඒ පිළිබඳ හොඳ අවධානයෙන් ඉන්න පිරිසක්; මේ ගැන හොඳින් අධ්‍යයනය කරපු පිරිසක්. බහුතර වෘත්තිකයන් පිරිසක් සමඟ අපි නිරන්තරයෙන් සංවාදයේ යෙදෙනවා. ඔවුන් සමඟ නිරතුරුවම අපට සම්බන්ධතාවක් තිබෙනවා. ඒ නිසා ඔවුන් කිසිම කෙනෙක් මේ වෙලාවේ ඒ විධියේ අනවශ්‍ය ප්‍රශ්නයකට රට පැටලීමට සූදානම් නැහැ. නමුත්, යම් දේශපාලන වුවමනාවක් වෙනුවෙන් සුළු කණ්ඩායමක් පෙනී ඉන්නවා.

කොහොම වුණත්, අද මාතෘකාවට අදාළව ගත්තොත්, මෙවැනි කරුණක් සම්බන්ධව, එනම් අක්ෂි රෝග පිළිබඳ කරුණක් සම්බන්ධව පාර්ලිමේන්තුවේ කථා කිරීම සහ ඒ පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කිරීම බොහොම හොඳ දෙයක්. අපි මේ වාගේ දේවල් නැවත නැවත සමාජයේ කථා බහට ලක් කළ යුතුයි. ඒ වෙනුවෙන් අවස්ථාව ලබා දුන් ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමාට අපේ ස්තුතිය හිමි වෙනවා.

**** සභාමේසය මත තබන ලද වගුව:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட அட்டவணை:*
** Table tabled:*

National Eye Hospital - Summary of the Surgeries
(2020 - Sep 2025)

| Surgery/ Specialty | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 (Up to 30.09. 2025) |
|---|---|---|---|---|---|---|
| General Ophthalmology Units Surgeries | 17751 | 13836 | 21513 | 21448 | 19813 | 16168 |
| Cataract Surgery | 8814 | 7245 | 11862 | 12164 | 12824 | 9807 |
| Vitreo Retinal Surgeries | 4839 | 4887 | 6265 | 5327 | 5901 | 5420 |
| Corneal & External Eye Diseases | 960 | 804 | 513 | 1583 | 1886 | 1078 |
| Oculo-plastic Surgeries | 713 | 536 | 845 | 998 | 898 | 604 |

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Presiding Member -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා යම් පැහැදිලි කිරීමක් කරනවා නම්, විනාඩියක කාලයක් දෙන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Sir. I will finish in 30 seconds.

I am really thankful to the Deputy Minister - I also spoke to the Minister - and the two doctors who spoke on this Motion in this august Assembly. Let us get together and make these things happen. Also, on behalf of the people of the North, I would like to thank especially Dr. Malaravan and again, the Minister and the Deputy Minister.

Thank you so much.

***එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 ඔක්තෝබර් 23 වන දින සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 14 වන සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது பி. ப. 6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், அதனது 2025 ஒக்ரோபர் 23ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 14, வெள்ளிக்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 9.30 a.m. on Friday, 14th November, 2025, pursuant to the Resolution of Parliament of 23rd October, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau at the Department of Government Information, No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.